324 වන කාණ්ඩය - 05 වන කලාපය
தொகுதி 324 - இல. 05
Volume 324 - No. 05

2026 ජනවාරි 20වන අඟහරුවාදා
2026 சனவரி 20, செவ்வாய்க்கிழமை
Tuesday, 20th January, 2026

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
- පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 795]
- වරප්‍රසාද: මාධ්‍ය තුළ ව්‍යාජ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම [තීරුව 795]
- තෛපොංගල් දිනය සැමරීම [තීරුව 796]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 798]

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු** [තීරු 799-852]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
- ලක්විජය ගල්අඟුරු බලාගාරයට ගල්අඟුරු සැපයීමේ ටෙන්ඩර් ක්‍රියාවලිය [තීරුව 854]
- සංචාරක ක්ෂේත්‍රයේ ඒක පුද්ගල සංචාරක වියදම් සහ විදේශ විනිමය ඉපැයීම් අඩුවීම [තීරුව 864]

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම** [තීරුව 871]

**පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 873]

**ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 873]

**කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 874]

**නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**
පළමුවන වර කියවන ලදී [තීරුව 874]

**සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය** [තීරු 875-967]

**කල් තැබීමේ ප්‍රශ්න** [තීරු 968-974]


---

# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
- பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 795]
- சிறப்புரிமை: ஊடகங்களில் உண்மைக்குப் புறம்பான செய்திகளைப் பரப்புதல் [ப: 795]
- தைப்பொங்கல் தின கொண்டாட்டம் [ப: 796]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 798]

**வினாக்களுக்கு வாய்மூல விடைகள்** [ப: 799-852]

**தனி அறிவித்தல் மூல வினா:**
- லக்விஜய நிலக்கரி மின் உற்பத்தி நிலையத்துக்கு நிலக்கரி வழங்கலுக்கான கேள்வி மனு நடைமுறை [ப: 854]
- சுற்றுலாப் பயணிகளின் தனிநபர் செலவு மற்றும் சுற்றுலாத் துறையில் அந்நியச் செலாவணி வருவாய் குறைவு [ப: 864]

**மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்வினது சொந்தவிளக்கம்** [ப: 871]

**இருப்பாட்சியாளர்களைப் பாதுகாத்தல் சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 873]

**வாடகை (நீக்கல்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 873]

**கொள்கல நிலையத் தொழிற்படுத்துநர்களுக்கு உரிமமளித்தல் சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 874]

**கப்பற்றொழில் முகவர்களுக்கு, சரக்கு அனுப்புநர்க்கு, கலன் செயற்படுத்தப்படாப் பொதுக் காவுநர்க்கு மற்றும் கொள்கலம் செயற்படுத்துநர்க்கு உரிமமளித்தல் (திருத்தம்) சட்டமூலம்:**
முதன்முறை மதிப்பிடப்பட்டது [ப: 874]

**நலன்புரி அனுகூலங்கள் சட்டத்தின்கீழ் அஸ்வெசும நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டம்** [ப: 875-967]

**ஒத்திவைப்பு வினாக்கள்** [ப: 968-974]

# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
- Parliamentary Pensions (Repeal) Bill: Petitions to the Supreme Court [Col. 795]
- Privilege: Dissemination of Fake News on Media [Col. 795]
- Celebration of Thai Pongal Day [Col. 796]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 798]

ORAL ANSWERS TO QUESTIONS [Cols. 799-852]

QUESTION BY PRIVATE NOTICE:
- Tender Process for Supply of Coal to Lakvijaya Coal Power Plant [Col. 854]
- Decrease in Per Capita Spending of Tourists and Foreign Exchange Earnings in Tourism Sector [Col. 864]

PERSONAL EXPLANATION BY HON. (DR.) M.L.A.M. HIZBULLAH [Col. 871]

PROTECTION OF OCCUPANTS BILL:
- Read the First time [Col. 873]

RENT (REPEAL) BILL:
- Read the First time [Col. 873]

LICENSING OF CONTAINER DEPOT OPERATORS BILL:
- Read the First time [Col. 874]

LICENSING OF SHIPPING AGENTS, FREIGHT FORWARDERS, NON-VESSEL OPERATING COMMON CARRIERS AND CONTAINER OPERATORS (AMENDMENT) BILL:
- Read the First time [Col. 874]

ASWESUMA WELFARE BENEFIT PAYMENT SCHEME UNDER THE WELFARE BENEFITS ACT [Cols. 875-967]

ADJOURNMENT QUESTIONS [Cols. 968-974]

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

*2026 ජනවාරි 20වන අඟහරුවාදා*
*2026 சனவரி 20, செவ்வாய்க்கிழமை*
*Tuesday, 20th January, 2026*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**

பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.

The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### பாராளுமன்ற ஓய்வூதியம் (நீக்குதல்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### PARLIAMENTARY PENSIONS (REPEAL) BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "පාර්ලිමේන්තු විශ්‍රාම වැටුප් (ඉවත් කිරීමේ)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් තුනක පිටපත් මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

## II

### වරප්‍රසාද: මාධ්‍ය තුළ ව්‍යාජ ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීම
### சிறப்புரிமை: ஊடகங்களில் உண்மைக்குப் புறம்பான செய்திகளைப் பரப்புதல்
### PRIVILEGE: DISSEMINATION OF FAKE NEWS ON MEDIA

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා විසින් 2025 නොවැම්බර් 13 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## III

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ජනවාරි 07 දින පැවති මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේදී, එකී කාරක සභාවේ සභාපති ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතා විසින් ලබා දෙන ලද උපදෙස් පරිදි "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් ආපදාවට පත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත රජය විසින් ලබා දෙනු ලබන ප්‍රතිලාභ පිළිබඳව, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් 2026 ජනවාරි 20 අඟහරුවාදා, එනම් අද දින පෙරවරු 11.30 සිට පස්වරු 1.30 දක්වා පාර්ලිමේන්තුවේ කාරක සභා කාමර අංක 01හිදී පැවැත්වීමට නියමිත බැවින් ඒ සඳහා සහභාගි වන ලෙස සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කාරුණිකව ආරාධනය කරනු කැමැත්තෙමි.

## IV

### තෛපොංගල් දිනය සැමරීම
### தைப்பொங்கல் தின கொண்டாட்டம்
### CELEBRATION OF THAI PONGAL DAY

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2026 ජනවාරි 21 බදාදා පෙරවරු 7.45 සිට පෙරවරු 9.15 දක්වා තෛපොංගල් දිනය සැමරීමක්, මාගේ ප්‍රධානත්වයෙන් පාර්ලිමේන්තුවේ ප්‍රධාන ද්වාරය අසල දී පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

එම උත්සවය සඳහා පැමිණ සහභාගි වන ලෙස සියලුම ගරු මන්ත්‍රීවරයන්ට කාරුණිකව ආරාධනා කරමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා (සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ - சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. (Dr.) Nalinda Jayatissa - Minister of Health and Mass Media and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම්; සහ

(iii) 2024 වර්ෂය සඳහා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව.

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මෙම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව; සහ

(ii) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවල අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, 2024 වර්ෂය සඳහා ජාතික ශිල්ප සභාවේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)

ගරු කථානායකතුමනි, 2018 වර්ෂය සඳහා ඇල්කඩුව වැවිලි සමාගමේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ඛනිජතෙල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2023 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව, නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
### அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
### PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு சம்பிக ஹெட்டிஆரச்சி)
(The Hon. Champika Hettiarachchi)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, එම කාරක සභාව වෙත යොමු කරන ලද 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වන වගන්තිය යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය (2025.12.15 දිනැති අංක 2467/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද) සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු කථානායකතුමනි, තංගල්ල, නාවික කඳවුර, නාවික සිවිල් සේවක සමිතියේ එස්.එන්. රණවීර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඩී.වී. චානක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

ගරු කථානායකතුමනි, මත්තේගොඩ, සපුමල් උයන, අංක 54/ඒ/3 යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. හාෂිණී චතුරිකා මෙනෙවියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ජගත් විතාන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ගල් අඟුරු දහනය: පාරිසරික ගැටලු
### நுரைச்சோலை அனல் மின் நிலையத்தில் நிலக்கரி எரியூட்டப்படுதல்: சூழல் சார்ந்த பிரச்சினைகள்
### COAL BURNING AT NOROCHCHOLAI COAL POWER PLANT: ENVIRONMENTAL ISSUES

680/2025

**1. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ගල් අඟුරු දහනය හේතුවෙන් ඒ අවට ගම්මානවල පදිංචි වී සිටින ජනතාව පාරිසරික ගැටලු රාශියකට මුහුණ දී සිටින බව දන්නේද;

(ii) එම පාරිසරික ගැටලු විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நுரைச்சோலை அனல் மின் நிலையத்தில் நிலக்கரி எரியூட்டப்படுவதால் சுற்றயல் கிராமங்களில் வசிக்கும் மக்கள் பல்வேறு சூழல் சார்ந்த பிரச்சினைகளை எதிர்கொண்டுள்ளதை அறிவாரா;

(ii) அச்சூழல் சார்ந்த பிரச்சினைகளைத் தீர்ப்ப தற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether he is aware that because of the burning of coal at the Norochcholai Coal Power Plant, the residents living in the surrounding villages are facing numerous environmental issues; and

(ii) the measures that will be taken to resolve such environmental issues?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා (පරිසර අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி - சுற்றாடல் அமைச்சர்)
(The Hon. (Dr.) Dammika Patabendi - Minister of Environment)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ ගල් අඟුරු දහනය හේතුවෙන් සිදු වන පාරිසරික ගැටලු සම්බන්ධව කිසිදු පැමිණිල්ලක් මෑතකදී වයඹ පළාත් පරිසර අධිකාරිය වෙත වාර්තා වී නොමැති බව එම අධිකාරිය විසින් දැනුම් දී ඇත.

(ii) නොරොච්චෝලේ පිහිටි ගල් අඟුරු බලාගාරයේ ක්‍රියාකාරීත්වය හේතු කොටගෙන ඇති වන පාරිසරික ගැටලු පාලනය කර සම්මත ප්‍රමිති හා උපමාන යටතේ කර්මාන්තය පවත්වාගෙන යාම සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කරනු ලබන අතර, එකී බලපත්‍රයේ කොන්දේසි ප්‍රකාරව කර්මාන්තකරු කටයුතු කරන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා පසු විපරම් කටයුතු සිදු කිරීමත්, අදාළ විශ්ලේෂණ වාර්තා ලබා ගැනීමත් සිදු කරනු ලබයි.

මධ්‍යම පරිසර අධිකාරියේ නිරීක්ෂණයන්ට අනුව ඉහත සඳහන් කර්මාන්තය සඳහා වයඹ පළාත් පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කර ඇති බැවින්, මෙම ගල් අඟුරු බලාගාරය හේතුවෙන් පාරිසරික ගැටලු ඇති වේ නම් එම ගැටලු පාලනය කිරීමේ නෛතික බලය පැවරී ඇත්තේ වයඹ පළාත් පරිසර අධිකාරිය වෙතය.

එබැවින්, එම පාරිසරික ගැටලු විසඳීම සඳහා වයඹ පළාත් පරිසර අධිකාරිය මඟින් පහත පරිදි ක්‍රියාත්මක වේ.

තාප විදුලි බලාගාර ක්‍රියාකාරීත්වයේදී ජනනය වන දූෂකාරක හේතුවෙන් සංසරණ වායු තත්ත්වය, භූගත ජලයේ තත්ත්වය හා සමුද්‍ර

[ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා]

පරිසරයට වන පාරිසරික බලපෑම අධ්‍යයනය සඳහා විශේෂඥ කමිටුවක් - expert panel එකක් - ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ මැදිහත් වීමෙන් ස්ථාපනය කෙරිණි. ඒ අනුව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමට - MoU එකට - අනුව;

- සුළං බාධක - wind barriers - ස්ථාපනය කරන ලදී.
- භෞතික ජෛවීය හා සමාජයීය බලපෑම අධ්‍යයනයට ඒ සඳහා වූ විශේෂඥ කමිටුවක් පත්කොට මාස 06කට වරක් කමිටුව රැස් වී ප්‍රගති සමාලෝචනයක් සිදු කිරීම.
- සංසරණ වායු තත්ත්වය නිරීක්ෂණය සඳහා ස්ථාවර වායු තත්ත්ව අධීක්ෂණ ඒකක ස්ථානගත කිරීමට - installation of permanent ambient air quality monitoring stations - කටයුතු කර ඇත.
- දැනට බාහිර පරිසරයට මුක්ත වන අළු පාලනය කිරීම සඳහා ස්ථිති විද්‍යුත් අවක්ෂේපකය - Electrostatic Precipitator - සහ SO2 වායුව පාලය කිරීම සඳහා විමෝචක වායු ගෙන්දගම් වියුක්තකය උපකරණ - flue-gas desulfurizer - සවි කර ඇති අතර, මනා පාලනයකින් ක්‍රියා කිරීමට කටයුතු කර ඇත.න
- ජල සම්පත් මණ්ඩලය මඟින් භූගත ජලයේ ගුණාත්මක තත්ත්වය සම්බන්ධව අධ්‍යයනය කරයි.
- NARA ආයතනය මඟින් ජලජ ජීවීන්ට සිදු වන බලපෑම අධ්‍යයනය කරයි.
- MEPA එක මඟින් සමුද්‍ර පරිසරයට ඇති වන බලපෑම අධ්‍යයනය කරයි.
- භූගත ජලයේ ගුණාත්මකභාවය, කුළුණු විමෝචන තත්ත්වය, සංසරණ වායු තත්ත්වය, පලායිත අවලංභිත අංශු, ශබ්ද මට්ටම් සහ පිරිපහදු කරන ලද කාර්මික අපසන්දන තත්ත්වය පිළිගත් ආයතනයකින් පරීක්ෂා කර ඇති අතර, එම තත්ත්වයන් අදාළ ප්‍රමිතීන් තුළ පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, හරබර උත්තරයක් ලබා දීම ගැන ගරු අමාත්‍යතුමාට මා පළමුවෙන්ම ස්තුතිවන්ත වනවා. හැබැයි, ගරු කථානායකතුමනි, භූමියේ තත්ත්වය ඒක නොවෙයි. භූමියේ තත්ත්වය ඊට වෙනස්. ගරු අමාත්‍යතුමනි, දැන් ඔබතුමා කියපු ඒ වාර්තා ටික ඔබතුමාට ලැබුණාද, එහෙම නම් එම වාර්තා ටික පාර්ලිමේන්තුවට සභාගත කරන්න පුළුවන්ද කියලා මම අහනවා.

ගරු අමාත්‍යතුමනි, එම ප්‍රදේශයේ ජනතාව විශේෂයෙන්ම මුහුණ දෙන ගැටලුවක් තමයි, අළු සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය. ඇඳුමක් හෝදලා වැලක දමන්න බැරි තත්ත්වයකට අද වනකොට ඔවුන් පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම එම ප්‍රදේශයේ ගොවිතැන්වලට මේ අළු නිසා විශාල හානියක් සිදු වනවා. ඒ වාගේම ජන ජීවිතයට විශාල වශයෙන් බලපානවා, මේ අළු සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය. ඒ ප්‍රශ්නය යම් ප්‍රමාණයකට අපි විසඳුවා. මම නැහැ කියන්නේ නැහැ. ඒ ප්‍රශ්නය යම් ප්‍රමාණයකට විසඳුවා. හැබැයි, ඒක ප්‍රමාණවත් නැහැ. ඔය කියන පරිසර ආරක්ෂණ බලපත්‍රයත් මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියලා මම ඉතා ගෞරවයෙන් ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා. මොකද, එම බලපත්‍රය නිසි අයුරින් ලැබුණාද කියාත් අපට ප්‍රශ්නයක් තිබෙනවා. එම බලාගාරය හදපු තැන ඊට සුදුසුයි කියලා අපි කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ. මොකද, ජනතාව ජීවත් වන ප්‍රදේශයක් මැද තමයි ඒ බලාගාරය හැදුවේ. ඒක බරපතළ ප්‍රශ්නයක්. හැබැයි, එම බලාගාරය නිසා පීඩා විඳින කණ්ඩායම්වලට අදටත් විදුලිය අඛණ්ඩව නොලැබීම බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමන්ලා හැම දෙනෙක්ම ඒ ප්‍රශ්නය ගැන හිතන්න ඕනෑ. මොකද, කල්පිටිය ප්‍රදේශයට තමයි විදුලිය හැම තිස්සේම විසන්ධි වෙන්නේ. නිතර විදුලිය විසන්ධි වීමේ බරපතළ ප්‍රශ්නයක් ඒ අයට තිබෙනවා. බලාගාරය තිබෙන්නේ එම ප්‍රදේශයේ. බලාගාරයෙන් පිට වන අළු ටික වැටෙන්නේ ඒ ප්‍රදේශයට. හානි වෙන්නේ ඒ අයගේ වගාවලට.

ඊළඟට, ඒ ප්‍රදේශයේ ධීවරයින්ට මුහුදු යන්න බැහැ. ඔවුන්ට මුහුදු යන්න තහනම්. මොකද, නැව ආවාට පස්සේ එම ප්‍රදේශයට බෝට්ටු එකකටවත් ළං වෙන්න දෙන්නේ නැහැ. ඒ ප්‍රදේශයේ මාළු අල්ලා තමයි ඒ අය ජීවත් වුණේ. මේ තත්ත්වය නිසා ඒ ප්‍රදේශයේ ජීවත් වන අයගේ ආර්ථිකය සම්පූර්ණයෙන් වෙනස් වුණා. ඉතින්, ඒ ආයතනයෙන් යම් විධියක හානියක් සිදු වෙනවා නම් ඒ ප්‍රදේශයේ ජනතාව බලාගැනීම ඒ ආයතනයේ වගකීමක්. ඒ වගකීම නිවැරදිව ඉෂ්ට වෙන්නේ නැහැ.

මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු ඇමතිතුමනි. මම මේ කියපු ප්‍රශ්න සියල්ල එකට එකතු කරගෙන ඒ ජන ජීවිතය නැවත නඟාසිටුවන්න ප්‍රායෝගිකව ඔබතුමන්ලා ගන්නා පියවර මොකක්ද? මොකද, ඔය උත්තරයෙන් මම සෑහීමට පත් වෙන්නේ නැහැ. ඒ ප්‍රදේශයට ගිහින් ඒ සම්බන්ධව ගන්නා පියවර මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහලා තිබුණු ප්‍රශ්නයට තමයි උත්තර දුන්නේ. ජන ජීවිතයට මොනවා හෝ ගැටලු ඇති වී තිබෙනවා නම්, ඒ ගැටලු අපට ඉදිරිපත් කරන්න. අපි ඒ ප්‍රශ්නවලට උත්තර ලබා දෙන්න සූදානම්.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. දැන් තව ප්‍රශ්නයක් එනවා. මේ අළු නිසා දැනටත් බරපතළ ප්‍රශ්නයකට මුහුණපා සිටිනවා මේ ප්‍රදේශයේ ජනතාව. දැන් බාල ගල් අඟුරු ගෙනැල්ලා, ඒවා දහනය වීමෙන් එන අළු ප්‍රදේශයේ ජනතාවට හිතකර ද, අහිතකර ද කියලා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන්න. මොකද, බාල ගල් අඟුරු ගෙනැල්ලා දහනය කළාම, ඒකෙන් යම්කිසි විෂ තත්ත්වයක් ඇති වෙනවා නම් කල්පිටිය බල ප්‍රදේශයේ ජනතාවට තමයි ඒ තත්ත්වය බලපාන්නේ. අන්න ඒ සම්බන්ධව ඔබතුමා අරගෙන තිබෙන පියවර මොකක්ද? ඔබතුමන්ලා පිළිඅරගෙන ඉවරයි ගල් අඟුරුවල ප්‍රශ්නයක් තිබෙනවා කියලා. ඒ සම්බන්ධව ඔබතුමන්ලා අරගෙන තිබෙන පියවර මොකක්ද කියලා මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරන්න.

**ගරු (වෛද්‍ය) දම්මික පටබැඳි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) தம்மிக பட்டபெந்தி)
(The Hon. (Dr.) Dammika Patabendi)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමනි, තවමත් ඇතිවෙලා නැති ප්‍රශ්නයකට; ඇති වේ යැයි කියා හිතන ප්‍රශ්නයකට දැන්ම පිළිතුරු දෙන්න බැහැ. ඒ ප්‍රශ්නය ඇති වන මොහොතේදී සහ ඒ ප්‍රශ්නය ඇති වෙනවා කියා නිශ්චිත සාක්ෂි සහිතව ඔප්පු කරපු මොහොතකදී ඔය ප්‍රශ්නයට උත්තර දෙන්න අපට පුළුවන්. ඇති වේ යැයි කියා අනුමාන කරන ප්‍රශ්නවලට උත්තර දෙන්න අපට බැහැ.

## ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය සහ ශ්‍රී ලංකා විදුහල්පති සේවය: වැටුප් වර්ධක අත්හිටුවා ඇති නිලධාරින්

## இலங்கை கல்வி நிருவாக சேவை மற்றும் இலங்கை அதிபர் சேவை: சம்பள ஏற்றம் இடைநிறுத்தப்பட்டுள்ள அதிகாரிகள்

## SRI LANKA EDUCATIONAL ADMINISTRATIVE SERVICE AND SRI LANKA PRINCIPALS' SERVICE: OFFICER FACING SUSPENSION OF SALARY INCREMENTS

818/2025

**2. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් අතරින් මේ වනවිට වැටුප් වර්ධක අත්හිටුවා ඇති නිලධාරින් සංඛ්‍යාව එක් එක් සේවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, වැටුප් වර්ධකය අත්හිටුවන ලද දිනය සහ ඊට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරින්ගේ වැටුප් වර්ධක නැවත ලබා දීම ඉතා මන්දගාමීව සිදු වන බව දන්නේද;

(iv) එම නිලධාරින් සම්බන්ධයෙන් කරනු ලබන පරීක්ෂණ කඩිනම් කර, වැටුප් වර්ධක ලබාදී ඔවුන්ට සාධාරණයක් ඉටු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை கல்வி நிருவாக சேவை மற்றும் இலங்கை அதிபர் சேவையிலுள்ள அதிகாரிகளுள் தற்போது சம்பள ஏற்றம் இடைநிறுத்தப்பட்டுள்ள அதிகாரிகளின் எண்ணிக்கை ஒவ்வொரு சேவையின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு அதிகாரியினதும் பெயர், சம்பள ஏற்றம் இடைநிறுத்தப்பட்டுள்ள திகதி மற்றும் அதற்கான காரணங்கள் வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி அதிகாரிகளின் சம்பள ஏற்றங்களை மீள வழங்குதல் மிகவும் மந்தகதியில் இடம்பெற்று வருவதை அறிவாரா என்பதையும்;

(iv) மேற்படி அதிகாரிகள் தொடர்பில் மேற்கொள்ளப்படும் விசாரணைகளை விரைவுபடுத்தி, சம்பள ஏற்றங்களை வழங்கி, அவர்களுக்கு நீதியை நிலைநாட்டுவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the number of officers of the Sri Lanka Educational Administrative Service and the Sri Lanka Principals' Service, whose salary increments have been suspended by now, separately in respect of each service;

(ii) the name of each such officer, the date on which increment was suspended, and the reason for each suspension, separately;

(iii) whether she is aware that the restoration of these salary increments is proceeding quite slowly; and

(iv) the measures that will be taken to expedite the inquiries concerning these officers, granting them with their increments without further delay to ensure that justice is served?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා (අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன - கல்வி, உயர் கல்விப் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Madhura Senevirathna - Deputy Minister of Education and Higher Education)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් අතරින් නිලධාරින් 32කගේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් අතරින් නිලධාරින් 553කගේ වැටුප් වර්ධක මේ වන විට අත්හිටුවා ඇත.

(ii)
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වැටුප් වර්ධක අත්හිටුවන ලද එක් එක් නිලධාරියාගේ නම, වැටුප් වර්ධකය අත්හිටුවන ලද දිනය සහ ඊට හේතු වෙන් වෙන් වශයෙන් ඇමුණුම 01 මඟින් ද,
- ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වැටුප් වර්ධක අත්හිටුවන ලද එක් එක් නිලධාරියාගේ නම, වැටුප් වර්ධකය අත්හිටුවන ලද දිනය සහ ඊට හේතු වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 මඟින්ද ඉදිරිපත් කර ඇත.

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා ]

දීර්ඝ විස්තර තිබෙන නිසා ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

(iii) නිලධාරින්ගේ වැටුප් වර්ධක ගෙවීම් සිදු කරනු ලබන්නේ නියමිත පරිදි වාර්ෂික කාර්ය සාධන වාර්තා නිලධාරින් විසින් ලබාදීමෙන් පසුව හා වැටුප් වර්ධකය අත්හිටුවීමට හේතු වූ අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමෙන් අනතුරුව හෝ විනය/ විමර්ශන කරුණක් නම් ඒ හා සම්බන්ධ සියලු විනය/ විමර්ශන කටයුතු අවසන් වූ බවට කරුණු තහවුරු කර ගැනීමෙන් අනතුරුව වේ. අදාළ ක්‍රියාවලිය කලාප/ පළාත් කාර්යාල හරහා සිදු කිරීමේදී යම් සාධාරණ කාලයක් ඒ සඳහා ගත වන බව නිරීක්ෂණය කරමි.

(iv) යම් නිලධාරියෙකු තම වැටුප් වර්ධක හේතු විරහිතව ප්‍රමාද වී ඇති බව අමාත්‍යාංශය වෙත දැනුම් දෙන්නේ නම් ඒ සම්බන්ධයෙන් ඍජුව මැදිහත් වී අදාළ ආයතන හා සම්බන්ධීකරණය වෙමින් කඩිනමින් අදාළ ගැටලුව නිරාකරණය කිරීමට හැකියාව ඇති අතර, විනය/ විමර්ශන කරුණු මත වැටුප් වර්ධක ගෙවීම අත්හිටුවා ඇති නිලධාරින් සම්බන්ධයෙන් දැනට පවතින විනය/ විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස අදාළ අංශ වෙත උපදෙස් ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඔබතුමා දන්නවා, දැනට පාසල්වල අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු ගණනාවක් තිබෙන බව. මම ඔබතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි, අධ්‍යාපන පරිපාලන සේවයේ පවතින ඒ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේ කවදාද කියන එක.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු මන්ත්‍රීතුමියනි, ඒ ප්‍රශ්නය ඇසීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, අපි ගිය අවුරුද්දේ අවස්ථා දෙකකදී අධ්‍යාපන පරිපාලන සේවයට අදාළ නිලධාරින් බඳවා ගැනීම් සිද්ධ කළා. ගරු මන්ත්‍රීතුමියනි, මේ අවුරුද්දේ ඒ අය ස්ථානගත කිරීම් සිද්ධ කරනවා. ඒ කියන්නේ, කලාප කාර්යාලවල සහ පාසල්වල ස්ථානගත කිරීම් තමයි අපි සිද්ධ කරන්නේ. මේ මොහොත වන විට බඳවා ගැනීම් සම්බන්ධයෙන් නිශ්චිතව තීරණයක් ගෙන නැහැ. නමුත්, ස්ථානගත කිරීම් එක්ක අපිට යම් කිසි මට්ටමකින් පරිපාලන කටයුතු සිදු කර ගැනීමේ හැකියාව ලැබෙයි කියලා හිතනවා.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
දිනයක් කියන්න බැරිද?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
දිනයක් කියන්න බැහැ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
අඩුම තරමින් "මේ කාලය වන විට අපි ගැසට් කරනවා" කියලා කියන්න පුළුවන් මට්ටමේ තත්ත්වයක් හරි තිබෙනවාද කියලායි දැන ගන්න ඕනෑ.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු මන්ත්‍රීතුමියනි, අධ්‍යාපන පරිපාලන සේවය සම්බන්ධයෙන් මේ මොහොතේ අපිට නිශ්චිතව තීරණයක් කියන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමියනි, දෙවැනි අතුරු ප්‍රශ්නයත් අහන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මම ඒක එහෙම අහන්න හේතුව මෙකයි. අපි දන්නවා, විදුහල්පති සේවයට බඳවා ගත්තත් ඔවුන්ව විධිමත්ව ස්ථානගත නොකිරීම නිසා බොහෝ පාසල්වල ප්‍රශ්න තිබෙන බව. අධ්‍යාපන පරිපාලන සේවයේ අය වාගේම විදුහල්පති සේවයේ අයත් විධිමත්ව ස්ථානගත නොකිරීම නිසා, ශ්‍රේණිධාරි දෙතුන්දෙනා හිටියත් සමහර පාසල්වල විදුහල්පති තනතුරු තවමත් පුරප්පාඩු වෙලා තිබෙන නිසා, පාසල් කළමනාකරණය කර ගැනීමේදී යම් යම් ගැටලු ඇති වෙනවා. අන්න ඒ නිසායි මම එහෙම ඇහුවේ.

අනෙක් අතට, 2020ට කලින් තිබුණු විභාගයක් පදනම් කරගෙන තමයි විදුහල්පතිවරුන් බඳවා ගැනීම සිදු කරලා තිබෙන්නේ. ඒකෙනුත්, සම්මුඛ පරීක්ෂණ පවත්වා තෝරා ගන්නවා කියපු අය 500කට ආසන්න ප්‍රමාණයක් ඉන්නවා. නමුත් ඒ අය බඳවා ගැනීම සිද්ධ වෙලාත් නැහැ, තව වනකල්. ඒ අය interview එක pass වෙලා තිබියදීත්, තවම ගුරුවරුන් හැටියට සේවය කරනවා. මේ වාගේ ප්‍රශ්න ගණනාවක් මේ අධ්‍යාපන සේවය තුළ තිබෙනවා. ඒ සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරවමින් තමයි මම කලින් ප්‍රශ්නය ඇහුවේ. ඒ නිසා එකී පුරප්පාඩු පිරවීම සඳහා දිනයක් ලබා දෙනවා නම් තමයි වඩාත් හොඳ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපි දන්නවා ගුරු සේවයට සාපේක්ෂව අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් අතර විශාල වැටුප් විෂමතාවක් තිබෙන බව. ඒක නිවැරැදි කිරීමට කටයුතු කරනවාද?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)
ගරු කථානායකතුමනි, අපි අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරින් සහ අනෙකුත් අංශවල නිලධාරින් සමඟ සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූවා. අධ්‍යාපන පරිපාලන සේවයේ කොටස් 5ක් තිබෙනවා නේ. පසුගිය කාලය තුළ එක් එක් අංශවලට, සේවාවලට

---
*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

අදාළව ගොඩනැඟුණු වැටුප් විෂමතා ප්‍රමාණයක් තිබෙනවා. අපි මේ මොහොතේදී නිශ්චිතවම කියනවා, 2027 වනකොට ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවත් එක්ක සම්බන්ධ වෙලා අධ්‍යාපන පරිපාලන සේවයේ කොටස් 5ටම අදාළව නිශ්චිත වැටුප් පරිමාණ ඉදිරිපත් කරන බව. පසුගිය කාලය තුළ වැටුප් සම්බන්ධ තීරණ අරගෙන තිබුණේ අදාළ අංශයට අදාළව විතරයි. ඔබතුමිය මතු කරන කාරණය පැන නඟින්නේ ඒ කාරණයත් එක්කයි, ගරු මන්ත්‍රීතුමියනි. ඒ ගැටීම වළක්වා ගැනීම සඳහා පොදු තීරණයක් ඔස්සේ වැටුප් සම්බන්ධ නිර්ණායක සකසා ගැනීමට තමයි අදහස් කරන්නේ, ගරු කථානායකතුමනි.

## පල්ලෙකැලේ බන්ධනාගාරයේ තදබදය අඩු කිරීම: ක්‍රියාමාර්ග

### பல்லேகலே சிறைச்சாலையில் நெருக்கடியைக் குறைத்தல்: நடவடிக்கை

### REDUCTION OF OVERCROWDING AT PALLEKELE PRISON: MEASURES TAKEN

851/2025

**3. ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පල්ලෙකැලේ, දුම්බර බන්ධනාගාරයේ මේ වන විට රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බන්ධනාගාරයේ රැඳවීමට හැකි රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම බන්ධනාගාරයේ නව ඉදි කිරීම් කඩිනම් කර, මේ වන විට බන්ධනාගාරයේ පවතින තදබදය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பல்லேகலே, தும்பர சிறைச்சாலையில் தற்போது தடுத்து வைக்கப்பட்டுள்ள சிறைக்கைதிகளின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி சிறைச்சாலையில் தடுத்து வைக்கக்கூடிய சிறைக்கைதிகளின் எண்ணிக்கை யாது;

(iii) மேற்படி சிறைச்சாலையின் புதிய நிர்மாணப் பணிகளை துரிதப்படுத்துவதன்மூலம் தற்போது சிறைச்சாலைகளில் காணப்படும் நெருக்கடியைக் குறைப்பதற்காக மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and National Integration:

(a) Will he inform this House the -

(i) number of inmates currently kept at the Dumbara Prison in Pallekele;

(ii) detention capacity of the prison concerned; and

(iii) measures that will be taken to expedite the new constructions of that Prison and to reduce the current overcrowding in the Prison?

(b) If not, why?

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2026.01.04 දිනට 2,246.

(ii) 699

(iii)
- පෙර පැවැති බෝගම්බර බන්ධනාගාරය හා නුවර රිමාන්ඩ් බන්ධනාගාරය විතැන් කරමින් කාන්තා රැඳවියන් 400ක් හා පිරිමි රැඳවියන් 2,500ක් රැඳවීමට පහසුකම් සැපයීමට සහ නිලධාරින් සඳහා නිල නිවාස 102ක් සහිතව දුම්බර බන්ධනාගාරය ඉදි කිරීමට සැලසුම් කරන ලදී.

  එහි ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව අනුව සමස්ත පිරිවැය රුපියල් මිලියන 4,363කි. මෙම ව්‍යාපෘතියේ සැලසුම් හා වැඩ අධීක්ෂණ කටයුතු ඉංජිනේරු උපදේශක සමාගම -EC- මඟින් සිදු කරනවා.

  මේ දක්වා වාර්ෂිකව වෙන් වන ප්‍රතිපාදන ඉලක්ක කර ගනිමින් කොන්ත්‍රාත් 11ක් යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සමඟ රුපියල් බිලියන 1.9ක මුදලකට ගිවිසුම්ගත වී එම කාර්යයන් සම්පූර්ණයෙන්ම නිම කර ඇති අතර, බන්ධනාගාරයේ ප්‍රධාන ආරක්ෂිත පවුර, කාර්යාල ගොඩනැඟිලි, මුළුතැන්ගෙය හා ගබඩා, බැරැක්ක ඉදිකිරීම හා යෝජිත රැඳවියන් රඳවා තබන ගොඩනැඟිලිවලින් කොටසක් ඉදි කර 2026 ජනවාරි 04 දින වන විට රැඳවියන් 2,139ක ප්‍රමාණයක් රඳවා තබන්න හැකියාව ලැබී තිබෙනවා.

- ඒ අනුව 2025 වර්ෂයේ නොවැම්බර් මස අවසන් වන විට කොන්ත්‍රාත් අංක - 12හි භෞතික ප්‍රගතිය සියයට 90ක් ද, කොන්ත්‍රාත් අංක - 13හි භෞතික ප්‍රගතිය සියයට 0.9ක් ද වන අතර 2025 වර්ෂය සඳහා ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 197.28ක් වශයෙන් දැක්විය හැකියි.

- මේ වන විට බන්ධනාගාර තදබදය පල්ලේකැලේ දුම්බර බන්ධනාගාරයට පමණක් සීමා වී නොමැති අතර, සමස්ත බන්ධනාගාර පද්ධතිය තුළම සියයට 300කට වඩා වැඩි තදබදයක් නිර්මාණය වී තිබෙනවා. වාර්ෂිකව වෙන් වන ප්‍රතිපාදන අනුව මෙහි ඉදිකිරීම් නිම කිරීමට කටයුතු කරන අතර, දැනට මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි පුද්ගලයන් පුනරුත්ථාපන කඳවුරු වෙත යොමු කිරීමටත් වැඩ පිළිවෙළක් සකස් කරමින් පවතිනවා. මීට අමතරව, රජයේ ගොඩනැඟිලි කිහිපයක් බන්ධනාගාර රැඳවියන් තාවකාලිකව රඳවා තැබීම සඳහා මේ වන විට පවරා ගැනීමට

[ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා ]

කටයුතු කරමින් සිටිනවා. එමඟින් පල්ලේකැලේ දුම්බර බන්ධනාගාරයේ පවතින තදබදය ද ඉදිරියේදී අවම කිරීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කරනවා.

(ආ) පැන නොනඟී.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, පිළිතුර ලබා දුන්නාට ස්තුතියි. ඔබතුමා කියපු ආකාරයට පල්ලේකැලේ දුම්බර බන්ධනාගාරය ඇතුළු අපේ මුළු බන්ධනාගාර පද්ධතියේම අතිරික්තයක් පවතිනවා; මා හිතන විධියට, සියයට තුන්සියයක්, හාරසියයක්, පන්සියයක් වාගේ තදබදයක් පවතිනවා. දළ වශයෙන් ගත්තොත්, මුළු රැඳවියන් 37,761න් 27,000ක්ම සැකකරුවන්. ඒ කියන්නේ, වරදකරුවන් නොකරන ලද රැඳවියන් තමයි අපේ බන්ධනාගාර පද්ධතිය තුළ බොහෝ සෙයින් රඳවා ගෙන සිටින්නේ. විශේෂයෙන්ම ඒකට බලපාන කරුණු රාශියක් තිබෙනවා. නඩු අවසන් කිරීමේ ප්‍රමාදය, සමහර රැඳවියන්ට ඇප මුදල් ගෙවීමට නොහැකි වීම, දඩ මුදල් ගෙවීමට නොහැකි වීම යන කරුණු කාරණා නිසා පල්ලේකැලේ දුම්බර බන්ධනාගාරය ඇතුළු ලංකාවේ බන්ධනාගාර පද්ධතිය තුළ මෙවැනි අතිරික්තයක් පවතිනවා. දැන් ගොඩක් රටවල පොදු සමාවක් දෙනවා. පෙර වැරැදිකරුවන් නොවන රැඳවියන්ට - first-time offenders - වාගේම රඳවා ගෙන ඉන්න අවස්ථාවේදී හොඳට, යහපත් ලෙස බන්ධනාගාරයේ රැඳී සිටින රැඳවියන්ට - on good behaviour - පොදු සමාව දෙන ක්‍රියාමාර්ග ගන්නවා. ඒ, විශේෂයෙන්ම පිටරටවල. ගරු අමාත්‍යතුමනි, ගිය වසරේ දකුණු අප්‍රිකාවේ ඇප අරමුදලක් ආරම්භ කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියගේ අතුරු ප්‍රශ්නය අහන්න. ඔබතුමිය දැනට විනාඩි දෙකක් අරගෙන තිබෙනවා.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ඔව්, අතුරු ප්‍රශ්නය අහනවා, ගරු කථානායකතුමනි.

ඇප අරමුදලක් - bail fund එකක් - ස්ථාපිත කළා විශේෂයෙන්ම ඇප මුදල් නොගෙවා තිබෙන රැඳවියන් වෙනුවෙන්. ගරු කථානායකතුමනි, අපේ රටේ එක රැඳවියෙකුට දිනකට රුපියල් 1,000ක් වියදම් කරන්න රජයට සිදු වෙලා තිබෙනවා. ඉතින් සමහර විට රජයට වියදම අඩු වෙයි මේ සුළු ඇප මුදල් ගෙවන එක, රැඳවියන් නඩත්තු කිරීමට වඩා. විශේෂයෙන්ම මා ඉල්ලා සිටින්නේ මෙවැනි ක්‍රියාමාර්ගයක් අපේ රටේත් ඇති කරන්න බලන්න කියලායි.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමියනි. ඔබතුමියගේ කරුණු නිවැරදියි. ඒ වාගේම ඉතාම වැදගත් කරුණක් ඔබතුමිය ඉස්මතු කරන්නේ. හැබැයි, දැනටමත් ප්‍රජා විශෝධන ක්‍රමය හරහා රැඳවියන් අධීක්ෂණයට තැබීම සිදු වනවා. අපි පසුගිය වසරේ විතරක් රිමාන්ඩ්ගත වෙන්න නොදී ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව හරහා දඬුවම් නොකර 17,000ක් පමණ එළියේ අධීක්ෂණයට තැබුවා. ඒ අනුවත් අපි තදබදය අඩු කරන්න කටයුතු කරනවා. මේ අවුරුද්දේ අපි ඒ target එක වැඩි කරන්න බලාපොරොත්තු වෙනවා.

දෙවැනි කරුණ මේකයි. දැනටත් දඩ ගෙවා ගන්න බැරිව ඉන්න අය වෙනුවෙන් ස්වේච්ඡා සංවිධාන සහ නොයෙකුත් සංවිධාන ඉදිරිපත් වෙනවා. ඒකට අපි පහසුකම් සපයනවා. නමුත් මේ තදබදයට මූලික වෙන්නේ, ගරු මන්ත්‍රීතුමියනි, drugsවලට රිමාන්ඩ් වෙච්ච කට්ටිය නිසා. ඒගොල්ලන්ට ඔබතුමිය කියන ඔය දඩමුදල් කාරණය බලපාන්නේ නැහැ. මම හිතන විධියට, ඔබතුමිය කියූ කරුණු ආසන්න වශයෙන් නිවැරදි විය යුතුයි. එතකොට ඒ කට්ටියගේ දඩ මුදල් ගෙවීමය කියලා ඒ තදබදය අඩු වෙන්නේ නැහැ. ඒ තදබදය අඩු කර ගැනීමේ ක්‍රමය තිබෙන්නේත් මගේ අමාත්‍යාංශය යටතේ තමයි. ඒක තමයි, රස පරීක්ෂක වාර්තා කඩිනම් කිරීම. ඒ සඳහා වැඩ පිළිවෙළක් දැන් සකස් කරලා තිබෙනවා. අපට රස පරීක්ෂකවරු 50දෙනෙක් බඳවා ගන්න PSC එකෙන් අනුමැතිය ලැබී තිබෙනවා. ඊට අමතරව, තව 32ක් ගන්නවා. ගරු මන්ත්‍රීතුමියනි, මගේ උත්සාහය තිබෙන්නේ මාස 3ක් වාගේ සුළු කාලයක් ඇතුළත මේ රස පරීක්ෂක වාර්තා ගෙන්වන්නයි. මොකද, ඒක නැතිව ඇප ලබා දීමේ හැකියාවක් නැහැ, ඇප ඉල්ලීම ගොනු කරන හේතුව දන්නේ නැති නිසා. කෙසේ වෙතත්, මේ වසරේ මුල් භාගය තුළ ඒ බඳවා ගැනීම් අවසන් කරලා ඒ කටයුතු කරන්න පුළුවන්. ඔබතුමියගේ ප්‍රශ්නය හරි. අපිත් ඒ සෙනග අඩු කරන්න අවශ්‍ය සියලු පියවර ගන්නවා.

**ගරු නීතිඥ චමින්ද්‍රාණී කිරිඇල්ල මහත්මිය**
(மாண்புமிகு சட்டத்தரணி (திருமதி) சமிந்திராணி கிரிஎல்லே)
(The Hon. (Mrs.) Chamindranee Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමා කියපු ආකාරයට අපේ රටේ රැඳවියන් 37,000න් 30,000ක් විතරම මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධ රැඳවියන් තමයි ඉන්නේ. එම නිසාම ඒ රැඳවියන් පුනරුත්ථාපනය කිරීම ඉතාම වැදගත්. මම හිතන විධියට, ඔබතුමාත් ඒකට එකඟ වෙයි. නමුත් ගරු කථානායකතුමනි, 2025 අය වැය තුළින් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමට රුපියල් මිලියන 500ක් වෙන් කළත් මූල්‍ය ඒකේ ප්‍රගතිය තිබුණේ සියයට 1යි. ඒ වාගේම 2026 අය වැය යෝජනාවල රුපියල් මිලියන 10ක් තමයි බන්ධනාගාර රැඳවියන් පුනරුත්ථාපනය කිරීම සඳහා වෙන් කර තිබුණේ. රුපියල් මිලියන දහය 30,000න් බෙදුවොත් එක රැඳවියකුට පුනරුත්ථාපන කටයුතු සඳහා රුපියල් 300ක වාගේ පොඩි මුදලක් තමයි වෙන් කර තිබෙන්නේ. අනිවාර්යයෙන්ම මේ මුදල ප්‍රමාණවත් නැහැ. මොකද, ඔබතුමා කියපු ආකාරයට ගොඩක් කට්ටිය repeat offendersලා. ඒ කියන්නේ, ඇප මත එළියට දමපු ගමන්ම නැවත බන්ධනාගාරගත වීමේ ප්‍රවණතාව වැඩි අය. ඒ අනුව මේ රුපියල් මිලියන 10 ප්‍රමාණවත් නැහැ. එම නිසා ඒ මුදල වැඩි කරන්න කියලා තමයි මම මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නේ.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය කියපු කරුණු ඔක්කොම වාගේ නිවැරදියි. නමුත්, පොඩි පැහැදිලි කිරීම් කිහිපයක් කරන්න ඕනෑ. රිමාන්ඩ් එකේ ඉන්න 27,000 පුනරුත්ථාපනය කරන්න බැහැ. රිමාන්ඩ් එකේ ඉන්නේ ආසන්න වශයෙන් 27,000ක් වාගේ ප්‍රමාණයක්. ඔබතුමිය රැඳවියන් 30,000ක් කිව්වාට, මට තොරතුරු ලැබුණේ රැඳවියන් 27,000ක් කියලා. කමක් නැහැ. ඔබතුමිය නිවැරදි ඇති. ඒ කට්ටිය අපි National Dangerous Drugs Control Board එකත් එක්ක එකතු වෙලා පුනරුත්ථාපනය කරනවා.

අධිකරණ අමාත්‍යාංශය සතු පුනරුත්ථාපන කාර්යාංශය දැන් අපි ගැසට් කරලා තිබෙනවා, මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය යටතට. මොකද, ඒ අයත් National Dangerous Drugs Control Board එක හරහා පුනරුත්ථාපන කටයුතු කරනවා. එතකොට අමාත්‍යාංශ දෙකක එකම දේ කරන්නේ නැතිව කටයුතු කරන්න පුළුවන්. මේ වෙනකොට ඒ අමාත්‍යාංශ දෙකේම ප්‍රතිපාදන එකතු කරලා තමයි පුනරුත්ථාපන කටයුතු කරන්නේ.

ඒ වාගේම ඔබතුමන්ලා දන්නවා, අපේ ආණ්ඩුව විසින් මත්ද්‍රව්‍ය නිවාරණය සඳහා කටයුතු කරන බව. විශේෂයෙන් දවසට 700ක් පමණ අත්අඩංගුවට පත් වෙන අවස්ථා තිබෙනවා. නමුත්, ඒ බහුතරයක් දෙනා අපි ස්වේච්ඡා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට යවන්නත් කටයුතු කරමින් ඉන්නවා. ඒ කටයුතු තව ටිකක් ප්‍රශස්ත මට්ටමට ගෙනෙන්න ඕනෑ. නමුත්, ඔබතුමිය කියන දේ නිවැරදියි. අපි ඒ කටයුතු කරනවා. මුදල් අඩුපාඩුවක් වෙන්නේ නැහැ. මොකද, අපට ගරු ජනාධිපතිතුමා කියලා තිබෙන්නේ වෙන් කරන ලද මුදල්වල අඩුවක් තිබුණොත් නැවත දැනුම් දෙන්න, මුදල් වෙන් කරනවා කියලා. නමුත්, මේ අවස්ථාවේ දී අධිකරණ අමාත්‍යාංශය වෙන් කරපු ප්‍රතිපාදනත්, National Dangerous Drugs Control Board එක අයිති මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙන් කරපු ප්‍රතිපාදනත් එකතු කළාම ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක් පුනරුත්ථාපනය සඳහා තිබෙනවා. ඒක මදි වුණොත් තවත් මුදල් වෙන් කර ගන්නත් පුළුවන්. ඒ වාගේම ඒ දේ කරන්නත් බලාපොරොත්තු වෙනවා.

බොහොම ස්තුතියි.

## කොඩින්නෑව ගමේ රජයේ ඉඩම: නීති විරෝධී ලෙස වගා කිරීම

### கொடின்னேவ கிராமத்திலுள்ள அரச காணி: சட்டவிரோத பயிர்ச்செய்கை

### STATE LAND IN KODIINNEWA VILLAGE: ILLEGAL CULTIVATION

859/2025

**4. ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, බදු පදනම මත ලබාදී තිබෙන රජයේ ඉඩම් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 153 ග්‍රාම නිලධාරි වසමේ, කොඩින්නෑව ගමේ පිහිටි අක්කර 100ක් පමණ විශාලත්වයකින් යුතු රජයේ ඉඩම අනවසරයෙන් එළිපෙහෙළි කර අස්වද්දා ඇති බව දන්නේද;

(iii) එසේ නම්, එම ඉඩම එළිපෙහෙළි කර අස්වද්දා ඇත්තේ කවුරුන් විසින්ද;

(iv) එම පුද්ගලයන්ට ඒ සඳහා නීත්‍යානුකූල අයිතියක් තිබේද;

(v) ඔවුන් පොහොර සහනාධාරය ලබා ගෙන තිබේද;

(vi) එසේ නම්, එම පොහොර සහනාධාරය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அநுராதபுரம் மாவட்டத்தில், குத்தகை அடிப்படையில் வழங்கப்பட்டுள்ள அரசாங்க காணிகளின் எண்ணிக்கை பிரதேச செயலகப் பிரிவு வாரியாக வெவ்வேறாக எத்தனை என்பதையும்;

(ii) ஹொரவப்பொத்தானை பிரதேச செயலாளர் பிரிவின், 153ஆம் இலக்க கிராம உத்தியோகத்தர் பிரிவின் கொடின்னேவ கிராமத்தில் அமைந்துள்ள சுமார் 100 ஏக்கர் பரப்பளவு கொண்ட அரசாங்க காணி அனுமதியின்றி துப்புரவு செய்யப்பட்டு அதில் பயிரிடப்பட்டுள்ளமையை அறிவாரா என்பதையும்;

(iii) ஆமெனில், அந்த காணியைத் துப்புரவு செய்து பயிர்ச்செய்கை நடவடிக்கைகளை மேற்கொண்டவர்கள் யாவர் என்பதையும்;

(iv) மேற்படி நபர்களுக்கு அதற்கான சட்டபூர்வ உரிமை உள்ளதா என்பதையும்;

(v) இவர்கள் உர மானியத்தைப் பெற்றுக் கொண்டுள்ளார்களா என்பதையும்;

(vi) ஆமெனில், மேற்படி உர மானியத்தின் பெறுமதி எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) the number of State lands that have been granted on lease basis in each Divisional Secretary's Division in the Anuradhapura District, separately;

(ii) whether he is aware that the State land of approximately 100 acres in extent located in Kodinnewa village in Grama Niladhari Division No. 153 of Horowpothana Divisional Secretary's Division, has been illegally cleared and cultivated;

(iii) if so, who have cleared and cultivated the land referred to above;

(iv) whether the individuals concerned have a legal right to do so;

(v) whether they have obtained the fertilizer subsidy; and

(vi) if so, what the value of the fertilizer subsidy is?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා (ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அரவிந்த செனரத் - காணி மற்றும் நீர்ப்பாசன பிரதி அமைச்சர்)
(The Hon. Aravinda Senarath - Deputy Minister of Land and Irrigation)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

[ගරු අරවින්ද සෙනරත් මහතා]

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ බදු පදනම මත ලබා දී ඇති රජයේ ඉඩම් සංඛ්‍යාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වශයෙන් පහත දැක්වේ.

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ඉඩම් කැබලි ප්‍රමාණය |
|---|---|---|
| 1 | මධ්‍යම නුවර ගම් පළාත | 659 |
| 2 | පලුගස්වැව | 106 |
| 3 | නැගෙනහිර නුවර ගම් පළාත | 1205 |
| 4 | රාජාංගනය | 30 |
| 5 | නොච්චියාගම | 56 |
| 6 | රඹෑව | 183 |
| 7 | හොරොව්පතාන | 12 |
| 8 | පලාගල | 04 |
| 9 | තලාව | 189 |
| 10 | කැකිරාව | 663 |
| 11 | කහටගස්දිගිලිය | 101 |
| 12 | මහඉලුප්පල්ලම | 118 |
| 13 | ඉපලෝගම | 42 |
| 14 | ගලෙන්බිඳුනවැව | 202 |
| 15 | පදවිය | 08 |
| 16 | ගල්නෑව | 44 |
| 17 | මැදවච්චිය | 350 |
| 18 | මිහින්තලය | 291 |
| 19 | නාච්චාදූව | 75 |
| 20 | විලච්චිය | 118 |
| 21 | කැබිතිගොල්ලෑව | 301 |
| 22 | තිරප්පනේ | 406 |
| 23 | තඹුත්තේගම | මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියලු ඉඩම් මහවැලි අධිකාරියට අයත් බව දන්වන ලදී. |

(ii) ඔව්.

(iii) ඉඩම එළිපෙහෙළි කරන ලද පුද්ගලයන් නිශ්චිතව හඳුනා ගත නොහැක. නමුත්, කාලාන්තරයක් මෙම ඉඩම් භුක්ති විඳින පිරිස් අතර 2005 වසරේ පමණ සිට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්. චන්ද්‍රසේන මහතා සහ ඔහුගේ බිරිඳ විසින් හේන් හා කුඹුරු ඉඩම් වගා කිරීමට මෙම ප්‍රදේශ භාවිත කරන බව කොඩින්නෑව ගොවි සංවිධානයේ ලේකම්ගේ තොරතුරු අනුව හා දැනට අක්කර 02ක පමණ ස්ථිර භෝග වගාවන් සිදු කරන අයගේ ප්‍රකාශ තුළින් තහවුරු කර ගත හැකි බව හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් විසින් වාර්තා කර ඇති බව ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් දන්වා ඇත.

- හේන් ඉඩම් අක්කර 75ක් පමණ ප්‍රදේශවාසීන් සහ බාහිර පුද්ගලයන් වගා කරන අතර, කන්න භෝග වගා කරන බැවින් වගා කන්නයේදී ක්ෂේත්‍ර පරීක්ෂාවක් මඟින් නිශ්චිතව තහවුරු කරගෙන දැන්වීමට කටයුතු කළ හැකි බව සහ
- වී වගා කරන කුඹුරු ඉඩම් අක්කර 75ක් පමණ ප්‍රදේශවාසීන් සහ බාහිර පුද්ගලයන් වගා කරන අතර, වගා කන්නයේදී ක්ෂේත්‍ර පරීක්ෂාවක් මඟින් හෝ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ලේඛන අනුව නිශ්චිතව තහවුරු කරගෙන දැන්වීමට කටයුතු කළ හැකි බව ද හොරොව්පොතාන ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. මේ වෙනකොට කන්නයේ වැඩ ආරම්භ කර තිබෙනවා. මේ මොහොත වන විටත් නිලධාරින් ඒ අදාළ සමීක්ෂණ කටයුතු සිදු කරමින්, අදාළ තොරතුරු එක්රැස් කර ගන්නවා කියන එක තමයි නිලධාරින්ගේ පැත්තෙන් දැනුම්දීම් කර තිබෙන්නේ.

(iv) බලපත්‍ර, දීමනා පත්‍ර හෝ දීර්ඝ කාලීන බලපත්‍ර මෙතෙක් නිකුත් කර නොමැත.

(v) ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දැනුම් දී ඇති පරිදි මෙම ඉඩම සඳහා පොහොර සහනාධාරය ලබාදී ඇත්තේ අක්කර 10ක් සඳහා පමණි.

(vi) මෙහි වගා කටයුතු කරන ගොවීන් දෙදෙනෙකු වෙත නිකුත් කර ඇති මුදල් සහනාධාර ප්‍රමාණය පිළිබඳ තොරතුරු ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහත පරිදි දක්වා ඇත.

- 2023/2024 මහ කන්නයේ දී එක් අක්කරයකට රුපියල් 6000.00 බැගින් අක්කර 05කට රුපියල් 30,000.00ක් නිකුත් කර ඇත.
- 2024/2025 මහ කන්නය සඳහා එක් අක්කරයකට රුපියල් 10,000.00 බැගින් අක්කර 10කට රුපියල් 100,000.00ක් නිකුත් කර ඇත.

පොහොර වශයෙන් නිකුත් කර ඇති සහනාධාර ප්‍රමාණය පහත පරිදි වේ.

- සුළු වාරිමාර්ග කුඹුරු සඳහා එක් අක්කරයකට යූරියා කිලෝග්‍රෑම් 72ක්, එම්ඕපී කිලෝග්‍රෑම් 16ක් හා ටීඑස්පී කිලෝග්‍රෑම් 14ක් බැගින් ලබා දී ඇත.
- අභස්දිය කුඹුරු සඳහා එක් අක්කරයකට යූරියා කිලෝග්‍රෑම් 62ක්, එම්ඕපී කිලෝග්‍රෑම් 14ක් හා ටීඑස්පී කිලෝග්‍රෑම් 12 බැගින් ලබා දී ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශේෂයෙන්ම අපේ රටේ බොහෝ ප්‍රදේශවල ඉඩම් දේශපාලනඥයන් විසින් අත්පත් කරගෙන තිබෙනවා කියලා අපි දන්නවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.එම්. චන්ද්‍රසේන මහත්මයා පසුගිය කාලයේ හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කොඩින්නෑව ගම්මානයේ අක්කර 75කට, 100කට වඩා ප්‍රමාණයක් ඔහුගේ දේශපාලන බලය පාවිච්චි කරලා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවත් යොදාගෙන තමයි ඒ හේන් වගාව කළේ. හැබැයි, ඔබතුමා දීපු

පිළිතුරේ ප්‍රශ්නයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දුන් පිළිතුරේ එක තැනක සඳහන් වෙනවා, ගොවීන් හඳුනා ගන්න බැහැ කියලා. හැබැයි, තව තැනක සඳහන් වෙනවා, එස්.එම්. චන්ද්‍රසේන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා - හිටපු ඇමතිතුමා - ඒ ඉඩම්වල වැඩ කළා කියලා. ඒක නිසා නිලධාරින් දීලා තිබෙන පිළිතුර සම්බන්ධයෙන් පරස්පරභාවයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මේ සම්බන්ධයෙන් ඔබතුමා නැවත විධිමත් පරීක්ෂණයක් කරලා හොඳ වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරනවාද කියලා මම අහනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

එම ප්‍රදේශයට අදාළ තොරතුරු ගත්තාට පස්සේ, එම ඉඩම් පරිහරණය කරද්දී දේශපාලනඥයන් සහ ඔවුන්ගේ හිතමිතුරන් අතරේ එම ඉඩම් බෙදා දී තිබෙන බව පෙනෙනවා. හැබැයි, ඒවා නිල වශයෙන් ලේඛනගත වෙලා නැහැ. එම නිසා නිලධාරින් යම් අපහසුතාවකට පත්වෙලා තිබෙනවා. අනුරාධපුරයේ විතරක් නොවෙයි, ඉතිහාසය පුරාම සෑම දිස්ත්‍රික්කයකම මේ විධියට රජයේ ඉඩම් දේශපාලනඥයින් සහ ඔවුන්ගේ හිතවතුන් විසින් අත්පත් කරගෙන තිබෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණයක් කරමින් තිබෙනවා. විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමා යොමු කළ ප්‍රශ්නයට අදාළව පිළිතුරක් දුන්නොත්, හොරොව්පතාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මෙම නිශ්චිත කාරණයට අදාළව දැනට නිලධාරින් ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් සිදු කරමින් සිටිනවා. ඒ වාගේම අපි නිලධාරින් දැනුවත් කර තිබෙනවා, ඊට අදාළ තොරතුරු වාර්තාවක් ඉක්මනින්ම අමාත්‍යාංශයට ඉදිරිපත් කරන්න කියලා. ඉන් පසුව මේ සම්බන්ධයෙන් ඔබතුමා දැනුවත් කරන්න බලාපොරොත්තු වනවා.

**ගරු සුසන්ත කුමාර නවරත්න මහතා**
(மாண்புமிகு சுசந்த குமார நவரத்ன)
(The Hon. Susantha Kumara Nawarathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

විශේෂයෙන්ම හොරොව්පතාන, කහටගස්දිගිලිය ප්‍රදේශයේ සත්ව පාලනයේ නියැළෙන බොහෝ ජනතාවක් සිටිනවා. එම ජනතාව මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි, විශේෂයෙන්ම ඔවුන්ට මාස් කන්නයේදී තමන්ගේ සතුන්ට ආහාර ලබා දීම සඳහා ඉඩම් නොමැතිකම. එම නිසා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අසන දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. එම ජනතාව දැන් ඉල්ලීමක් කරලා තිබෙනවා, ඒ සඳහා අවශ්‍ය ඉඩම් ලබා දෙන්න කියලා. මම ගරු ඇමතිතුමාගෙන් අහනවා, නිශ්චිත ලෙස හඳුනා ගැනීමක් කරන්න බැරි නම්, ඒ ඉඩම් ටික සත්ව පාලනයේ නියැළී සිටින ජනතාව වෙනුවෙන් ලබා දෙන්න පුළුවන්ද කියලා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)
ගරු මන්ත්‍රීතුමා යොමු කරන්නේ රටේ තිබෙන ඉතාම වැදගත් ප්‍රශ්නයක්. අනුරාධපුරයේ කිරි ගොවීන්ට විතරක් නොවෙයි, හම්බන්තොට, අම්පාර, මඩකලපුව වාගේ දිස්ත්‍රික්ක ගණනාවක සිටින කිරි ගොවීන්ට තමන්ගේ ගවයින්ට ආහාර සැපයීමට අවශ්‍ය තණ බිම් පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඇත්තටම අපි රටක් විධියට ගත්තාම මෑත ඉතිහාසය තුළ මේ විෂයයන් පිළිබඳව අවධානය යොමු කරලාම නැහැ. එම නිසා බරපතළ ප්‍රශ්නයක් නිර්මාණය වෙලා තිබෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ පැත්තෙන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හරහා නියමාකාරයෙන් ඉල්ලීමක් කරන්න. අපි මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා කිරි ගොවීන්ගේ ගවයින්ට අවශ්‍ය තණ භූමි වෙන් කර දෙන්න අමාත්‍යාංශය විධියට දැනටමත් අවධානය යොමු කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය ඉල්ලීම කරන්න. මේ පිළිබඳව සමීක්ෂණයක් කරලා අදාළ ඉඩම් නිදහස් කරලා දෙන්න අපට පුළුවන්කම තිබෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
Sir, I rise to a point of Order. මට විනාඩියක කාලයක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතැන point එකක් නැහැ.

## මන්මුනෙපත්තු ප්‍රා.ලේ. කොට්ඨාසයේ රජයේ ඉඩම්: නීති විරෝධී පදිංචිකරුවන්

மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரசாங்க காணிகள்: சட்டவிரோத குடியிருப்பாளர்கள்

STATE LANDS IN MANMUNAI PATTU DS DIVISION: ILLEGAL OCCUPANTS

881/2025

**5. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' - Deed of Grant- හෝ 'ඉඩම් බලපත්‍ර' - Land Permit - නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයින් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාල සීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයින් අතරින් 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාල සීමාවේදී අධිකරණ නියෝග මත

[ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා]

රජයේ ඉඩම්වලින් ඉවත් කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු, එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයින් සිටින්නේද;

(vii) එසේ නම්, එම පුද්ගලයින් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தால் வழங்கப்படுகின்ற 'அளிப்புப் பத்திரம்' - Deed of Grant - அல்லது 'காணி உரிமம்' - Land Permit - இல்லாது மட்டக்களப்பு மாவட்டத்தின், மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவிலுள்ள அரசாங்க காணிகளில் ஆட்கள் குடியிருக்கின்றமையை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி அரசாங்க காணிகளிலிருந்து மேற்குறிப்பிட்ட ஆட்களை சட்டரீதியாக வெளியேற்றுவதற்கு 2017.01.01 தொடக்கம் 2025.03.31ஆம் திகதி வரையான காலப்பகுதியில் ஏற்புடைய பிரதேச செயலாளரினால் அவர்களுக்கெதிராக நீதிமன்றத்தில் வழக்குத் தாக்கல் செய்துள்ளாரா என்பதையும்;

(iv) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் சம்பந்தப்பட்ட விபரங்கள் யாவை என்பதையும்;

(v) குறிப்பிட்ட பிரதேச செயலாளரால் வழக்குத் தாக்கல் செய்யப்பட்டுள்ள ஆட்களில் 2017.01.01 முதல் 2025.03.31 வரையான காலப்பகுதியில் நீதிமன்ற உத்தரவுகளுக்கமைய அரசாங்க காணிகளிலிருந்து வெளியேற்றப்பட்ட ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை என்பதையும்;

(vi) வழக்குத் தாக்கல் செய்யவேண்டி இருப்பினும் ஏற்புடைய பிரதேச செயலாளரினால் வழக்குத் தாக்கல் செய்யப்படாத ஆட்கள் இருக்கின்றார்களா என்பதையும்;

(vii) ஆமெனில், மேற்படி ஆட்களின் எண்ணிக்கை, அவர்களின் பெயர்கள் மற்றும் ஏற்புடைய விபரங்கள் யாவை என்பதையும்;

(viii) குறிப்பிட்ட சிலருக்கு எதிராக மாத்திரம் வழக்குத் தாக்கல் செய்யப்பட்டமைக்கும், கூடுதலான ஆட்களுக்கெதிராக வழக்குத் தாக்கல் செய்யப்படாமைக்குமான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he inform this House -

(i) whether he is aware that persons are residing on State lands in the Manmunai Pattu Divisional Secretary's Division of the Batticaloa District without a Deed of Grant or a Land Permit awarded by the Government;

(ii) if so, the number of such individuals, their names and relevant details;

(iii) whether the respective Divisional Secretary has filed action at the court of law against them during the period from 01.01.2017 to 31.03.2025 to legally evict those individuals from the above State lands;

(iv) if so, the number of such individuals, their names and their relevant details;

(v) the number of evicted individuals from the State lands on court orders from 01.01.2017 to 31.03.2025 along with their names and relevant details, out of the total number of individuals prosecuted by the relevant Divisional Secretary;

(vi) whether there are persons against whom the Divisional Secretary has not filed action, although he should have;

(vii) if so, the number of such persons, and their names and other relevant details; and

(viii) the reasons for filing action against only a few of them while not filing action against most?

(b) If not, why?

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා. ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා ප්‍රදේශයට අදාළ ඉතා වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

(අ) (i) ඔව්.

(ii)

ඇමුණුම 1

**අවසරයකින් තොරව රජයේ ඉඩම්වල පදිංචිව සිටින පුද්ගලයින්ගේ විස්තර**

1 **සෙල්වනගර් නැගෙනහිර**

| නැත | සම්පූර්ණ නම | ජාතික හැඳුනුම්පත අංකය | පර්චස් | ලිපිනය | ආදායම |
|---|---|---|---|---|---|
| 1 | මංගලේශ්වරී වඩිවෙල් | 566742861V | 18 | සෙල්වනගර් | 20,000.00 |
| 2 | වෙල්ලත්තම්බි ෂර්වශාන්තිමලාදේවි | 196168310654 | 19 | මධ්‍යම වීදිය | 73,000.00 |
| 3 | රුක්ෂානා ගුණශ්‍රී | 807611739V | 8 | මධ්‍යම වීදිය | 14,000.00 |
| 4 | කනගලිංගම් පිරශාන්තිනී | 957450253V | 8 | වල්ලුවර් වීදිය | 15,000.00 |
| 5 | තරුමලිංගම් ලලිතාලෝගිනී | 756054678V | 14 | ආරයම්පති | 15,000.00 |
| 6 | සදාෂරලිංගම් ලක්ෂාන | 936151264V | 15 | ආරයම්පති - 02 | - |
| 7 | රතිකලා ජෙගතීස්වරන් | 875782444V | 20 | කාලි කෝවිල් වීදිය | 26,000.00 |
| 8 | සිත්ති තෝෂණා රියාස් | 796293683V | 18 | මඩකලපුව | 25,000.00 |

02 **රාජදුරෙග්‍රිරාම**

| නැත | සම්පූර්ණ නම | ජාතික හැඳුනුම්පත අංකය | පර්චස් | ලිපිනය | ආදායම |
|---|---|---|---|---|---|
| 1 | සුන්දරරාසා සුනීතකුමාරි | 197776801583 | 13 | නරසිංග වීදිය | 15,000.00 |
| 2 | තම්බිඇයා සුසිලාදේවි | 705582645ඩ | | රාජදුරෙයිගිරාම | 15,000.00 |

3 **සෙල්වනගර්**

| නැත | සම්පූර්ණ නම | ජාතික හැඳුනුම්පත අංකය | පර්චස් | ලිපිනය | ආදායම |
|---|---|---|---|---|---|
| 1 | තුවාරගන් ෂරෝනිකා | 200274604136 | 10 | සාන්තන් වීදිය | - |
| 2 | එන්පසෙල්වම් ප්‍රවීනා | 837250676V | 18 | ප්‍රධාන වීදිය | - |
| 3 | ඥානසෙල්වම් ඉන්පසෙල්වම් | 197820803902 | 20 | ප්‍රධාන වීදිය | - |
| 4 | සෙල්වමාණිකම් විජයලෙඩ්චුමි | 194761403098 | 18 | ප්‍රධාන වීදිය | - |
| 5 | නිතුජා කීර්තිරාජ් | 199478901801 | 20 | මුහුදු වීදිය | 23,000.00 |
| 6 | පුෂ්පරාණි නිත්තියනන්තම් | 787370578V | 17 | ප්‍රධාන වීදිය | 22,000.00 |
| 7 | රන්ජන් නිලන්තිනී | 915904149V | 13 | පාලමුනෙ වීදිය | 15,000.00 |

4 **ආරයම්පති**

| නැත | සම්පූර්ණ නම | ජාතික හැඳුනුම්පත අංකය | පර්චස් | ලිපිනය | ආදායම |
|---|---|---|---|---|---|
| 1 | ගනේෂමූර්ති සුදර්ශන් | 200306700340 | 10 | තිරුනීට්වුකර්නි | - |
| 2 | වීරකුඩි දේවි | 707423323V | 11 | නවරත්නරාජා විද්‍යාලය වීදිය | 19,300.00 |
| 3 | මාණික්කවාසගර් සුමිත්‍රාදේවි | 197258200313 | 15 | මාරි අම්මාන් කෝවිල් වීදිය | 15,000.00 |
| 4 | ජෙගතීපන් කලයිචෙල්වි | 797033740V | 10 | තිරුනීට්වුකර්නි | 20,000.00 |
| 5 | අතම්බව සිට්රි බෆ්ෂියා | 197553202130 | 15 | හයිරත් කaaස් වීදිය | 15,000.00 |
| 6 | ජනිතා ලවන් | 886192177V | 26 | තිරුනීට්වුකර්නි | 75,000.00 |
| 7 | මුගමතු ඉස්මයිල් මුගමතු රිස්වන් | 713270628V | 42 | හයිරත් වීදිය | 30,000.00 |
| 8 | ගෝබලපිල්ලෙයි කයාත්තිරේ | 805682000V | 11.5 | ගණපතිපිල්ලෙයි වීදිය | 20,000.00 |
| 9 | සෙල්ලමුතු මාරිමුත්තු | 536842055V | 12 | ගණපතිපිල්ලෙයි වීදිය | 10,000.00 |
| 10 | ලිංගම් කෞතමී | 916663684V | 15 | භාරති වීදිය | 45,000.00 |
| 11 | කෝණමලෙයි අමිර්තාංජලී | 765554462V | 15 | තිරුනීට්වුකර්නි | 25,000.00 |
| 12 | අනන්තනායගම් අනන්තරුබිනී | 197484901260 | 18 | සිවසුබ්‍රමනියම් වීදිය | 25,000.00 |
| 13 | ලෝගේන්ද්‍රන් සුගන්ධිනී | 197854901823 | 8.5 | තිරුනීට්වුකර්නි | - |
| 14 | විටර්සන් සුලෝගිනි | 200282301534 | 10 | තිරුනීට්වුකර්නි | - |
| 15 | රාජේන්ද්‍රකුමාර් පෙරින්බනායගි | 827642819V | 10 | නවරත්නරාජා විද්‍යාලය වීදිය | 30,000.00 |

[ගරු අරවින්ද සෙනරත් මහතා]

| නැත | සම්පූර්ණ නම | ජාතික හැඳුනුම්පත අංකය | පර්චස් | ලිපිනය | ආදායම |
|---|---|---|---|---|---|
| 16 | තනනේන්ද්‍රන් ජෙයකුමාරි | 736782952V | 15 | නවරත්නරාජා විද්‍යාලය වීදිය | - |
| 17 | වේලපොඩි තේවමලර් | 676473688V | 13 | නවරත්නරාජා විද්‍යාලය වීදිය | 15,000.00 |
| 18 | තංගරසා දල්ෂෙනා | 947243640V | 15 | නවරත්නරාජා විද්‍යාලය වීදිය | 15,000.00 |
| 19 | ගනේෂලිංගම් තිලකවතී | 575532527V | 10 | නවරත්නරාජා විද්‍යාලය වීදිය | 30,000.00 |
| 20 | පෙරියතම්බි මහේන්ද්‍රරාසා | 720504243V | 15 | නවරත්නරාජා විද්‍යාලය වීදිය | 30,000.00 |
| 21 | යෝග රාණි ජේසුරාසා | 546681459V | 27 | තිරුනීට්වුකර්නි | - |
| 22 | ගෞරි මනෝගරි ජෙයරාජ් | 196477603260 | 15 | තිරුනීට්වුකර්නි | 20,000.00 |
| 23 | සරවනභවන් උතයචන්ද්‍රිකා | 808400316V | 15 | තිරුනීට්වුකර්නි | 30,000.00 |
| 24 | තමයන්ති සත්‍යසීලන් | 886593732V | 24 | ගිරාමකොඩ්ඩු වීදිය | 40,000.00 |
| 25 | අප්තුල් සමතු ජෙස්මින් | 198527402780 | 10 | කර්බාලා වීදිය | 50,000.00 |
| 26 | බාලසුන්දරම් කෙතරලෝගන් | 732271490V | 7 | තිරුනීට්වුකර්නි | 10,000.00 |
| 27 | සිවරාස චන්ද්‍ර | 615454281V | 23 | භාරති වීදිය | 2,500.00 |
| 28 | වර්තරාජන් සරෝජාදේවි | 667612233V | 11 | තිරුනීට්වුකර්නි | 27,000.00 |
| 29 | උතුමාලෙබ්බායි මුහම්මතු හලිතීන් | 196501502670 | 6 | කර්බාලා ග්‍රාමම් | 20,000.00 |
| 30 | නල්ලතම්බි චන්ද්‍රවානි | 856684202V | 10 | තෝමස් වීදිය | 15,000.00 |
| 31 | නල්ලරතීනම් නිශාන්තිනී | 826844850V | 16.5 | නවරත්නරාජා විද්‍යාලය වීථිය | 50,000.00 |
| 32 | සරවනයි වේලන් | 811452481V | 15 | තිරුනීට්වුකර්නි | 12,000.00 |
| 33 | තියාගරාසා පරමේෂ්වරී | 526553535V | 17 | නවරත්නරාජා විද්‍යාලය වීථිය | 8,000.00 |

**5 වෙදර් කුඩියිරුප්පු**

| නැත | සම්පූර්ණ නම | ජාතික හැඳුනුම්පත අංකය | පර්චස් | ලිපිනය | ආදායම |
|---|---|---|---|---|---|
| 1 | ජෙම්ස් ජෙහිරිස්ටි | 200416000182 | 11 | මුහුදු වීදිය තලංකුඩා | 23,100.00 |
| 2 | සෙල්වරාජ් තිරුනාවුකරෂි | 907453359V | 10 | මාරි අම්මාන්කෝවිල් වීදිය | 10,000.00 |

**6 බලමුනේ**

| නැත | සම්පූර්ණ නම | ජාතික හැඳුනුම්පත අංකය | පර්චස් | ලිපිනය | ආදායම |
|---|---|---|---|---|---|
| 1 | හයාතු මුගමතු උම්මුලා හතීජා | 775570113V | | මීරා පල්ලි වීදිය | 15,000.00 |
| 2 | අතම්බව අන්සාර් | 196619801253 | 10 | හිස්පුල්ලා වීදිය | 8,500.00 |
| 3 | මුග්මතු මුස්තාබා අලිම් සිත්ති සබුතුල් අනෙගා | 736271303V | 9 | සහුල්හමඩ් වීදිය | |

**7 පුතුක්කුඩුඉරුප්පු උතුර**

| නැත | සම්පූර්ණ නම | ජාතික හැඳුනුම්පත අංකය | පර්චස් | ලිපිනය | ආදායම |
|---|---|---|---|---|---|
| 1 | ඥානමුතු වරලෙඩ්චුමි | 195858603971 | 25 | පුලියාඩි වීථි | |

(iii) ඔව්.

(iv) පුද්ගලයින් 31දෙනෙකු.

ඇමුණුම 2

**2017.01.01 සිට 2025.03.31 දක්වා කාලය තුළ නීති උල්ලංඝනය කරන්නන්ට එරෙහිව ගොනු කරන ලද නඩු**

| නැත | ජී.එස්. බෙදීම නැත | රජයේ ඉඩම්වල එන්හොරොව් පිළිබඳ විස්තර | ප්‍රසාරණය | නඩුව ගොනු කළ දිනය | නඩු අංක | ඉඩම නිදහස් කළාද? |
|---|---|---|---|---|---|---|
| 1 | 157 157 සී ආරයම්පති නැගෙනහිර | සභාපති, නගර සභාව, කාතන්කුඩි | 1.1902 ha | 20.10.2022 | 66547/s/2022 | ඔව් |
| 2 | 153 බී වෙදර් කුඩිඉරිප්පු | ජෝන් පුනිතම් | 30 p | 20.10.2022 | 66549/s/2022 | ඔව් |
| 3 | 157b සෙල්වනගර් නැගෙනහිර | කුනරත්නම් විජයනිර්මල | 20 p | 20.10.2022 | 66548/s2022 | ඔව් |
| 4 | 150c ගිරාන් කුලම් මධ්‍යස්ථානය | කුමාරවේලු තිනකරන් | 20 p | 25.08.2022 | 66078/s/2022 | ඔව් |
| 5 | 150c ගිරාන් කුලම් මධ්‍යස්ථානය | කුමාරවේලු කරුණාකරන් | 20 p | 25.08.2022 | 66076/s/2022 | ඔව් |
| 6 | 150c ගිරාන් කුලම් මධ්‍යස්ථානය | තරුමරත්නම් තයනන්තන් | 20 p | 25.08.2022 | 66075/s/2022 | ඔව් |
| 7 | 150b ගිරාන් කුලම් | කත්තලිංගම් සෙන්ඩිකුමාර් | 3 Root | 25.08.2022 | 66077/s/2022 | ඔව් |
| 8 | 153 බී වෙදර් කුඩිඉරිප්පු | කයිලායපිල්ලෙයි විජයකුමාරි | 0.0279 ha | 16.02.2023 | 68392/s/2023 | ඔව් |
| 9 | 152 බලමුනේ | අ.ම්.සිරක් මුනීර් | 1.5 p | | 67866/s/2023 | ඔව් |
| 10 | 157b සෙල්වනගර් නැගෙනහිර | සෙල්වරාසා යුවතස් | 8 p | 19.01.2023 | 67864/s/2023 | ඔව් |
| 11 | 157b සෙල්වනගර් නැගෙනහිර | සුප්‍රමනියම් ශාන්තිරකුමාර් | 7 p | 19.01.2023 | 67867/s/2023 | ඔව් |
| 12 | 157b සෙල්වනගර් නැගෙනහිර | සමිතම්බි මංජුල | 8 p | 19.01.2023 | 67865/s/2023 | ඔව් |
| 13 | 154 මාවෙලංගතුරෙයි | රාසයියා නදේශපති | 20 p | 16.02.2023 | 68393/s/2023 | ඔව් |
| 14 | 154 මාවෙලංගතුරෙයි | අබ්තුල්රහීම් මුගමතු පායිස් | 10 p | 03.01.2023 | 67865/s/2023 | ඔව් |
| 15 | 157b සෙල්වනගර් නැගෙනහිර | මහේෂ්වරන් සුමන | 8 p | | | ඔව් |
| 16 | 157b සෙල්වනගර් නැගෙනහිර | අතම්ලෙබ්බායි අබ්දුල් අසීස් | 1/2 Acr | 09.03.2023 | 68737/s/2023 | ඔව් |
| 17 | 153 බී වෙදර් කුඩිඉරිප්පු | පොන්නම්බලම් නරේන්දිරන් | 60 p | 22.06.2023 | 70282/s/2023 | ඔව් |
| 18 | 153 බී වෙදර් කුඩිඉරිප්පු | පොන්නම්බලම් නරේන්දිරන් | 01 Acr | 22.06.2023 | 70283/s/2023 | නැත |
| 19 | 153 බී වෙදර් කුඩිඉරිප්පු | සදාරතිනම් තෙවරත්නම් | 01 acr | 20.07.2023 | 70680/s/2023 | ඔව් |
| 20 | 152 බලමුනේ | අබ්තුල් මජීතු බර්ජානා | 8 p | 14.03.2024 | 74201/s/2024 | නැත |
| 21 | 152 බලමුනේ | මුගමතු බයිසල් මුහමතු පාෂ්කන් | 35 p | 14.03.2024 | 74200/s/2024 | නැත |
| 22 | 152 බලමුනේ | අබ්දුල් මජීඩ් මුහම්මඩ් බහාත් | 32 p | 10.03.2024 | 74204/s/2024 | නැත |
| 23 | 152 බලමුනේ | මුස්තාෆා පරිතාරි කලන්තරුමා | 30 p | 14.03.2024 | 74203/s/2024 | නැත |
| 24 | 152 බලමුනේ | අබ්දුල් මජීඩ් මුහම්මඩ් උවයිස් | 55 p | 14.03.2024 | 74199/s/2024 | නැත |
| 25 | 152 බලමුනේ | අබ්දුල් මජීඩ් මුහම්මඩ් ජමීල් | 45 p | 14.03.2024 | 74202/s/2024 | නැත |
| 26 | 152 බලමුනේ | හමීඩ්ලෙෆි නයිමා වීවී | 68 p | 28.03.2024 | 74419/s/2024 | නැත |
| 27 | 152 බලමුනේ | තම්බිලෙෆායි අබ්දුල් රහීම් | 9.5 p | 28.03.2024 | 74420/s/2024 | නැත |
| 28 | 152 බලමුනේ | මුහම්මද් ඊබ්‍රාහිම් මුහම්මඩ් හුසේන් | 8 p | 28.03.2024 | 74418/s/2024 | නැත |
| 29 | සෙල්වනගර් නැගෙනහිර | ශ්‍රීස්කන්තරාජා ශ්‍රීධරන් | 10 p | 24.10.2024 | misc/2594/24 | ඔව් |
| 30 | ඔලිකුලම් | අබ්දුල් කාතර් සෙයිදුන් උම්මා | 1 acr | 22.05.2025 | 4274/ld/2025 | නැත |
| 31 | ඔලිකුලම් | අහමඩ් ලෙප්පායි මීරා සහිබ් | 40 p | 22.05.2025 | 4273/ld/2025 | නැත |

(v)

ඇමුණුම 3

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 153B වෙදර් කුඩියෙරුප්පු | 03.02.2022 | ජෝන් පුනිතම් | 30 p | 17.02.2022 | 20.10.2022 | 66549/s/2022 | ඔව් | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |
| 2 | 157B සෙල්වනගර් නැගෙනහිර | 11.03.2022 | ගුණරත්නම් විජයනිර්මාලා | 10 p | 21.03.2022 | 20.10.2022 | 66548/s/2022 | ඔව් | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |
| 3 | 152 බලාමුනායි | 09.09.2022 | ඒ.එම්.සිරා මුනීර් | 1.5 p | 15.09.2022 | 19.01.2023 | 67866/s/2023 | ඔව් | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |
| 4 | 154 මාවෙලන්තුරෙයි | 20.12.2022 | රාසයියා නදේශ්වරී | 20 p | 28.12.2022 | 16.02.2023 | 68393/s/2023 | ඔව් | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |
| 5 | 154 මාවෙලන්තුරෙයි | 29.12.2022 | අබ්දුල් රහීම් මුහම්මද් බේයිස් | 10 p | 03.01.2023 | 03.01.2023 | 67865/s/2023 | ඔව් | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |
| 6 | 157B සෙල්වනගර් නැගෙනහිර | 29.12.2022 | ආතම්ලෙබ්බායි අබ්දුල් අසීස් | 1/2 Acr | 18.01.2023 | 09.03.2023 | 68737/s/2023 | ඔව් | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |
| 7 | 153B වෙදර් කුඩියෙරුප්පු | 22.03.2023 | පොන්නම්පලම් නරේන්ද්‍රන් | 60 p | 29.03.2023 | 22.06.2023 | 70282/s/2023 | ඔව් | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |
| 8 | 153B වෙඩර් කුඩියෙරුප්පු | 24.03.2023 | පොන්නම්පලම් නරේන්ද්‍රන් | 01 Acr | 18.04.2023 | 22.06.2023 | 70283/s/2023 | නැත | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |
| 9 | 153B වෙඩර් කුඩියෙරුප්පු | 18.04.2023 | සබාරත්නම් තේවරත්නම් | 8 p | 25.04.2023 | 20.07.2023 | 70680/s/2023 | ඔව් | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |
| 10 | සෙල්වනගර් නැගෙනහිර | 06.08.2024 | ශ්‍රීස්කාන්තරාජා ශ්‍රීතරන් | 10 p | 13.08.2024 | 24.10.2024 | MISC/2594/24 | ඔව් | ඉවත් කිරීමේ නියෝගය ක්‍රියාත්මක කර ඇත. |

[ගරු අරවින්ද සෙනරත් මහතා]

(vi) නැත.

(vii) අදාළ නොවේ.

(viii) එලෙස සිදුකර නොමැත.

(ආ) අදාළ නොවේ.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)

ගරු කථානායකතුමනි, மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவில் காணி சம்பந்தப்பட்ட விடயங்களில் தொடர்ச்சியாக முஸ்லிம்களுக்கு எதிராக அந்தப் பிரதேச செயலக அதிகாரிகள் செயற்பட்டு வருவதை நான் பல தடவை சொல்லியிருக்கிறேன். குறிப்பாக, என்னிடமுள்ள இந்தப் பட்டியலில்கூட அங்கிருக்கின்ற அந்த அரச காணிகளில் வசிக்கின்ற தமிழ் மக்களுக்கு எதிராக எந்தவொரு வழக்கும் தொடுக்கப்பட்டதற்கான விபரங்கள் இல்லை. அங்கு வாழுகின்ற முஸ்லிம்களுக்கு எதிராக மட்டும் - அவர்களை அங்கிருந்து வெளியேற்றுவதற்காக - இவ்வாறான வழக்குகளைத் தொடுத்திருக்கிறார்கள். இதனால் அங்குள்ள முஸ்லிம்கள் பெரும் பிரச்சினைகளை எதிர்நோக்கி வருகின்றார்கள். இந்தப் பிரச்சினை மண்முனைப்பற்று பிரதேச செயலாளர் பிரிவிலும் வாகரைப் பிரதேச செயலாளர் பிரிவிலும் இருக்கிறது. கௌரவ பிரதி அமைச்சர் அவர்களே, இவ்விடயம் தொடர்பில் ஆராய்ந்து ஓர் அறிக்கை சமர்ப்பிப்பதற்காக காணி ஆணையாளர் நாயகத்தினூடாக ஒரு குழுவை நியமிக்குமாறு அண்மையில்கூட நான் உங்களிடத்தில் கேட்டிருந்தேன். இதனைச் செய்வதாக நீங்கள் இந்தச் சபையில் சொல்லியிருந்தீர்கள். இது தொடர்பில் உங்களுடைய நிலைப்பாடு என்னவென்பதை என்னுடைய முதலாவது மேலதிக வினாவாகக் கேட்கின்றேன்.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගනිද්දි ජන වර්ග පදනම් කරගෙන අධිකරණ ක්‍රියාමාර්ග අරගෙන නැහැ. පැහැදිලිවම මීට අදාළ ඕනෑම පුද්ගලයෙකුට ජන වර්ගය හෝ තරාතිරම නොබලා ගන්න පුළුවන් අධිකරණමය ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. මෙතුමාගේ පැත්තෙන් දිගින් දිගටම ඉදිරිපත් වනවා, මේ ප්‍රශ්නයේදී මේ ප්‍රදේශයේ එක ජන කොට්ඨාසයකට පමණක් අසාධාරණයක් වන ලෙස තීන්දු තීරණ ගන්නවා වාගේ අදහසක්. නමුත් එහෙම නැහැ. ඒක ගැන පැහැදිලිව කියන්න ඕනෑ. මේ ලේඛන පරීක්ෂා කිරීමේදී පෙනී යනවා, ඒ ප්‍රදේශයේ ජීවත් වන ජන කණ්ඩායම් නීති විරෝධී කටයුත්තකට සම්බන්ධ වෙලා තිබෙනවා නම්, ජන වර්ග භේදයකින් තොරව නීතිය ක්‍රියාත්මක කළා කියන එකට අදාළව තොරතුරු, ලේඛන ඉදිරිපත් වෙලා තිබෙනවා කියලා. ඔබතුමාටත් ඒවා පරිශීලනය කරන්න පුළුවන්.

ඉඩම් අමාත්‍යාංශයේ නිලධාරීන් දැනටමත් මැදිහත් වෙමින්, මේ ප්‍රදේශවල ස්ථාන පරීක්ෂණ කරමින්, ඒ භූමියට ගිහින් ක්ෂේත්‍ර අධ්‍යයනයක් කරමින් තොරතුරු එක්රැස් කරමින් ඉන්නවා. ඔබතුමා මීට පෙර අවස්ථාවලදීත් ප්‍රශ්නයක් විධියට ඉදිරිපත් කළා, මේ ප්‍රශ්නයටම අදාළ යම් යම් කරුණු. ඒ නිසා ඔබතුමාට විධිමත් වූ පිළිතුරක් ලබා දෙන්න අමාත්‍යාංශය විධියට ඉඩම් කොමසාරිස්තුමාගේ නිලධාරීන් මේ වන විට ප්‍රදේශයට ගිහින් තොරතුරු එකතු කරමින් ඉන්නවා.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
Okay, thank you.

## අවසර ලබා දීමෙන් පසු ආනයනය කරන ලද වාහන: අය කරන ලද බදු
## அங்கீகாரம் வழங்கப்பட்டதன் பின்னர் இறக்குமதி செய்யப்பட்ட வாகனங்கள்: விதிக்கப்படும் வரித்தொகை
## VEHICLES IMPORTED AFTER GRANT OF PERMISSION: TAXES LEVIED

1062/2025

**6. ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවට නැවත වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමෙන් පසු මේ වන විට ආනයනය කර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලින් අය කර ගත යුතු බදු මුදල එන්ජින් ධාරිතාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වාහන ආනයනය කිරීමෙන් උපයා ගැනීමට අපේක්ෂිත බදු මුදල සහ එයින් මේ වන විට උපයා ගෙන ඇති බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවට නැවත වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමෙන් පසු මේ වන විට ආනයනය කර ඇති ත්‍රිරෝද රථ සංඛ්‍යාව සහ යතුරුපැදි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආනයනික ත්‍රිරෝද රථයකට අය කරනු ලබන බදු මුදල කොපමණද;

(iii) ආනයනික යතුරුපැදියකට අය කරනු ලබන බදු මුදල එන්ජින් ධාරිතාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கைக்கு மீண்டும் வாகனம் இறக்குமதி செய்ய அனுமதி வழங்கப்பட்டதன் பின்னர் இற்றைவரை இறக்குமதி செய்யப்பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி வாகனங்களிலிருந்து அறவிட்டுக்கொள்ள வேண்டிய வரித் தொகை 'என்ஜின்' கொள்ளளவுக்கு அமைய வெவ்வேறாக எவ்வளவு;

(iii) வாகனங்களை இறக்குமதி செய்வதன்மூலம் ஈட்டிக்கொள்வதற்கு உத்தேசிக்கப்பட்ட வரித் தொகை மற்றும் அவற்றிலிருந்து இதுவரை ஈட்டிக்கொள்ளப்பட்ட வரித் தொகை வெவ்வேறாக எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கைக்கு மீண்டும் வாகனம் இறக்குமதி செய்ய அங்கீகாரம் வழங்கப்பட்டதன் பின்னர் இற்றைவரை இறக்குமதி செய்யப்பட்டுள்ள முச்சக்கர வண்டிகளின் எண்ணிக்கை மற்றும் மோட்டார் சைக்கிள்களின் எண்ணிக்கை வெவ்வேறாக யாது;

(ii) இறக்குமதி செய்யப்படுகின்ற ஒரு முச்சக்கர வண்டிக்கு அறவிடப்படுகின்ற வரித் தொகை எவ்வளவு;

(iii) இறக்குமதி செய்யப்படுகின்ற ஒரு மோட்டார் சைக்கிளுக்கு அறவிடப்படுகின்ற வரித் தொகை 'என்ஜின்' கொள்ளளவுக்கு அமைய வெவ்வேறாக எவ்வளவு;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Planning and Economic Development:

(a) Will he inform this House the -

(i) number of vehicles that have been imported so far after the permission granted for the import of vehicles to Sri Lanka again;

(ii) tax to be collected from the said vehicles, separately according to engine capacity; and

(iii) tax income expected to be generated from importing vehicles and the tax income that has hitherto been generated, separately?

(b) Will he also inform this House of the -

(i) number of three-wheelers and motorcycles that have been imported so far, separately after permission was granted to import vehicles to Sri Lanka again;

(i) amount of tax levied on an imported three-wheeler; and

(i) amount of tax levied on an imported motorcycle, separately as per the engine capacity?

(c) If not, why?

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) 451,770යි.

(ii) මෝටර් රථ වාහන සඳහා අදාළ වන බදු හා එම බදු පනවා ඇති ආකාරය දැක්වෙන ගැසට් පත්‍ර පහත පරිදි වේ.

| | බදු වර්ගය | අදාළ පනත | ගැසට් පත්‍රය සහ දිනය |
|---|---|---|---|
| 01 | රේගු බදු | රේගු ආඥාපනත | 2324/49 - 24.03.2023<br>2436/10 - 15.05.2025<br>2452/03 - 01.09.2025 |
| 02 | රේගු බදු මත අධිභාරය | රේගු ආඥාපනත | 2421/43 - 31.01.2025<br>2434/03 - 28.04.2025 |
| 03 | එකතු කළ අගය මත බදු (VAT) | 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2363/22 - 19.12.2023 |
| 04 | වාහන හිමිකම් අය බද්ද | 2018 අංක 35 දරන මුදල් පනත (2019.01.01 දින සිට බලපැවැත්වේ) | අදාළ නොවේ. |

ඒ අනුව ඉහත ගැසට් පත්‍රයන්හි රේගු ශීර්ෂ අංක 87.02, 87.03, 87.04 සහ 87.05 යටතේ මෝටර් වාහන වර්ගීකරණය වන අතර, එම එක් එක් රේගු ශීර්ෂය යටතේ වන රේගු සංකේතාංක ඉදිරියේ ඉහත ගැසට් පත්‍රවල සඳහන් කර ඇති බදු මුදල් අදාළ වනවා. ඒ කියන්නේ, ඒ ගැසට් පත්‍රවල නිසි පරිදි දක්වා තිබෙනවා, ඒ ඒ engine capacity එකට අදාළව කොපමණ මුදලක් අය කරනවාද කියලා. ඒ අනුව ඒ ගැසට් පත්‍රවල දක්වා තිබෙන විධියට තමයි මේ අය කිරීම් සිදු වන්නේ.

(iii)

| බද්ද | ඇස්තමේන්තුගත ආදායම (2025 අය වැය) රුපියල් බිලියන | 2025 දෙසැම්බර් 31 දිනට බදු ආදායම රුපියල් බිලියන |
|---|---|---|
| ආනයන රේගු බදු සහ අධිභාරය | 66 | 148 |
| එකතු කළ අගය මත බද්ද | 132 | 234 |
| නිෂ්පාදන බද්ද | 230 | 461 |
| වාහන හිමිකම් ගාස්තුව | 1 | 2 |
| මෝටර් රථ මත සුඛෝපභෝගී බද්ද | 10 | 55 |
| වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 2 | 4 |
| **එකතුව** | **441** | **904** |

(ආ) (i) ත්‍රිරෝද රථ සංඛ්‍යාව - 22,407

යතුරුපැදි සංඛ්‍යාව - 313,989

(ii) රේගු ශීර්ෂ අංක 87.03 යටතේ ත්‍රිරෝද රථ වර්ගීකරණය වන අතර, එම රේගු ශීර්ෂය යටතේ වන රේගු සංකේතාංක ඉදිරියේ ඉහත ගැසට් පත්‍රවල සඳහන් කර ඇති බදු අදාළ වේ.

(iii) රේගු ශීර්ෂ අංක 87.11 යටතේ යතුරුපැදි වර්ගීකරණය වන අතර, එම රේගු ශීර්ෂය යටතේ වන රේගු සංකේතාංක ඉදිරියේ ඉහත ගැසට් පත්‍රවල සඳහන් කර ඇති බදු අදාළ වේ.

(ඇ) පැන නොනඟී.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු කථානායකතුමනි, මම පළමුවන අතුරු ප්‍රශ්නය අහන්න ඉස්සෙල්ලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, වාහන ආනයනය කිරීමෙන් ලැබුණු මුළු මුදල පිළිබඳව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක ප්‍රශ්නයක් විධියට අහන්න.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අහන්නේ බලාපොරොත්තු වුණු මුදල සහ ලැබුණු මුදල ගැන නේද?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
අවසානයේ ලැබුණු මුළු මුදල ගැන.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
රුපියල් බිලියන 441ක් බලාපොරොත්තු වුණා. රුපියල් බිලියන 904ක් ලැබුණා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
බිලියන කීයක්ද?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
රුපියල් බිලියන 441ක් බලාපොරොත්තු වුණා. බිලියන 904ක් ලැබුණා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
රුපියල් බිලියන 904ක්?

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ඔව්.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම කලින් ඔබතුමාට බාධා කළේ නැහැ, අතුරු ප්‍රශ්න අහන්න කලින් මම මේ ගැන අහන්න හිටපු නිසා.

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වාහනයක් ආනයනය කිරීමේදී අදාළ ලියකියවිලි Sri Lanka Customs එකට භාර දුන් දිනයේ ඉඳලා වාහනය ලබා ගත් දිනය වනකොට දින 90ක් ඇතුළත සියයට 3ක බද්දක් එකතු කරනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, සාමාන්‍යයෙන් documents submit කරලා ආපසු clear කරලා එනකොට අඩුම වශයෙන් ඒකටත් දින 40කට කිට්ටු කාලයක් ගත වෙනවා. ඊට පසුව සීමිත කාලයක් තමයි customer කෙනෙක් හොයාගෙන ඒක විකුණා ගන්න තිබෙන්නේ. තවත් මාසයකට - දින 30කට - පසුව තවත් සියයට 3ක් අය වෙනවා. තවත් දින 30කට පසුව ආපසු සියයට 3ක් අය වෙනවා. එතකොට, ඒක ලොකු ප්‍රමාණයක්. ඒක සියයට 45 දක්වා යනවා. සාමාන්‍යයෙන් මාස 5ක වාගේ කාලයක් ගත වනකොට අඩුම වශයෙන් සියයට 9ක, 10ක මුදලක් අය වෙනවා. ඒ මුදල අවසානයේදී යන්නේ පාරිභෝගිකයාට. මේ රටේ වාහනයක් ගන්න කෙනෙකුට තමයි මේ මුදල වැය වෙන්නේ. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා යම් වෙනසක් කිරීමට, එහෙම නැත්නම් යම් සංශෝධනයක් කිරීමට බලාපොරොත්තු වෙනවාද කියලා මම දැනගන්න කැමැතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා වැදගත් ප්‍රශ්නයක් ඉදිරිපත් කළේ. ඇත්තටම වාහනයක් ආනයනය කරලා මාස 3ක් ඇතුළතදී ඒ ආනයනකරු ඒ වාහනය වික්කේ නැත්නම්, සියයට 3ක අධිභාරයක් පනවන්න හේතුපාදක වුණේ, ඒ සඳහා අපේ රටෙන් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් වැය වීමයි. ඒක අපි වළක්වා ගන්න ඕනෑ. මොකද, ආනයනකරුවන් වාහන විශාල ප්‍රමාණයක් ගෙනැල්ලා මෙහේ ලොකු stock එකක් තියා ගන්නකොට අපේ විදේශ විනිමය විශාල ප්‍රමාණයක් එළියට යනවා. අන්න ඒක පාලනය කර ගැනීමේ උපක්‍රමයක් විධියට තමයි සියයට 3ක අධිභාරයක් පනවා තිබෙන්නේ. ඇත්තටම ඔබතුමා කියපු විධියට දින 40ක් ගත වෙන්නේ නැහැ. මම ඒ ගැන රේගුවෙන් පරීක්ෂා කරලා බැලුවා. එහෙම වාහනයක් ආනයනය කරලා දින 40ක් ප්‍රමාද වෙන්නේ නැහැ, සාමාන්‍යයෙන් ඒ වාහනය නිදහස් කර ගන්න. මොකද, වාහන විශාල ප්‍රමාණයක් එකවර ආවොත් උපරිම වශයෙන් සති දෙකක වාගේ කාලයක් ගත වෙනවා. එහෙම නැත්නම්, දවස් තුන හතරක් ඇතුළත ඒ වාහනය නිෂ්කාසනය කරන්න හැකියාව තිබෙනවා, රේගුවේ දත්ත අනුව. එහෙම තත්ත්වයක් තමයි තිබෙන්නේ. නමුත්, ඔබතුමා කියපු විධියට අධිභාරයක් එනවා තමයි. නමුත් ඒක පනවන්න වෙන්නේ, අපේ රටෙන් විදේශ විනිමය විශාල ප්‍රමාණයක් ගලාගෙන යාම පාලනය කර ගැනීමටයි. ඒක තමයි අරමුණ; intention එක.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරට ස්තුතියි. නමුත්, අවසානයේදී වාහනයක් මිලදී ගන්න යන පාරිභෝගිකයාට තමයි ඒක බලපාන්නේ. ඒක, එක කාරණයක්.

දෙවැනි කාරණය, අපි දකින කාරණයක්. පසුගිය කාලයේ ලංකාවට ඕනෑවට වඩා වාහන ආනයනය වුණා. ඔබතුමා දන්නවා, අද මාර්කට් එක flood වෙලා තිබෙන්නේ කියලා. ඒ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා අපි යෝජනා කරනවා, ඒකට වෙනයම් ක්‍රමයක් භාවිත කරලා, අවසානයේදී ඒ මුදල පාරිභෝගිකයාට යන එක නවත්වන්න කියලා.

ඔබතුමාගෙන් අහන දෙවැනි අතුරු ප්‍රශ්නය මේකයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. හම්බන්තොට වරායේ cross-border ක්‍රමයට ආපු වාහන 1,000ක් විතර දැන් අවුරුද්දකට ආසන්න කාලයක් තිස්සේ එහෙමපිටින්ම හිර වෙලා තිබෙනවා. ඒවා ඉතාම සුඛෝපභෝගී වාහන. ඔබතුමා කිව්වා වාගේ ඒ ඔක්කෝටම ඩොලර්වලින් ගිහිල්ලා තිබෙන්නේ අපේ රටේ මුදල් තමයි. ඒ cross-border ක්‍රමයට ආපු වාහනවල agent සමහර විට ඉන්නේ

ඩුබායිවල. හැබැයි, agent ඩුබායිවල හිටියත් ඔහු වාහන ටික එකතු කරනවා, ඕස්ට්‍රේලියාවෙන්, ජපානයෙන් හෝ වෙනත් රටකින්. ඔහු වාහන එකතු කරලා තමයි අපේ රටට ගෙනෙන්නේ. ඒක මීට ඉස්සෙල්ලා තිබුණු ක්‍රමයක්. හැබැයි, මෙතැන තිබෙන එක ප්‍රශ්නයක් තමයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එම වාහන ටික නිදහස් කර ගන්න ක්‍රමවේදයක් නොමැතිකම. එම වාහන සම්බන්ධව අධිකරණ කටයුත්තක් තිබෙනවා නම්, එම වාහන auction කරලා මුදල් ටික උසාවියේ හෝ තැන්පත් කර තැබිය යුතුයි. දැන් මුහුද ආශ්‍රිතව ඒ වාහන තිබෙන නිසා එම වාහනවල සම්පූර්ණ වටිනාකම නැති වෙලා යනවා. සමහර ව්‍යාපාරිකයෝ බැංකුවලින් loans අරගෙන වාහන ගෙන්වලා අද වනකොට එක පැත්තකින් ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. අනෙක් පැත්තෙන්, මොකකද වෙන්නේ? එම වාහනවල වරාය ප්‍රමාද ගාස්තු - demurrage - වැඩි වනවා. තව ටික කාලයක් තිබුණොත් ඒ එක වාහනයක්වත් පාවිච්චියට ගන්න බැරි වනවා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. මොකද, ඒවා censors සහිත, නවීන මාදිලියේ ක්‍රමවේද සහිත වාහන. කාලයක් එක තැන තිබුණාම ඒවා පාවිච්චියට ගන්න බැරි වනවා. මේ ගැන ඔබතුමා දරන මතය මොකක්ද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම ඔය කාරණය පිළිබඳව අධිකරණයේ දැන් නඩුවක් විභාග වෙමින් පවතිනවා. ඒ අතරතුර අධිකරණයෙන් කියා තිබෙනවා, යම් විසඳුමකට එළඹෙන්න කියලා. ඒ අනුව, මුදල් අමාත්‍යාංශය පැත්තෙන් ඒකට චක්‍රලේඛයක් නිකුත් කරලා තිබෙනවා. එම චක්‍රලේඛයට අනුව යම් පිරිසක් වාහන නිදහස් කරගෙන තිබෙනවා. නමුත්, අධිකරණ කටයුත්තක් පවතින බැවින් මෙතැනින් එහාට ක්‍රමවේදය ගැන අපි කථා කරන එක සුදුසු නැහැ කියලායි මම හිතන්නේ.

## පොල් වගාව සහ ආශ්‍රිත කර්මාන්ත: විස්තර
## தெங்குப் பயிர்ச்செய்கையும் அது சார்ந்த கைத்தொழிலும்: விபரம்
## COCONUT CULTIVATION AND RELATED INDUSTRIES: DETAILS

1270/2025

**7. ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (3):

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන භෝග වර්ග තුන කවරේද;
(ii) ප්‍රධාන අපනයන භෝගයක් ලෙස පොල් භෝගය නම් කරන ලද වර්ෂය කවරේද;
(iii) ශ්‍රී ලංකාවේ ඇති පොල් ගස් සංඛ්‍යාව සහ පොල් වගා කර ඇති බිම් ප්‍රමාණය හෙක්ටෙයාරවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;
(iv) ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්න වැඩි කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) පොල් ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කර්මාන්ත කවරේද;
(ii) පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබෙන වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණය කොපමණද;
(iii) පොල් ලෙලි ආශ්‍රිතව ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන දේශීය කර්මාන්තශාලා සංඛ්‍යාව හා විදේශීය කර්මාන්තශාලා සංඛ්‍යාව, ඒවායේ ප්‍රධාන අපනයන නිෂ්පාදන සහ උත්පාදනය කර ඇති සෘජු හා වක්‍ර රැකියා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;
(iv) පොල් ලෙලි කර්මාන්තය ආශ්‍රිතව ඇති ප්‍රධාන ගැටලු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையின் மூன்று பிரதான ஏற்றுமதிப் பயிர் வகைகள் யாவை என்பதையும்;
(ii) பிரதான ஏற்றுமதிப் பயிராக தென்னை அறிவிக்கப்பட்ட ஆண்டு யாது என்பதையும்;
(iii) இலங்கையில் காணப்படுகின்ற தென்னை மரங்களின் எண்ணிக்கை மற்றும் தெங்கு பயிரிடப்பட்டுள்ள நிலப்பரப்பு ஹெக்டெயார் களில் வெவ்வேறாக எவ்வள என்பதையும்;
(iv) இலங்கையில் தேங்காய் விளைச்சலை அதிகரிக்க எடுக்கப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) தெங்கு சார்ந்து இலங்கையில் இன்றளவில் நடைமுறையிலுள்ள கைத்தொழில்கள் யாவை என்பதையும்;
(ii) தெங்கு சார்ந்த உற்பத்திகள்மூலம் இலங்கைக்குக் கிடைக்கும் வருடாந்த வெளிநாட்டுச் செலாவணி அளவு எவ்வளவு என்பதையும்;
(iii) தேங்காய் மட்டை சார்ந்து இலங்கையில் தற்போது நடைமுறையிலுள்ள உள்நாட்டு மற்றும் வெளிநாட்டுக் கைத்தொழில்களின் எண்ணிக்கை, அவற்றின் பிரதான ஏற்றுமதி உற்பத்திகள் மற்றும் உருவாக்கப்பட்டுள்ள நேரடி மற்றும் மறைமுக வேலைவாய்ப்புகளின் எண்ணிக்கை வெவ்வேறாக யாது என்பதையும்;
(iv) தேங்காய் மட்டைக் கைத்தொழில் சார்ந்து எழுந்துள்ள முக்கியமான பிரச்சினைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation and Community Infrastructure:

(a) Will he inform this House of the -
(i) three main export crops of Sri Lanka;
(ii) year in which coconut was declared one of the main export crops;
(iii) number of coconut trees existing in Sri Lanka and the extent of land cultivated with coconut, separately in hectares; and
(iv) steps taken to increase the coconut harvest of Sri Lanka?

(b) Will he also inform this House the -
(i) coconut-related industries in operation in Sri Lanka at present;

[ගරු සුජීව දිසානායක මහතා]

(ii) the annual foreign exchange earnings accrued to Sri Lanka from coconut-based products;

(iii) number of factories in Sri Lanka associated with coconut husks with local and foreign ownership, and their main export products and the number of direct and indirect jobs they have created, separately; and

(iv) key problems associated with coconut husks industry?

(c) If not, why?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i)
- තේ
- පොල්
- රබර්

(ii) නිශ්චිත වර්ෂයක් නොදනී.

නමුත්, 1950 වර්ෂවල සිට ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල පොල් ක්ෂේත්‍රයේ අපනයන ආදායම් පිළිබඳ වාර්තා කර ඇත. එහි පොල් ද අපනයන භෝගයක් ලෙස නම් කර ඇති බව පොල් පර්යේෂණ ආයතනය විසින් සඳහන් කර තිබේ.

(iii) පොල් වගා කර ඇති භූමි ප්‍රමාණය හෙක්ටෙයාර 484,677යි. මෙය 2024 දී ඇස්තමේන්තුගත අගයක්.

පොල් ගස් සංඛ්‍යාව ගස් මිලියන 65යි. මේකත් 2024 දී ඇස්තමේන්තුගත අගයක්.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ 2014 සංගණන වාර්තාව පදනම් කර ගනිමින් පොල් වගා කිරීමේ මණ්ඩලය හා පොල් පර්යේෂණ ආයතනය විසින් සිදු කරන ලද ගණනය කිරීම් තමයි මම කිව්වේ.

(iv) ශ්‍රී ලංකාවේ පොල් අස්වැන්න 2030 වනවිට ගෙඩි මිලියන 4,200ක් ලෙස වර්ධනය කිරීම ප්‍රධාන ඉලක්කය කර ගනිමින් පොල් අස්වැන්න වැඩි කිරීම සඳහා පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් කෙටිකාලීන සහ දීර්ඝකාලීන ක්‍රියාමාර්ග ගෙන ඇත. ගරු මන්ත්‍රීතුමනි, එම ක්‍රියාමාර්ග ටිකක් විස්තරාත්මකව තිබෙන්නේ. මම ඔබට එයින් ප්‍රධාන කිහිපයක් කියන්නම්.

කෙටිකාලීන ක්‍රියාමාර්ග

- පොල් අක්කර ලක්ෂ 3කට පොහොර යෙදීම සඳහා වගාකරුවන්ට පොහොර සහනාධාරය ලබා දීම අප විසින් සිදු කරනවා. මේ යටතේ APM පොහොර ලබා ගැනීමට අවශ්‍ය වගාකරුවන්ට විවෘත වෙළෙඳ පොළේ රුපියල් 9,000ක් පමණ වන කිලෝ 50 පොහොර බෑගයක් අපි රුපියල් 4,000ක් වැනි සහන මිලකට ලබා දෙනවා. ඊට අමතරව, MOP පොහොර හැටියට කෙනෙක් ලබා ගන්න කැමැති නම් අපි කිලෝ 50ක පොහොර මිටියක් රුපියල් 600කට ලබා දෙනවා. එහි පොඩි කොන්දේසි ප්‍රමාණයක් තිබෙනවා. කොහොමටත් MOP කිලෝ 50 පොහොර මිටියක් රුපියල් 600කට ලබා දෙනවා.
- පොල් ගස් වසුන් කර තෙතමන සංරක්ෂණය කිරීම වෙනුවෙන් එක් ගසකට රුපියල් 150ක සහනාධාරයක් ලබා දෙනවා.
- නිර්දේශිත ක්‍රමවේද අනුව පොල් ඉඩම්වලට ජල සම්පාදනය කරනවා නම් එම පද්ධති ඉදිකිරීම වෙනුවෙන් අක්කරයකට රුපියල් 30,000ක සහනාධාරයක් ලබා දෙනවා.
- ඊට අමතරව පළිබෝධ මර්දනයට අදාළ වැඩ පිළිවෙළක් තිබෙනවා.
- ඒ වාගේම, වන සතුන්ගෙන් වන හානිය වළක්වන්නත් අපි කටයුතු කරමින් ඉන්නවා.
- ඒ වාගේම, පොල් ත්‍රිකෝණය -විශේෂයෙන්ම කුරුණෑගල, ගම්පහ, පුත්තලම- තුළ තිබෙනවා, ඌන උපයෝජිත පොල් ඉඩම්. ඒවායේ අඩු ඵලදායීතාවක් තිබෙන්නේ. මෙන්න මේ ඉඩම් අපි මේ වසරේ සිට පොකුරු ක්‍රමයට සංවර්ධනය කිරීමේ රජයේ වැඩ පිළිවෙළක් දියත් කරන්න සැලසුම් කර තිබෙනවා.

දීර්ඝකාලීන ක්‍රියාමාර්ගත් මෙම පිළිතුරේ දක්වා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

(ආ) (i) පොල් ආශ්‍රිත කර්මාන්තකරුවන් 900දෙනෙකු පමණ පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වෙලා ඉන්නවා. 2022, 2023, 2024 සහ 2025 වර්ෂයන්ට අදාළව පොල් සංවර්ධන අධිකාරියේ කර්මාන්ත ලියාපදිංචිය ඇමුණුම මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

පොල් මදය ආශ්‍රිත කර්මාන්ත ගත්තොත්, පොල් කිරි, දියිදි පොල්, නැවුම් පොල් තෙල්, පිටි කළ පොල් කිරි, සාමාන්‍ය පොල් තෙල්, පොල් ක්‍රීම්, පොල් තලප, තරමක් මේදය ඉවත් කළ පොල්, පොල් පිටි, පුන්නක්කු, කොප්පරා, පොල් වතුර, පොල් බටර්, පොල් අයිස්ක්‍රීම් ආදිය නිෂ්පාදනය වෙනවා. පොල් යුෂ ආශ්‍රිත කර්මාන්ත ප්‍රමාණයකුත් රටේ ක්‍රියාත්මක වෙනවා. ඒ අනුව පොල් ආශ්‍රිත මද්‍යසාර, පොල් සීනි, පොල් හකුරු, පොල් ඇමිනෝ, පොල් විනාකිරි ආදිය හඳුන්වා දෙන්න පුළුවන්. ඒ වාගේම දැන් ටිකක් ප්‍රචලිත වෙන, අපනයන ආදායම වැඩි කර දෙන පොල් ලෙලි ආශ්‍රිත කර්මාන්තත් රටේ වේගයෙන් වර්ධනය වෙමින් තිබෙනවා. ඒ අනුව බ්‍රිස්ටල් කොහු, මෙට්‍රස් කොහු ආදී දේවල් කොහු ආශ්‍රිත කර්මාන්ත අතර තිබෙනවා. ඒ වාගේම පොල් කටු ආශ්‍රිත කර්මාන්තත් රටේ ප්‍රවර්ධනය වෙමින් තිබෙනවා. ඒ අනුව පොල් කටු අඟුරු, පොල් කටු පවුඩර්, සක්‍රිය කාබන්, විසිතුරු භාණ්ඩ පොල් කටු ආශ්‍රිතව නිෂ්පාදනය වෙලා රැකී රක්ෂා උත්පාදනය වෙමින් රටට ආදායම් ලබා දෙන බව දැනුම් දෙන්න කැමැතියි.

(ii) පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබෙන වාර්ෂික අපනයන ආදායම ඩොලර්වලින් මම ඉදිරිපත් කරන්නම්. 2017 අවුරුද්දේ අපනයන ආදායම ඩොලර් මිලියන 598යි; 2018දී 584යි; 2019දී 610යි; 2020දී 661යි; 2021දී 834යි; 2022දී 817යි; 2023දී 700යි. ඒ අනුව ගිය අවුරුද්දේ අපට පුළුවන්කම ලැබුණා පොල්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ආශ්‍රිත අපනයන ආදායම ඩොලර් මිලියන 855 දක්වා වර්ධනය කර ගන්න. 2025දී, පසුගිය අවුරුද්දේ, - මම මේ කියන්නේ අවසානය දක්වා නොවෙයි. අවසන් වාර්තාව තවම ලැබිලා නැහැ - ජනවාරි සිට නොවැම්බර් දක්වා ලංකා ඉතිහාසයේ පළමුවෙනි වතාවට අපි පොල්වල අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 1 ඉක්මවා තිබෙනවා. ඒ අනුව අපි නොවැම්බර් දක්වා ඇමෙරිකානු ඩොලර් මිලියන 1,127ක ආදායමක් ලබලා තිබෙනවා. මම විශ්වාස කරනවා 2025 සම්පූර්ණ වර්ෂයට ගණනය කළාම ඒක ඩොලර් මිලියන 1,200 ඉක්මවයි කියලා.

(iii) මේ සඳහාත් දීර්ඝ පිළිතුරක් තිබෙන්නේ. මම කෙටියෙන් කියන්නම්.

2025 වර්ෂයේ පොල් සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි පොල් ලෙලි ආශ්‍රිත කර්මාන්ත 450ට අධික සංඛ්‍යාවක් තිබෙනවා. මීට අමතරව අවිධිමත් ගණයේ කොහු කර්මාන්ත හා කොහුබත් කර්මාන්ත තවත් 900ක් පමණ තිබෙනවා. ලියාපදිංචි කර්මාන්ත අතරින් ආයතන 11ක් විදේශ කර්මාන්තශාලා ලෙසයි තිබෙන්නේ.

පොල්ලෙලි කර්මාන්තය ආශ්‍රිතව ඍජු රැකියා 20,000ක් පමණ සහ වක්‍ර රැකියා 40,000ක් පමණ තිබෙනවා.

(iv) පොල් ලෙලි කර්මාන්තය ආශ්‍රිතව අපි හඳුනා ගත් ගැටලු ලෙස, අමුද්‍රව්‍යවල ලොකු හිඟයක් තිබෙනවා. ඉල්ලුමට අනුව අපට සපයා ගන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම පොල් ලෙලි කැපීම කර්මාන්තයක් ලෙස වර්ධනය වීමත් සමඟ පොල් ලෙලිවල මිල ඉහළ යාම නිසා කොහු කර්මාන්තයට අවශ්‍ය ලෙලි නොලැබී යාම හා ඉහළ මිලකට පොල් ලෙලි මිලදී ගැනීමට කොහු කර්මාන්තකරුවන්ට, සාමාන්‍ය සුළු කර්මාන්තකරුවන්ට හැකියාවක් නැතිවීමෙන් කර්මාන්තවලට යම් ගැටලුවක් උදා වෙලා තිබෙනවා. ඒ වාගේම පොල් වතුවල තෙතමන සංරක්ෂණය සඳහා පොල් ලෙලි යොදවන්න වෙලා තිබෙන නිසා පොල් ලෙලි හිඟයට ඒ පැත්තෙනුත් බලපෑමක් වෙලා තිබෙනවා. ඒ වාගේම, පොල් ලෙලි කැපීම නියාමනය කළ යුතු කර්මාන්තයක් ලෙස පොල් සංවර්ධන අධිකාරිය නිරීක්ෂණය කළද, වෙනත් ආයතන පොල් ලෙලි කැපීම ප්‍රවර්ධනය කරමින් තිබෙන එකත් අපි ගැටලුවක් හැටියට හඳුනා ගෙන තිබෙනවා.

ඒ වාගේම, අගය වැඩි කළ සමහර කොහු ආශ්‍රිත කර්මාන්ත සඳහා කර්මාන්තකරුවන් භාවිත කරන්නේ සරල ක්‍රමවේද නිසා, නවීන තාක්ෂණය, නවීන සංකල්ප මෙම ක්ෂේත්‍රයට භාවිත කිරීම අල්පවීමත් අපි ගැටලුවක් හැටියට දකිනවා.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නයට අදාළ සවිස්තරාත්මක පිළිතුර මම **සභාගත*** කරනවා.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ ගරු ඇමතිතුමා ප්‍රකාශ කරපු ආකාරයට, කුරුණෑගල දිස්ත්‍රික්කය කියන්නේ පොල් ත්‍රිකෝණය තුළ සාම්ප්‍රදායික දිස්ත්‍රික්කයක්. නමුත්, පසුගිය දශකයකට ආසන්න කාලය තුළ ශීඝ්‍ර මානව ජනාවාසකරණය වාගේම, දැදුරු ඔය ජලාශය නිර්මාණය කිරීමත් එක්ක අක්කර දහස් ගණනක පොල් වගාව අපිට අහිමි වුණා. පසුගිය අවුරුද්දේ උතුරු පොල් ත්‍රිකෝණය කියලා එකක් ක්‍රියාත්මක කළා. ඒ විධියට 2026 අවුරුද්දේ දී කුරුණෑගල දිස්ත්‍රික්කය ආශ්‍රිතව අලුතින් පොල් පැළ සිටුවීම සඳහා වූ වැඩ පිළිවෙළක් අමාත්‍යාංශය හැටියට ක්‍රියාත්මක කරනවාද කියන එක තමයි මම අහන්නේ.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, මම පිළිතුරේදීත් ඒ ගැන පැහැදිලි කළා. 2030 වර්ෂයේදී පොල් ක්ෂේත්‍රයේ අපේ ඉලක්කය තිබෙන්නේ, ගෙඩි මිලියන 4,200ක අස්වැන්නක් මේ රටට ලබා දීමයි. හැබැයි, 2024 වර්ෂය අවසන් වන විට අපිට යන්න පුළුවන් වුණේ, ගෙඩි මිලියන 2,700කට ආසන්න ප්‍රමාණයකට පමණයි. 2030 වර්ෂය වන විට අපි ඒක ගෙඩි මිලියන 2,700 සිට 4,200 දක්වා ගෙන එන්න බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමා ඇහුවා වාගේම, එහෙම නම් අපිට පොල් වගාව ප්‍රවර්ධනය කරන්න වෙනවා. අලුත් වගාවලට යන්න වෙනවා. වයසට ගිය ගස් ටික ඉවත් කරලා නව වගා ස්ථාපිත කරන්න වෙනවා. පාලු සිටුවන්න වෙනවා. ඒ අනුව අපි උතුරු පොල් ත්‍රිකෝණය සඳහා ගිය අවුරුද්දේ රුපියල් මිලියන 500ක් යෙදුවා. අපේ බලාපොරොත්තුව වන්නේ, 2027 වන විට උතුරේ පොල් වගා බිම් ප්‍රමාණය අක්කර 40,000 දක්වා ගෙන ඒමයි. ඒකට අදාළ වැඩ පිළිවෙළ කර ගෙන යනවා. ඒ වාගේම, ගරු ජනාධිපතිතුමා විසින් මෙවර අය වැය ඉදිරිපත් කිරීමේදී උතුරු පොල් ත්‍රිකෝණයට රුපියල් මිලියන 600ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම ගෙවතු වගා වැඩසටහන සඳහා පොල් පැළ ලක්ෂ පහක් ගිය අවුරුද්දේ යෙදුවා, මේ අවුරුද්දේත් අපි ඒක යොදවන්න බලාපොරොත්තු වෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන කුරුණෑගල දිස්ත්‍රික්කය, මම ඉස්සෙල්ලා කියපු කුරුණෑගල, ගම්පහ, පුත්තලම කියන ප්‍රධාන පොල් ත්‍රිකෝණයට අයත් දිස්ත්‍රික්කයක්. ඒ දිස්ත්‍රික්කයේ පොල් වගා කරන විශාල බිම් තිබෙනවා. ඒවායේ වගා තිබෙන සමහර භූමි අයිතිකරුවන් -ව්‍යාපාරිකයින්- ඉන්නේ කොළඹ, එහෙම නැත්නම් පිටරට. ඔවුන් ඒවායෙන් පාඩු නිසා සමහර ඒවා හරියට නඩත්තු කරන්නේ නැහැ. පොකුරු ක්‍රමයට ඒ වගා බිම් ගොඩනහලා, රජය මැදිහත් වෙලා ඒ වගා බිම් යථාවත් කරන්න, පුනරුත්ථාපනය කරන්න වැඩ පිළිවෙළක් අපි සකස් කරලා තිබෙනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රය ගොඩනගන්න වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, එතුමාගේ ප්‍රශ්නය තුළ ගැබ්වෙලා තිබුණු තව කාරණයක් තමයි, මේ සංවර්ධනයත් එක්ක පොල් ඉඩම් කට්ටි වෙනවා කියන එක. එය පාලනය කිරීම සඳහා අපේ අමාත්‍යාංශය යටතේ මණ්ඩලයක් තිබෙනවා. එහි අනුමැතිය නැතිව පොල් ඉඩම් කට්ටි කරන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ සම්බන්ධව නීත්‍යානුකූලව කටයුතු කරනවා. අපි ළඟ සැලැස්මක්, දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් තිබෙනවා.

**ගරු සුජීව දිසානායක මහතා**
(மாண்புமிகு சுஜீவ திசாநாயக்க)
(The Hon. Sujeewa Dissanayake)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පොල් ලෙලි ආශ්‍රිතව නිෂ්පාදන සිදු කරන මහා පරිමාණයේ කර්මාන්ත ගණනාවක් කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම වාරියපොල, පඩුවස්නුවර ආසන මුල්කරගෙන ඒ කර්මාන්තශාලා ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම බහුජාතික කර්මාන්තශාලා කිහිපයකුත් තිබෙනවා. ඒ බහුජාතික කර්මාන්තශාලාවල හිමිකරුවන්, පොල් ලෙලි සහ ඒ ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන් පාලනය කරනවා. ඒ නිසා සුළු සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් විශාල ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. ඒ සම්බන්ධව අමාත්‍යාංශය විසින් මොනයම් හෝ ක්‍රියාමාර්ගයක් ගන්නවාද, ගරු ඇමතිතුමනි?

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன)
(The Hon. K.V. Samantha Viddyarathna)

ගරු කථානායකතුමනි, එතුමා කියන කාරණය නිවැරදියි. අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් බොහොම අමාරුවෙන් පොල් ලෙලි ආශ්‍රිත කර්මාන්තවල නියැළෙනවා. ඒ වාගේම විශාල කර්මාන්ත ඇති වෙනවාත් එක්කම තරගකාරිත්වයකුත් ඇතිවෙලා තිබෙනවා. 2025 නොවැම්බර් වන විට පොල් ගෙඩියක ලෙල්ල රුපියල් 22කට වාගේ මුදලකට අලෙවි වුණා සමහර තැන්වල. ඒකත් එක්ක සාමාන්‍ය කෙනකුට තරග කරන්න බැහැ. තාක්ෂණය, යාන්ත්‍රීකරණය ඉහළින්ම පාවිච්චි කරන අයට එය ලාභදායී ලෙස කරන්න පුළුවන් වුණත්, සාමාන්‍ය කෙනාට කර ගන්න බැහැ. පොල් ලෙලි ආශ්‍රිත නිෂ්පාදනවලට විශාල වශයෙන් ආයෝජනය කරන්න කැමති විදෙස් සමාගම් ගණනාවක් පසුගිය දවස්වල ආවා. මේ තිබෙන තත්ත්වය තුළ අපි ඒවාට අනුමැතිය ලබා දුන්නේ නැහැ. මොකද, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් ආරක්ෂා කරන්න ඕනෑ නිසා. අනෙක් පැත්තෙන්, මෙකට උත්තරයක් විධියට නිෂ්පාදනවලට අවශ්‍ය පොල් ලෙලි ලබා ගැනීම සඳහා අපේ රටේ පොල් වගාව ප්‍රවර්ධනය කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, සාමාන්‍යයෙන් අපේ රටේ පොල් ගසක වාර්ෂික පොල් අස්වැන්න පොල් ගෙඩි 55ක් කියලා තමයි පොල් පර්යේෂණ ආයතනය සලකන්නේ. ඒක ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒක ගොවියාට ලාභදායී වෙන්නෙත් නැහැ. ඉන්දියාවේ පොල් ගසකින් ලැබෙන වාර්ෂික අස්වැන්න ගෙඩි 80යි. මැලේසියාවේ සහ පිලිපීනයේ ගසකින් ලැබෙන වාර්ෂික අස්වැන්න ගෙඩි 120යි. මම මුලින් කියපු විධියට 2030දී පොල් ගෙඩි 4,200ක අස්වැන්නක් ලබා ගන්න නම්, අලුත් ගහක් හිටුවලා 2030දී ගෙඩි කඩන්න පුළුවන් වෙන්නේ නැහැ. තිබෙන වගාවට හොඳින් පොහොර ටික දමලා, කෘමි උවදුරු පාලනය, රෝග මර්දනය කරලා අපේ පොල්ගස්වල අස්වැන්න වැඩි කරගන්න ඕනෑ. ඒ නිසා තමයි තෙතමන ආරක්ෂණය, ගසට ජලය ලබා දීම සහ පොහොර දැමීම ආදිය සිදු කරන්නේ. අපි බලය ගන්න පෙරාතුව අවුරුදු 5ක් ලංකාවේ පොල් ගස්වලට පොහොර යොදා තිබුණේ නැහැ. රජයේ පොල් වතුවලට පවා අවුරුදු 5ක් පොල් පොහොර දමා තිබුණේ නැහැ. දරුවෙකුට කෑම දුන්නොත් තමයි, ඒ දරුවා කායික සහ මානසික වශයෙන් හොඳින් වර්ධනය වෙන්නේ. නැත්නම් මන්දපෝෂණය හැදෙනවා. පසුගිය කාලයේදී ලංකාවේ පොල් වගාවටත් හොඳ පෝෂණයක් නොලැබුණු නිසා අස්වැන්න අඩුවෙලා තිබෙනවා. එම නිසා අපි බලාපොරොත්තු වෙනවා, මේ විධියට අස්වැන්න වැඩි කරලා නව වගාවන් තුළින් රටේ කර්මාන්තවලට අවශ්‍ය පොල් ලෙලි ප්‍රමාණය ලබා දීම කෙටි කාලීන සහ දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් හැටියට ක්‍රියාත්මක කරන්න.

## ආයෝජන ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති LRC ඉඩම්: පුත්තලම දිස්ත්‍රික්කය
## முதலீட்டுக் கருத்திட்டங்களுக்காக ஒதுக்கப்பட்டுள்ள LRC காணிகள்: புத்தளம் மாவட்டம்
## LRC LANDS ALLOCATED FOR INVESTMENT PROJECTS: PUTTALAM DISTRICT

1278/2025

**8. ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වලින් ආයෝජන ව්‍යාපෘතිවලට ලබා දී ඇති ඉඩම් කවරේද;

(ii) එම එක් එක් ඉඩම ලබා දී ඇති ආයෝජන ව්‍යාපෘතිය, ඉඩමේ ප්‍රමාණය සහ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් සඳහා ගෙවිය යුතු බදු මුදල් නියමිත පරිදි ගෙවා තිබේද;

(iv) නොඑසේ නම්, බදු මුදල් ගෙවීම පැහැර හැර තිබේද;

(v) ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දුන් ඉහත ඉඩම් සංවර්ධනය කර තිබේද;

(vi) ඒවා අතරින් ඌන සංවර්ධිත ඉඩම් හඳුනාගෙන තිබේද;

(vii) ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දුන් ඉහත ඉඩම් නිසි පරිදි සංවර්ධනය කර නොමැති නම් හෝ බදු ගෙවීම් පැහැර හැර තිබේ නම්, ඒවා නැවත පවරා ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඉහත කොමිෂන් සභාවට අයත් මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම්, නිවාස ඉදිකිරීම සඳහා ලබා දෙන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தில் காணி சீர்திருத்த ஆணைக்குழுவுக்குச் சொந்தமான காணிகளில் முதலீட்டுக் கருத்திட்டங்களுக்கு வழங்கப் பட்டுள்ள காணிகள் யாவை என்பதையும்;

(ii) மேற்படி ஒவ்வொரு காணியும் வழங்கப்பட்டுள்ள முதலீட்டுக் கருத்திட்டம், காணியின் அளவு மற்றும் அமைந்துள்ள பிரதேச செயலாளர் பிரிவு வெவ்வேறாக யாவை என்பதையும்;

(iii) மேற்படி காணிகளுக்குச் செலுத்த வேண்டிய குத்தகைத் தொகை உரியவாறு செலுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(iv) இன்றேல், குத்தகைத் தொகை செலுத்துவது தவிர்க்கப்பட்டுள்ளதா என்பதையும்;

(v) முதலீட்டுக் கருத்திட்டங்களுக்கு வழங்கப் பட்டுள்ள மேற்படி காணிகள் அபிவிருத்தி செய்யப்பட்டுள்ளனவா என்பதையும்;

(vi) அவற்றில் குறை அபிவிருத்தியுடைய காணிகள் அடையாளம் காணப்பட்டுள்ளனவா என்ப தையும்;

(vii) முதலீட்டுக் கருத்திட்டங்களுக்கு வழங்கப்பட்ட மேற்படி காணிகள் உரியவாறு அபிவிருத்தி செய்யப்படாதவிடத்து அல்லது குத்தகை செலுத்துதல் தவிர்க்கப்பட்டுள்ள பட்சத்தில் அவை மீள சுவீகரிக்கப்படுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) புத்தளம் மாவட்டத்தில் அமைந்துள்ள மேற்படி ஆணைக்குழுவுக்குச் சொந்தமான மொத்தக் காணியின் அளவு ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவு வாரியாக வெவ்வேறாக யாது என்பதையும்;

(ii) அக்காணிகள் வீடுகளை நிர்மாணிப்பதற்கு வழங்கப்படுமா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Livestock, Land and Irrigation:

(a) Will he state -

(i) the names of the lands which have been allocated for investment projects from the lands belonging to the Land Reform Commission in the Puttalam District;

(ii) the investment project for which each plot of land has been provided, the extent of the land and the respective Divisional Secretary's Division in which it is located, separately;

(iii) whether the due lease for the above-mentioned lands have been properly paid;

(iv) if not, whether the lease payments have been defaulted;

(v) whether the above-mentioned lands provided for investment projects have been developed;

(vi) whether underdeveloped lands have been identified among those lands; and

(vii) if the above-mentioned lands provided for investment projects have not been properly developed or if lease payments have been defaulted, whether such lands will be repossessed?

(b) Will he also state -

(i) the total extent of land belonging to the above Commission in the Puttalam District, according to each Divisional Secretary's Division, separately; and

(ii) whether those lands will be provided for the construction of houses?

(c) If not, why

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත්, පුත්තලම දිස්ත්‍රික්කයෙන් කොමිෂන් සභාවට ප්‍රකාශ කරන ලද මුළු ඉඩම් ප්‍රමාණය, පැවරුණු ඉඩම් ප්‍රමාණය හා බැහැර කරන ලද ඉඩම් ප්‍රමාණය හැරුණු විට අවසන් වශයෙන් කොමිෂන් සභාවට පැවරෙන ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව වෙන් වෙන් වශයෙන් සකස් කර ඇමුණුම 01 මඟින් යොමු කරමි. මෙකී ඉඩම් වරින් වර සංශෝධිත 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ විධිවිධාන ප්‍රකාරව පවරා ගනු ලැබ ඇති අතර, එසේ පවරා ගැනීමේදී මැනුම් කර පවරා ගැනීමක් සිදුව නොමැත.

එම ලේඛනයේ සඳහන් ක්ෂේත්‍රයේ ඉතිරි ඉඩම් ප්‍රමාණයෙන් වැඩි ප්‍රමාණයක් දීර්ඝ කාලයක් තිස්සේ අනවසරකරුවන්ගේ ග්‍රහණයට නතුව පවතින බවත්, ඒ අනුව දීර්ඝ කාලීනව පදිංචිව සිටින අනවසරකරුවන් වෙත කොමිෂන් සභාවේ අනුමත ක්‍රමවේද හා විධිවිධාන යටතේ මැනුම් කර ඔප්පු ලබා දෙන බවත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් දන්වා ඇත.

ගරු මන්ත්‍රීතුමාගේ පළමුවැනි ප්‍රශ්නයට අදාළව ගත්තොත්, අපේ රටේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හඳුන්වා දුන් මොහොතේ ඉඳලා මේ දක්වාම කොමිෂන් සභාව පවරා ගත්තු ඉඩම් හෝ කොමිෂන් සභාව බැහැර කරපු ඉඩම් හෝ සියයට 100ක්ම මැනුම් කටයුතු කරලා නිවැරැදිව හඳුනාගෙන පවරා දීම සඳහා කොමිෂන් සභාව විධියට ගත්තු ක්‍රියාමාර්ග අප හඳුනා ගෙන නැහැ. ඒක බරපතළ ප්‍රශ්නයක් විධියට තිබෙනවා. සමහර අවස්ථාවල කොමිෂන් සභාව දන්නේත් නැහැ, කොමිෂන් සභාවට පවරා ගත් ඉඩම් මොනවාද කියලා. කොමිෂන් සභාව ඒවා හඳුනාගෙනත් නැහැ. එවැනි තත්ත්වයක් තමයි තිබෙන්නේ.

පළමුවැනි ප්‍රශ්නයේ පිළිතුර විධියට ලබා දෙන්න පුළුවන් වන්නේ ඉහත කී ආකාරයට කරුණු හඳුනා ගනිමින් ඇමුණුම 01 යටතේ තොරතුරු ඉදිරිපත් කර තිබෙන බවයි.

(ii) ඇමුණුම 02 යටතේ තොරතුරු විශාල ප්‍රමාණයක් තිබෙනවා.

(iii) ඔව්.

[ගරු අරවින්ද සෙනරත් මහතා]

(iv) නැත.

(v) ආයෝජන ව්‍යාපෘති 48කින්, ව්‍යාපෘති 43ක් සංවර්ධනය කර තිබෙන බව තමයි තොරතුරුවලින් ඉදිරිපත් වන්නේ.

(vi) ඔව්.

(vii) ඔව්.

(ආ) (i) ඇමුණුම් අංක 2හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් සඳහන් කර ඇත.

(ii) එම ඉඩම්, නිවාස ඉදිකිරීම සඳහා ලබා දීමක් සිදු නොවේ.

(ඇ) අදාළ නොවේ.

ඇමුණුම් 01 සහ 02 **සභාගත*** කරමි.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, විශේෂයෙන්ම පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් යටතේ තිබෙන ඉඩම් වාගේම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව යටතේ තිබෙන ඉඩම් ඇතැම් අය ව්‍යාජ ලේඛන හදාගෙන විශාල ලෙස පරිහරණය කරමින් තිබෙනවා. මේ සම්බන්ධයෙන් පවතින තොරතුරු මත අදාළ ආයතන වැඩ කටයුතු කරද්දී පෙනෙනවා, ඒ ආයතනවල ලේඛනවල තිබෙන තොරතුරු මත නොව, වෙනම ලේඛන හදලා ඒ ඉඩම් අත්පත් කරගෙන තිබෙන ක්‍රියාවලියක්. මෙවැනි ක්‍රියාවලියක් අඛණ්ඩව සිදු වෙනවා වාගේම නීතිමය වශයෙන්ද මේ ආයතනයට කටයුතු කරන්න බැරි තැනට පත් වෙලා තිබෙනවා. පොලීසිය ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න යද්දීත් එම ගැටලුවම මතු වනවා. මොකද, ඔවුන් ළඟ ලේඛන තිබෙනවා; ඔවුන්ට ඔප්පු ලබා දීලා තිබෙනවා. එහෙම නම්, ඒ ඉඩම් ලබා ගන්නේ කෙසේද, මේ සම්බන්ධයෙන් ඔබතුමන්ලාට වැඩ පිළිවෙළක් තිබෙනවාද කියන ප්‍රශ්නය මා අහන්න කැමැතියි, පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමනි, අමාත්‍යාංශය විධියට, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විධියට අපි සෑම දිස්ත්‍රික්කයකම තිබෙන ඉඩම් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබෙනවා. ඒ වාගේම අනීතිකව බැහැර කර තිබෙන ඉඩම් කොටස් - බිම් කොටස් - පිළිබඳව ද තොරතුරු එකතු කරමින් තිබෙනවා. සමහර තැන්වල අවුරුදු 30ක්, 40ක් තිස්සේ නේවාසිකව ජීවත් වන අය ද සිටිනවා. ඒ නිසා මේ සියල්ල හඳුනා ගනිමින් රජය විධියට -ආණ්ඩුව විධියට - අපි ඒ ජනතාවටත් උපරිම සාධාරණයක් කරමින් සිටිනවා. කොමිෂන් සභාව පැත්තෙන්, ආණ්ඩුව පැත්තෙන් මෙහි නීත්‍යනුකූල තත්ත්වය තහවුරු කර, අනීතික ලෙස බැහැර කර තිබෙන ඒ ඉඩම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්න ආයතනයක් විධියට අපි දැන් කටයුතු කරමින් සිටිනවා. ඒ වාගේම ඒ ඉඩම් අනීතිකව බැහැර කිරීම සඳහා සම්බන්ධ වෙච්ච නිලධාරින් සම්බන්ධයෙන් ද යම් යම් ක්‍රියාමාර්ග ගනිමින් තිබෙනවා. අනීතිකව ඉඩම් බැහැර කිරීම සහ හිතවතුන්ට ඉඩම් ලබා දීම සම්බන්ධයෙන් පසුගිය කාලයේ නිලධාරින් තිදෙනෙකුගේ වැඩ තහනම් කරන්න අපි කටයුතු කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නයට අදාළ පිළිතුර විධියට වැඩිදුරටත් කියන්න තිබෙන්නේ, මේ සියලු කටයුතු නිවැරැදි කරමින්, උපරිම විනිවිදභාවයකින් ඒ ඉඩම් පරිහරණය සඳහා අවස්ථාව උදා කර දෙන්න අමාත්‍යාංශයක් විධියට අප කටයුතු කරමින් ඉන්නවා කියන එකයි.

**ගරු අජිත් ගිහාන් මහතා**
(மாண்புமிகு அஜித் கிஹான்)
(The Hon. Ajith Gihan)

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි. පුත්තලම දිස්ත්‍රික්කයේ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දී තිබුණත්, ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවාද කියන සැකය තිබෙනවා. පසුගිය කාලය ගත්තොත්, අපි දන්නවා නාත්තන්ඩිය තෝරවැටිය ප්‍රදේශයේ අක්කර 50ක ඉඩමක් වෙනත් නමකින්, හිටපු රාජ්‍ය අමාත්‍යවරයෙකු අරගෙන තිබුණු බව. නමුත් කොමිෂන් සභාව ඔවුන්ට තිබෙන හැකියාව අනුව, ලේඛන මත ඒ ඉඩම් අත්පත් කර ගනු ලැබුවා. ඒ වාගේම හලාවත, බංගදෙනිය ග්‍රාම නිලධාරි වසමේ කුඹුටුකුලිය කියන ප්‍රදේශයේ අක්කර 87-100 අතර ඉඩම් ප්‍රමාණයක් හිටපු මන්ත්‍රීවරයෙකු වූ සනත් නිශාන්ත මන්ත්‍රීවරයා විසින් අත්පත් කර ගැනීමට කටයුතු කළා. කූට ලේඛන හදමින් ඒ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු වුණා. මේ වනකොට ඔහුගේ බිරිඳ විසින් ඒ ඉඩම් ලබා ගැනීම සඳහා කටයුතු කරමින් සිටිනවා. කූට ලේඛන සකස් කරලා තිබෙනවා; ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කරලා නැහැ. එතකොට ඒවා ලබා දෙන්න කටයුතු කරලා තිබෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ ඉඩම් රටට අවශ්‍ය විධියට ආයෝජනවලට, ව්‍යාපෘතිවලට ලබා දෙන්න නම්, ඒවා නිදහස් කර ගැනීම අවශ්‍යයි. කූට ලේඛන මත සිදු කරන මේ සියලු ක්‍රියා නවත්වා ඒ ඉඩම් පවරා ගන්නේ කෙසේද, රටට අවශ්‍ය විධියට, ආර්ථිකයට අවශ්‍ය විධියට ඒ ඉඩම් පරිහණය කරන්න කටයුතු කරනවාද කියන කාරණා ඔබතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් විධියට මම අහනවා.

**ගරු අරවින්ද සෙනරත් මහතා**
(மாண்புமிகு அரவிந்த செனரத்)
(The Hon. Aravinda Senarath)

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්නය සම්බන්ධයෙන් අපි ආණ්ඩුව විධියට අවධානය යොමු කරලා කටයුතු කරමින් ඉන්නවා. විශේෂයෙන්ම පළමු කොටසේදී එතුමා විසින් ප්‍රශ්න කරනු ලැබුවේ, ව්‍යාපෘති සම්බන්ධයෙන්. ඇත්තටම අපේ රටේ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් පවරා දීමේදී මූලික ව්‍යාපෘති වාර්තාවේ තිබෙන සැලැස්මට පිටින් ඒ ඉඩම් සංවර්ධනය කරපු අවස්ථා තිබෙනවා. ඒ වාගේම ඒ සැලැස්මේ තිබෙන සංවර්ධන ව්‍යාපෘති ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරපු නැති නිසා එහි ඵලදායීතාව රටට ලබා ගන්නට අසමත් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි නැවත පසු විපරමක් කරමින් සිටිනවා. අදාළ සංවර්ධන ව්‍යාපෘතියට නොයොදා තිබෙනවා නම්, පැහැදිලිවම ඒ ඉඩම් නැවත පවරා ගැනීම සඳහා කටයුතු කරන්න අමාත්‍යාංශයක් විධියට අපි දැන් තොරතුරු එකතු කරමින් ඉන්නවා.

ඒ වාගේම දේශපාලනඥයන් හෝ දේශපාලනඥයන්ගේ හිතවතුන් හෝ කූට ලේඛන සකස් කරලා ඉඩම් අත්පත් කරගෙන තිබෙනවා නම් ඒවාට අදාළවත් පියවර ගන්නවා. මොකද, ඒවා ජනතාව සතු ඉඩම්. ඇත්තටම ගත්තොත්, අපේ රටේ අලුත් පවුල් ඒකක විධියට ගොඩ නැගෙන සමහර තරුණ පවුලකට පර්චස් 10ක් නැති සමාජයකයි අප ජීවත් වන්නේ. එහෙම තත්ත්වයක් යටතේ රජයේ ඉඩම් ටික මංකොල්ල කාපු එක තමයි පසුගිය දශක දෙකතුන ඇතුළේ සිදු වෙලා තිබෙන්නේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

දේශපාලනඥයන්ට හෝ ඔවුන්ගේ හිතවතුන්ට හෝ අනීතිකව දීලා තිබෙන ඒ ඉඩම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය ඉක්මනින්ම පරීක්ෂණ ආරම්භ කර තිබෙනවා. දැනටත් සමහර දිස්ත්‍රික්කවල තොරතුරු එක් රැස් කරමින් තිබෙනවා. ගරු මන්ත්‍රීතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා, ඒ වාගේම මේ සභාවෙන් ඉල්ලීමක් කරනවා, තමතමන්ගේ සම්බන්ධීකරණ බල ප්‍රදේශවල මෙවැනි කූට ලේඛන හදලා විශාල ප්‍රමාණයෙන් ඉඩම් අත්පත් කරගෙන තිබෙන කාරණයට අදාළව සම්බන්ධීකරණ තීන්දු තීරණ අරගෙන අමාත්‍යාංශයට යොමු කරන්න කියලා. මොකද, ඒක අමාත්‍යාංශයට ලොකු පහසුවක්. අමාත්‍යාංශය විධියට අපි ඊට අදාළව ගන්න පුළුවන් උපරිම ක්‍රියාමාර්ග අරගෙන විනිවිදභාවයකින් ජනතාව සතු වස්තුවක් වෙච්ච, දේපළක් වෙච්ච මේ ඉඩම් නිරවුල් කිරීම සඳහා කටයුතු කරනවා.

## ඇල්පිටිය අධ්‍යාපන කලාපයේ රජයේ නොවන පාසල්: විස්තර

எல்பிட்டிய கல்வி வலயத்திலுள்ள அரச சார்பற்ற பாடசாலைகள்: விபரம்

NON-GOVERNMENT SCHOOLS IN ELPITIYA EDUCATION ZONE: DETAILS

1313/2025

**9. ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (2):

(අ) (i) ඇල්පිටිය අධ්‍යාපන කලාපය තුළ පිහිටා ඇති රජයේ නොවන පාසල් කවරේද;

(ii) එම එක් එක් පාසල ආරම්භ කරන ලද වර්ෂය සහ පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාසල් අධීක්ෂණය කරනු ලබන රජයේ ආයතන කවරේද;

(iv) මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එම පාසල් සම්බන්ධයෙන් මහජන පැමිණිලි ලැබී තිබේද;

(v) එම පාසල්වලින් ලබා දෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ එම පාසල්වල සිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) எல்பிட்டிய கல்வி வலயத்தில் அமைந்துள்ள அரச சார்பற்ற பாடசாலைகள் யாவை;

(ii) மேற்படி ஒவ்வொரு பாடசாலையும் ஆரம்பிக்கப் பட்ட வருடம் மற்றும் நிருவாக சபை அங்கத்தவர் களின் பெயர்கள் வெவ்வேறாக யாது;

(iii) மேற்படி பாடசாலைகளை மேற்பார்வை செய்யும் அரச நிறுவனங்கள் யாவை;

(iv) மத்திய அரசாங்கத்தின் கல்வி அமைச்சுக்கு அல்லது மாகாண கல்வி அமைச்சுக்கு மேற்படி பாடசாலைகள் தொடர்பில் பொதுமக்களி டமிருந்து முறைப்பாடுகள் கிடைக்கப் பெற்றுள்ளனவா;

(v) மேற்படி பாடசாலைகளால் வழங்கப்படும் கல்வியின் தரம் மற்றும் இப்பாடசாலை மாணவர்களது உரிமைகளைப் பாதுகாப்பதற் காக மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of Education, Higher Education and Vocational Education:

(a) Will she inform this House -

(i) the non-government schools located within the Elpitiya Education Zone;

(ii) the founding year of each of these schools and the names of their governing board members, separately;

(iii) the government authorities tasked with the supervision of the said schools;

(iv) whether the Ministry of Education of the Central Government or the Provincial Ministry of Education has received public complaints regarding the aforementioned schools; and

(v) the measures that have been taken to ensure the quality of education provided by those schools and to protect the rights of students in those schools?

(b) If not, why?

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) රජයේ අනුමත (ආධාර නොලබන) පෞද්ගලික පාසල් දෙකක් මෙම අධ්‍යාපන කලාපය තුළ පිහිටා ඇති අතර ඒවා පහත පරිදි වේ.

- කේ.එස්.එෆ්. විද්‍යාලය, මොරගොඩ, රන්තොටුවිල.
- අනුර විද්‍යාලය, මාතර (මාළිගාතැන්න ශාඛා පාසල), මාළිගාතැන්න, හත්තක.

(ii)

| අනු අංකය | පාසලේ නම | ආරම්භ කරන ලද වර්ෂය | පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් |
|---|---|---|---|
| 01 | කේ.එස්.එෆ්. විද්‍යාලය | 2007 | කළමනාකරු - Mrs. I. Frauenfeld |
| 02 | අනුර විද්‍යාලය (මාළිගාතැන්න ශාඛා පාසල) | 2021 | කළමනාකාර/ සාමාන්‍යාධිකාරී ස්වාමීන් වහන්සේ තිස්සමහාරාමයේ ඉන්දානන්ද හිමි **අනෙකුත් පාලක මණ්ඩලයේ සාමාජිකයන්** ගරු කැගල්ලේ රතනසාර නාහිමි ගරු හක්මන ධම්මරතන හිමි ගරු අත්තුඩාවේ ධම්මාරාම හිමි නිතිඥ කපිල මනම්පේරි මහතා නීතිඥ රම්‍යචන්ද්‍ර ගුණසේකර මහතා මහාචාර්ය ඒ.කේ.ජී. ජයසිංහ මහතා ඩබ්ලිව්. ගුණසිරි මහතා ඩී. සුදුසිංහ මහතා බැංකු නිලධාරි සෝමදාස කන්දගේ මහතා ආර්.කේ. අබේවර්ධන මහතා |

[ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා]

- කේ.එස්.එෆ්. විද්‍යාලයේ අයිතිය F. කත්‍රිනා ශිරාණි මිය සතු බව ඇමුණුමෙහි දක්වා ඇති 2007.03.07 දිනැති අධ්‍යාපන අධ්‍යක්ෂ (පාසල් කටයුතු සහ පෞද්ගලික පාසල්) ගේ ලිපිය මඟින් තහවුරු වේ. ඇමුණුම **සභාගත*** කරනවා.

  මෙම පාසලේ කළමනාකාරීත්වය ඇයගේ මව වන I. Frauenfeld මහත්මිය විසින් දරන බව පාසල් මඟින් ගැසට් නිවේදනය සඳහා කළමනාකරුවන්ගේ නම් ඉල්ලා සිටි අවස්ථාවේදී එවා ඇති විද්‍යුත් තැපැල් ලිපිය මඟින් දැනුම් දී ඇත.

- අනුර විද්‍යාලය, මාතර (මාළිගාතැන්න ශාඛා පාසල) හි අයිතිය එම විද්‍යාලයේ කළමනාකාර / සාමාන්‍යාධිකාරි ස්වාමීන් වහන්සේ සතු වේ.
  මෙම කළමනාකරුවන් 2025.10.03 දිනැති අංක 2457 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇත. මෙහි අංක 02හි සඳහන් අනුර විද්‍යාලය, මාතර (මාළිගාතැන්න ශාඛා පාසල) සඳහා අවසන් අනුමැතිය මේ වන තෙක් ලබා දී නොමැත. මූලික අනුමැතියක් පමණක් ලබා දී ඇති අතර ඒ අනුව පාසල පවත්වාගෙන යනු ලබයි.

(iii) අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය, දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සහ ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලය

(iv) කේ.එස්.එෆ්. විද්‍යාලය සම්බන්ධයෙන් වරින් වර පැමිණිලි ලැබී ඇති අතර අනුර විද්‍යාලය, මාතර (මාළිගාතැන්න ශාඛා පාසල) සම්බන්ධයෙන් පැමිණිලි ලැබී නැත.

(v)
- සියලු රජයේ අනුමත පෞද්ගලික පාසල් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම පාසල්වලට අදාළව වරින් වර නිකුත් කරනු ලබන අදාළ චක්‍රලේඛ සහ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු වේ.
- රන්තොටුවිල, කේ.එස්.එෆ්. විද්‍යාලයට පාසල විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා උපදෙස් ලබා දෙමින් අධ්‍යාපන ලේකම්ගේ අංක ඊඩී/03/10/05/95(11) හා 2017.08.09 දිනැතිව ලිපියක් නිකුත් කර ඇත.
- රජයේ අනුමත පෞද්ගලික පාසල් ශාඛාවේ නිලධාරීන් සහ ඇල්පිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ නිලධාරීන් විසින් 2025.09.30 දින රන්තොටුවිල, කේ.එස්.එෆ්. විද්‍යාලය අධීක්ෂණය කරන ලද අතර එහිදී පාසලේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා අවශ්‍යා උපදෙස් ලබා දෙන ලදී.

එම අවස්ථාවේදී අනාවරණය කර ගත් පරිදි අ.පො.ස (සා/පෙළ) 2025 විභාගයට අයදුම් කිරීම සඳහා අවස්ථාව ලබා නොදුන් සිසුන් තිදෙනෙකු සඳහා එම අවස්ථාව ලබා දීමට ද ක්‍රියා කරන ලදී.

(ආ) අදාළ නොවේ.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු කථානායකතුමනි, මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් අහන පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කේ.එස්.එෆ්. විද්‍යාලය ගැන අපේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේත් දිගින් දිගටම සාකච්ඡා වෙනවා. රජයේ නිලධාරින්ගේ පැත්තෙන් ඉතාම බරපතළ විධියේ කාරණා ටිකක් සිද්ධ වෙනවා. මම හිතන හැටියට, ඒවා ගරු ඇමතිතුමාටත්, අමාත්‍යාංශයටත් වාර්තා වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මෙහි ප්‍රධානම කාරණය තමයි ළමයි ශාරීරික වධ හිංසනයට ලක් කිරීම. ඒ වාගේම බරපතළ මානව හිමිකම් උල්ලංඝනයවීම් ටිකකුත් වෙනවා. ඒ වාගේම ශිෂ්‍යත්වය පාස් වෙච්ච ළමයින්ට මොනම හේතුවක් නිසාවත් පාසලෙන් අයින් වෙන්න දෙන්නේ නැහැ. අස්වීම් සහතික දෙන්නේ නැහැ. මේක බරපතළ ප්‍රශ්නයක්.

අනෙක් කාරණය මෙයයි. මෙම විද්‍යාලයේ සුදුසුකම් ලත් විදුහල්පතිවරයෙක් නැහැ. විද්‍යාලයෙන් අයින් වෙන ශිෂ්‍යයෝ තමයි අධ්‍යාපන කටයුතු කරන්න -දරුවන්ට උගන්වන්න- ගුරුවරු විධියට බඳවා ගන්නේ. තවත් පැත්තකින්, මේ විද්‍යාලය අධ්‍යාපන කලාපයට වග කියන්නේ නැහැ. යම් කෙනෙක් මේ විද්‍යාලය සම්බන්ධ මොනවා හෝ ඇහුවොත් උත්තරයක් දෙන්න කෙනෙක් නැහැ. ඒ නිසා මෙතැන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. ජර්මන් ජාතිකයෝ තමයි මේ විද්‍යාලය පටන් අරගෙන තිබෙන්නේ. මුල් කාලයේ මේ පාසල යම් හොඳ මට්ටමක තිබුණත් දැන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. මම හිතන හැටියට මේ විද්‍යාලය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට වග කියන්නේත් නැහැ. ඒ නිසා මෙන්න මේ කියන කාරණා සම්බන්ධයෙන් බරපතළ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මේක නියාමනය වෙන විධියට, ඒ කියන්නේ මේ කරපු වැරදිවලට, මේ ශිෂ්‍යයන්ට සහ දෙමව්පියන්ට වෙච්ච අසාධාරණය වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක තමයි මගේ පළමුවන අතුරු ප්‍රශ්නය, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, රජයේ අනුමත ආධාර නොලබන පෞද්ගලික පාසල්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ හා උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

එතකොට මෙතැනදී ශිෂ්‍යයන්ට සිද්ධ වෙන යම්කිසි අසාධාරණයක් හෝ යම්කිසි පැමිණිල්ලක් අදාළ ප්‍රදේශයේ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත යොමු කළ යුතුයි. එහිදී ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපේ පිළිතුරේ සඳහන් කළ ආකාරයට මේ කරුණු රජයේ අනුමත පෞද්ගලික පාසල් ශාඛාවේ නිලධාරීන් සෘජුව දැනුවත් කිරීමේ හැකියාවත් තිබෙනවා. මේ ආකාරයට නියාමනය සම්බන්ධයෙන් ගැටලු පැන නැඟිච්ච අවස්ථා කිහිපයක්ම ආවා. අපි දැන් අමාත්‍යාංශය විධියට පොදුවේ අරගෙන තිබෙන තීරණය අනුව රජයේ අනුමත පෞද්ගලික පාසල්වල නියාමන හැකියාව, විභාග, බඳවා ගැනීම් ඇතුළු

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

සියල්ලට මැදිහත්වීමේ හැකියාව තිබෙනවා. ඒ අනුව මේ පිළිබඳ සෘජු නිරීක්ෂණයක් සිද්ධ වෙනවා. ඒ නිසා මේ චක්‍රලේඛවලට වගවිය යුතුයි. අපි මේ නිශ්චිත කාරණාව සැලකිල්ලට ගන්නම්. ගරු මන්ත්‍රීතුමාගේ අදහස අපි පිළිගන්නා අතරතුර, අපට හසු නොවන පෞද්ගලික පාසල් කොටසකුත් තිබෙනවා. මේ පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවත් නිරීක්ෂණ කටයුතු කරනවා. නියාමනය සඳහා මේවා ඒ පද්ධතියට ඇතුළත් කර ගන්න තමයි බලාපොරොත්තු වන්නේ. නිශ්චිත කාරණා සම්බන්ධයෙන් අපට ඉක්මනින්ම තීරණයක් ගන්න හැකියාව තිබෙනවා.

**ගරු නිශාන්ත පෙරේරා මහතා**
(மாண்புமிகு நிஷாந்த பெரேரா)
(The Hon. Nishantha Perera)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මෙවැනි පාසල් සම්බන්ධයෙන් ලංකාව පුරාම මෙහෙම තමයි වෙන්න ඇත්තේ කියලා තමයි මට හිතෙන්නේ. මෙතැන බරපතළ අසාධාරණකම් ටිකක් වෙලා තිබෙනවා. අධ්‍යාපන අමාත්‍යාංශය විධියට මේ වෙච්ච අසාධාරණය සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු (වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு (வைத்தியர்) மதுர செனெவிரத்ன)
(The Hon. (Dr.) Madhura Senevirathna)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා අහපු කාරණාව වාගේ සමාන කාරණා මේ ආකාරයේ පාසල්වලින් සිද්ධ වෙලා තිබෙනවා. ඒවා ගැන පැමිණිලි කළ අවස්ථාවලදී ඒ කාලයට අදාළව නොවෙයි, ඊට පෙර සිද්ධ වෙච්ච සිදුවීම්වලටත් අදාළව අපි මැදිහත්වීම් කර තිබෙනවා. විශේෂයෙන්ම දකුණු පළාතේ ඔය ආකාරයෙන් තිබුණු වෙනත් පාසල්වලටත් අපි ඒ මැදිහත්වීම් කර තිබෙනවා. ඒ හැකියාව තිබෙනවා. ඒ වාගේම, නීතිමය වගවීමක් පාසල්වලටත් තිබෙනවා. විශේෂයෙන්ම බඳවා ගැනීමේදී නිසි ලෙස චක්‍රලේඛ අනුගමනය කරමින් පාසල පවත්වාගෙන යෑමට හැකි පරිදි ඒ ක්‍රියාවලිය සිද්ධ විය යුතුයි. නැත්නම්, අධ්‍යාපන අමාත්‍යාංශයේ සෘජු මැදිහත්වීමක් මාතර දිස්ත්‍රික්කයේදීත් අපි සිද්ධ කරලා තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් නිශ්චිතව ක්‍රියා කරන බව ගරු මන්ත්‍රීතුමාට සඳහන් කරන්න කැමැතියි.

## සමෘද්ධි සංවර්ධන නිලධාරීන්: උසස්වීම් සහ විශ්‍රාම වැටුප් හිමිකම්
### சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்கள்: பதவியுயர்வும் ஓய்வூதிய உரித்தும்
### SAMURDHI DEVELOPMENT OFFICERS: PROMOTIONS AND PENSION ENTITLEMENTS

1570/2025

**10. ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම් සහ හිඟ මුදල් ගෙවීම් සම්බන්ධයෙන් පවතින නොවිසඳුණු ගැටලු කවරේද;

(ii) ඒවා විසඳීමට රජය ගෙන ඇති කඩිනම් ක්‍රියාමාර්ග සහ ඒ සඳහා වන නිශ්චිත කාලවකවානු කවරේද;

(iii) ඔවුන්ගේ උසස්වීම් ලබා දීමේ සහ ශ්‍රේණිගත කිරීමේ නිසි පරිපාටියක් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙන්නේද;

(iv) එසේ නම්, එහි වත්මන් ප්‍රගතිය කවරේද;

(v) සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් වාර්තා වන අපචාර හා දූෂණ සිදුවීම් සම්බන්ධයෙන්, විනය ක්‍රියා මාර්ග කඩිනම් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) සමෘද්ධි බැංකු පද්ධතිය පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்களின் ஓய்வூதிய உரித்து மற்றும் நிலுவைப் பணத்தைச் செலுத்தல் தொடர்பாக நிலவுகின்ற தீர்க்கப்படாத பிரச்சினைகள் யாவை என்பதையும்;

(ii) மேற்படி பிரச்சினைகளைத் தீர்ப்பதற்காக அரசாங்கம் மேற்கொண்டுள்ள துரித நடவடிக்கைகள் மற்றும் அதற்கெடுக்கும் திட்டவட்டமான காலப்பகுதி யாது என்பதையும்;

(iii) அவர்களுக்கான பதவியுயர்வை வழங்கல் மற்றும் தரவரிசைப்படுத்தலுக்கு ஏற்புடைய நடவடிக்கைமுறையைத் துரிதமாக நடைமுறைப்படுத்துவதற்குத் திட்டமிடப்பட்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அதன் தற்போதைய முன்னேற்றம் யாது என்பதையும்;

(v) சமுர்த்தி அபிவிருத்தி உத்தியோகத்தர்கள் தொடர்பாக அறிக்கையிடப்படும் துர்நடத்தை மற்றும் மோசடிகள் தொடர்பான ஒழுக்காற்று நடவடிக்கைகளைத் துரிதப்படுத்துவதற்காக மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) சமுர்த்தி வங்கிக் கட்டமைப்பை கணினிமயப்படுத்தும் கருத்திட்டத்தைப் பூர்த்தி செய்வதற்காக மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Rural Development, Social Security and Community Empowerment:

(a) Will he inform this House -

(i) the unresolved issues that exist regarding the payment of pension entitlements and arrears of Samurdhi Development Officers;

(ii) the prompt measures that have been taken by the Government to resolve them and the specific timeframe for implementing the same;

(iii) whether it has been planned to expeditiously implement a proper system for their promotions and grading;

[ගරු ලාල් ප්‍රේමනාත් මහතා]

(iv) if so, the progress of it at present; and

(v) the steps that have been taken to expedite disciplinary action regarding the incidents of misconduct and corruption reported against Samurdhi Development Officers?

(b) Will he also inform this House of the steps that have been taken to complete the project to computerize the Samurdhi Bank system?

(c) If not, why?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) මේ වෙනකොට විශ්‍රාම වැටුප් හිමිකම් ලබා දීම පිළිබඳවත්, ඒ හිඟ මුදල් ගෙවීම සම්බන්ධයෙනුත් පැවති ගැටලු සැලකිය යුතු ප්‍රමාණයකින් අපි විසඳලා තිබෙනවා, ගරු කථානායකතුමනි. නමුත් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය 1995දී පිහිටුවන අවස්ථාවේ බඳවාගත් ඇතැම් සමෘද්ධි සංවර්ධන නිලධාරින්ට පැවතිය යුතු අවම අධ්‍යාපන සුදුසුකම් නොතිබීම නිසා තවදුරටත් විශ්‍රාම වැටුප් ගෙවීමේ ගැටලුවක් ඉතිරි වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. මේ තත්ත්වය යටතේ විශේෂයෙන් 2016දී අමාත්‍ය මණ්ඩල තීරණයක් අරගෙන තිබෙනවා, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය යටතේ බඳවාගත් සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති නිලධාරින් සඳහා වෛකල්පිත විශ්‍රාම යෑමේ දිනයෙන් ඔබ්බට සේවා දිගු ලබා නොදීමට. නමුත් මේ තීරණය නිසි පරිදි ක්‍රියාත්මක කරලා නැහැ, පසුගිය කාලයේ. ගරු කථානායකතුමනි, එහි ප්‍රතිඵලයක් විධියට මේ වනවිටත් විශේෂයෙන් අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා නැති අවුරුදු 55න් ඔබ්බටත් සේවය කළ යම් පිරිසක් ඉන්නවා. අන්න ඒ අයගේ ගැටලුව විසඳීම සඳහා මේ වනවිට අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන ඒ එක් එක් නිලධාරින් සම්බන්ධයෙන් විශේෂයෙන් කැබිනට් මණ්ඩලයේ තීරණයක් ගැනීම සඳහා අපි අවශ්‍ය කටයුතු යොදමින් ඉන්නවා, ගරු කථානායකතුමනි.

(ii) මා කලින් කිව්වා වාගේ මේ ගැටලුව විසඳීම සඳහා නිශ්චිත තොරතුරු රැස්කිරීමට අපි කටයුතු කරලා තිබෙනවා. අධ්‍යාපන සුදුසුකම් සපුරා නොමැති අවුරුදු 55න් ඔබ්බට සේවය කරන නිලධාරින් මේ වනවිටත් සිටින්නේ නම් වහාම ඔවුන්ගේ සේවය අවසන් කිරීමට තීරණයක් අරගෙන තිබෙනවා. ඒ වාගේම වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට ඇති එවැනි අවම අධ්‍යාපන සුදුසුකම් සපුරා නැති අයගේ සේවය නියමිත දිනයට අවසන් කිරීමටත් කටයුතු කරන ලෙස සියලු දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත මේ වනකොට අපි දැනුම් දීලා තිබෙනවා.

(iii) මේ ප්‍රශ්නයෙන් අහන්නේ, උසස්වීම් දීමේ පටිපාටිය පිළිබඳවයි. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමෘද්ධි නිලධාරින්ගේ උසස්වීම් පටිපාටියක් ආරම්භයේ සිටම තිබිලා නැහැ, ගරු කථානායකතුමනි. නමුත් 2023 නොවැම්බර් මාසයේ 01වැනි දා විශේෂයෙන්ම සමෘද්ධි කළමනාකරණ සහකාර තනතුරක් සඳහා අවසර ලබාගෙන තිබෙනවා. නමුත් ඒ තීරණය ක්‍රියාත්මක කරලා නැහැ, අපි බලයට පත් වෙන 2024 අග භාගය වනවිටත්. මේ තත්ත්වය සැලකිල්ලට ලක් කරලා අපි ආණ්ඩු බලය ලබා ගත්තාට පසුව සමෘද්ධි සංවර්ධන නිලධාරින් සඳහා උසස්වීම් පටිපාටියක් හඳුන්වා දුන්නා. ඒ අනුව, කළමනාකරණ සහකාර තනතුරේ - MN-2 - උසස්වීම් සඳහා වන වැටුප් කේතවල පැවැති තත්ත්වයන් සමාලෝචනය කරලා, අලුත් යෝජනාවක් අනුව 2025 දෙසැම්බර් 22වැනි දින අපි ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් අරගෙන තිබෙනවා. ඒ අමාත්‍ය මණ්ඩල තීරණය මේ වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කරලා තිබෙනවා.

ඒ වාගේම සමෘද්ධි කළමනාකරු තනතුර සඳහා උසස්වීම් පටිපාටියක් සකස් කරලා, ඒකත් අපි රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කරලා, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ සමඟ මේ වන විට අග්‍රාමාත්‍ය කාර්යාලයේ තිබෙන බඳවා ගැනීමේ සමාලෝචන කමිටුව වෙත යොමු කරලා තිබෙනවා. මෙතෙක් සමෘද්ධි කළමනාකරු නිලධාරින් සඳහා උසස්වීමේ පටිපාටියක් අනුගමනය කරලා තිබුණේ නැහැ. ගරු කථානායකතුමනි, ඒ අනුව අපි ඔවුන් සඳහා උසස්වීමේ ක්‍රමවේදයක් හදලා, පසුගිය වසරක කාලය තුළ ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා.

(iv) ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් සමාජය තුළ විශාල කතිකාවක් තිබුණා. විශේෂයෙන්ම අපි ආණ්ඩු බලය ගත්තාට පස්සේ පසුගිය වර්ෂය තුළ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම බැංකු රජයේ විගණනයට යටත් කිරීම සඳහා Act එකක් ගෙනැල්ලා අදාළ පනත සංශෝධනය කළා. ඒ අනුව මේ වන විට අපට විගණන කටයුතුවල විනිවිදභාවය ආරක්ෂා කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා.

ඒත් එක්කම, විශේෂයෙන්ම අභ්‍යන්තර විමර්ශන නිලධාරින්ගේ ධාරිතාව වර්ධනය කිරීම සඳහා පසුගිය වසරේ පුහුණු වැඩසටහන් ගණනාවක් පවත්වා තිබෙනවා. ඒ අනුව අපි ඔවුන්ගේ ධාරිතාව වැඩි කිරීම සඳහා කටයුතු කර තිබෙනවා.

(v) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකය හා විමර්ශන ඒකකය ඒකාබද්ධ කරලා මූල්‍ය අක්‍රමිකතා හා දූෂණ ක්‍රියාවලිය අවම කිරීමට ඒකාබද්ධ යන්ත්‍රණයක් සකස් කරලා මේ වෙනකොට ක්‍රියාත්මක කරමින් සිටිනවා.

(ආ) සමෘද්ධි බැංකු කාලාන්තරයක් තිස්සේ පරිගණක ක්‍රියාවලියකට යොමු කරලා තිබුණේ නැහැ. ඒ සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් ලබා ගැනීම සඳහා අපි මේ වන විට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කරලා තිබෙනවා. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව සමෘද්ධි බැංකු

1,097ක් සහ සමෘද්ධි සමිති 335ක් තිබෙනවා. ඒවායින් සැලකිය යුතු ප්‍රමාණයක් මේ වන විට manual ක්‍රමය අතහැර පරිගණකගත කිරීමේ ක්‍රියාවලියට යොමු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රජාමූල බැංකු 450ක් මේ වන විට තැන්පතුවලට අදාළ ලෙජර් කටයුතු manual ක්‍රමයට කිරීම අතහැර තිබෙනවා, ගරු කථානායකතුමනි. නමුත්, මම කලින් කිව්වා වාගේ සමස්තයක් විධියට ගත්තාම සමෘද්ධි බැංකු 1,097ක් සහ සමෘද්ධි සමිති 335ක් තිබෙන නිසා බොහෝ වෙලාවට එක් එක් බැංකුව කටයුතු කරන ක්‍රමය වෙනස්. එම නිසා, සියලුම බැංකු එකම ජාලගත ඩිජිටල් වේදිකාවකට ගෙනඒම සඳහා අපි පසුගිය සතියේ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. අපි ඒ සම්බන්ධයෙන් වැඩ කටයුතු කරලා, බැංකු ටික තනි, තනි විධියට තිබියදී ඩිජිටල් ක්‍රමවේදයක් හරහා සියලුම බැංකු එක් ජාලයකට පරිගණකගත කිරීමේ කටයුතු මේ වන විට ආරම්භ කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

(ඇ) අදාළ නොවේ.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්තටම සමෘද්ධි සංවර්ධන නිලධාරිතුමන්ලා රාජ්‍ය සේවයට බඳවා ගත්තේ එවකට සිදු වුණු දැවැන්ත බල පෙරළියක ප්‍රතිඵලයක් හැටියටයි. නමුත්, ඒ බල පෙරළියේ වඩාත්ම හොඳ ප්‍රතිඵලය රටට දෙන්න ඒ පාලකයින් සමත් වුණේ නැහැ. මට මතක විධියට ඔවුන් එක් අවස්ථාවකදී හිරිමල් වයසේ පසු වුණු පිරිසට; එම බල පෙරළිය වෙනුවෙන් කර උර දුන් තරුණ පිරිසට දෙන රැකියාවක් විධියට තමයි මේ තනතුර හඳලා දුන්නේ. ඒ වාගේම, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ප්‍රශ්නය දීර්ඝ කාලයක් තිස්සේ ඇදෙමින් පවතින එකක්. ගරු ඇමතිතුමනි, අපිත් මෙවර දැවැන්ත පරිවර්තනයක් සහිතව සිටින මොහොතක වුවත්, දැනට තිබෙන ආර්ථික තත්ත්වය උඩ අපි හිතන ආකාරයෙන්ම මෙය ඉටු කිරීමට ඔබට නොහැකි වෙයි කියලා මට හිතෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, ඔවුන්ගේ විශ්‍රාම වැටුප සකස් කර අවසන් කරන තෙක් ඔවුන්ට යම් කිසි අතුරු දීමනාවක් හෝ වෙනත් සහනදායී දීමනාවක් ලබා දීමේ හැකියාවක් තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ 25,000කට අධික කාර්ය මණ්ඩලයක් සේවය කරනවා. ඔවුන් අතරින් ඉතාම සුළු පිරිසකට තමයි මේ ගැටලුව පැනනැඟී තිබුණේ. මගේ පිළිතුරේදී ප්‍රකාශ කළා වාගේම, ඒ ගැටලුවත් අවම අධ්‍යාපන සුදුසුකම් නොමැතිවීම නිසා ඇති වුණු ප්‍රශ්නයක්.

මේ සම්බන්ධයෙන් ලබාගත හැකි විසඳුම පිළිබඳව මම පසුගිය සතියේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනාරාල්තුමා, එම කාර්යාලයේ නිලධාරින්, අපේ අමාත්‍යාංශයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් ගෙන්වලා විශේෂ සාකච්ඡාවක් කළා. එම සාකච්ඡාව අනුව අපි සාධනීය විසඳුම් ගණනාවක් යෝජනා කළා. ගරු මන්ත්‍රීතුමා මතු කරනවා වාගේ, අතුරු දීමනාවක් ලබා දීම සම්බන්ධයෙන් දැනට පවතින නීති රීති අනුව කටයුතු කරන්න බැහැ කියන එක තමයි අපට විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ නිලධාරින් ප්‍රකාශ කළේ. මේ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් යොමු කරලා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්න කියලා තමයි ඔවුන් අපට උපදෙස් ලබා දුන්නේ. ඒ අනුව අපි මේ වෙනකොට එම ක්‍රියාමාර්ගය අනුගමනය කරමින් ඉන්නවා, අවම අධ්‍යාපන සුදුසුකම් නැති අයගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ගැටලුව විසඳීම සඳහා.

අනෙක් අයගේ විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් අපි එනකොටත් බරපතළ ගැටලු ගණනාවක් තිබුණා. සේවක අර්ථසාධක අරමුදලේ හිටපු අය විශ්‍රාම වැටුප් හිමිකම දක්වා පරිවර්තනය කිරීමේදී, විශේෂයෙන් සමෘද්ධි අධිකාරිය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව බවට පරිවර්තනය කිරීමේදී ඇති වෙච්ච ගැටලු ගණනාවක් තිබුණා. ඒ ගැටලු සියල්ල අපි මේ වනවිට විසඳලා අවසන් කර තිබෙනවා, ගරු කථානායකතුමනි.

**ගරු ලාල් ප්‍රේමනාත් මහතා**
(மாண்புமிகு லால் பிரேமநாத்)
(The Hon. Lal Premanath)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ සමෘද්ධි බැංකු පරිගණකගත කිරීම සහ විනිවිදභාවය සම්බන්ධව මා ඉදිරිපත් කළ ප්‍රශ්නයට අපේ ඇමතිතුමා ලබා දුන් පිළිතුරට අදාළවයි. ගරු ඇමතිතුමනි, අපි දන්නවා, සමෘද්ධි බැංකු පද්ධතිය පරිගණකගත කරනවා කියන එක දීර්ඝ කාලයක් තිස්සේ දිගින් දිගටම ආණ්ඩු කිහිපයක් තුළ සාකච්ඡා වුණු කාරණයක් බව. නමුත් තවමත් පැරණි ක්‍රමයටම අතින් ලියන, ලේඛන භාවිත කරලා ගනුදෙනු කරන ක්‍රමයක් තමයි දකින්න ලැබෙන්නේ. ඒ වාගේම මේ ප්‍රතිලාභ ලබන බොහෝ අහිංසක පුරවැසියන් මේවා පරිහරණය කිරීමට නොදන්නවා වාගේම අපට තවමත් පැමිණිලි විශාල වශයෙන් එනවා. "මට මේ මුදල් ලැබුණේ නැහැ, මගේ එකතු කරපු මුදලක් තිබෙනවා ගන්න විධියක් නැහැ, ණයක් ගන්න විධියක් නැහැ" කියලා හැම තිස්සේම මැසිවිලි ප්‍රමාණයක් එනවා. මම හිතන විධියට, තාක්ෂණික දුබලතාව මේකට බලපානවා. ගරු ඇමතිතුමනි, මෙය සමනය කිරීම සඳහා තාවකාලිකව SMS ක්‍රමයකින් හෝ මේ පිරිස් දැනුවත් කිරීමට කෙටි කාලීන වැඩ පිළිවෙළක් සකස් කර දීමේ හැකියාවක් තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

ගරු කථානායකතුමනි, මම කලිනුත් සඳහන් කළා වාගේ මෙය අවුරුදු 30ක් තිස්සේ පැවැති ප්‍රශ්නයක්. 1995දී තමයි සමෘද්ධි අධිකාරිය පිහිටුවන්නේ. මේ, 2026 වර්ෂය. මේ වනවිට අවුරුදු 31ක් ගත වෙලා තිබෙනවා. මේ වසර ගණනාව තුළ manual ක්‍රමයට හුරු වෙලා, අද ලෝකයට ගැළපෙන විධියට ඩිජිටල්කරණය නොවීමත් එක්ක ඇති වෙලා තිබෙන ගැටලු කිහිපයක් තිබුණා. නමුත් අපි මේවා ක්‍රමයෙන් විසඳාගෙන තමයි පසුගිය අවුරුද්ද තුළ කටයුතු කළේ. ඒ අනුව මම කලිනුත් සඳහන් කළා වාගේ. දැනටමත් අපේ බැංකුවලින් සැලකිය යුතු ප්‍රමාණයක් - බැංකු 450ක් විතර - manual ක්‍රමය අයින් කරලා - එතැනින් ඉවත් වෙලා - පරිගණක භාවිතයට යොමු වෙලා තිබෙනවා. ඒ වාගේම සියලුම බැංකු manual ක්‍රමයට යොමු වෙන්නේ නැහැ. ඔවුන්ගේ යම් යම් කටයුතු දැන් ඩිජිටල් ක්‍රමයට පරිවර්තනය වෙලා තිබෙනවා. මම කලින් කිව්වා වාගේ, එක් ඩිජිටල් වේදිකාවක් ඔස්සේ ජාලගත බැංකු පද්ධතියක් බවට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැනට තිබෙන බැංකු 1,097ත්, බැංකු සමිති 335ත් ඒකාබද්ධ කරපු වැඩ පිළිවෙළක් අපි මේ වෙනකොට ක්‍රියාත්මක කරමින් පවතිනවා. ඒ ඔස්සේ දැනට ඇති වෙලා තිබෙන සුළු සුළු ප්‍රශ්න ටික විසඳාගන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා කථා කරන්නේ පොදු වැදගත්කමක් තිබෙන කරුණක් ගැනයි. ඔබතුමා දන්නවා, ගරු අගමැතිතුමියට විරුද්ධව විපක්ෂයෙන් විශ්වාස භංගයක් අත්සන් කරගෙන යනවා කියලා මෑතකදී මාධ්‍යවල පළ වෙලා තිබුණු බව. අගමැතිතුමියකට විරුද්ධව, අග්‍රාමාත්‍ය ධුරයට විරුද්ධව විශ්වාස භංගයක් අත්සන් කරගෙන යනවා කියන එක ඉතාම බරපතළ කරුණක් කියලා අපි දන්නවා. ඒ නිසා විශ්වාස භංගයක් අත්සන් කරලා ඒක ඉදිරිපත් නොකර ඉන්න එක ගැටලුවක් කියලා අපි හිතනවා. ආණ්ඩු පක්ෂයේ අපි මේ දවස් හතරට Agenda එක හදලා තිබෙනවා. ඒ නිසා, ඉදිරි දවස් දෙක - 22වන දා සහ 23වන දා - අවශ්‍ය නම් සම්පූර්ණයෙන්ම ඒ විශ්වාස භංග යෝජනාව පිළිබඳ විවාදය සඳහා ලබා දෙන්න අපි කැමැතියි. ඒ නිසා, විපක්ෂය පැත්තෙන් එම විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරනවාද, නැද්ද කියලා අපි දැනගන්න කැමතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඒක විපක්ෂයේ කාර්යභාරයක්. අපි සාකච්ඡා කරලා අවශ්‍ය වෙලාවට කටයුතු කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ඒක අත්සන් කරන එක විපක්ෂයේ කාර්යභාරය වෙන්න පුළුවන්. නමුත් අග්‍රාමාත්‍ය ධුරයට අදාළව විශ්වාස භංගයක් අත්සන් කරනවා නම්, ඒක භාර දෙන්න කියලායි අපි කියන්නේ. මොකද, ඒක රටේ ස්ථාවරභාවයට පවා බලපෑමක් ඇති කරනවා. විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඒකයි අපි ඔබතුමාට කියන්නේ කරුණාකරලා විපක්ෂය ඒක භාර දෙනවාද, නැද්ද කියන එක කියන්න කියලා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු කථානායකතුමනි, අපි එය නිසි වෙලාවට ඔබතුමාට භාර දෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, මට පෙනෙනවා, ඔබතුමාගේ බොහොම හොඳ නම්‍යශීලී ප්‍රවණතාවක් තිබෙන බව. මොකද, වැදගත් ප්‍රශ්නයක් අහන්න ඔබතුමා අවස්ථාව ලබා දුන්නා. රටේ තිබෙන වැදගත් දේවල් ගැන අහන්න ඔබතුමා විපක්ෂයටත් ඒ ආකාරයෙන්ම ඒ අවස්ථාව - අවකාශය - ලබා දෙයි කියලා අපි බලාපොරොත්තු වනවා. අපි ඒක අගය කරනවා. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් දෙගොල්ලන්ටම අවස්ථාව ලබා දුන්නා, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි.

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ලක්විජය ගල්අඟුරු බලාගාරයට ගල්අඟුරු සැපයීමේ ටෙන්ඩර් ක්‍රියාවලිය
### லக்விஜய நிலக்கரி மின் உற்பத்தி நிலையத்துக்கு நிலக்கரி வழங்கலுக்கான கேள்வி மனு நடைமுறை
### TENDER PROCESS FOR SUPPLY OF COAL TO LAKVIJAYA COAL POWER PLANT

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මා පහත සඳහන් ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

රටේ විදුලි නිෂ්පාදනයේ අතිශය වැදගත් බලාගාරයක් වන නොරොච්චෝලේ ලක්විජය ගල්අඟුරු බලාගාරයට ගල්අඟුරු සැපයීම සම්බන්ධයෙන් පවතින ටෙන්ඩර් ක්‍රියාවලියේ අසාර්ථකත්වය හා විනිවිදභාවයෙන් තොර තීරණ ගැනීම් පිළිබඳව අද රට පුරාවටම මහජන අවධානයක් යොමු වෙලා තිබෙනවා. ඒ නිසාම ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්න හැටියට පහත සඳහන් ප්‍රශ්න මම අදාළ අමාත්‍යවරයාට යොමු කරනවා.

1. ගල්අඟුරු සඳහා ප්‍රශ්නගත ටෙන්ඩරය කැඳවීම සිදු කර ඇත්තේ කුමන ආකාරයටද? මෙම ප්‍රශ්නගත ටෙන්ඩරය තාක්ෂණික දෝෂයක් නොව, රටේ බලශක්ති සුරක්ෂිතතාව සහ මහජන මුදල් අවදානමට ලක් කළ පාලන අසාර්ථකත්වයක් බව අමාත්‍යවරයා පිළිගන්නේද?

ගරු ඇමතිතුමනි, මේ කාරණය මම ඔබතුමාට පැහැදිලි කරන්න කැමැතියි. විශේෂයෙන්ම මෙගාවොට් 900ක බලාගාරයකට දිනකට ගල්අඟුරු මෙට්‍රික් ටොන් 2,500ක්, ඒ වාගේම වාර්ෂිකව ගල්අඟුරු මෙට්‍රික් ටොන් මිලියන 1.5ත්, 1.7ත් අතර ප්‍රමාණයක් යොදවනවා. මැයි මාසයේ සිට අගෝස්තු මාසය දක්වා පවතින වාරකන් සමය හේතුවෙන් ගල්අඟුරු ගොඩබාන්නට බැරි නිසා හැම අවස්ථාවකදීම අප්‍රේල් මාසයේදී තමයි ඊළඟ වර්ෂය වෙනුවෙන් ප්‍රමාණවත් ගල්අඟුරු තොග ඇණවුම් කිරීම සිද්ධ වන්නේ. එය අප්‍රේල් මාසයේ පටන් ගෙන අගෝස්තු වන විට අවසන් කරන්න ඕනෑ. හැබැයි, රජය මේ වැඩ පිළිවෙළෙන් බැහැර වෙලා විශේෂයෙන්ම මේ ටෙන්ඩරය කැඳවන්නේ අගෝස්තු මාසයේ. එම නිසා ඔබතුමාගෙන් මේ පිළිබඳ පැහැදිලි කිරීමක් මම බලාපොරොත්තු වනවා.

2. ටෙන්ඩරය සඳහා ලබා දිය යුතු කාල සීමාව දින 21ක් දක්වා අඩු කර ඇති බවට වාර්තා වනවා. සාමාන්‍යයෙන් ටෙන්ඩරයකට දින 42ක් ලබා දෙනවා. මම අහන්න කැමැතියි, මේක දින 21ක් දක්වා අඩු කළේ කාගේ අනුමැතියක් යටතේද, ඒ අනුමැතිය ලබා දුන්නා නම් ඒ පිළිබඳ වාර්තා සභාගත කළ හැකිද කියලා.

3. මීට පෙර ගල්අඟුරු ටෙන්ඩරය සඳහා අයදුම් කිරීමට තිබිය යුතු තාක්ෂණික/මූල්‍ය සුදුසුකම් කවරේද? මෙවර රජය එම කොන්දේසි වෙනස් කිරීමක්, ලිහිල් කිරීමක් හෝ ඉවත් කිරීමක් සිදු කර තිබෙනවාද?

මොකද, වෙනදාට ගල්අඟුරු මෙට්‍රික්ටොන් මිලියනයකට වඩා සපයා ඇති සැපයුම්කරුවන් ලියාපදිංචි කළත්, මෙවර ඒක ගල්අඟුරු මෙට්‍රික්ටොන් 100,000 දක්වා අඩු කර තිබෙනවා. අපි අහන්න කැමැතියි, මේ ලිහිල් කිරීම, එහෙම නැත්නම් වෙනස් කිරීමට අනුමැතියක් ලැබුණේ කොහොමද, එම අනුමැතිය ලබා දෙන්නට කටයුතු කරපු නිලධාරින්, බලධාරින්, ඒ පුද්ගලයින් කවුද කියලා.

4. මෙම ටෙන්ඩරයට ඉදිරිපත් වූ මුළු ලංසු සංඛ්‍යාව කොපමණද? ටෙන්ඩරය පිළිබඳ සම්පූර්ණ ලංසු ඇගැයීම් වාර්තාව සභාගත කළ හැකිද?

5. රජය තෝරා ගත් සැපයුම්කරුට නොරොච්චෝලේ වැනි විශාල ගල්අඟුරු බලාගාර සඳහා පෙර සැපයුම් අත්දැකීම් තිබුණේද?

ඒ කියන්නේ, රජය තෝරා ගත් සැපයුම්කරුට මේ වාගේ විශාල ප්‍රමාණයක් සැපයුම් කිරීමේ අත්දැකීම් තිබෙනවාද? එසේ නොමැති නම්, රටේ මූලික විදුලි නිෂ්පාදනයේ වගකීම එවැනි නුසුදුසු සමාගමකට ලබා දුන්නේ ඇයි කියන එක අපි මේ අවස්ථාවේදී අහන්නට කැමැතියි.

මොකද, මීට පෙර ගල්අඟුරු ගෙන්වන ක්‍රියාවලියට ඉල්ලුම් කරන්න පුළුවන් වුණේ කිලෝග්‍රෑම් ඒකකයකට කිලෝ කැලරි 5,900ක මට්ටමේ පවතින ගල්අඟුරු මෙට්‍රික් ටොන් මිලියනයක ප්‍රමාණයක් ව්‍යාපාර කර ඇති සමාගම්වලට පමණයි. අපි අහන්න කැමැතියි, මේ කොන්දේසිය උල්ලංඝනය වුණේ කොහොමද කියලා.

6. මෙම ටෙන්ඩරයට අනුව ගල්අඟුරුවල Net Calorific Value - NCV - එක, කිලෝග්‍රෑම් ඒකකයකට කිලෝ කැලරි 5,900ක් විය යුතු බව සත්‍යයක්ද? ලක්විජය බලාගාරයට රැගෙන ආ ගල්අඟුරු එම NCV අගයට නොගැළපෙන බවට වාර්තා ලැබී තිබේද? එසේ නොගැළපෙනවාය කියන වාර්තාවල පිටපත් අපට ලැබී තිබෙනවා. රජයෙන් අපි අහන්න කැමැතියි, එහෙම නොගැළපෙනවාය කියන වාර්තා රජයට ලැබී තිබෙනවාද කියලා. පරීක්ෂණ වාර්තා ලැබීමට පෙර ගල්අඟුරු බොයිලේරුවලට ඇතුළත් කිරීමක් සිද්ධ වෙලා තිබෙනවාද? තවත් අපට අහන්නට ලැබී තිබෙනවා, මේ වාර්තා ලැබෙන්නට පෙර කඩිමුඩියේම මේ ආනයනය කරපු ගල්අඟුරු බොයිලේරුවලට ඇතුළු කර තිබෙනවාය කියලා. ඒක සත්‍යයක්ද, ඊට අනුමැතිය ලබා දුන්නේ කවුද, කුමන පදනමක් හෝ නීතියක් යටතේද එය ලබා දුන්නේ කියන එක මේ අවස්ථාවේදී අපි අහන්න කැමැතියි.

7. ගල්අඟුරු සාම්පල් ඉන්දියාවට හෝ වෙනත් රටකට පරීක්ෂාව සඳහා යවා තිබේද? යවා තිබෙනවා නම් ඒ කවදාද? එම පරීක්ෂණ වාර්තා මේ වන විට ලැබී තිබේද? ලැබී තිබෙනවා නම්, ඒවා සභාගත කරන්නේද? ඒවා ලැබී නැත්නම්, මෙතෙක් එම වාර්තා ප්‍රමාදවීමට හේතු කවරේද?

8 බාල ගල්අඟුරු හේතුවෙන් එක් බොයිලේරුවකට පැයකට ගල්අඟුරු දහනය මෙට්‍රික් ටොන් 107 සිට 120ක් දක්වා ඉහළ ගොස් ඇති බව අමාත්‍යවරයා පිළිගන්නේද? ඒ කියන්නේ, බාල ගල්අඟුරු නිසා දහනයට අවශ්‍ය ගල්අඟුරු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. ඒ වැඩිවීම තුළ රටටත්, රජයටත් රුපියල් බිලියන 10කට -කෝටි 1,000කට- වැඩි පාඩුවක් සිදු වන බව අමාත්‍යවරයා පිළිගන්නවාද, ඒක ප්‍රතික්ෂේප කරනවාද, ඒ කරුණු කාරණාවලට තුඩු දුන් අමතර විස්තර කවරේද කියලා අපි එතුමාගෙන් අහන්න කැමැතියි.

9. මෙම අතිරේක ගල්අඟුරු දහනය හේතුවෙන් වසර පුරා අවශ්‍ය ගල්අඟුරු තොග කලින් අවසන් වීමේ අවදානමක් පවතින බව අමාත්‍යවරයා පිළිගන්නේද? බාල ගල්අඟුරු භාවිතය හේතුවෙන් බොයිලේරුවලට හානි, කාර්යක්ෂමතාව පහළ යෑම, බලාගාර ආයු කාලය අඩුවීම පිළිබඳ යම් කිසි අවදානම් ඇගැයීමක් සිදු කර තිබේද?

අපි මෙම ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තු වනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)

ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථාවර නියෝග 27(2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. නැත.

වර්ෂ 2025-2026 දක්වා ගල්අඟුරු සැපයීම සඳහා වන ප්‍රසම්පාදනයට - LCC/25/TT/1 - ලංකා ගල්අඟුරු සමාගමේ ලියාපදිංචි, පූර්ව සුදුසුකම් සපුරන ලද, එනම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1.3 අනුව සීමිත තරගකාරී ලංසු ක්‍රමය අනුව තෝරා ගත් ගල්අඟුරු සැපයුම්කරුවන්ගෙන් ලංසු කැඳවීම සිදු කරන ලදී. ලියාපදිංචි සැපයුම්කරුවන් තෝරා ගනු ලැබුවේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල 3.4ට අනුකූලව ජාත්‍යන්තර තරගකාරී ලංසු කැඳවීම මඟිනි.

මෙම ගල්අඟුරු සැපයීමේදී තාක්ෂණික දෝෂයක් හෝ මහජන මුදල් අවදානමකට ලක් කිරීමක් හෝ බලශක්ති සුරක්ෂිතතාවට බාධාවක් සිදුව නැත. එබැවින්, එය පාලන අසාර්ථකත්වයක් බව අමාත්‍යවරයා ලෙස මම විසින් පිළිනොගනිමි.

මෙම ටෙන්ඩරය සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අභියාචනා මණ්ඩලය වෙත කිසිදු ලංසුකරුවෙකු අභියාචනා ඉදිරිපත් කිරීමක් ද සිදු කර නොමැත.

[ගරු කුමාර ජයකොඩි මහතා]

2. අදාළ අනුමැතීන් සභාගත කළ හැකිය.

ප්‍රසම්පාදනය සඳහා ඇති කාල සීමාව දින 21 දක්වා අඩු කළ බව පිළිගනී. එය සිදු කරන ලද්දේ ජාතික ප්‍රසම්පාදන කොමිසමේ - NPCහි - කැමැත්ත, consent එක මත වන අතර, ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ - Standing High Level Procurement Committee එකේ - අනුමැතිය ලබා දීමෙන් පසුව දින 21 දක්වා කාලය අඩු කර ඇත.

ඊට අදාළ ජාතික ප්‍රසම්පාදන කොමිසමේ කැමැත්ත දක්වන ලද ලිපිය සහ ඉහළ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට අදාළ ලේඛන ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

තවද, ලංසුකරුවන්ගෙන් ලැබුණු ඉල්ලීම් සලකා බලා තවත් දින 7කින් කාල සීමාව දීර්ඝ කර ඇති අතර, ඒ අනුව සම්පූර්ණයෙන් දින 28ක කාල සීමාවක් ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇත.

ගරු කථානායකතුමනි, ඇත්තටම 2023 සිට මෙම ටෙන්ඩරය දක්වා කිසිදු වලංගු ටෙන්ඩර් කැඳවීමක් සිදු නොකර තමයි මෙම සැපයීම සිදු කර තිබෙන්නේ. පසුගිය ආණ්ඩුව විසින් ඉතා වංචාකාරී සහ දූෂිත ලෙස කැබිනට් මණ්ඩල අනුමැතියක් හරහා කිසිම සුදුසුකමක් නැති, එකම එක සැපයුම්කරුවෙකුට දීලා තිබෙනවා, රුසියාව හරහා නීති විරෝධී ලෙස සැපයීමට. ඒවා ගැන මේ පාර්ලිමේන්තුවේ කථා කළාද කියලා මට සැක සහිතයි. මොකද, මේක මුලිකවම ඉදිරිපත් කළ මන්ත්‍රීවරයා අද පාර්ලිමේන්තුවේ නැහැ. එතුමන්ලාගේ ළඟ සම්බන්ධකමක් තිබෙන, පසුගිය රෙජිමයේ ඥාති සම්බන්ධකම් තිබෙන කොම්පැනියක් තමයි කලින් සැපයුවේ කැබිනට් මණ්ඩල අනුමැතියෙන්. කිසිම ටෙන්ඩරයක් නැහැ. ටෙන්ඩරයක් call කළාම ටෙන්ඩරයේ prices බලලා, ඒකට counter-price එකක්, පොඩි ගණනක් අඩු කරලා දීලා Cabinet Paper එකෙන් තමයි ඒගොල්ලන් ඒවා සපයා තිබෙන්නේ. ඒගොල්ලන් වෙන කොහේවත් රටකට මේවා සපයලාත් නැහැ. කිසිම මූලික සුදුසුකමක් තිබිලාත් නැහැ. වෙනත් සමාගමක මූල්‍ය සුදුසුකම්, සැපයුම් සුදුසුකම් කැබිනට් මණ්ඩලයට පෙන්වලා තමයි ඒගොල්ලන් සැපයීම කරලා තිබෙන්නේ. මම හිතන විධියට, මේ ප්‍රශ්නය ගොඩක් කලින් අහන්න ඕනෑ ප්‍රශ්නයක්.

3. මීට පෙර අවසානයට කැඳවන ලද ගල් අඟුරු ප්‍රසම්පාදනයට - LCC/24/TT/1 - අයදුම් කිරීම සඳහා තිබිය යුතු තාක්ෂණික සුදුසුකම් වූයේ මෙම ප්‍රසම්පාදනයේදී සලකා බලන ලද තාක්ෂණික සුදුසුකම්ම වන අතර, කිසිම දෙයක් සංශෝධනය කරලා තිබුණේ නැහැ. ඒ කියන්නේ, 2023ට කලින් ටෙන්ඩරවල තිබුණු එකම තමයි මේ 2025 ටෙන්ඩරයටත් සම්බන්ධ වුණේ.

මූල්‍ය සුදුසුකම්ද මෙම ප්‍රසම්පාදනයේදී සලකා බලන ලද මූල්‍ය සුදුසුකම්ම වෙයි. ඒවා නම්, තාක්ෂණික සුදුසුකම් සහ දළ කැලරි අගයයි.

අවම වශයෙන් පසුගිය මාස 36 තුළ කිලෝග්‍රෑමයට කිලෝ කැලරි 5,900ක් - GCV, 5900 kcal/kg - අවම වශයෙන් මෙට්‍රික් ටොන් 100,000ක් සමඟ සම්පූර්ණ මෙට්‍රික් ටොන් 500,000ක ගල් අඟුරු සැපයීමේ අත්දැකීම් ලබා තිබීම ඇතුළු නිර්ණායක සලකා බලනු ලබයි. ඊට අදාළ ලේඛනය ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

විශේෂයෙන්ම ගරු විපක්ෂ නායකතුමාට මම කියන්න කැමැතියි, Net Calorific Value- NCV - එක නොවෙයි, මේ ගිවිසුම් අනුව මේ ප්‍රසම්පාදනයෙන් සලකන්නේ කියන එක. ඒකත් පරීක්ෂා කරනවා තමයි. නමුත් Gross Calorific Value එක තමයි සලකන්නේ.

ඊළඟට, ප්‍රධාන සුදුසුකම තමයි, මූල්‍ය සුදුසුකම. පසුගිය වසර 03 තුළ අවම වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 150ක පිරිවැටුමක් තිබීම සලකා බලනවා. රජය විසින් මෙවර එම කොන්දේසි වෙනස් කිරීමක් හෝ ලිහිල් කිරීමක් හෝ ඉවත් කිරීමක් සිදු කර නොමැත. ඒ ලියකියවිලිත් මම සභාගත කරන්නම්.

4. මෙම ප්‍රසම්පාදනය සඳහා ලංසු 10ක් ඉදිරිපත්ව තිබුණා. එම ලංසු ඇගයීම් වාර්තාව ඇමුණුම 03 වශයෙන් ඉදිරිපත් කරමි. එය ගල් අඟුරු සැපයුම් ඉතිහාසයේ වැඩිම තරගකාරී ලංසුකරුවන් සහභාගි වූ ප්‍රසම්පාදනයයි.

5. ඔව්.

වැඩිමනක් වශයෙන් පිළිතුර 1හි සහ 3හි සඳහන් පරිදි නොරොච්චෝලේ ලක්විජය ගල් අඟුරු බලාගාරයට ගල් අඟුරු සැපයීමට සුදුසුකම් ඇති සැපයුම්කරුවන් පමණක් ලියාපදිංචි කරගෙන ඇති නිසා මෙම සැපයුම්කරුටද එම සැපයුම් අත්දැකීම් ඇති බව ලියාපදිංචියේදී ඉදිරිපත් කරන ලද ලිඛිත ලේඛන අනුව සඳහන් කළ හැකිය.

විපක්ෂ නායකතුමා අහලා තිබෙනවා, විදුලි නිෂ්පාදනයක් භාර දීලා තිබෙන්නේ ඇයි කියලා. මෙම සමාගම මඟින් ශ්‍රී ලංකාව තුළ කිසිදු විදුලි නිෂ්පාදනයක් සිදු නොකරන අතර, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට 2026 අප්‍රේල් දක්වා මෙට්‍රික් ටොන් ලක්ෂ 15ක් සැපයීමට පමණක් ගිවිසුම්ගත වී ඇත.

6. මීට අදාළ පිළිතුරේ මම කලින් කියපු කාරණයමයි තිබෙන්නේ. Net Calorific Value - NCV- එක 5900 kcal/kg විය යුතු බව සත්‍ය නොවෙයි.

සාමාන්‍යයෙන් අනෙකුත් පිරිවිතරයන් අතර ගල් අඟුරුවල දළ කැලරි අගය හෙවත් Gross Calorific Value එක සාමාන්‍යයෙන් 5900-6150 අතර හෝ ඊට ඉහළ අගයක ඇති ගල් අඟුරු සැපයුම්කරුවන් විසින් සැපයිය යුතු අතර, යම් හෙයකින් එම පිරිවිතරය අපගමනය වුවහොත් දඩ මුදල් අය කර ගැනීම සිදු කරනු ලබයි.

ප්‍රසම්පාදනයට අදාළ ගිවිසුම අනුව පැටවුම් වරායේ පරීක්ෂණ වාර්තාව - Load Port Report - පරිදි පිරිවිතරවලට අනුකූල වන ගල් අඟුරු ලැබී ඇත.

ගොඩබෑම් වරායේ පරීක්ෂණ වාර්තාව - Discharge Port Report - අනුව පළමු නැව් තොගයේ - Gross Calorific Value - අගය 5520 kcal/kgකි. එහි ස්වාධීන තත්ත්ව පරීක්ෂණ වාර්තාව අපට ලැබිලා තිබෙනවා. එය මට සභාගත කරන්න පුළුවන්.

එම ගල් අඟුරු සැපයීමට අදාළ ගිවිසුමේ 5.6 වගන්තියට අනුව දඩ මුදල දෙගුණයකින් අය කරනු ලබයි. ඒ සඳහා දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 2කට ආසන්න දඩ මුදලක් අය කරනු ලබයි.

ඒක අපි හරියටම ගත්තොත් ගරු කථානායකතුමනි, "M.V. Ceylon Breeze" කියන අපේ Ceylon Shipping Corporation එකේ නැවකින්මයි එම තොගය ගෙනැල්ලා තිබෙන්නේ. ඒකෙන් දඩ මුදල විධියට අපට අය කර ගන්න වනවා, ඩොලර් 2,079,749.93ක්. මොකද, ඒකට අපි සියයට 80ක් ගෙව්වාට සියයට 20ක් ඉතුරු තිබෙනවා. ඒ වාගේම මිලියන එකහමාරකම තොගයට අදාළ සියයට 10ක කාර්ය සාධන ඇපකරයක් - performance bond එකක් - අප ළඟ රඳවාගෙන තිබෙනවා. එම නිසා අපට එම මුදල අය කර ගැනීමේ කිසිම අපහසුවක් නැහැ. එයට නීතිමය හැකියාවත් තිබෙනවා.

දෙවන නැව් තොගයට අදාළ වාර්තාවේ Gross Calorific Value එක 6017 kcal/kgකි. ඒ අනුව දෙවන නැව් තොගය අදාළ පිරිවිතර පරාසයන් තුළ ඇත. දැන් තුන්වන තොගයත් ඇවිත් ගොඩබානවා.

පැටවුම් වරායේ පරීක්ෂණ වාර්තාව මත පදනම්ව ගල් අඟුරු බොයිලේරුවලට දමා ඇත. එම ගල් අඟුරු බොයිලේරුවට දමන ලද්දේ පැටවුම් වරායේ පරීක්ෂණ වාර්තා අනුව බොයිලේරුවට දැමීමේ අවදානමක් නොමැති නිසාය. පැටවුම් වරායේ වාර්තාවේ බලාගාරයේ පිරිවිතරයන්ට අනුකූල ගල් අඟුරු ඇත්නම් පමණක් -ප්‍රතික්ෂේපිත අගයන් නොවන - භාර ගන්නා අතර ප්‍රතික්ෂේපිත අගයන් - rejected values - නම් හෝ එය ඉක්මවයි නම් එම ගල් අඟුරු තොගය භාර නොගනී. ඒක ගිවිසුමේ පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා. එහි නීතිමය පදනම වන්නේ පැටවුම් වරායේ වාර්තාව අනුව ගොඩබාන ගල් අඟුරු බලාගාරයේ අවශ්‍යතාව මත දහනය කළ හැකි වීමයි.

7. වෙනත් රටකට යවා නැත. ඉන්දියාවට පමණක් යවා ඇත.

ජාත්‍යන්තර ප්‍රමිති සහතික ලත් ගල් අඟුරු පරීක්ෂණ රසායනාගාරයක් - accredited laboratory එකක් - ලංකාවේ නැත. ඒ සඳහා මම මැදිහත් වෙලා ITI එකත් සමඟ සාකච්ඡා කරලා අවශ්‍ය මූලික කටයුතු සිදු කර තිබෙනවා. මෙම වසර තුළ බොහෝ විට ගල් අඟුරු පරීක්ෂණ රසායනාගාරය ආරම්භ කිරීමට මම බලාපොරොත්තු වනවා.

ඇත්තටම ආණ්ඩුව භාර ගත්ත වෙලාවේ සිටම මේ ප්‍රශ්නය අපි දැක්කා. ගල් අඟුරුවල ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්. එම නිසා තමයි අපි ගල් අඟුරු පරීක්ෂණ රසායනාගාරයක් ආරම්භ කරන්න කටයුතු කරන්නේ. නමුත්, ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රසූත්‍ර ITI එකේ නැහැ. මම ඊයේත් එම ආයතනයේ සභාපතිතුමා එක්ක මේ ගැන කථා කළා. අපට ඉතා ඉක්මනින් එය ආරම්භ කරන්න පුළුවන් වෙයි. ඒ අනුව අපට ඉන්දියාවට හෝ වෙනත් රටකට සාම්පල් යැවීමේ අවශ්‍යතාවක් නැහැ. ඉතිහාසයේ පළමු වරට මේ වතාවේ තමයි මම හිතන්නේ ලංකාවේ ඉඳලා සාම්පල් හරියට track කරලා, හරියට seal කරලා යැව්වේ. වෙනදාට සාම්පල් යැව්වාද, නැද්ද කියලා මුකුත් නැහැ. මේ සැරේ තමයි සාම්පල් හරියට track කරලා ඉන්දියාවට යැව්වේ. මොකද, වෙන සාම්පල්වල reports එන්නත් පුළුවන්.

එම නිසා ලක්විජය බලාගාරය විසින් කැඳවන ලද ලංකා ගල්අඟුරු සමාගමේ ද නියෝජනය සහිත ප්‍රසම්පාදන කටයුත්තක් මඟින් තෝරාගෙන ඇති ජාත්‍යන්තර සමාගම වන Cotecna Inspection India නැමති සාම්පල පරීක්ෂා කරන ආයතනයට 2026.01.06 සහ 2026.01.13 දිනවල යවා ඇත. එය ස්වාධීන තත්ත්ව පරීක්ෂණ ආයතනයක්. එම වාර්තා දෙකම 2026.01.19 දින - ඊයේ දින - අප වෙත ලැබී ඇත. එම වාර්තා දෙක ඇමුණුම 04 ලෙස ඉදිරිපත් කරමි.

ඇමුණුම් 01, 02, 03 සහ 04 **සභාගත*** කරමි.

වාර්තා ලබා දීම ප්‍රමාද වන අවස්ථාවලදී දඬ මුදල් අය කිරීමක් සහ අකුසලතා - demerit - ලකුණු කිරීමක් සිදු කරනු ලබයි. මීට පෙර ද මෙම සේවාව ප්‍රසම්පාදන ක්‍රමවේද හරහා ඉන්දියාවේ වෙනත් සමාගම්වලින් ලබාගෙන ඇත.

ඇත්තටම මේක විශේෂයෙන්ම කියන්න ඕනෑ. අර කිව්වා වාගේ 2023 සිට 2025 දක්වාම දීර්ඝ වශයෙන්ම වර්ෂ 2ක් කෙළින්ම Russian ගල් අඟුරුවල specificationවලට විතරක් ගෙනැල්ලා, ඒවායේ කිසිම deviation එකක් නැති විධියට තමයි වාර්තා කර තිබෙන්නේ. සාමාන්‍යයෙන් මේක minesවලින් ගන්නා එකක්. South Africa එක්ක 2020, 2021, 2022 අවුරුදු තුනේම ගත්තත් වෙනස්කම් වෙලා තිබෙනවා. ඒ වෙනස්කම්වලට penalties ගහලා, අඩු වෙච්ච calorific value එකට අදාළව penalties ගත්ත විස්තරත් මා ළඟ තිබෙනවා. ඕනෑ නම් සභාගත කරන්න පුළුවන්. මොකද, මේක අලුත් දෙයක් නොවෙයි. අලුත් දෙයක් විධියට පෙන්වන්න හැදුවාට මේ වාගේ සැපයුම්වලදී සාමාන්‍යයෙන් ඇති වන දෙයක්. ඒ නිසා ඒ ගිවිසුමට fly ash වැඩි වීම ද, Gross Calorific Value එක අඩු වීම ද සඳහා වෙනම formulas තිබෙනවා, ඒකට කොහොමද penalty ගහන්නේ කියලා. මොකද, මේවා ඉබේ එනවා නොවෙයි. ලෝකයේම සම්මත දේවල්. ලෝකෙන්ම ගත්ත ගිවිසුම් තමයි මේ ගහලා තිබෙන්නේ. ඉතින්, ඒවා ගිවිසුමේ තිබෙනවා. ඒවායේ ඇතුළේ දාලා තිබෙන්නේ; already included. එහෙම තිබියදී අපි මතුපිටින් අරගෙන කථා කරන එක කිසිම වැඩක් නැහැ. මොකද, මේකෙන් රටට හෝ ආයතනයට කිසිම මූල්‍යමය පාඩුවක් නොවෙන්න කටයුතු කරන්න අවශ්‍ය ඉඩ අපට අනිවාර්යයෙන් තිබෙනවා.

8. නැත.

ප්‍රතික්ෂේප කරනු ලබයි.

බලාගාරයේ අවශ්‍යතාවට අනුකූල ගල් අඟුරු පැටවුම් වරායේ පරීක්ෂණ වාර්තාව අනුව ලබාගෙන ඇති නිසා බාල ගල් අඟුරු ලෙස නාමකරණය කිරීම නිවැරදි නොවේ. තවද, ගල් අඟුරුවල ගුණාත්මකභාවය මනින පරාමිතීන් 09ක් ඇත. පළමු නැව් තොගයේ ප්‍රතික්ෂේපිත මට්ටමේ ඇත්තේ පරාමිතීන් 03ක් පමණි. එම නිසා එය බාල ගල් අඟුරු ලෙස සැලකීම නිවැරදි නොවේ. දෙවන ගල් අඟුරු නැව් තොගයේ සියලුම පරාමිතීන් අදාළ පරාසයන් තුළ පවතී. මෙම ගල් අඟුරු තොගය භාවිත කරමින් විදුලිය නිපදවීම නිසා ආර්ථික වශයෙන් කිසිදු පාඩුවක් ඇති විය නොහැක.

9. නැත.

එක් ගල් අඟුරු තොගයක් මත වසරක කාලයකට කරන පුරෝකථනයක් නිවැරදි නොවන අතර, බොයිලේරුවට බලපෑමක් හෝ ආයු කාලය අඩුවීමක් සැලකිය යුතු ලෙස හේතුවක් නොවේ.

ගල් අඟුරු තොග කලින් අවසන් වීමේ අවදානමක් නොමැත.

මොකද, ඇත්තටම අපි ගිය අවුරුද්දේ දෙසැම්බර් වෙනකල් ආනයනය කරපු, පෙබරවාරි මාසයේ අග වෙනකල් අවශ්‍ය ගල් අඟුරු තොග තිබෙනවා. සාමාන්‍යයෙන් මාසයකට මෙට්‍රික්ටොන් 2,500ක් යනවා එක unit එකකට. එතකොට units තුනම පාවිච්චි කළොත් අපට මෙට්‍රික්ටොන් 7,500ක් යනවා. ඒ කියන්නේ උපරිම capacity එකෙන්. ඇත්තටම units තුන පසුගිය දවස්වල එකක් විධියට තිබුණේ. ඊයේ වෙනකොට තමයි units 03ම ආයෙත් ක්‍රියාකාරී මට්ටමට වැටුණේ. ඒ නිසා අපට මේ එන තොග එක්ක ජුනි මාසය පහුවෙනකල් කිසිම අවදානමක් නැහැ. අප්‍රේල්වල ඒගොල්ලන් මේ සැපයීම අවසන් කරන්න ඕනෑ. දැනට සමාගම සතුව නොරොච්චෝලේ අපේ ගබඩාවල මෙට්‍රික්ටොන් 450,000ක් තිබෙනවා. තවත් මෙට්‍රික්ටොන් 1,380,000ක් ලැබීමට නියමිතව පවතිනවා. මම හිතන විධියට, අර පළමු තොගයේ තිබුණු අඩුපාඩුව වෙනස් වෙලා දැන් ඉස්සරහට එනවා. ඒකටත් අපි ගිවිසුම් අනුව නිසි ක්‍රියාමාර්ග ගන්නවා. ජාත්‍යන්තර මිලදී ගැනීම්වලදී මේ වාගේ දේවල් වෙනවා. මේක අපි pavement එකෙන් බඩු ගන්නවා වාගේ නොවෙයි. ඒවා අධ්‍යයනය කරලා, මේ ගැන අර constructive criticismවලට යනවා නම් බොහොම වැදගත් කියලා අපි සලකනවා. මොකද, මේවා අලුත්

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කුමාර ජයකොඩි මහතා]

දේවල් නොවෙයි. හැබැයි, ගොඩක් අයට රිදිලා තිබෙනවා. අපේ මන්ත්‍රීතුමෙක් බොහොම දැහැලුවා. මොකද, ඒගොල්ලන්ට රිදිලා තිබෙනවා. මොකද, ඒගොල්ලන්ගේ supplierට loss එකක් වුණා. ඒගොල්ලන්ගේ supplierට ගන්න බැරි වුණා මේ සැරේ. Russian coal සාමාන්‍යයෙන් sanctions නිසා අඩුවෙන්න ඕනෑ. ඔහුගේ ගණන මේ සැරේ tender එකේ වැඩි වුණා. ලොකු දේවල් කළා, ටෙන්ඩර් නැතුව එන්න. Cabinet Papers එව්වා, මේවායේ තිබෙන ඒවා අනුව හදලා එවන්න, ඔහුව අනුමත කරන්න කියලා, ඔහුගේ කාලය මදි කියලා. කාලයත් හරි ගියාට පසු ඔහුට අන්තිමට මේකෙන් loss එකක් වුණා මුදලත් එක්ක. Bid එක හරිම competitive. අපි කිසිම දේශපාලන ඇඟිලි ගැසීමක් හෝ රජය විධියට කිසිම ඇඟිලි ගැසීමක් කරන්නේ නැහැ. ඔය කිසිම සැපයුම්කරුවෙක් මම දැකලත් නැහැ, හමුවෙලාත් නැහැ. කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා සුදුසුකම් හදලා දුන්නෙත් නැහැ. ඒවාට රිදුණු කට්ටිය එක්ක විපක්ෂ නායකතුමා එක පේළියට හිට ගන්නකොට චූට්ටක් පරිස්සමින් ඒක කරන්න. මොකද, ඒගොල්ලන් එතැන නොවෙයි ඉන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, ඔබතුමා විශේෂයෙන්ම මන්ත්‍රීවරයෙක් ගැන කථා කළා. පැහැදිලිව කියන්න. මොකද, "මන්ත්‍රීවරයෙක්" කියලා කිව්වාම විපක්ෂයේ අපිත් මන්ත්‍රීවරු. කිසිම දවසක ගල් අඟුරු ක්‍රියාවලියට අපේ කිසිම සම්බන්ධයක් තිබුණේ නැහැ. ඇත්ත වශයෙන්ම මම මේ ප්‍රශ්නය ඇහුවේ සමාජයේ විශාල කථාබහකට ලක් වෙන කාරණාවක් නිසා, ඒ පිළිබඳව කරුණු පැහැදිලි කර ගන්නයි.

මට ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් හැටියට අහන්න කාරණයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම ප්‍රධාන කොන්දේසියක් තිබෙනවා නේ සුදුසුකම් මත ගල් අඟුරු සැපයීම සම්බන්ධව යම්කිසි පළපුරුද්දක් තිබෙන්න ඕනෑ කියලා. ඒකේ තිබෙනවා නේ මෙට්‍රික් ටොන් මිලියනයක ප්‍රමාණයක්වත් ව්‍යාපාර කළ සමාගම්වලටයි ඒක ලබා දෙන්නේ කියලා. එහෙම තිබෙනවා නේ. ඒ වාගේම කිලෝග්‍රෑමයට කිලෝ කැලරි 5,900ක මට්ටමේ පවතින ගල් අඟුරු සපයපු පළපුරුද්ද තිබෙන්න ඕනෑ. පැහැදිලිවම අපි දන්නවා එවැනි පළපුරුද්දක් නොමැති ආයතනයකට තමයි මේක ලැබිලා තිබෙන්නේ කියලා. මේ සිදුවී තිබෙන ගනුදෙනුව පිළිබඳව සමාජයේ ලොකු කතිකාවක් තිබෙනවා, ලොකු කුතුහලයක් තිබෙනවා. අන්න ඒ ගැන ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා.

ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් මේ ටෙන්ඩර් කැඳවීම් ක්‍රියාත්මක කරන්නේ අප්‍රේල් මාසයේ නේ. එහෙම නේද? ඔබතුමන්ලා අප්‍රේල් මාසයේ කැඳවන්න ඕනෑ ටෙන්ඩර් එක ඒ කාල වකවානුව පන්නලා කැඳවීම් කරලා තිබෙන්නේ. ඉතින් මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, කොහොමද එහෙම වෙන්නේ කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ටෙන්ඩර් ක්‍රියාපටිය, ගල් අඟුරු ආනයනය කිරීම, ඒ වාගේම වාරකන් කාලය මග හරවාගෙන මේවා රටට සපයා ගැනීම කියන මේ කරුණු කාරණා මත ඒ ක්‍රියාත්මක වුණු කාල පරිච්ඡේදයේ වෙනසක් සිද්ධ වෙලා තිබෙනවා. ඒක කොහොමද සිද්ධ වුණේ?

අනෙක් කාරණය මෙයයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අවසන් කරන්න. ඔබතුමා දැන් කාරණා ගොඩක් ඇහුවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මේ, අවසාන කාරණාව, ගරු කථානායකතුමනි. ගරු ඇමතිතුමනි, පැහැදිලිවම මේ කාරණාව පිළිබඳව ආංශික අධීක්ෂණ කාරක සභාවට - Sectoral Oversight Committee එකට - අදාළ නිලධාරින් ගෙන්වලා ප්‍රශ්න කරනකොට, -ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමාගේ සභාපතිත්වයෙන් තමයි ඒ ප්‍රශ්න කිරීම කළේ- ඒ අය පිළිගෙන තිබෙනවා අඩුපාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා කියලා. එහෙම අඩුපාඩුවක් සිද්ධ වෙලා තිබෙන මොහොතක මම ඔබතුමාට යෝජනා කරනවා ඒ පිළිබඳව සම්පූර්ණ forensic audit එකක් කරලා, ඒ වාර්තාව මේ සභාවට ඉදිරිපත් කරන්න කටයුතු කරන්න කියලා. එතකොට හැමෝටම පුළුවන් මේ කරුණු කාරණා සියල්ල පිළිබඳවම හොඳ අවබෝධයක් ලබා ගන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, විපක්ෂ නායකතුමාගෙන් අහන්න කැමැතියි ඒ කියපු අඩුපාඩුව මොකක්ද කියලා. මොකද, ඒකට අපට සහභාගි වෙන්න බැරි නිසා මම දැනුවත් නැහැ. අඩුපාඩුවක් වෙලා තිබෙනවා කියලා පිළිගත්තාය කිව්වා නේ. මොකක්ද ඒ අඩුපාඩුව? SOC එකේදී පිළිගත්තා කිව්වා නේ, අඩුපාඩුවක් වුණා කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම මේ ඉදිරිපත් කළ කරුණු කාරණා සම්බන්ධයෙන් යම් අඩුපාඩුකම් සිදු වුණා කියලා යම් යම් නිලධාරින් සාක්ෂි ඉදිරිපත් කළා, කරුණු ඉදිරිපත් කළා. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා ඒ පිළිබඳව-

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, මොකක්ද අඩුපාඩුව කියලා පැහැදිලි නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ගරු අමාත්‍යතුමා, කෙටියෙන් පිළිතුරු ලබා දෙන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

ගරු කථානායකතුමනි, එතුමාගේ පළමුවෙනි කාරණයට පිළිතුර ප්‍රශ්න අංක 3ට අදාළ පිළිතුරේ තිබෙනවා. මොකද, මේක pre-qualification කළ ටෙන්ඩර් එකක්. Pre-qualification කරලා තමයි ඒ අයව බඳවාගෙන තිබෙන්නේ. ඒ pre-qualification එකෙන් විසි ගාණක් සුදුසුකම් ලබලා තිබෙනවා. ඒගොල්ලන්ගෙන් දසදෙනෙකු තමයි bid එකට ලංසු ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒකට අදාළ මූලික දේවල් තමයි ප්‍රශ්න අංක 3 සඳහා වන පිළිතුරේ කියන්නේ. Gross calorific value එක කිලෝග්‍රෑමයට කිලෝ කැලරි 5,900ක මට්ටමේ තිබෙන ගල් අඟුරු අවම වශයෙන් මෙට්‍රික් ටොන් 100,000ක් සමඟ සම්පූර්ණ මෙට්‍රික් ටොන් 500,000ක් සපයලා තිබෙන්න ඕනෑ. ඒ සුදුසුකම් ප්‍රසම්පාදන කමිටුව හරහා පරීක්ෂා කරලා තමයි ඒක දීලා තිබෙන්නේ. එහෙම නැත්නම් අනිවාර්යයෙන් ඔය විසිදෙනාගෙන් එක්කෙනෙකුට හරි පුළුවන් Appeal Board එකට ගිහින් ඒකට challenge කරන්න. කවුරුවත් එහෙම කරලාත් නැහැ. ඇත්තටම දේශපාලනඥයෝ විධියට අපි ඒවා බලලාත් නැහැ. ඒ හින්දා ඔබතුමාට එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම්, - ඔබතුමා කියනවා නේ පැහැදිලිවම ඒක දන්නවා කියලා - ඒකට සාක්ෂි ඉදිරිපත් කළා නම් වඩා වැදගත්. මොකද, ඒක ඒ නිලධාරින්, ඒ කමිටුව විසින් පරීක්ෂා කර බලලා තිබෙන්නේ. අඩුම ගාණේ මෙච්චර කල් නීති විරෝධී විධියට සපයපු Potencia FZ LLC කියන සමාගමවත් ඒකට challenge කරලා නැහැ. ඉතින් ඒක නිසා පැහැදිලිවම,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, අවසන් කරන්න. මේ ප්‍රශ්නය මෙතැනින් අවසන් කරන්න ඕනෑ. ස්ථාවර නියෝග 27 (2) යටතේ මීළඟ ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දෙන්න ඕනෑ. ගරු රවී කරුණානායක මහතා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මොකක්ද point of Order එක, ගරු විපක්ෂ නායකතුමා?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මා කරපු පැහැදිලි කිරීම තුළ මම ඇහුවා, forensic audit එකක් කරලා ඒ වාර්තාව සභාගත කරනවාද කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක point of Order එකක් නොවෙයි. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා- *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒකට උත්තර දුන්නේ නැහැ. ඒකට උත්තරය දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පිළිතුරක් ලැබුණා. ගරු අමාත්‍යතුමා පිළිතුර ලබා දුන්නා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා දැන් පිළිතුර ලබා දීලා අවසන් කළා නේද?

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)

අවශ්‍ය කටයුතු කරනවාද කියලා නේ ඇහුවේ. ඒ ගැන සොයා බලලා අපි අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

වාර්තාව සභාගත කරනවාද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ මීළඟ ප්‍රශ්නය, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා.

## II

## සංචාරක ක්ෂේත්‍රයේ ඒක පුද්ගල සංචාරක වියදම් සහ විදේශ විනිමය ඉපැයීම් අඩුවීම
சுற்றுலாப் பயணிகளின் தனிநபர் செலவு மற்றும் சுற்றுலாத் துறையில் அந்நியச் செலாவணி வருவாய் குறைவு
DECREASE IN PER CAPITA SPENDING OF TOURISTS AND FOREIGN EXCHANGE EARNINGS IN TOURISM SECTOR

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු කථානායකතුමනි, වාර්තාගත සංචාරක පැමිණීම් සහ පහත වැටෙන ඒක පුද්ගල සංචාරක ආදායම, බැංකු පද්ධතියට ලැබෙන දුර්වල විදේශ විනිමය ගලා ඒම් සහ හෝටල් ඒකක 40,000ක් ලියාපදිංචි වී නොමැති වීම, ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ පවතින නියාමන අසාර්ථකත්වය යන ජාතික වැදගත්කමකින් යුත් කරුණු සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 27 (2) යටතේ මම පැහැදිලි කිරීමක් අපේක්ෂා කරමි.

2025 වසරේ ශ්‍රී ලංකාව සංචාරක පැමිණීම මිලියන 2.36කට අධික ප්‍රමාණයක් වාර්තා කළ ද, මුළු සංචාරක ආදායම දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 3.22ක් දක්වා සුළු

[ගරු රවී කරුණානායක මහතා]

වශයෙන් පමණක් වැඩි වී ඇති අතර, සංචාරකයෙකුගේ සාමාන්‍ය වියදම වසරින් වසර සියයට 12කින් පමණ පහත වැටී ඇත. ඒ අතරම, ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිතවලින් පිළිබිඹු වන සංචාරක ක්ෂේත්‍රයට අදාළ විදේශ විනිමය ගලා ඒම් පැමිණීම්වලට සාපේක්ෂව වර්ධනය වී නොමැති අතර, එමඟින් ආදායමේ ගුණාත්මකභාවය, විදේශීය පියවීම් - offshore settlements, නොනිල මට්ටමේ ගනුදෙනු සහ දුර්වල නීති ක්‍රියාත්මක කිරීම් පිළිබඳව කනස්සල්ලක් මතු කරයි.

ඒ අනුව, මම පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් අපේක්ෂා කරමි.

1. මූලාශ්‍ර වෙළෙඳ පොළ වෙනස්වීම්, රැඳී සිටින කාලය සහ මිල නියම කිරීමේ ක්‍රමවේදයන් ඇතුළුව, ඉහළ සංචාරක පැමිණීම් මධ්‍යයේ වුවද ඒක පුද්ගල සංචාරක ආදායම පහත වැටීමට බලපාන ප්‍රධාන ව්‍යුහාත්මක හේතු මොනවාද?

2. 2025 වසරේදී බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා සැබැවින්ම මාරු කරන ලද සහ මහ බැංකු සංචිතවල පිළිබිඹු වන මුළු සංචාරක විදේශ විනිමය ප්‍රමාණය කොපමණද?

   ඒ කියන්නේ, 2,360,000 touristsලා ආවාට ඒක පුද්ගල සංචාරක ආදායම ඇමෙරිකානු ඩොලර් 184 සිට 148ට අඩු වෙලා තිබෙනවා. ඒක තමයි මේ ප්‍රශ්නයට බලපා තිබෙන්නේ.

3. මෙම අගය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් වාර්තා කරන ලද මුළු සංචාරක ආදායම සමඟ සැසඳෙන්නේ කෙසේද සහ එහි පවතින ඕනෑම විභිදීමක් - variance එකක් - පැහැදිලි කරන්නේ කුමක්ද?

4. ශ්‍රී ලංකාවට සේවා සපයන මාර්ගගත වෙන් කරවා ගැනීමේ වේදිකා - online booking platforms - මඟින් විදේශීය පියවීම් හේතුවෙන් සිදු වන විදේශ විනිමය කාන්දුවීම් සම්බන්ධයෙන් සිදු කර ඇති තක්සේරුව කුමක්ද?

Hon. Speaker, monies earned through online bookings now go out directly through gateways operated outside the country. There are two or three such countries operating here. So, when you swipe a credit card, the payment does not go through the Central Bank-operated gateways, but directly to a third-party country. As a result, it is estimated that almost Rs. 1 billion is lost to the country because, for each invoice, you charge 31 per cent of taxes: VAT, 18 per cent, SSCL, 2.5 per cent, NBT, 1 per cent and so on. So, when you add up that 31 per cent tax on an invoice, roughly, there will be Rs. 1 billion revenue erosion from the country. So, that justifies the matter I am raising through this Question.

5. What proportion of tourism activity is estimated to be conducted by unregistered accommodation providers and informal operators outside the banking system?

   This has been aptly reported in the "Daily Mirror", "The Island" and "Ceylon Today", highlighting that 40,000 institutions are not registered in the country.

6. Does the Government accept that a material share of tourism-generated foreign exchange is bypassing the domestic financial system without strengthening the Official Reserves?

7. Why has enforcement of mandatory registration, banking-channel settlement and foreign exchange repatriation requirements remain weak, despite existing legal powers?

8. When will the Government present to Parliament a tourism policy explicitly linked to earnings, foreign exchange inflows and reserve accumulation rather than reporting the number of tourist arrivals with headlines every day?

හැමදාම කියනවා, සංචාරකයෝ 5,000ක් 6,000ක් ආවා කියලා. හැබැයි, ඒ හරහා විදේශ විනිමය උපයන ප්‍රමාණයත් දවසින් දවස දෙන්න පුළුවන් නම් මේ වාගේ අවස්ථාවක හොඳයි කියලා මම කියනවා.

9. Is the Government aware that overseas credit cards are widely used for tourism payments in Sri Lanka, with invoicing and settlement occurring outside the country, thereby avoiding domestic taxation and that international booking platforms similarly process payments offshore, depriving Sri Lanka of the full taxable revenue? Therefore, what corrective action is being taken?

Thank you, Sir.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)

ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට කල් ගන්නවා. ඒ ප්‍රශ්නයට අපි ඊළඟ දවසේදී පිළිතුර ලබා දෙන්නම්.

ගරු කථානායකතුමනි, මේ සතියේ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳව මම මේ වෙලාවේ ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. විපක්ෂය විශ්වාස භංග යෝජනාවක් අත්සන් කළේ, ගරු අගමැතිතුමියට විරුද්ධවයි. ඒ වෙන මොකුත් නිසා නොවෙයි, ගරු අගමැතිතුමිය අධ්‍යාපන අමාත්‍යවරිය හැටියට එතුමියගේ අමාත්‍යාංශයෙන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කරපු නිසායි. එතකොට අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට එරෙහිව තමයි ඒ විශ්වාස භංග යෝජනාව ගෙන එන්නේ. ආණ්ඩුවක් හැටියට අප ලැහැස්තියි, එළඹෙන බ්‍රහස්පතින්දා සහ සිකුරාදා ඒ විශ්වාස භංග යෝජනාව විවාදයට අරගෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ආණ්ඩුවේ පැහැදිලි පිළිතුර ලබා දෙන්න.

යම් හෙයකින් විපක්ෂය, ඒ විශ්වාස භංග යෝජනාව විවාද කිරීම සඳහා ඒ දින දෙක පාවිච්චි කරන්නේ නැත්නම්; විශ්වාස භංග යෝජනාව ඉදිරිපත් කරන්නේ නැත්නම්; ඒ විවාදය බ්‍රහස්පතින්දා සහ සිකුරාදා -එනම්, 22 සහ 23- ගන්නේ නැත්නම් ආණ්ඩු පක්ෂය හැටියට අපි බ්‍රහස්පතින්දා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් කල් තැබීමේ විවාදයක් ඉල්ලා සිටිනවා. අපි එදා දවස පුරා ඒ ගැන විවාද කරන්න ලැහැස්තියි. එපමණක් නොවෙයි. සිකුරාදාට අපට තිබෙන්නේ, විශ්වවිද්‍යාල (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයක්. එතකොට බ්‍රහස්පතින්දා සහ සිකුරාදා කියන දවස් දෙකම මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සම්බන්ධව ආණ්ඩු පක්ෂය පැත්තෙන් විවාද කරන්න අපි සූදානම්. විපක්ෂය, ඒ දවස් දෙකේ විශ්වාස භංග යෝජනාව විවාදයට ගත්තේ නැතත් අපි ලැහැස්තියි, සම්පූර්ණයෙන් ඒ දවස් දෙක තුළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ විවාදය පවත්වන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා ඉදිරිපත් කරපු කාරණාව පිළිබඳව මටත් ප්‍රතිචාර දක්වන්න අවස්ථාව ලබා දෙන්න. ගරු කථානායකතුමනි, විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කරන ක්‍රියාවලියක් තිබෙනවා. එහිදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටියක් තිබෙනවා. ඒක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඉතාම පැහැදිලිව සඳහන් වෙනවා. විශ්වාස භංග යෝජනාවක් ඉදිරිපත් කිරීමේදී කාලය, වෙලාව, ස්ථානය කියන සියල්ල තීන්දු කිරීමේ අයිතිය අපට තිබෙනවා. ඒක, තීන්දු කරන්නේ ආණ්ඩුව නොවෙයි. ආණ්ඩුව කියන කියන ආකාරයට, කියන කියන වෙලාවට, කියන කියන තැන්වල විශ්වාස භංග යෝජනා ක්‍රියාත්මක කරන්න අපි සූදානම් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, කරුණාකර මට අවස්ථාව දෙන්න. එතුමාට අවස්ථාව දුන්නා නේ, ඒ කාරණාව කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙන්නාටම සමානව විනාඩියක කාලයක් දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම පැහැදිලිවම කියන්න කැමැතියි, අප විශ්වාස භංග යෝජනාව නිසි ලෙසට, නිසි කලට, නිසි ආකාරයට ගෙනෙන බව. මොකද, ඒකට අත්සන් නොකරපු විපක්ෂයේ තවත් මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. ඒ සියලු දෙනාගේ අත්සනුත් ලබාගෙන අපි ඒක නිසි ආකාරයට, නිසි වෙලාවට ඉදිරිපත් කරන්නම්. හැබැයි මම එක දෙයක් කියන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවසන් කරන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මම එතුමාට කියන්න කැමැතියි, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා විතරක් නොවෙයි, අධ්‍යාපනය පිළිබඳ දින තුනක විවාදයක් ඕනෑ නම් හෙට ඉඳලාම පටන් ගන්න කියලා. අපි සූදානම් ඒකට. දින දෙකක් නොවෙයි. ඒක හෙටම - බදාදාම - පටන් ගන්න. අපි සූදානම්.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, මම හිතුවා දමපු සද්දෙ හැටියටයි, විශ්වාස භංග යෝජනාවට අත්සන් ලබා ගන්න ගත්තු වේගයේ හැටියටයි අද - අඟහරුවාදා - ඉඳලාම ඒ විවාදය පටන් ගනියි කියලා. අපි ලැහැස්තියි දවස් හතරේම වුණත් විවාද කරන්න. අඩු තරමින් එය ගෙනෙන්න කියන්නකෝ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අද Parliamentary Business Committee එක කැඳවා ඒ ගැන සාකච්ඡා කරලා,- *[බාධා කිරීමක්]*

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ස්ථාවර නියෝග අත්හිටුවලාත් එය ගෙනෙන්න පුළුවන්. ඒ නිසා ඔය අත්සන් කරපු එක පුස්කන්න කලින් විවාදයට ගේන්න. අපි ලැහැස්තියි ඒකට උත්තර ලබා දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි හදිසියේ Parliamentary Business Committee එකක් කැඳවා ඒ ගැන තීරණය කර ගනිමු. *[බාධා කිරීමක්]* දැන් ඒ කාරණය අවසන් කරන්න.

මීළඟට, පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි Parliamentary Business Committee එකක් හදිසියේ කැඳවා තීරණය කරමු. ආණ්ඩු පක්ෂයේත් යෝජනාව තිබෙනවා - *[බාධා කිරීමක්]*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තත්පර 60ක් දෙන්න, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තත්පර 60ක් දෙන්න බැහැ, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සාධාරණ වෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි Parliamentary Business Committee එකක් කැඳවා ඒ ගැන තීරණය කරමු.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තත්පර 60ක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තත්පර 60ක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අවස්ථාව දීලා තිබෙන්නේ. ඔබතුමා කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මා එතුමාගේ යෝජනාවට යහපත් ප්‍රතිචාරයක්, ප්‍රගතිශීලී ප්‍රතිචාරයක් දැක්වුවා. අප තීන්දු කරන ආකාරයට විශ්වාස භංග යෝජනාව නිසි ලෙස ලබා දෙන්නම්. අපි සූදානම්, අධ්‍යාපනය පිළිබඳ විවාදය හෙට ඉඳලාම ආරම්භ කරන්න. ඔබතුමන්ලා ඒකට සූදානම් ද? ඒකට සූදානම් ද?

**ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**
(மாண்புமிகு (வைத்தியர்) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayatissa)
ගරු කථානායකතුමනි, එතුමන්ලාම යෝජනාවක් ගෙනාවා, "දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේ නොවැම්බර් 12 ඉඳන් නොවැම්බර් 27 දක්වා වෙච්ච ක්‍රියාවලිය ගැන විවාදයක් ඕනෑ කියලා. ඒ විවාදය එපා නම්, ඔබතුමන්ලා හෙට ලෑස්තියි නම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධ විවාදයට අපිත් ලෑස්තියි. ඔබතුමන්ලා තීන්දු කරන්න, "දිට්වා" ගැන කථා කරනවාද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරනවාද කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, "දිට්වා" සුළි කුණාටුව අවස්ථාවේ රජයේ අකාර්යක්ෂම වැඩ පිළිවෙළ පිළිබඳ සාකච්ඡාවටත් - විවාදයටත්- අපි සූදානම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ විවාදයටත් සූදානම්. ඒ සඳහා මේ සතියේ සැසි වාරයත්, ඊළඟ සතියේ සැසි වාරයත් ලෑස්ති කර ගන්න. අපි සූදානම්. අපි ඒ කාරණා දෙකටම සූදානම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි Parliamentary Business Committee එකේදී ඒ පිළිබඳව සාකච්ඡා කරලා එකඟ වෙමු.

පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන ක්ෂේත්‍රය ගැන ගරු බිමල් රත්නායක ඇමතිතුමායි, නලින්ද ජයතිස්ස ඇමතිතුමායි දෙන්නාම,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක conduct එකේ ප්‍රශ්නයක් නොවෙයි නේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේක සම්බන්ධයි. *[බාධා කිරීමක්]* මම අහන්නේ, මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම, ගරු හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩියක කාලයක් ලබා දෙනවා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළේ point of Order එකක් නොවෙයි.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම point of Order එකක්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ කටයුතු පවත්වා ගෙන යෑම සහ deviate වෙනවා නම් කියන කාරණාව විතරයි තිබෙන්නේ. ඔබතුමා Standing Orders හරියට කියවන්න. *[බාධා කිරීම්]*

ගරු හිස්බුල්ලාහ් මන්ත්‍රීතුමාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම.

## ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම

## மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்வினது சொந்தவிளக்கம்

## PERSONAL EXPLANATION BY HON. (DR.) M.L.A.M. HIZBULLAH

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபாநாயகர் அவர்களே, கடந்த 09ஆம் திகதி இச்சபையில் சக பாராளுமன்ற உறுப்பினர் கௌரவ சாணக்கியன் அவர்கள், நான் காரமுனை பிரதேசம் சம்பந்தமாக இங்கு ஆற்றிய உரையிலுள்ள விடயங்கள் உண்மைக்குப் புறம்பானவை என்றும் அவை எந்தவித அடிப்படையும் அற்றவை என்றும் தெரிவித்ததுடன், என்னுடைய பெயரை மூன்று தடவை குறிப்பிட்டும் பேசியிருந்தார். இது தொடர்பில் விளக்கமளிப்பதற்கு எனக்குச் சந்தர்ப்பம் தந்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தின் வாகரை பிரதேச செயலாளர் பிரிவில் காரமுனை என்ற ஒரு முஸ்லிம் கிராமம் இருக்கின்றது. காணி, உறுதிப் பத்திரம், வீதி தொடர்பான விடயங்களில் அங்கு வாழுகின்ற முஸ்லிம் மக்கள் பல்வேறு பிரச்சினைகளை எதிர்கொள்கின்றார்கள். அங்குள்ள நூற்றுக்கணக்கான மக்கள் தங்களது வீடுகளுக்கு மின்சார வசதியைக்கூட பெற்றுக் கொள்ள முடியாமல் மிகவும் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கின்றார்கள். அவர்களால் எந்தவித அடிப்படை வசதிகளையும் பெற்றுக்கொள்ள முடியாமல் இருக்கின்றது. காரமுனை பிரதேசத்தில் வாழுகின்ற முஸ்லிம் மக்களுக்கு ஏன் இந்த அநியாயத்தைச் செய்கின்றீர்கள்? அங்குள்ள பிரதேச செயலாளர் திட்டமிட்டு அந்தக் கிராமத்திலிருந்து முஸ்லிம் மக்களை வெளியேற்றுவதற்காக அடிப்படை வசதியான மின்சாரத்தைக்கூட அவர்களுக்கு வழங்கவில்லையென நான் சொன்னேன். கௌரவ சாணக்கியன் அவர்கள் இங்கு பேசும்போது, "இது முஸ்லிம்களுடைய கிராமம் இல்லை; இதற்கும் முஸ்லிம்களுக்கும் எந்தச் சம்பந்தமும் இல்லை; முஸ்லிம்கள் இங்கு வாழவுமில்லை; இது முழுக்க முழுக்க தமிழ் மக்களுடைய ஒரு பூர்வீகக் கிராமம்; தமிழ் மக்கள் வாழுகின்றதொரு கிராமம்" என்று சொன்னார். என்னுடைய நண்பரான கௌரவ சாணக்கியன் அவர்களுக்குப் பிழையான தகவல்களைக் கொடுத்துப் பிழையாக வழிநடாத்தி இருக்கிறார்கள். காரமுனை கிராமத்துக்கும் தமிழ் மக்களுக்கும் எந்தச் சம்பந்தமும் கிடையாது. அங்கு ஒரு தமிழ் குடும்பம் வாழ்ந்ததற்குக்கூட எந்த ஆதாரமும் கிடையாது. அவர்கள் வாழ்ந்ததற்கு அடையாளமாக அங்கு ஒரு கோவில்கூட கிடையாது.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලාහ් මහතා**
(மாண்புமிகு (கலாநிதி) எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. (Dr.) M.L.A.M. Hizbullah)
I will wind up within a minute, Sir.

கௌரவ சபாநாயகர் அவர்களே, இந்தக் கிராமத்தில் 200 வருடங்கள் பழைமை வாய்ந்த ஒரு ஸியாரம் இருக்கிறது. 50 வருடங்கள் பழைமை வாய்ந்த ஒரு பள்ளிவாசல் இருக்கிறது. 75 வருடங்களுக்கு முன்னர் அங்கு RDS உட்பட பல சங்கங்கள் பதிவுசெய்யப்பட்டு இருக்கின்றன. அங்கு முஸ்லிம்கள் 1983ஆம் ஆண்டிலிருந்து வாழ்ந்ததற்கான ஆதாரமாக அவர்களிடம் permit இருக்கின்றது. யுத்தம் காரணமாக அங்கிருந்த 109 குடும்பங்கள் வெளியேறியதாக 1983ஆம் ஆண்டு வழங்கப்பட்ட பிரதேச செயலாளரின் கடிதம் இருக்கின்றது. இவ்வாறு அங்கு முஸ்லிம்கள் வாழ்ந்ததற்கான ஆதாரங்கள் பல இருக்கின்றன. கௌரவ சபாநாயகர் அவர்களே, காரமுனை கிராமம் தொடர்பில் நான் இந்தச் சபையில் பேசிய விடயங்கள் உண்மையானவை. எனவே, அந்தக் கிராமத்திலுள்ள முஸ்லிம்களுடைய பிரச்சினைகள் தொடர்பில் உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මීට පෙර අහපු ප්‍රශ්නය තමයි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇතිවෙලා නැත්නම් කැබිනට් මණ්ඩලයෙන් ඒක වසරකට කල් දැම්මේ ඇයි කියන එක. අපටත් ඒ තොරතුරු බලන්න අවශ්‍යයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක මේ විවාදයට අදාළ කාරණාවක් නොවෙයි. සභාව පවත්වාගෙන යෑමට අදාළ කාරණාවක් නොවෙයි. *[බාධා කිරීම්]*

මීළඟට, පනත් කෙටුම්පත් පිළිගැන්වීම.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
Sir, I rise to a point of Order.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව තුළ ලොකු ආරංචියක් පැතිර යනවා. ශිරාණි බණ්ඩාරනායක මැතිනියට කළා වාගේ, වර්තමාන නීතිපති පාරින්ද රණසිංහ මහතා ඉවත් කිරීමට දෝෂාභියෝගයක් ඉදිරිපත් කරනවා කියලා. ඒක සත්‍යද, අසත්‍යද කියලා දැන ගන්න කැමැතියි. ඒක බොහොම වැදගත්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒක point of Order එකක් නොවෙයි.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

### පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත
இருப்பாட்சியாளர்களைப் பாதுகாத்தல் சட்டமூலம்
PROTECTION OF OCCUPANTS BILL

"ගෙහිමියෙකු විසින් පරිශ්‍රයක පදිංචි වී සිටින තැනැත්තන් නෙරපීම වැළැක්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2026 පෙබරවාරි 03වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 பெப்ருவரி 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Attorney-at-Law, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 03rd February, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

### ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත
வாடகை (நீக்கல்) சட்டமூலம்
RENT (REPEAL) BILL

"1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඉවත් කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා විසිනි.***

***2026 පෙබරවාරි 03වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர் மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 பெப்ருவரி 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Harshana Nanayakkara, Attorney-at-Law, Minister of Justice and National Integration; to be read a Second time upon Tuesday, 03rd February, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.*

### කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ පනත් කෙටුම්පත
கொள்கல நிலையத் தொழிற்படுத்துநர்களுக்கு உரிமமளித்தல் சட்டமூலம்
LICENSING OF CONTAINER DEPOT OPERATORS BILL

"කන්ටේනර් ඩිපෝ මෙහෙයුම්කරුවන්ගේ ව්‍යාපාර පවත්වාගෙන යාම නියාමනය කිරීම සහ පාලනය කිරීම සඳහා ද; ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා ද, විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු අනුර කරුණාතිලක මහතා විසිනි.***

***2026 පෙබරවාරි 03වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் மாண்புமிகு அனுர கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 பெப்ருவரி 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Anura Karunathilaka, Minister of Ports and Civil Aviation; to be read a Second time upon Tuesday, 03rd February, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development.*

### නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ (සංශෝධන) පනත් කෙටුම්පත
கப்பற்றொழில் முகவர்களுக்கு, சரக்கு அனுப்புநர்க்கு, கலன் செயற்படுத்தப்படாப் பொதுக் காவுநர்க்கு மற்றும் கொள்கலம் செயற்படுத்துநர்க்கு உரிமமளித்தல் (திருத்தம்) சட்டமூலம்
LICENSING OF SHIPPING AGENTS, FREIGHT FORWARDERS, NON-VESSEL OPERATING COMMON CARRIERS AND CONTAINER OPERATORS (AMENDMENT) BILL

"1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට, නැව් බඩු ගෙනයන්නන්ට, යාත්‍රා ක්‍රියාකරුවන් නොවන පොදු ප්‍රවාහකයන්ට සහ කන්ටේනර් මෙහෙයුම්කරුවන්ට බලපත්‍ර ලබාදීමේ පනත සංශෝධනය කිරීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය ගරු අනුර කරුණාතිලක මහතා විසිනි.***

***2026 පෙබරවාරි 03වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர் மாண்புமிகு அனுர கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2026 பெப்ருவரி 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் மூலோபாய அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Anura Karunathilaka, Minister of Ports and Civil Aviation; to be read a Second time upon Tuesday, 03rd February, 2026 and to be printed; and to be referred to the Sectoral Oversight Committee on Infrastructure and Strategic Development.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 01 ඉදිරිපත් කිරීම.

The Hon. (Dr.) Upali Pannilage to start the Debate. You have 15 minutes.

## සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය
## நலன்புரி அனுகூலங்கள் சட்டத்தின்கீழ் அஸ்வெசும நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டம்
## ASWESUMA WELFARE BENEFIT PAYMENT SCHEME UNDER THE WELFARE BENEFITS ACT

[පූ.භා. 11.54]

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනතේ 9 වගන්තිය යටතේ සුබසාධක ප්‍රතිලාභ සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 දෙසැම්බර් 15 දිනැති අංක 2467/03 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2026.01.06 දින ඉදිරිපත් කරන ලද අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය අනුමත කළ යුතු ය.
>
> (අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන්, එම ගැසට් පත්‍රය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් අද දින පවත්වන මේ විවාදයේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කරන්නට කැමැතියි. අඩු ආදායම්ලාභී පුද්ගලයින්ටත්, ආන්තික සමාජ කණ්ඩායම්වලටත් ප්‍රතිලාභ ලබා දෙන අපේ රටේ මේ වෙනකොට ක්‍රියාත්මක වෙන ප්‍රධානතම සුබසාධන යෝජනා ක්‍රමය තමයි සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරන 2022 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත. මේ පනත මඟින් වරින් වර ගැසට් කරනු ලබන ආකාරයට අනුව තමයි සුබසාධක ප්‍රතිලාභ ලබා දෙනු ලබන්නේ. 2022 වර්ෂයේදී ආරම්භ කළත්, 2023 වර්ෂයේ ජූලි මාසයේ තමයි මේ පනත යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ අපේ රටේ අඩු ආදායම්ලාභී ප්‍රජාවට ලබා දීමේ කටයුත්ත ප්‍රථම වතාවට ආරම්භ කළේ.

මේ සුබසාධක යෝජනා ක්‍රමයේ ප්‍රධාන කාණ්ඩ 4ක් යටතේ සුබසාධක ප්‍රතිලාභ ලබා දීමක් සිදු කරනවා. දුප්පත්, අන්ත දුප්පත්, අවදානමට ලක් වූ සහ සංක්‍රාන්ති ලෙස සමාජ කණ්ඩායම් හඳුනා ගෙන ඔවුන් වෙත සුබසාධක ප්‍රතිලාභ ලබා දීම තමයි ප්‍රධාන වශයෙන්ම මේ යෝජනා ක්‍රමය මඟින් ක්‍රියාත්මක කරනු ලබන්නේ. මේ සඳහා ප්‍රතිලාභීන් තෝරා ගැනීම සම්බන්ධයෙන් සමාජය තුළ යම් කතිකාවක් තිබෙනවා; ඒ සම්බන්ධයෙන් විවේචනයක් තිබෙනවා. විශේෂයෙන්ම සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සඳහා ප්‍රධාන නිර්ණායක 6කුත් ඒ නිර්ණායක 6 සඳහා වූ අනු නිර්ණායක 22කුත් භාවිත කරනවා. එම නිර්ණායක භාවිත කරලා තමයි ප්‍රතිලාභීන් තෝරා ගනු ලබන්නේ. එවකට තිබිච්ච දත්ත විධියට 2019 වසරේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ගෘහස්ත ආදායම් වියදම් සමීක්ෂණය පදනම් කර ගෙන තමයි මේ ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කරමින් පවතින්නේ.

අපි බලයට පත් වන විට මෙහි යම් යම් කණ්ඩායම්වලට - විශේෂයෙන්ම එක් කණ්ඩායමකට - 2024 දෙසැම්බර් මාසයේ ගෙවීම් අවසන් කිරීමට නියමිතව තිබුණා. එම කණ්ඩායමට අදාළ ගෙවීම් 2025 වසරේ ජූනි මාසය දක්වා අපි දීර්ඝ කරනු ලැබුවා. ඉන්පසුව අපි 2025 මාර්තු මාසයේ සංශෝධනය කරපු ගැසට් පත්‍රය අනුව 2025 දෙසැම්බර් මාසයේ ගෙවීම් අවසන් වීමට තිබුණු ඒ කණ්ඩායම සම්බන්ධයෙන්,- පසුගිය නොවැම්බර් මාසයේ ඇති වෙච්ච දිට්වා සුළි කුණාටු තත්ත්වයත් එක්ක විශාල ආපදාවක් අපේ රටේ ඇති වුණා. ඒ අනුව යම් යම් සමාජ කණ්ඩායම්වලට ආර්ථික වශයෙන් බරපතළ ලෙස යම් යම් අර්බුදයන්ට මුහුණ දෙන්නට සිදුවුණා. ඒ නිසා 2025 දෙසැම්බර් මාසයේ සුබසාධක ප්‍රතිලාභ ගෙවීම අවසන් කරන්න තිබුණු කණ්ඩායම්වල ගෙවීම් අපි එසේ අවසන් නොකර, 2026 ජූනි මාසය දක්වා දීර්ඝ කිරීම තමයි මේ සංශෝධනයෙන් ප්‍රධාන වශයෙන්ම සිදු වෙන්නේ, ගරු කථානායකතුමනි. ඒත් එක්කම මේ කාරණයත් මම සඳහන් කරන්න ඕනෑ. මේ සුබසාධක ප්‍රතිලාභ ක්‍රමය යටතේම අපි තවත් සමාජ කණ්ඩායම් ගණනාවකට සුබසාධක ප්‍රතිලාභ ලබා දෙමින් තිබෙනවා. විශේෂයෙන්ම ආබාධ සහිත පුද්ගලයින්ට, වකුගඩු රෝගාබාධවලින් පෙළෙන පුද්ගලයින්ට සහ වැඩිහිටි ආධාර ලබන පුද්ගලයින්ට මේ සුබසාධක ප්‍රතිලාභ ක්‍රමය යටතේම අපි ආධාර ලබා දෙමින් තිබෙනවා, ගරු කථානායකතුමනි.

විශේෂයෙන්ම 2024 වර්ෂයේදී අපි බලයට පත් වෙනකොට ආබාධ සහිත පුද්ගලයින් 142,804 දෙනෙකුට පමණයි ආධාර ලබා දුන්නේ. ගරු කථානායකතුමනි, මම මේක විශේෂයෙන් සඳහන් කරන්නේ එවකට ගැසට් පත්‍රයේ තිබුණා 410,000කට ආධාර ලබා දෙනවා කියලා. නමුත් 2024 අග භාගය වෙනකොට

[ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා]

නිශ්චිතවම 142,804 දෙනෙකුට පමණයි ආධාර ලබා දුන්නේ. ඒ ආධාර ලබා දුන්නේ රුපියල් 7,500ක මාසික දීමනාවක් හැටියට. මෙන්න මේ තත්ත්වය අපි සැලකිල්ලට අරගෙන, නැවත වතාවක් අයදුම්පත්‍ර කැඳවලා ආබාධ සහිත පුද්ගලයන්ගේ දීමනාව 2025දී නැවත වතාවක් එක් පුද්ගලයකු සඳහා රුපියල් 7,500 සිට රුපියල් 10,000 දක්වා වැඩි කළා. ඒ විතරක් නොවෙයි. 2025 නොවැම්බර් මාසයේ අලුත් අයදුම් පත් 27,217ක් අලුතෙන් මේ යෝජනා ක්‍රමයට අපි එකතු කළා. මොකද, අපට අලුතෙන් අයදුම්පත් ලැබුණා. අන්න, ඒ අනුව -අපි නිවැරදි සංඛ්‍යා ලේඛන එක්ක, ගැසට් පත්‍රයේ සංඛ්‍යා ලේඛනවලට වඩා- සැබෑ ලෙස, ප්‍රායෝගිකව අද අපට තිබෙන අයදුම්පත් සැලකිල්ලට ලක් කරලා තමයි මේ ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රමාණය 200,000 දක්වා ගැසට් පත්‍රයේ සඳහන් කරලා තිබෙන්නේ. ඔවුන්ට ලබා දෙන දීමනාව අපි රුපියල් 10,000 බැගින් ඒ විධියටම ලබා දීම සඳහා සැලසුම් කරලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම පසුගිය කාලයේ අපට ලැබුණු තොරතුරු එක්ක, විශේෂයෙන්ම අයදුම් පත් දෙස බලනකොට මේ අස්වැසුම යෝජනා ක්‍රමය යටතේ වකුගඩු රෝගීන් 42,000 ගණනකට තමයි ආධාර ලබා දෙමින් තිබුණේ. නමුත් අපට අලුතෙන් අයදුම්පත් ගණනාවක් ලැබෙමින් පැවතුණා. ඒ නිසා පෙර ගැසට් පත්‍රයේ පරිදි ආධාර ලබා දුන් වකුගඩු රෝගයෙන් පෙළෙන අඩු ආදායම්ලාභීන් 50,000ක ප්‍රමාණය අපි මේ ගැසට් පත්‍රයෙන් 50,000 සිට 70,000 දක්වා තවත් 20,000කින් වැඩි කිරීම සඳහා යෝජනා කරලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ඒ අනුව විශේෂයෙන්ම අන්ත දිළිඳු, දිළිඳු, සංක්‍රාන්තික සහ අවදානමට ලක් වූ කියන ඒ සමාජ කාණ්ඩ හතර ගත්තොත්, මේ වෙනකොට 1,920,000කට පමණ මේ යෝජනා ක්‍රමය යටතේ අපි ආධාර මුදල් ලබා දෙනවා. ගරු කථානායකතුමනි, කලින් රුපියල් 8,500 තිබුණු ප්‍රමාණය රුපියල් 10,000 කරලා, කලින් රුපියල් 15,000 තිබුණු ප්‍රමාණය රුපියල් 17,500 කරලා අපි ඒ විධියටම ක්‍රියාත්මක කරමින් යනවා. මේ යෝජනා ක්‍රමය 2027 ජුනි මාසය දක්වා දිගටම පවත්වාගෙන යාමට අපි කටයුතු කරමින් සිටිනවා, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමනි, ඒ වාගේම මා විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, අපි රජයක් විධියට මේ සුබසාධක යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරමින් තිබුණත්, අපේ රජයේ ප්‍රතිපත්තිය වෙන්නේ සුබසාධනය අත්‍යවශ්‍ය අයට සුබසාධන ප්‍රතිලාභ ලබා දෙමින් මේ සමාජයේ සිටින ජනතාව හැකිතාක් දුරට සවිබල ගැන්වීමයි. ඒක තමයි අපේ ප්‍රධාන තේමාව. මොකද, ඔවුන් තවදුරටත් යැපුම් මානසිකත්වයේ තබා ගැනීම නොවෙයි අපේ අරමුණ. ගරු කථානායකතුමනි, නමුත් පසුගිය දශක ගණනාව තුළ ගෙනගිය ඒ ආර්ථික වැඩපිළිවෙළ එක්ක සමාජයේ තවදුරටත් ආධාර අවශ්‍ය විශාල ජන කොටසක් සිටින බව අපි දන්නවා. අන්න, ඒ අත්‍යවශ්‍ය අයට ආධාර ලබා දෙමින් අනෙක් පැත්තෙන් ඒ ආධාර මත යැපීමෙන් ඔවුන් ක්‍රමයෙන් මුදා ගැනීම සඳහා තමයි අපි වැඩකටයුතු කරන්නේ.

විශේෂයෙන්ම පසුගිය වර්ෂයේ අපි ප්‍රජා සවිබල ගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළා. එම වැඩසටහන යටතේ විශේෂයෙන්ම අපට ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාරත්, ඒ වාගේම ලෝක බැංකුවේ මූල්‍ය ආධාරත්, ඒ වාගේම භාණ්ඩාගාර ප්‍රතිපාදනත් ලැබුණා. මේ හරහා විශේෂයෙන්ම අපි උත්සාහ කළේ ක්ෂුද්‍ර හා කුඩා ව්‍යවසායකත්වයන් වර්ධනය කරන්නයි. ගරු කථානායකතුමනි, අපි ඒ මූල්‍යාධාර යටතේ එක් පවුලකට 150,000ක ආධාරයක් දුන්නා. ඒ අනුව ක්ෂුද්‍ර මට්ටමේ හා කුඩා ව්‍යාපාර කරගෙන යන අයගේ ඒ ව්‍යාපාර දියුණු කර ගැනීම සඳහා අවශ්‍ය ඒ මූල්‍ය සාක්ෂරතාවත්, ඒ අවශ්‍ය මූල්‍ය සහනාධාරත් ලබා දුන්නා. ඒ වාගේම ඒ ගොල්ලන්ට අවශ්‍ය ව්‍යාපාරික සැලසුම් හදලා ඔවුන් සවිබල ගැන්වීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළා.

ඒ වාගේම තවත් පැත්තකින් අපි ඒ සවිබල ගැන්වීමේ වැඩසටහන හරහා අපේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ණය ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කළා. ඒ ණය වැඩසටහන සඳහා අපට භාණ්ඩාගාරයෙන් - අඩු පොලියක් යටතේ ඒ ණය ලබා දීම සඳහා- ප්‍රතිපාදන ලබා දෙනවා. ඒ අනුව මේ වසරේ සියයට 4ක අඩු පොලියකට මේ අයට ණය පහසුකම් ලබා දෙනවා. ඒ ඔස්සේ 2025 වර්ෂයේදී අපි බිලියන 58ක් ණය වශයෙන් ලබා දුන්නා, මේ ව්‍යවසායකත්වයන් වර්ධනය කිරීම සඳහා. 2026 වර්ෂයේදීත් රුපියල් බිලියන 60ක් -මිලියන 60,000ක්- වෙන් කරලා තිබෙනවා, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් මේ ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යවසායකත්වය වර්ධනය කරලා ඔවුන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා. මම මධ්‍ය පරිමාණ කියන්නේ නැහැ.

අපේ රජයේ ප්‍රතිපත්තිය තමයි, අපේ අනෙකුත් අමාත්‍යාංශවලින් ඒ වැඩ කටයුතු කරන අතරතුර අත්‍යවශ්‍ය අයට සුබසාධනය ලබා දෙන ගමන්, මේ ප්‍රජාව හැකිතාක් දුරට සවිබල ගන්වමින් ඔවුන් යැපුම් මානසිකත්වයෙන් මුදා ගැනීම. ඒ වෙනුවෙන් අපි වැඩසටහන් ගණනාවක් මේ වනකොට ක්‍රියාත්මක කරමින් ඉන්නවා, ගරු කථානායකතුමනි.

ඒත් එක්කම මේ කාරණයත් මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, ගරු කථානායකතුමනි. අද දින විවාදය පැවැත්වෙන්නේ සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ, අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ගැන වුවත්, මේ වනකොටත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ කතිකාවක් මතු කර තිබෙනවා. ඒ වාගේම නීතිපතිවරයා පිළිබඳ තවත් කතිකාවකුත් මතු කර තිබෙනවා. විපක්ෂය සමහර වෙලාවට මේ කොහේවත් නැති කතිකා පාර්ලිමේන්තුවට ගෙනෙනවා. ඔවුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව ඉතාම වැරදි මතයක් මේ රටේ සමාජගත කළා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කියන්නේ මොකක්ද කියලාවත් දන්නේ නැතිව, ප්‍රාථමික යුගයට ගිහිල්ලා ඉතාම වැරදි තැනකින් අල්ලාගෙන විපක්ෂය විසින් සමාජයේ වැරදි මතයක් නිර්මාණය කළා, ගරු කථානායකතුමනි. අපි ඉතාම වැදගත්, දියුණු විද්‍යාත්මක පදනමක් මත, මූලධර්ම මත පිහිටා තමයි කුලුනු 5ක් ඔස්සේ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්නේ.

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රධාන ක්ෂේත්‍ර 5ක් ඔස්සේ දිවෙනවා. ප්‍රධාන වශයෙන් ගත්තාම, විෂයමාලා සංවර්ධනය එකක්. අනෙක් පැත්තෙන්, මානව සම්පත දියුණු කිරීම. ගරු කථානායකතුමනි, දැන් බලන්න, පසුගිය වසර ගණනාවක් තිස්සේ අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අධ්‍යාපනඥයන්, අධ්‍යාපන පරිපාලනඥයන් වාගේම ගුරුවරුන් බඳවාගෙන තිබුණේ නැහැ. ඒ අවශ්‍ය මානව සම්පත ලබා දීම, ඔවුන් පුහුණු කිරීම, ඔවුන්ට දැනුම කුසලතාව ලබා දීම කියන එකත් මේකේ එක කුලුනක්. පසුගිය සතියේ අපේ කැබිනට් මණ්ඩලය තීරණය කළා, ගුරුවරුන් 23,000කට ආසන්න පිරිසක් නැවත බඳවාගෙන අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අවශ්‍ය මානව සම්පත ලබා දීමට.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තුන්වැනි කුලුන මොකක්ද, ගරු කථානායකතුමනි? ඒ තමයි, භෞතික සහ අනෙකුත් පහසුකම් ලබා දීම. ඔවුන්ට අවශ්‍ය ගොඩනැඟිලි පහසුකම්, පන්ති කාමර පහසුකම්, විද්‍යාගාර පහසුකම්, අනෙකුත් තාක්ෂණික පහසුකම් ඇතුළු මේ සමස්තය ලබා දීම තමයි තුන්වැනි කුලුන. ගරු කථානායකතුමනි, විෂයමාලාව විතරක් නොවෙයි.

හතරවැනි කුලුන, ඇගැයීම් ක්‍රියාවලිය. අපි දන්නවා, අපේ දැනට තිබෙන ඇගැයීම් ක්‍රියාවලිය ඉතා දියුණු ක්‍රියාවලියක් නොවෙයි කියන එක. අපි සාමාන්‍යයෙන් වර්ෂයකදී, එහෙම නැත්නම් පහ වසරෙදී, එහෙම නැත්නම් සාමාන්‍ය පෙළ, එහෙම නැත්නම් උසස් පෙළ විභාග සඳහා සූදානම් කරලා විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් තමයි ක්‍රියාත්මක කළේ. මේ විභාග කේන්ද්‍රීය ක්‍රමයෙන් මිදිලා සම්පිණ්ඩිත ඇගැයීම් ක්‍රමය වෙනුවට සම්භවන ඇගැයීම් ක්‍රමයක් ඇතුළත් කරලා - අඛණ්ඩ ඇගැයීම් ක්‍රමයක් ඇති කරලා - මේ ඇගැයීම් ක්‍රමය අධ්‍යාපන ක්‍රමයේ හතරවැනි කුලුන විධියට අපි ක්‍රියාත්මක කරනවා.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තිබෙන පස්වන කුලුන තමයි, ශිෂ්‍යයින්, ගුරුවරුන් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉන්න අය, ඒ වාගේම දෙමව්පියන් ඇතුළු මේ රටේ ජනතාව, සමාජය කියන මේ සියල්ල දැනුවත් කිරීම. මේ කියන ක්ෂේත්‍ර 5 ඔස්සේ තමයි අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දී තිබෙන්නේ.

මේ කාරණා පිළිබඳව නිසි අධ්‍යයනයක් නොකර තමයි විපක්ෂය අද කථා කරන්නේ. හයවන ශ්‍රේණියේ සහ පළමුවන ශ්‍රේණියේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මේ වසරේදී ක්‍රියාත්මක කරන්න අපි සැලසුම් කළා. හයවන ශ්‍රේණියේ මොඩියුල 15ක් තිබෙනවා. ඒ මොඩියුල 15න් එක මොඩියුලයක එක තැනක තිබුණු ඉතාම පොඩි තාක්ෂණික දෝෂයක් අරගෙන සමාජයේ නොතිබුණු තත්ත්වයක් ඇති කරලා, අනාගත දරු පරපුරට මේ රට දියුණු ලෝකයක් කරා ගෙනයන්න, දියුණු මානවයෙක් බිහි කරන්න අපි හදපු සමස්ත අධ්‍යාපන වැඩ පිළිවෙළ පිළිබඳව විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් ඉතාම ප්‍රාථමික විවේචන ඉදිරිපත් කළා. මේ හරහා ඔවුන් සමාජය ඉතාම ප්‍රාථමික තැනකට ගෙනයන්න කටයුතු කළා, ගරු කථානායකතුමනි. ඒ නිසා මේ වනකොට අපි කටයුතු කර තිබෙනවා, පළමුවන ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඒ විධියටම ක්‍රියාත්මක කරන්න. කුලුනු පහේ අනෙක් සියලු දේවල් අපි ක්‍රියාත්මක කරනවා. ඒ ඔස්සේ මේ වනකොට සමාජයේ යම් කතිකාවකුත් නිර්මාණය වෙලා තිබෙනවා. විපක්ෂය විසින් ඉදිරිපත් කරපු ඒ විවේචනය ඔවුන්ටම පාරා වළල්ලක් වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි.

අධ්‍යාපන ඇමතිතුමියට - අගමැතිතුමියට - විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනවා කිව්වා. දැන් අපි කියනවා, ඒ විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න කියලා. බොරුවට බිල්ලෙක් මවලා, සමාජයට වැරදි මත ගෙනිහිල්ලා සමාජය ව්‍යාකූල කළා, ගරු කථානායකතුමනි. ඒ විධියට සමාජය ව්‍යාකූල කරලා දැන් ලිස්සලා යනවා. දැන් කියනවා, කාලය, දීපය, දේශය බලනවා ලු, විශ්වාස භංග යෝජනාව ගෙනෙන්න. අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව විතරක් නොවෙයි, ඕනෑම මාතෘකාවක් පිළිබඳව ඕනෑම මොහොතක විවාදයකට සූදානම්. ඒ නිසා බොරු බිල්ලෝ මවන්න එපා.

විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විපක්ෂයේ ඇතැම් කල්ලි විසින් ඇති කරපු ඒ අවුල් සහගත තත්ත්වය, ඒ ව්‍යාකූල තත්ත්වය මේ රටේ අනාගත දරු පරපුර වෙනුවෙන් කරපු ඉතාම බරපතළ විවේචනයක්, ඒ වාගේම ඔවුන්ගේ අනාගතය ආපස්සට ඇද දැම්මක් කියලා මම සඳහන් කරන්න කැමතියි, ගරු කථානායකතුමනි. ඒ නිසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳවත් අපි විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අවධානයට යොමු කරනවා. යැපුම් මානසිකත්වයෙන් මිදුණු නිවහල් මිනිසෙක් නිර්මාණය කිරීම සඳහාත් අපට මේ අධ්‍යාපනය ඉතාම වැදගත් වනවා. ඒ නිසා තමයි විධිමත් අධ්‍යාපනය වාගේම, නොවිධිමත් අධ්‍යාපනය හරහාත් මේ සමාජය සුවපත් කිරීම සඳහා වූ කාර්යභාරයට අපි යොමු වෙලා තිබෙන්නේ. ඒ ඔස්සේ ඉතාම දියුණු මානවයෙක්, දියුණු මානව සම්පතක් අපේ රටේ ගොඩනඟා ගැනීම වෙනුවෙන් අපි කටයුතු කරමින් ඉන්නවා. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
The Hon. (Dr.) Harsha de Silva. You have 11 minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

[12.10 p.m.]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
Sir, I had 12 minutes. Please give me that time. We started the Debate only at 12 noon. Time got wasted not because of us.

ඇත්තවශයෙන්ම මෙම අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම දීර්ඝ කිරීම පිළිබඳව අපට කිසි ගැටලුවක් නැහැ. දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාවට රජය විසින් ඒ සහනාධාර ලබා දිය යුතුයි. ඒකට අවශ්‍ය මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ සම්බන්ධව අපට මූලික ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ගරු ඇමතිතුමාත් සඳහන් කළ පරිදි මේ අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම 2023දී introduce කළේ, දීර්ඝ කාලීන programme එකක් හැටියට නොවෙයි. මේක තාවකාලික - temporary - වැඩ පිළිවෙළක්. මොකද, මෙහි අරමුණ ජනතාව දරිද්‍රතාවෙන් මුදා ගැනීම නොවෙයි. මෙහි අරමුණ වුණේ 2022 පැවති අර්බුදයෙන් පස්සේ ජනතාව තවදුරටත් දරිද්‍රතාවෙන් පෙළීම වැඩිවන එකෙන් බේරාගැනීම. මොකද, එවකට පැවති රජය මේ පාර්ලිමේන්තුවේදී පැවති එම විවාදයේදී කරුණු ඉදිරිපත් කරනකොට සඳහන් කරපු කාරණාව තමයි ඒක. ඒ නිසා තමයි 2026දී මේ වැඩ පිළිවෙළ අවසන් කරන්න තීරණය කරලා තිබුණේ. නමුත්, ඔබතුමන්ලාගේ ආණ්ඩුවත් මාස හයෙන් හයට - 2027 වසරේ අග වෙනකන් - මේ ප්‍රතිලාභ ගෙවීම දීර්ඝ කරලා තිබෙනවා.

හැබැයි, මේ අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම තවදුරටත් ඉදිරියට යනවා නම්, ඇමතිතුමා සඳහන් කළ පරිදි මේ සඳහා තෝරා ගැනීමේ ගැටලු පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, Dr. H.M. Gunatilake, Senior Adviser, Centre for Poverty Analysis සහ මහාචාර්ය සිරිමල් අබේරත්න මහතා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරපු research report එකේ තිබෙනවා, මේ තෝරා ගැනීමේ ගැටලු පිළිබඳව. ඒ සමීක්ෂණය කර තිබෙන්නේ 2,611ක නියැදියකින්. උදාහරණයක් හැටියට අපි කියනවා, මේකේ බැහැර කිරීමේ දෝෂ තිබෙන බව. ඒ කියන්නේ අස්වැසුම ලැබිය යුතු අයගෙන් සියයට 42කට ලැබෙනවා, 58කට ලැබෙන්නේ නැහැ. ඊළඟට, මේ ප්‍රතිලාභය නොලැබිය යුතු අයගෙන් සියයට 26කට මේක ලැබෙන බවත් කියනවා. මූලිකවම exclusion and inclusion errors තියාගෙන මේ වැඩ පිළිවෙළ ඉස්සරහට යන එකෙන් ගම්‍ය වන්නේ ඇත්තවශයෙන්ම වැරැද්දක් තිබෙනවා කියලා දැන දැනම ඒ වැරැද්ද ඉස්සරහට අරගෙන යන එකයි. නමුත් එය එහෙම නොකළ යුතුයි. අපි කාරක සභාවේදී මේ සම්බන්ධයෙන් විමසුවාම සුභසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ සභාපති

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

කිව්වේ, මම කලින් නම සඳහන් කරපු ඒ මහාචාර්යවරුන් ඇතුළු කණ්ඩායම විසින් මේ දත්ත යාවත්කාලීන කිරීම සහ මේ නිර්ණායක සමාලෝචනය කළ යුතු බව වාර්තා කර තිබෙන බව.

ගරු ඇමතිතුමා මේ සම්බන්ධ නිර්ණායක 20ක් ගැන කථා කළා. මෙතැන ලොකු ගැටලුවක් දිගින් දිගටම තිබුණු නිසා අපි ඒ වැරැද්ද ලෝක බැංකුවටත් පෙන්වා දුන්නා. මේකේ weight base එකක් නැහැ. හැම නිර්ණායකයටම දීලා තිබෙන්නේ එකම weight එක.

උදාහරණයක් හැටියට අපි electricity use එක බැලුවොත් එහෙම, electricity use එකෙන්ම පමණක් මේ බැහැර කිරීමේ දෝෂ බොහෝ දුරට අඩු කර ගන්න පුළුවන්. මේ සම්බන්ධයෙන් විශේෂඥ කමිටුවක් පත් කර තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඔවුන්ගේ report එක ගැන සලකා බලා මේ නිර්ණායක නැවතත් සමාලෝචනය කරයි කියලා. මම එක දෙයක් ගරු ඇමතිතුමාට කියන්න කැමැතියි. ඒ තමයි, නැවතත් මේ සංශෝධනය කරපු නිර්ණායක සහ යාවත්කාලීන කරපු දත්ත එක වතාවට රට පුරාම පටන් ගන්න එපා කියන එක. මොකද, ඒකට හේතුව pilot project එකක් වාගේ තමයි මේක කරන්නේ. මේ වැඩේ කරගෙන යන අතරතුරේදී අපේ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාම එකඟ වුණා, අවම වශයෙන් 3,000ක විතර නියැදියක් අරගෙන සමීක්ෂණයක් කරලා බලන්න, මේ නිර්ණායක හරහා අර බැහැර කිරීමේ දෝෂ, ඇතුළත් කිරීමේ දෝෂ තවදුරටත් අඩු කර ගන්න පුළුවන් ද කියලා. එතකොට අපට පුළුවන් වෙයි, මේ ප්‍රශ්නය යම්කිසි දුරකට විසඳා ගන්න. මොකද, අවශ්‍ය වන්නේ ගරු ඇමතිතුමා කිව්ව පරිදි මේ දරිද්‍රතාවෙන් ජනතාව මුදා ගන්න එකයි.

ගරු ඇමතිතුමනි, ජනතාව මුදා ගැනීම ගැන කථා කරද්දී ඔබතුමා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව ගැන කථා කළා. ඒ වාගේම, අද දින වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න යටතේ, 10වැනි ප්‍රශ්නයට උත්තර දෙමින් ඔබතුමා කියා සිටියා, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ තිබෙන ගැටලු, ඔවුන්ගේ විශ්‍රාම යෑම් සහ ඔවුන්ගේ උසස්වීම් සම්බන්ධයෙන්. හැබැයි, ගරු ඇමතිතුමනි, 2025 අවුරුද්දේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට වියදම් කරලා තිබුණේ අපේ භාණ්ඩාගාරයෙන් රුපියල් බිලියන 27යි. මේ රුපියල් බිලියන 27න්, රුපියල් බිලියන 5 ඇත්තවශයෙන්ම "අස්වැසුම" ප්‍රතිලාභය ලැබූ ප්‍රතිලාභීන්ගේ අතට ගියේ. රුපියල් බිලියන 22ක්ම ගියේ මේකේ administration එකට පඩි ගෙවන්න. දැන් මෙතුමා රුපියල් බිලියන 60ක් ක්ෂුද්‍ර මූල්‍ය සම්බන්ධයෙන් කථා කළා. ඒක සමෘද්ධියට අයිති දෙයක් නොවෙයි. ඒක වෙනත් අමාත්‍යාංශ හරහා, වෙනත් බැංකු හරහා සිද්ධ වෙන ක්‍රියාවලියක්. මොකද, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට වියදම් කළේ රුපියල් බිලියන 27යි. මම නැවතත් කියනවා, ඒකෙන් රුපියල් බිලියන 22ක්ම වැය වෙන්නේ පඩි ගෙවන්න කියන එක.

අපි මේ කාරණය තේරුම් ගන්න ඕනෑ. මේ සිදු කරන්නේ පඩි ගෙවාගෙන කණ්ඩායමක් තියාගෙන යන වැඩ පිළිවෙළක්. මම කියන්නේ නැහැ, ඔවුන්ව අයින් කරන්න කියලා. ඔවුන් ජීවත් වෙන්නේ ඒකෙන්. නමුත්, ඔබතුමන්ලා නැවත කල්පනා කරලා බලන්න ඕනෑ, ඔවුන්ගෙන් මීට වඩා ඵලදායී සේවාවක් ලබා ගන්නේ කොහොමද කියලා. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට රුපියල් බිලියන 27ක් වියදම් කරලා, ඒකෙන් රුපියල් බිලියන 22ක් පඩි ගෙවලා, ප්‍රතිලාභීන්ට රුපියල් බිලියන 5ක් විතරක් ලබා දෙන්නේ මොකටද? ඒක සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය ක්‍රියාවලියක්. ගරු ඇමතිතුමනි, ඒ නිසා අපි ඔබතුමාටත් මේ කාරණය ගැන මතක් කරනවා; අපි මුදල් ඇමතිවරයාටත් මේ සම්බන්ධයෙන් ලිව්වා. වහාම ස්වාධීන ඇගැයීමකට මේක ලක් කරන්න. නිකම්ම නිකම් විගණනයක් කරන එකෙන් ඇති ප්‍රයෝජනයක් නැහැ. ඊට එහාට අපි යන්න ඕනෑ.

ඔබතුමා කථා කරනකොට කිව්වා, මේ සමෘද්ධි බැංකු දැන් විගණනය කරන්න විගණකාධිපතිතුමාට භාර දීලා කියලා. දැන් මේ රටේ විගණකාධිපතිවරයෙක් නැහැ. විගණකාධිපතිවරයාගේ වැඩ පිළිවෙළයි, Budget එකයි pass කරන්නේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවෙන්. ඔහු එතැනට ආවාම මම ඒ ප්‍රශ්නය කෙළින්ම ඔහුගෙන් ඇහුවා. එතකොට ඔහු කිව්වා, ඔහුගේ වැඩ ප්‍රමාණය සියයට 41කින් වැඩි වෙලා තිබෙනවා කියලා. සියයට 41කින් ඔහුගේ වැඩ ප්‍රමාණය වැඩි වෙනවා නම් ඔහුගේ budget එක වැඩි වෙන්න ඕනෑ. නමුත්, ඔහුගේ budget එක වැඩි වෙලා නැහැ. එහෙම නම් මේක outsource කරන්න ඕනෑ කියලා කිව්වා. හැබැයි, මේ කිසි දෙයක් කර ගන්න බැහැ, විගණකාධිපතිවරයෙක් නැති නිසා. ඒ නිසා මම නැවතත් මේ අවස්ථාව ප්‍රයෝජනයට ගන්නවා, කරුණාකරලා විගණකාධිපතිවරයෙක් මේ රටට පත් කර ගන්න කියලා කියන්න.

ඒ වාගේම දැන් අපිට තිබෙනවා, "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ කියලා එකක්. ඒ ගැන මම මේ අවස්ථාවේදී කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, මේක සම්පූර්ණයෙන්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී වැඩ පිළිවෙළක්. මම දකින විධියට තමන්ගේ මේ one-party rule එක ව්‍යාප්ත කර ගන්න පැලවත්තෙන් කට්ටිය පත් කරලා, ඡන්දයෙන් තොරව තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරගෙන යන්නේ. ඒ පිළිබඳව අපි ඉදිරියේදී කථා කරමු.

ගරු ඇමතිතුමනි, මේ ඇගැයීමේදී මම ඔබතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. මීට අවුරුදු 20කට විතර කලින් මට යම් අවස්ථාවක් ලැබුණා, MIT විශ්වවිද්‍යාලයේ මේ පිළිබඳව අධ්‍යයනයකට යොමු වෙන්න. එතැනදී මම වැඩ කළේ Professor Abhijit Banerjee සහ Professor Esther Duflo කියන දෙදෙනාත් එක්කයි. ඔවුන්ට 2019දී නොබෙල් ත්‍යාගය ලැබුණා. මම ඒකේ තිබෙන දේ සිංහලට පරිවර්තනය කරලා කියන්නම්. "ගෝලීය දරිද්‍රතාව පිටුදැකීම සඳහා ඔවුන්ගේ පර්යේෂණාත්මක ප්‍රවේශය" වෙනුවෙන් තමයි Esther Dufloට සහ Abhijit Banerjeeට Nobel Prize එක ලැබුණේ. එතැනදී මොවුන් කරන්නේ ලෝකයේ බොහෝ රටවල් මේ වාගේ දැවැන්ත වියදම් කරනකොට ඇත්තවශයෙන්ම ඵලදායීතාව කුමක්ද කියන එක randomize trialsවලින් test කරන එකයි. එතකොට අපි හැමදාම කරන මේ evaluation එකට එහා ගිහිල්ලා අපට අවශ්‍ය වෙනවා, මෙවැනි මුදල් ප්‍රමාණයක් වියදම් කරනකොට ඒකෙන් ලැබෙන ප්‍රතිඵල කුමක්ද කියන එක scientifically, independently monitor කරන්න. ඒ නිසා අපි මේ බහුවිධ දරිද්‍රතාව ගැන තමයි ඊළඟට අපේ අවධානය යොමු කරන්න ඕනෑ. මොකද, එතුමාත් කිව්වා වාගේම ආදායමට එහා ගිය අධ්‍යාපනයට සහ සෞඛ්‍යයට තිබෙන ප්‍රවේශය ලබා ගැනීමට ඇති හැකියාව පිළිබඳව තමයි අපි ඉදිරියට යනකොට සාකච්ඡා කරන්න ඕනෑ.

දැන් මම පෙන්වන්න කැමැතියි, අද "ඩේලි මිරර්" පුවත් පතේ headline එක. "ඩේලි මිරර්" පුවත් පතේ headline එකේ මොකක්ද කියන්නේ? I quote:

"AI to threaten 22.8 per cent of employed people in Sri Lanka"

GenAI නිසා තිබෙන රැකියා අවස්ථා නැති වෙමින් පවතිනවා. මම පෞද්ගලික කාරණාවක් කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සාමාන්‍යයෙන් දෙමව්පියන් කථා කරලා මට

කියනවා, "මගේ දුව, මගේ පුතා විශ්වවිද්‍යාලයේ අවසාන අවුරුද්දේ ඉන්නේ. IT අංශයෙන් internship එකක් හොයා ගන්න ඕනෑ. හොයලා දෙන්න" කියලා. බොහෝ වෙලාවට මට පුළුවන් වෙනවා, මම දන්නා කට්ටියට කථා කරලා, පොඩි උදවුවක් හැටියට ඒ දරුවන්ට මාස හයක internship එකක් අරගෙන දෙන්න. නමුත්, ඔබතුමා විශ්වාස කරන්න, මේ සැරේ එක්කෙනෙකුටවත් internship එකක් අරගෙන දෙන්න මට බැරි වුණු බව. මම ඒ ගැන හොයා බලනකොට ඔවුන් කියන්නේ, "දැන් අපට මේ internsලාගෙන් ඇත්තවශයෙන්ම ප්‍රයෝජනයක් නැහැ. අපි AI එකෙන් ඒ වැඩ ටික ඔක්කෝම කර ගන්නවා" කියායි. එතකොට clerical වැඩ, internship වාගේ වැඩ කරන්න හැකියාවක් නැහැ.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන ඔබතුමා කිව්වා. ඒක අනවශ්‍ය විධියට ගෙනාවත් සමහරු අනවශ්‍ය විධියට ඒක විවේචනය කළා. අපි එහෙම විවේචනය කළේ නැහැ. අපි දිගටම කිව්වේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සම්පූර්ණයෙන්ම එකඟයි කියායි. නමුත්, ඒකේ තිබුණු වෙන වෙන ප්‍රශ්න නිසා තමයි මේ ප්‍රශ්න ඇති වෙලා තිබෙන්නේ. ඒක කරගෙන යන්න පුළුවන් නම් දෙවියනේ ඒක අවුරුද්දකින් postpone කළේ ඇයි?

කුලුනු පහක් ගැන කථා කළා. හැබැයි, ඒ කුලුනු පහෙන්, කුලුනු හතරක් ගැන කිසිම කථාවක් නැහැ. 1981දී ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා අධ්‍යාපන ඇමතිතුමා හැටියට පටන් ගත් White Paper එක ගැන දැන් අපි කථා නොකර ඉඳිමු. ඒකට ඔබතුමන්ලා වග කියන්න ඕනෑ. අවුරුදු ගණනාවක් තිස්සේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය නොකරන්න ඔබතුමන්ලා කරපු දේවලට ඔබතුමන්ලා වග කියන්න ඕනෑ. අපට website එකක් අදාළ නැහැ. කවුරු හරි ඒක වැරදි විධියට කළා නම් ඒ අය පන්නලා දාන්න. ඊට එහාට අපි යන්න ඕනෑ. මේවා කරන්න ඕනෑ. එහෙම නම් ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ postpone කරන්නේ නැතුව ඔබතුමන්ලා කොන්ද කෙළින් තියාගෙන, "මේ වැරැද්ද වුණා. අපි මේ වැරැද්ද වෙනස් කරමු. අපි මේක කරමු" කියලා එකඟ වෙමු. එහෙම නැතුව curriculum එක විතරක් වෙනස් කරලා මදි. ඔබතුමා කිව්වා වාගේ teachersලා පුහුණු කරන්න ඕනෑ; technology ගෙනෙන්න ඕනෑ. Semester system එකත් එක්ක අපට කිසිම අවුලක් නැහැ. ඒක තමයි වෙන්න ඕනෑ. අපි ඒ ගැන විවේචනය කළේ නැහැ. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ දරුවා ඉගෙන ගන්නේ කොහොමද කියන එක දරුවාට උගන්වන එකයි. අද කටපාඩම් කරන්න ඕනෑ නැහැ. හැම දෙයම AI එකේ තිබෙනවා. හැබැයි, ඒ දරුවා දැනගන්න ඕනෑ, තමන් කොහොමද ඒක උපුටා ගන්නේ, උපුටා ගන්න දේ තමන් ජීවිතයේ පාවිච්චි කරන්නේ කොහොමද කියලා. ඒකයි අවශ්‍ය වෙන්නේ.

ඊයේ බිමල් රත්නායක ඇමතිතුමා කියනවා මම අහගෙන හිටියා, පාසල් 2,500 ගණනකට smart board එකක්වත් නැහැ කියලා. ඒක ඇත්ත. ඒවා දෙන්න ඕනෑ. අපේ සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා කාලයක් තිස්සේ තමන්ට හැකි විධියට, අපේ පක්ෂයට හැකි විධියට ඉස්කෝලවලට smart boards දුන්නා. හැබැයි, ඒ මදි. රජය ඒවාට මුදල් වියදම් කරන්න ඕනෑ. ඒක තමයි ඇත්ත කථාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට පුළුවන් වෙන්න ඕනෑ, අධ්‍යාපනයට මීට වඩා මුදල් වැය කරන්න. අමතක කරන්න එපා, "දිට්වා" සුළි කුණාටුවට වියදම් කරන ඒවා ඇතුළු මේ ඔක්කෝම එක්ක ඔබතුමන්ලා භාරගෙන තිබෙනවා, limit එකක්. ඒ limit එක තමයි, දළ දේශීය නිෂ්පාදනයෙන් උපරිම වියදම් කරන්න පුළුවන් සියයට 13 කියන එක. ඒ සියයට 13ත් "දිට්වා" reconstruction එකටයි, අනෙක් ඒවාටයි වියදම් කළාම කොම්පියුටර් ගන්න සල්ලි මදි වෙනවා. Teachersලා train කරන්න සල්ලි මදි වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, your time is up.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
I will finish in a minute, Sir.

ඉංග්‍රීසි අධ්‍යාපනය උගන්වන්න සල්ලි මදි වෙනවා. ඒ නිසා ආණ්ඩුවක් වුණාම ප්‍රමුඛතාව තේරුම් ගන්න. පෞද්ගලික අංශයට කරන්න පුළුවන් දේවල්වලට ආණ්ඩුව ඔළුව දාන්න ඕනෑ නැහැ. ඇයි, Sri Lanka Electricity Act එක reverse කළේ? Sri Lanka Electricity Act එක reverse කරලා අවසානයේ ඩොලර් බිලියන පහක් වියදම් කරන්න වෙනවා, network එක improve කරන්න. ඒ වෙනුවට එම මුදල් පාවිච්චි කරන්න පුළුවන්, ඉස්කෝලවල ගුරුවරුන් train කරන්න. ඒ අය AI trainingවලට පාවිච්චි කරන්න වෙනවා. ඒක නිසා ප්‍රමුඛතාව තේරුම්ගෙන, public good සඳහා public money යොදවන්න. මම මේක කියන්නේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට ඒ තොප්පියත් දමා ගෙනයි. මහජන යහපත සඳහා වූ පොදු ආර්ථික හා සමාජ යටිතල පහසුකම් නිර්මාණය කරන්න, සේවා සහ භාණ්ඩ නිර්මාණය කරන්න, ඒවාට වියදම් කරන්න තමයි ඇත්තවශයෙන්ම රජය ප්‍රමුඛත්වය ලබා දෙන්න ඕනෑ.

"අස්වැසුම" වැඩ පිළිවෙළ පිළිබඳව අපට අවුලක් නැහැ. මේ වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යනකොට ඇත්තවශයෙන්ම දරිද්‍රතාවෙන් ජනතාව මුදා ගැනීමේ ක්‍රමවේදයක් පිළිබඳව ඔබතුමන්ලා කරුණු ඉදිරිපත් කරලා නැහැ. White Paper එකක් තියා මොකවත් ඉදිරිපත් කරලා නැහැ. "ප්‍රජා ශක්ති" ගැන නම් කථා කරන්න එපා, ඒක දේශපාලන වැඩපිළිවෙළක්. ඇත්ත වශයෙන්ම ඉදිරියේදී දරිද්‍රතාව වැඩි වෙන්නේ ආදායම මත නොවෙයි, අධ්‍යාපනයට ප්‍රවේශ වෙන්න පහසුකම් අඩු වීම නිසායි. එම නිසා අපි දෙපැත්තේ ඉඳගෙන ගහගෙන වැඩක් නැහැ, අඩු පාඩුකම් හරිගස්වාගෙන, කුලුනු පහම ඔස්සේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කටයුතු කරගෙන යමු. අපේ පැත්තෙන් කවදාවත් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධ වෙන්නේ නැහැ. නමුත් ප්‍රශ්නය තිබුණේ, ඇති වුණු අවුලත් එක්ක ඔබතුමන්ලා ඒක හකුළා ගැනීම නිසායි. එහෙම නැත්නම් මේක ඉස්සරහට අරගෙන යන්න අපට දැනුත් අවස්ථාව තිබෙනවා. බොහොමත්ම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Wijesiri Basnayake.

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Minister?

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே)
(The Hon. (Dr.) Upali Pannilage)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියපු එකකටවත් මම respond කරන්නේ නැහැ. නමුත් ඔබතුමා කියපු එක කරුණක් ගැන විතරක් පැහැදිලි කරන්න ඕනෑ. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධව කථා කරද්දී මම කිව්වේ, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් වැය කරන මුදල් ගැන. විශේෂයෙන්ම මහා භාණ්ඩාගාරයේ මුදල්වලින් විශාල ප්‍රමාණයක් Recurrent Expenses විධියට යන බව ඇත්ත. නමුත්, මම සඳහන් කළ රුපියල් බිලියන 60 මේ වසරේත් අපි වෙන් කරලා තිබෙන්නේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ මුදල්වලින්. වැටුප් ගත්තාට, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් බැංකුවල මුදල් සහ එම අරමුදල්වල තිබෙන මුදල් යොදාගෙන තමයි අපි සමාජ සවිබල ගැන්වීමේ වැඩසටහන කරන්නේ. ඊට අමතරව විදේශ ආධාර වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවෙනුත්, ලෝක බැංකුවෙනුත් ලැබුණු රුපියල් බිලියන 2ක විතර මුදලක් යොදාගෙන තමයි මේක කරන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකට මට පිළිතුරක් ලබා දෙන්න අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Dr.) Harsha de Silva, let us not make it a debate. That was a clarification and that is why I gave him time.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
It is not to make it a debate, Sir. මම කියන්නේ, ඒ බැංකුවල තිබෙන්නේ ආණ්ඩුවේ සල්ලි නොවෙයි, බැංකුවල තිබෙන්නේ ඒ මිනිසුන්ගේ සල්ලි. ඒ මිනිසුන්ගේ සල්ලි වියදම් කරලා කොහොමද කියන්නේ, ආණ්ඩුව වියදම් කළා කියලා? ආණ්ඩුව වියදම් කළේ රුපියල් බිලියන 27යි. ඒකෙන් රුපියල් බිලියන 22කින් පඩි ගෙව්වා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. Now, will call upon the next speaker. Hon. Wijesiri Basnayake, you have nine minutes.

[අ.භා. 12.25]

**ගරු විජේසිරි බස්නායක මහතා**
(மாண்புமிகு விஜேசிறி பஸ்நாயக்க)
(The Hon. Wijesiri Basnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ අපි විවාදයට භාජන කරන්නේ 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ ගැසට් කර ඉදිරිපත් කරන ලද අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ගැනයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුබසාධනය, ප්‍රතිලාභ ගැන කියන විට, දරිද්‍රතාව -දිළිඳුකම- කියන එක ඉබේම සාකච්ඡාවට භාජන වන කරුණක්. මොකක්ද, මේ දරිද්‍රතාව කියන්නේ? ලෝක බැංකුව නිර්වචනය කරනවා, "අඩු ආදායම්ලාභී ජනතාවට ගෞරවාන්විතව ජීවත් වීමට අවශ්‍ය මූලික භාණ්ඩ සහ සේවා ලබා ගැනීමට ඇති නොහැකියාව දරිද්‍රතාවයි" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දරිද්‍රතාව ගත්තාම එහි විවිධ ප්‍රවේශයන් තිබෙනවා. සම්බන්ධතාව පිළිබඳ දුප්පත්කම, තාවකාලික දුප්පත්කම, ඒ වාගේම පරම්පරාවෙන් පරම්පරාවට එන දුප්පත්කම - generational poverty - තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අපි අද දවසේ බහුමාන දරිද්‍රතාව - multi-dimensional poverty - ගැන කථා කරනවා. එතැනදී ආදායම විතරක් නොවෙයි, විශේෂයෙන්ම පුද්ගලයන්ගේ සෞඛ්‍ය - health, අධ්‍යාපනය, ඒ වාගේම living standards ගැනත් කථා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිදහසින් පස්සේ පත් වුණු හැම රජයක්ම මේ රටේ දිළිඳුකම පිටුදැකීම සඳහා විවිධ වැඩසටහන් නිර්මාණය කළා. අපි දන්නවා, කූපන් පොත -මුද්දර පොත- ලබා දීම ඒ වාගේම "සමෘද්ධිය" ආදී වශයෙන් විවිධ ආකාරයේ වැඩසටහන් නිර්මාණය කළත්, අද ගත්තත් ජනගහනයෙන් හතරෙන් එකක් විතර ඒ දිළිඳුකමේ ගිලිලා ඉන්නේ. එහෙම නම් කොහේ හෝ වැරැද්දක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද දවසේ අපි සාකච්ඡා කරන 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ විශේෂයෙන්ම ඒ ප්‍රතිලාභ ලැබිය යුත්තන් හඳුනා ගැනීමත්, ඔවුන් වෙත ප්‍රතිලාභ ලබා දීමේ වගකීමත් පැවරිලා තිබෙන්නේ සමාජ සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයට. ඒ අනුව තමයි අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ලැබීමේ යෝජනා ක්‍රමය එන්නේ. විශේෂයෙන්ම මේක 2003දී ආරම්භ වෙලා, අද වන විට එය සෑහෙන්න ගමනක් ඇවිල්ලා තිබෙනවා.

විශේෂයෙන්ම මේ යෝජනා ක්‍රමය යටතේ ප්‍රධාන සමාජ කණ්ඩායම් 4ක් හඳුනාගෙන තිබෙනවා. ඒ පිළිබඳව ගරු අමාත්‍යතුමා පැහැදිලි කළා. ඒ තමයි, සංක්‍රාන්තික කණ්ඩායම, අවදානමට ලක් වූ කණ්ඩායම, දුප්පත් කණ්ඩායම සහ අන්ත දිළිඳු කණ්ඩායම විධියට අරගෙන මේ වැඩසටහන ආරම්භ වුණා. ඊට අමතරව මේ මොහොත වන විට මේ සමාජයේ ජීවත් වන වෙනස් වූ හැකියාවන් සහිත තැනැත්තන්ටත් - differently-abled people, වකුගඩු රෝගයට ගොදුරු වුණු ජනතාවටත්, ඒ වාගේම අපේ රටේ වැඩිහිටියන්ටත් එම ප්‍රතිලාභ ලැබෙනවා. ආබාධ සහිත තැනැත්තන් සඳහා රුපියල් 10,000ක දීමනාවක්, වකුගඩු රෝගීන් සඳහා රුපියල් 10,000ක දීමනාවක් වාගේම වැඩිහිටියන් සඳහා රුපියල් 5,000ක දීමනාවක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ මොහොතේ අත්විඳින සත්‍යය තමයි "දිට්වා" සුළි කුණාටුවේ පශ්චාත් සමය. මේකත් එක්ක මේ රටේ ජීවත් වන මිනිසුන් විශාල අර්බුදයකට මුහුණ දෙනවා. "දිට්වා" සුළි කුණාටුව මඟින් ජනතාවට ඇතිවූ කෙටිකාලීන, දිගුකාලීන බලපෑම් සැලකිල්ලට ගන්න අවශ්‍යයි. මේක මුල් කරගෙන මේ මොහොතේ සංශෝධන රාශියක් ඉදිරිපත් වෙනවා. ඒ වාගේම මේකට අනුව ඒ අදාළ සංශෝධන ගණනාවක් ඉදිරිපත් වුණා. විශේෂයෙන් 2025.12.15 දින දරන ගැසට් පත්‍රයේ මේ පිළිබඳව සාකච්ඡා වෙනවා. මේ ගැසට් පත්‍රයේ නව ගෙවීමේ යෝජනා කිහිපයක් අඩංගුව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අනුව අවදානමට ලක් වෙච්ච සමාජ කණ්ඩායමට ප්‍රතිලාභ ලබා දීමේ කාලය අපි තවදුරටත් දීර්ඝ කරනවා. ඔවුන්ගේ කාලය අවසන් වෙන්න තිබුණේ 2025.12.31වැනිදායි. ඒක මේ වසරේ ජුනි මාසය දක්වා අපි දීර්ඝ කරනවා. ඒ වාගේම ඉතිරි කණ්ඩායම් දෙක වන දිළිඳු සහ අන්ත දිළිඳු කණ්ඩායම් ගැනත් අපි තීව්‍ර ලෙස සලකා බලනවා. මේ අයගේ ප්‍රතිලාභ ගෙවීම මේ වසරේ ජුනි මාසයෙන් අවසන් වෙන්න තිබුණේ. ඒක 2027 ජුනි මාසය දක්වා දීර්ඝ කරනවා. ඒ වාගේම සංක්‍රාන්ති කණ්ඩායමට කරන ගෙවීම 2025 අප්‍රේල් මාසයෙන් අවසන් වුණා. එහි වෙනසක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආබාධ සහිත පුද්ගලයන්, වකුගඩු රෝගීන් සහ වැඩිහිටියන් සඳහා ආධාර ලබා දීමේ කටයුත්ත කිසිම වෙනසක් නැතිව ඒ ප්‍රතිලාභීන් සංඛ්‍යාව වැඩි කරලා දිගටම කරගෙන යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මොහොතේ සමාජයේ දැවැන්ත කතිකාවක් නිර්මාණය වෙලා තිබෙනවා, අස්වැසුම වැඩසටහන පිළිබඳව. මෙතැනදී බහුවිධ දරිද්‍රතාව තමයි මනින්නේ. මේක මැනීමේ නිර්ණායකවලට අදාළ දත්ත එකතු කිරීමේ ක්‍රමය - data collection method - පිළිබඳව දැවැන්ත විවේචනයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වැඩසටහන ජාතික ජන බලවේගයේ වැඩසටහනක් නොවෙයි. අපි ආණ්ඩු බලය ගන්නකොට මේ වැඩසටහන තිබුණා. අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා - රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා - පැහැදිලි කළා, මේ වැඩසටහනේදී ප්‍රධාන වැරැදි දෙකක් කරලා තිබෙනවා කියලා. එකක් තමයි බැහැර කිරීමේ දෝෂය - exclusion error එක. සත්‍ය ලෙස දුප්පත් පවුල් මේ වැඩසටහන තුළට ඇවිල්ලා නැහැ. ඒ වාගේම අපි inclusion error එක ගැන කථා කරනවා. නුසුදුසු පවුල් මේ වැඩසටහනට ඇවිල්ලා තිබීම තුළ රජයේ ආදායම් විශාල ප්‍රමාණයක් අනවශ්‍ය ලෙස බෙදා හැරීමක් සිදු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ වැරැද්ද නිවැරදි කරන්න මේ මොහොත වනවිට ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විධියට අපි මුදල් අමාත්‍යාංශයට යෝජනා කළා, අස්වැසුම වැඩසටහනට ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ නිර්ණායක සහ එහි බරතැබීම පිළිබඳව වෙනසක් කරන්න ඕනෑ කියලා. එහි ප්‍රතිඵලයක් විධියට මේ වනවිට මුදල් අමාත්‍යාංශය expert team එකකින් යුත් Technical Committee එකක් පත් කරලා තිබෙනවා. එහි සභාපතිත්වය දරන්නේ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක. අනෙක් සාමාජිකයන් විධියට මහාචාර්ය සිරිමල් අබේරත්න, මහාචාර්ය සීතා බණ්ඩාර, ආචාර්ය පුලස්ති අමරසිංහ, ආචාර්ය හේරත් ගුණතිලක යන expert team එක වැඩ කරනවා. ඔවුන් මේ මොහොත වනවිට දෙවරක් හමුවෙලා මේ පිළිබඳ අවශ්‍ය සාකච්ඡා සිදුකරලා ඒ සංශෝධන කරමින් පවතිනවා. ඉතා නුදුරේදී අපට ඒ පිළිබඳ වාර්තාව ලැබෙනවා. ඒ වාර්තාව ලැබුණු විගස අපි ගමට ගිහිල්ලා, නිවෙස්වලට ගිහිල්ලා මේ මහ පොළොවේ සැබෑ - real - ලෙසම දරිද්‍රතාවයෙන් පෙළෙන මිනිසුන් හඳුනා ගැනීමේ වැඩසටහන ක්‍රියාත්මක කරලා දුප්පත්කමේ registry එක - poverty registry එක - නිවැරදි ලෙස සංශෝධනය කරලා මේ අවුරුද්දේ ජුනි මාසයේ සිට අස්වැසුම ලැබිය යුතු පුද්ගලයන්ගේ දිළිඳුකම තවදුරටත් පහළ යාමට නොදී ඒ ජනතාව වෙනුවෙන් මේ වැඩසටහන ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණය සඳහන් කරන්න කැමැතියි. අපි ජාතික ජනබලවේගය විධියට මේ රටේ මිනිසුන්ට දුන්න පොරොන්දුව වන "පොහොසත් රටක්- ලස්සන ජීවිතයක්" ඇති කිරීම සඳහා අස්වැසුම වැඩසටහනට සංශෝධන ගෙනැල්ලා ඒක යාවත්කාලීන කරලා සුදුසුම පුද්ගලයන් තෝරාගෙන ඒ වැඩසටහනට රජයේ බදු මුදල් නිවැරදි ලෙස යොදවන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The ongoing Proceedings of the House shall stay suspended till 1.00 p.m for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ (ගරු හේමාලි වීරසේකර මහත්මිය) සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டும் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

මම පළමුවෙන්ම අපේ පොලිසිය භාර අමාත්‍යවරයාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, සැප්තැම්බර් 12වන දින "වෝටර්ස් එජ්" හෝටලය තුළ ඇති වුණු ප්‍රශ්නයක් සම්බන්ධව. ප්‍රධාන මාධ්‍ය ආයතනයක ප්‍රධාන මාධ්‍යවේදියෙකුගේ පුතා ඇතුළු කාන්තාවක් ඇතුළු 4දෙනෙකුට එදින දැඩි පහර දීමක් කර තිබෙනවා. ඉන්පසු ඔවුන් රෝහල්ගත කර තිබෙනවා. හැබැයි, මේ වනකල් ඒ සම්බන්ධව අත්අඩංගුවට ගැනීමක් හෝ එවැනි කිසිම දෙයක් සිදු වෙලා නැහැ. ඒ සිදුවීම වුණු අවස්ථාවේ එම "වෝටර්ස් එජ්" හෝටලයේ සභාපතිවරයා පවා එම ස්ථානයේ සිටියා කියා දැනගන්නට ලැබී තිබෙනවා. ගරු අමාත්‍යතුමාගේ අවධානය මේ කෙරෙහි යොමු කරවමින් අපි අහන්න කැමැතියි, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු වන්නේ නැත්තේ ඇයි කියලා. පරීක්ෂණ කඩිනම් කරලා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගන්න කියා අපි ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ අවස්ථාවේ බලශක්ති ඇමතිතුමා මෙතැන සිටියා නම් මම කැමැතියි. මොකද, බලශක්ති ඇමතිතුමා උදේ කථා කරලා ගිහිල්ලා. උදේ කථා කරලා පැනලා යනවා කියන්නේ අපේ පැත්තේ අයට නේ. හැබැයි, ඇමතිතුමා උදේ කථා කරලා පැනලා ගිහිල්ලාද, නැද්ද දන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පාර්ලිමේන්තුව ඇතුළේ මටත් වරප්‍රසාද තිබෙනවා; බලශක්ති අමාත්‍යතුමාටත් පාර්ලිමේන්තුව ඇතුළේ වරප්‍රසාද තිබෙනවා. ජනාධිපතිතුමා කිව්වා වාගේ, ඇත්තක් නම් CID එකට යනවා, බොරුවක් නම් පාර්ලිමේන්තුවේ කියනවා. ඒ නිසා ජනාධිපතිතුමා කියපු විධියටම මම බලශක්ති ඇමතිතුමාට අභියෝගයක් කරනවා, ආරාධනයක් කරනවා, ලංකාවේ තිබෙන ඕනෑම ප්‍රසිද්ධ මාධ්‍යයක, ඕනෑම යූටියුබ් නාළිකාවක විවාදයකට එන්න කියලා. මම ඔප්පු කරන්නම්, ඔබතුමන්ලා ගෙනා ගල් අඟුරු ටෙන්ඩර් එක අන්ත දූෂිතයි කියන කාරණය. පුළුවන් නම් ඒ අභියෝගය භාර ගෙන විවාදයකට එන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ගරු සජිත් ප්‍රේමදාස මහත්මයා අද උදේ මේ ගල් අඟුරු ටෙන්ඩරය ගැන ප්‍රශ්න කළා. එසේ ප්‍රශ්න කරද්දී ලබා දුන් උත්තර පට්ටපල් බොරු. මම ඒවායෙන් එකක් ගැන විතරක් කියන්නම්. සජිත් ප්‍රේමදාස මහත්මයා ස්ථාවර නියෝග 27 (2) යටතේ ඇසූ ප්‍රශ්නයේ 9වැනි කොටසෙන් අසා තිබෙනවා, මේ බාල ගල් අඟුරු ඒ බොයිලේරුවලට දැම්මොත් ඒකෙන් ඒ බොයිලේරුවලට හානියක් වෙනවාද, නැද්ද කියලා. කෙළින්ම උත්තරය දෙන්නේ, "නැත" කියලායි. මොකක්ද මේ උත්තරය? මා දන්නා විධියට එතුමා ඉංජිනේරු මහත්මයෙක්. කොහොමද එහෙම, "නැහැ" කියන්නේ? වැඩිය ඕනෑ නැහැ, ඔබතුමා Google එකට යන්නකෝ, ChatGPT යන්නකෝ. ගල් අඟුරුවල ash content එක වැඩි වුණාම, calorific value එක අඩු වුණාම මොනවාද වෙන්නේ කියලා ඔබතුමන්ලා අන්තර්ජාලයට ගිහිල්ලා බලන්න.

[ගරු ඩී.වී. චානක මහතා]

එහි මේවා ගැන පැහැදිලිව සඳහන්ව තිබෙනවා. බාල ගල් අඟුරු භාවිතය නිසා එක පැත්තකින් බලශක්තිය අඩු වෙනවා; අනෙක් පැත්තෙන් දුමාරය වැඩි වෙනවා; බොයිලේරුව විනාශ වෙනවා; නිතරම clean කරන්න වෙනවා; වායුගෝලය දූෂණය වෙනවා; ඒ වාගේම තමයි ජලය දූෂණය වෙනවා; පස දූෂණය වෙනවා.

ඒ කාලයේ හොඳ ගල් අඟුරු දැම්මත් ලාල් කාන්ත මැතිතුමන්ලා "සාම්පූර් එපා" කියලා සුප්‍රිම් උසාවි ගියා. නමුත් අන්තිමට අද බාල ගල් අඟුරු මේ රටට ගෙනැල්ලා දහනය කරමින් කියනවා, "කමක් නැහැ. දෙගුණයක් අපට ගන්න පුළුවන්" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ තිබෙන්නේ ඒ ගිවිසුම. මම ඇමතිතුමාට කියනවා, මේ Agreement එකේ Section 3.5.6 කියවන්න කියලා. එහි පැහැදිලිවම තිබෙනවා, බාල ගල් අඟුරු අඩු මුදලට හෝ වන්දියක් එක්ක හෝ මොන විධියට ගත්තත්, ඒවායෙන් හානියක් වුණොත් -නොරොච්චෝලේ බලාගාරයට යම්කිසි ආකාරයකට හානියක් වුණොත්- එහි වගකීම buyer ගන්න ඕනෑ කියලා. Seller කොයි වෙලාවකවත් වගකීම ගන්නේ නැහැ කියලා මේකේ පැහැදිලිව කියා තිබෙනවා.

මේ Agreement එකේ එසේ කියා තිබියදීත් බාල ගල් අඟුරු ගෙන්වා තිබෙනවා. ඒ බාල ගල් අඟුරු දහනය කිරීම නිසා එක පැත්තකින් ශ්වසන ආබාධ ඇති වෙන්න පුළුවන්. නොරොච්චෝලේ බලාගාරය අවට සිටින අයට ශ්වසන ආබාධ ඇති වෙන්න පුළුවන්, වකුගඩු රෝග ඇති වෙන්න පුළුවන්. මේ හේතුවෙන්, කෘෂි කර්මාන්තයටත් බලපෑම් ඇති වෙන්න පුළුවන්. මොකද, ඒකේ ash content එක වැඩියි, dust එක එළියට යනවා වැඩියි, දුමාරය වැඩියි. ඒවා පාවිච්චි කළොත් නොරොච්චෝලේ බලාගාරය අවට සිටින ජනතාවගේ පුංචි දරු පැටවුන්ගේ, වයසක අයගේ ජීවිත පවා අවදානමට ලක් වෙන්න පුළුවන්කම තිබෙනවා.

හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අහපු ප්‍රශ්නවලට හරියට උත්තර දෙනවා වෙනුවට අමාත්‍යවරයා මොකක්ද කළේ? අද උදේ එතුමාගෙන් මේවා ගැන ඇහුවාට පසුව මොකක්ද කිව්වේ? "විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ ගැන කථා කරන්නේ අර පරණ company එකට, අර Russian company එකට ගල් අඟුරු ටෙන්ඩරය හම්බ වුණේ නැති නිසා" කියලායි කිව්වේ. "විපක්ෂයට තිබෙන්නේ පොටෙන්ෂියා කියන සමාගමට ගල් අඟුරු ටෙන්ඩරය හම්බ වුණේ නැති ප්‍රශ්නයයි; ඒ සමාගම දූෂිතයි; ඒ සමාගමට ඒ ටෙන්ඩර් එක හම්බ වුණා නම් විපක්ෂය කෑ ගහන්නේ නැහැ" කියලාත් කිව්වා. හැබැයි මම ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ඔය පොටෙන්ෂියා කියන සමාගමට registration දීලා තිබෙන්නේ ඔබතුමාය කියන කාරණයට. බලශක්ති අමාත්‍යාංශය ජයකොඩි ඇමතිතුමා භාරයේ තිබියදී පසු ගිය අවුරුද්දේ ජූලි මාසයේදී තමයි පොටෙන්ෂියා කියන සමාගමට registration දීලා තිබෙන්නේ. එතුමාගේ වම් අත කරන දේ දකුණු අත දන්නේ නැහැ; දකුණු අත කරන දේ වම් අත දන්නේ නැහැ. එතුමාම registration දීලා එතුමාම විපක්ෂයට චෝදනා කරනවා. ඒ වාගේම, එතුමන්ලා දූෂිතයි කියන ඒ සමාගමට ඒ අවුරුද්දේම අගෝස්තු මාසයේදී හොරට නැව් පහකුත් වැඩි කරලා දුන්නා. ඊට පස්සේ මම තමයි පාර්ලිමේන්තුවේදී ඒක හෙළි කළේ. හෙළි කළ ගමන් ආයෙත් ගිහිල්ලා, ගහපු award එකත් cancel කළා. මා හිතන විධියට මේ ඇමතිතුමාට short-term memory loss; තමන් කියපු දේ එතුමාටම මතක නැහැ. එතුමාම කියනවා, මේ සමාගම දූෂිතයි කියලා; එහෙත් ඒක register කරනවා; ටෙන්ඩරයට තවත් නැව් පහකුත් දෙනවා; අප ඒක හෙළි කළාම එතුමාම එය cancel කරනවා; අන්තිමට විපක්ෂය පැත්තටත් චෝදනා දමන්න හදනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ගනුදෙනුව දූෂිතයි. මොකද, ඉස්සර අමාත්‍යවරුන්ට තිබුණේ හදිසි මිල කැඳවීම් පිළිබඳ ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නයම තමයි මේකත්. මේ ඇමතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයටම හිරේ යන්න වෙනවා. මොකද, ලංකාවේ කිසිම හදිසියක් තිබුණේ නැහැ. අප්‍රේල් මාසයේ කැඳවන්න ඕනෑ ටෙන්ඩරය අගෝස්තු වනකල් කල් දැම්මා. ඊට පස්සේ සති හයක් දෙන්න ඕනෑ එකට සති තුනක් දුන්නා. ඊට පස්සේ හදිසි ටෙන්ඩරයක් කියපු එක අන්තිමට review කරන්න මාස එකහමාරක් ගත්තා. හදිසි ටෙන්ඩරයක් නම් සති දෙකෙන් review කරන්න ඕනෑ. අන්තිමට මොකක්ද කළේ? කෙනෙකුට ඕනෑ විධියට ඇඳුම මහලා දෙනවා වාගේ, අමාත්‍යතුමා සමාගම්වලට ඕනෑ විධියට කෙලින්ම ටෙන්ඩරය හදලා දීම නිසා අද බාල ගල් අඟුරු ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ඒවා භාවිතය නිසා එක පැත්තකින් බොයිලේරු කැඩෙන්න පුළුවන්; අනෙක් පැත්තෙන් ශ්වසන රෝග ඇති වෙන්න පුළුවන්; ජලය අපවිත්‍ර වෙන්න පුළුවන්; පස අපවිත්‍ර වෙන්න පුළුවන්. හැබැයි ඇමතිතුමා කියනවා, "අපි දෙගුණයක් ගන්නවා, ප්‍රශ්නයක් නැහැ" කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ඉන්න ඉංජිනේරු මහත්වරුත් එක්ක සාකච්ඡා කරන්න මේකෙන් technically විය හැකි බලපෑම ගැන.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

**ගරු ඩී.වී. චානක මහතා**
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D.V. Chanaka)
පැහැදිලිවම මෙතැන දූෂිත ගනුදෙනුවක් වෙලා තිබෙනවා. මම නැවත වතාවක් අමාත්‍යවරයාට අභියෝග කරනවා, ආරාධනා කරනවා, පුළුවන් නම් මේ පාර්ලිමේන්තුවෙන් පිටතදී මේ පිළිබඳව ප්‍රසිද්ධ විවාදයකට එන්න කියලා. එතකොට අපි සූදානම්, විවාද කරන්න.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තිලංක යූ. ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.07]

**ගරු තිලංක යූ. ගමගේ මහතා**
(மாண்புமிகு திலங்க யூ. கமகே)
(The Hon. Thilanka U. Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය සංශෝධනය කිරීමට අදාළව කරුණු සාකච්ඡා වන මේ මොහොතේ මටත් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

අපි කවුරුත් දන්නවා, "අස්වැසුම" කියන්නේ පසුගිය ආණ්ඩුව විසින් මේ රටේ දුප්පත් ජනතාව වෙනුවෙන් ගෙන එන ලද වැඩ පිළිවෙළක් බව. නමුත් අපි මේ ආණ්ඩුව භාර ගන්න කලින් ඉඳලාම කථා කළේ, මීට එහා යමින්, සැබෑ ලෙසම මේ රටේ දුප්පත්කම, දරිද්‍රතාව තුරන් කිරීම සඳහා අවශ්‍ය කරන, විශේෂයෙන් බිම් මට්ටමට අනුව හඳුනාගත්තු, ආර්ථිකයත් එක්ක බද්ධ වෙච්ච වැඩ පිළිවෙළක් ගැනයි. එවැනි වැඩ පිළිවෙළක් ගැන තමයි අප සාකච්ඡා කරමින් ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම 2026 වර්ෂයෙන් අවසන් කිරීමට තමයි නියමිතව තිබුණේ. නමුත් මේ වෙලාවේ, විශේෂයෙන්ම "දිට්වා" සුළි

කුණාටුවත් සමඟම මේ රටේ දරිද්‍රතාවෙන් පෙළෙන ජනතාව බරපතළ ව්‍යසනයකට පත් වෙලා තිබෙනවා, රටේ දිස්ත්‍රික්ක කිහිපයක හැරුණාම. ඒ නිසා අපි මේ වෙලාවේ 2027 අවුරුද්ද දක්වා ඒ ඇතැම් ගෙවීම් කාල සීමා දීර්ඝ කර තිබෙනවා. මෙහිදී සුබසාධක ප්‍රතිලාභ ගෙවීම් ලබන සමාජ කාණ්ඩ වෙන් කර තිබෙනවා සංක්‍රාන්තික, අවදානමට ලක්වූ, දුප්පත් සහ අන්ත දිළිඳු යනුවෙන්. ඒ අනුව "සංක්‍රාන්තික" කියන කාණ්ඩය සඳහා 2025 අප්‍රේල් 30වන දා දක්වාත්, "අවදානමට ලක් වූ" කියන කාණ්ඩය සඳහා 2025 දෙසැම්බර් 31වන දා දක්වාත්, "දුප්පත්" කියන කාණ්ඩය සඳහා 2026 ජුනි මාසයෙන් අවසන් වන විධියටත්, ඒ වාගේම "අන්ත දිළිඳු" ජනතාව සඳහා 2026 ජුනි මාසයෙන් අවසන් වන විධියටත් තමයි ප්‍රතිලාභ ගෙවීමේ කාලය නියම කර තිබුණේ. නමුත් අප මේ සංශෝධනයත් එක්ක සුබසාධක ප්‍රතිලාභ ගෙවන කාල සීමාව "දුප්පත්" ජනතාව සඳහා 2027 ජුනි දක්වාත්, "අන්ත දිළිඳු" ජනතාව සඳහා 2027 ජුනි දක්වාත්, "අවදානමට ලක් වූ" පවුල් සඳහා 2026 ජුනි දක්වාත් දීර්ඝ කර තිබෙනවා. ඒ සඳහා තමයි මේ සංශෝධනය ගෙනැවිත් තිබෙන්නේ. ඒ වාගේම මේ වැඩ පිළිවෙළත් එක්කම අපි පාසල් ළමුන්ට, ආබාධිත පුද්ගලයන්ට වාගේම වැඩිහිටියන්ට අදාළ දීමනා ලබා දීම යන සියල්ලත් සිදු කරනවා. විශේෂයෙන්ම 1,920,000ක වාගේ ප්‍රමාණයකට අපි අස්වැසුම ලබාදෙනවා. ගොඩක් වෙලාවට මේ අස්වැසුම කැපුණාට පස්සේ -අහිමි වුණාට පස්සේ- දුප්පත් ජනතාව කියන්න උත්සාහ කළා, ආණ්ඩුව විසින් අස්වැසුම කපනවා කියලා. නමුත් ඇත්තටම ඒක කපනවා නොවෙයි, ඒ වැඩ පිළිවෙළ අනුව අස්වැසුම අවසන් වන ක්‍රමයක් තමයි මේක ඇතුළේ තිබෙන්නේ. හැබැයි අස්වැසුම අවසන් වෙනවාත් එක්කම ජනතාව සැබෑ ලෙස ආර්ථිකයට බද්ධ කරගන්නා වූ වැඩ පිළිවෙළක් සහිතව ඔවුන් නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගනිමින්, කුඩා කර්මාන්තකරුවන්ට ණය පහසුකම් ලබා දෙමින් මේ රටේ දුප්පත්කම තුරන් කිරීම සඳහා සැබෑ වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙනවා. මේ දවස්වල ඒ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කිරීම සඳහා කමිටු පත් කරලා ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. එහෙම නැතුව අපට එක සැරේ මේක අවසන් කරන්න බැහැ. එහෙම අවසන් කළොත් වෙන්නේ දුප්පත් ජනතාව තත්ත්වයෙන් තවත් පහළට වැටෙන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දුප්පත් ජනතාව වෙනුවෙන් ඉතිහාසයක් පුරාවට මෙතෙක් කල් කරගෙන ආපු කිසිදු වැඩ පිළිවෙළකින් අපේ රටේ දුප්පත්කම තුරන් කරන්න හැකියාවක් ලැබුණේ නැහැ. විශේෂයෙන්ම දුප්පත්කම වැඩි වුණා මිස එහි අඩුවීමක් අපි දැකලා තිබුණේ නැහැ. දුප්පත් ජනතාව අස්වැසුම හෝ වෙනත් ප්‍රතිලාභීන් විධියට එකතු වෙන එක තමයි අපි හැම දාම දැක්කේ. ඒ නිසා අපට මෙන්න මේ දුප්පත්කම නැති කරන සැබෑ වැඩ පිළිවෙළක් ඕනෑ. ඒ සඳහා තමයි අපි කථා කරන්නේ ඔවුන් මෙන්න මේ නිෂ්පාදන ක්‍රියාවලියට බද්ධ කරගන්නේ කොහොමද කියලා. රටේ ජාතික නිෂ්පාදනයට ඔවුන්ගේ දායකත්වය සපයා ගනිමින්, ඔවුන් ආර්ථිකයට බද්ධ කරගෙන ඔවුන්ට ස්වශක්තියෙන් නැඟී සිටින්න අවශ්‍ය ශක්තිය ලබා දෙන්න ඕනෑ යම් වැඩ පිළිවෙළක් ඇතුළේ. අන්න ඒ වෙනුවෙන් තමයි අපි කටයුතු කරන්නේ. එතෙක් තමයි මේ දීර්ඝ කිරීම කරන්න කටයුතු කරමින් තිබෙන්නේ. අපි දන්නවා, එවැනි වැඩ පිළිවෙළක් තුළ තමයි ඔවුන් දුප්පත්කමින් මුදා ගන්න පුළුවන් වන්නේ කියලා. නමුත් හැමදාමත් ආණ්ඩු කළේ මේකයි. දුප්පත්කම විකුණමින්, එහෙම නැත්නම් දුප්පත්කම නඩත්තු කරමින් පැවතිච්ච ආණ්ඩු තමයි අපි දැක්කේ. ඔවුන් හැම දාම දුප්පත්කම නඩත්තු කළා තමන්ගේ ඡන්ද ව්‍යාපාරය වෙනුවෙන්. ඡන්ද ව්‍යාපාරයක් එනකොට ඔවුන්ට විවිධ දේවල් ලබා දෙනවා කියනවා. පසුගිය කාලයේ අස්වැසුම හෝ සමෘද්ධිය වැනි දේවල් ලබා දෙමින් තමයි ඡන්ද ව්‍යාපාර කළේ. අපේ ආණ්ඩු කාලය තුළ අපි කෙසේ හෝ තවදුරටත් දුප්පත්කම මත දේශපාලනය කරන එක නතර කරනවා. අපි ඒ වෙනුවෙන් වැඩ පිළිවෙළක් සකස් කරමින් යනවා. එතෙක් අපි අස්වැසුම මේ විධියට ලබා දෙනවා. ඇත්තටම ගත්තොත්, අපි බලයට ඇවිල්ලා මේ දීමනාව වැඩි කරලා තිබෙනවා. මොකද, මේ ජනතාව ආරක්ෂා කරගන්න අපට විශේෂයෙන්ම වගකීමක් තිබෙනවා.

ඒ වාගේම අපි දන්නවා, මේ අය ආර්ථිකයට බද්ධ කරගන්න වැඩ පිළිවෙළින් විතරක් හරියන්නේ නැහැ කියලා. ඒ සඳහා මේ මානව සම්පත දියුණු මානව සම්පතක් බවට පත් කරගන්න ඕනෑ. ඒ සඳහා හොඳ අධ්‍යාපනයක් ඕනෑ. ඒ වෙනුවෙන් තමයි අපි පසුගිය දවස්වල අවශ්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙළ ගෙනාවේ. ඒක ගේනකොට මේ රටේ මහා බිල්ලෙක් මැව්වා. විශේෂයෙන්ම මේ රටේ දුප්පත් ජනතාවගේ දරුවන් වෙනුවෙන් තමයි අපි මේ වැඩ පිළිවෙළ ගෙනාවේ. හැබැයි ඒ වැඩ පිළිවෙළ ගේනකොට මොකක්ද කළේ? විපක්ෂය ඒ වෙනුවෙන් මහා හඬක් නඟමින් දුප්පත් අම්මා තාත්තාගේ දරුවන් ගැන හිතන එක වෙනුවට ඒක කඩාකප්පල් කරන්න, ඒක නතර කරන්න විශේෂයෙන් මැදිහත් වුණා. අපි ඒ වෙලාවේ අඩියක් පිටිපස්සට ගත්තා නොවෙයි. අපිට ඊට වඩා වේගයෙන් ජනතාවට මේ ගැන පැහැදිලි කරන්න ඕනෑ වෙලා තිබුණා. ජනතාව දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ මාලාවක් අපි හදලා තිබෙනවා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ඇතුළේම විතරයි සැබෑ වැඩ පිළිවෙළක් තුළ දුප්පත්කම තුරන් කරගන්න පුළුවන් වන්නේ.

අපේ අගමැතිතුමියට විශාල ලෙස අපහාස කරමින් විපක්ෂයේ අය හැසිරුණු ආකාරය අපි දැක්කා. ඇත්තටම ඔවුන්ගේ හැසිරීම ගැන අපි කනගාටු වෙනවා. ඔවුන් විශ්වාස භංග යෝජනාවක් ගේනවා කියලා පාරම්බෑවා. හැබැයි අද වෙනකොට ඒක කල් දමමින් තිබෙනවා. අපි කියනවා, පුළුවන් නම් ලබන බ්‍රහස්පතින්දා, සිකුරාදා දින දෙක තුළ ඔබතුමන්ලාගේ විශ්වාස භංගය ගේන්න කියලා. අපි ඒ විවාදයට සූදානම්. එහෙම නැත්නම් ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ගැන මේ රටට කියන විවාදයක් සඳහා අපි සූදානම්. එහෙම නැත්නම් මේක ගැන තවදුරටත් එළියේ නොකියා ඉන්න ඕනෑ. අපි ඒ නිසා විපක්ෂයට කියනවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන ඔබතුමන්ලාත් හරියට ඉගෙන ගන්න කියලා. ඒ ගැන හරියට ඉගෙන ගෙන මේ රටේ දුප්පත්කම තුරන් කිරීම සඳහා වූ සැබෑ වැඩ පිළිවෙළ වෙනුවෙන් ඔබතුමන්ලාත් දායක වෙන්න. එහෙම නැතුව කවදාවත් මේ රටේ ජනතාව දුප්පත්කමින් මුදා ගන්න බැහැ. ඒ වෙනුවෙන් අවශ්‍ය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තමයි ගෙනාවේ. ඒ තුළ මේ රටේ දුප්පත් දරුවන්ට හොඳ අධ්‍යාපන වැඩ පිළිවෙළක් එක්ක ඔවුන්ගේ නිපුණතාවට සරිලන වැඩ පිළිවෙළ තිබෙනවා. ඔවුන්ට තිබෙනවා විවිධ හැකියා, කුසලතා. ඔවුන්ගේ ඒ දැනුම, හැකියාව, කුසලතාව මඟින් පුළුවන් විවිධ ක්ෂේත්‍රවලට යොමුවන්න.

අපි දන්නවා මෙතෙක් කල් තිබුණේ කට පාඩම් කරලා විභාග පාස් කරන අධ්‍යාපන ක්‍රමයක් බව. හැබැයි, ගොඩක් දරුවන්ට ඒ හැකියාව නැහැ. අපේ පාසල් අධ්‍යාපන ක්‍රමය ඇතුළේ තිබුණේ විභාගයෙන් දක්ෂයන් තෝරන එක විතරයි. ඒ කියන්නේ, අදක්ෂයන් හලන එක විතරයි. හැබැයි, අපට ඕනෑ දරුවන්ගේ හැකියාව මත ඔවුන් විවිධ ක්ෂේත්‍රවලට තෝරා යොමු කරන අධ්‍යාපන ක්‍රමයක්. එවැනි අධ්‍යාපන ක්‍රමයක් අපට අවශ්‍යයි. අපට ඕනෑ, හැම කෙනෙක්ම තෝරා ගන්නා ක්ෂේත්‍රය පිළිබඳ විද්වතෙක්, නිපුණතා සහිත ප්‍රවීණයෙක් ලෙස ගොඩනඟන්නයි. එවැනි අධ්‍යාපන ක්‍රමයක් තමයි අපි ගෙනැල්ලා තිබෙන්නේ. ඒ තුළින් තමයි දුප්පත්භාවය තුරන් කර ගන්න හැකියාව ලැබෙන්නේ.

අපි දන්නවා, ඈත පිටිසර ගම්වල අපේ දුප්පත් අම්මා තාත්තාගේ දරුවන්ට හරි හමන් අධ්‍යාපනයක් නැහැ කියලා. ඔවුන්ට හරි හමන් අධ්‍යාපනයක් නැති වනකොට හොඳ රැකියා

[ගරු තිලංක යූ. ගමගේ මහතා]

අවස්ථා ලැබෙන්නේ නැහැ. ඔවුන් තුළින් හොඳ නිර්මාණ බිහි වෙන්නේ නැහැ. ඔවුන් තුළින් ආර්ථිකයට අවශ්‍ය නව නිපැයුම් බිහි වෙන්නේ නැහැ. ලෝකයේ ගොඩක් රටවල් ගොඩනැඟුණේ එහෙම ක්‍රමවලින් තමයි. දැවැන්ත ආර්ථිකයක් හදපු, විශාල කර්මාන්ත බිහි කළ රටවල් ගැන අපි කථා කරනවා. ඒ හැම එකක්ම බද්ධ වෙලා තිබෙන්නේ අධ්‍යාපනයත් එක්ක. අධ්‍යාපන ක්‍රමයේ වෙනසක් නැතුව දුප්පත්කම තුරන් කිරීමේ හැකියාවක් නැහැ. අපි ඒ නිසා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන එනවා වාගේම, අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ගෙවනු ලබන කාල සීමාව දීර්ඝ කරලා තවදුරටත් ලබා දෙනවා.

අපි ඉදිරියේදී මේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය වෙනුවට ඒ ජනතාව ආර්ථික වශයෙන් නඟා සිටුවන්න, ග්‍රාමීය දුප්පත්භාවය තුරන් කරන්න වෙනම වැඩ පිළිවෙළක් ගෙන එනවා. ප්‍රජා ශක්ති ජාතික වැඩසටහන අපි ගෙන එන්නේත් ඒ වැඩ පිළිවෙළ ඇතුළේ. විශේෂයෙන්ම දුප්පත්භාවය තුරන් කිරීම සඳහා වැඩ පිළිවෙළක් අපි හදාගෙන යනවා. අපට අනිවාර්යයෙන්ම සහතික කරලා කියන්න පුළුවන්, මේ හැම වැඩ පිළිවෙළක් තුළින් මේ අවුරුදු පහ යනකොට දුප්පත්භාවයෙන් තොර ජනතාවක් මේ රටේ හදන්න පුළුවන් බව. අපි රටේ දරුවන්ට හොඳ අධ්‍යාපන ක්‍රමයක් හදනවා. අනිවාර්යයෙන්ම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනෙන්න අපි හැම දෙනාම එකට එකතු වෙලා රජය විධියට මැදිහත් වනවා. විපක්ෂය මොන දේවල් කිව්වත්, මොන ආකාරයේ අවලාද, මඩ ප්‍රචාර හා බොරු වැපුරුවත් අම්මා, තාත්තා ඇතුළු රටේ ජනතාව මේ වෙලාවේ දැනුවත් වෙමින් ඉන්නවා; දැනුවත් කරමින් යනවා. අපි කෙසේ හෝ මේ රට ගොඩනඟනවා කියන එක සහතික කරලා කියමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු තුරෙයිරාසා රවිකරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.16]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, நலன்புரி அனுகூலங்கள் சட்டத்தின் கீழான அஸ்வெசும நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டத்தின் ஊடாக நலிவுற்றோருக்கு தற்காலிக மற்றும் நீடித்த வலுவூட்டலை மேற்கொள்ளும் இந்தக் கொடுப்பனவுத் திட்டத்தின் தொடர்ச்சி வரவேற்புக்குரியது. சிங்களத்தில் 'அஸ்வெசும' என்பது தமிழில் 'ஆறுதல்' எனப் பொருள்படும். நலனோம்பல் வழியே மக்களை ஆற்றுப்படுத்தும் முயற்சிகள் எப்போதும் வரவேற்புக்குரியன.

ஆனால், மக்கள் எப்போதும் ஆற்றுப்படுத்தப்படுவதில்லை. ஆற்றுப்படுத்துவதற்கான அளவுகோல்கள் இந்த நிலத்திலே வீசி எறியப்பட்டு இருக்கின்றன. கடந்த மாதம் நாங்கள் தொலைத்த எங்கள் மகள் குகநேசன் டினோஜோ இன்னும் ஆறாமல் நீதிக்காகக் காத்திருக்கிறாள். இன்று அவளது 31ஆவது நினைவு நாள்! கௌரவ சுகாதார அமைச்சர் அவர்களே, கௌரவ சபை முதல்வர் அவர்களே, உங்கள் அரசு பக்கச்சார்பற்ற விசாரணையை நடாத்தி எங்கள் மகள் தொடர்பில் நீதியை வழங்க வேண்டும். முல்லைத்தீவு மாவட்டத்தின் சிலாவத்தைப் பகுதியைச் சேர்ந்த 12 வயதுப் பள்ளி மாணவி குகநேசன் டினோஜோவுக்கு இந்தச் சபையில் மனம் கனத்து நீதி வேண்டிய வண்ணம் என் அஞ்சலியைச் செலுத்துகின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இயலாத மக்களின் இறுதி நம்பிக்கைதான் மருத்துவமனைகள்! அந்தத் தளமே உயிர்களுக்கும் இறுதி நம்பிக்கைகளுக்கும் பலிபீடமாகுவது, மருத்துவத்துறையைத் தாண்டி அரச முறைமைக்கே பேரிழுக்காகிறது. சிறந்ததோர் எதிர்காலத்துக்கான முதலீடாகவேண்டிய டினோஜாவின் வாழ்வுக்கு 12 வயதில் முல்லைத்தீவு மாவட்டப் பொது மருத்துவமனையில் முற்றுப்புள்ளி வைக்கப்பட்டுள்ளது. இது இலங்கையில் இடம்பெற்றுவரும் மருத்துவத் தவறுகளின் தொடர்ச்சி என்பதையே காலம் சுட்டிக்காட்டுகிறது. மருத்துவர்களின் அசமந்தப்போக்கு இன்னும் எத்தனை உயிர்களை இலங்கையில் காவு கொள்ளப்போகிறது? பிள்ளையின் மரணம் தொடர்பில் நீதியான விசாரணை மேற்கொள்ளுமாறும், முல்லைத்தீவு மாவட்டப் பொது மருத்துவமனையில் தொடரும் வினைத்திறனற்ற மருத்துவ சேவை வழங்கலுக்கு இறுக்கமான கண்காணிப்பை மேற்கொள்ளுமாறும் இந்த உயரிய சபையூடாக அரசின் மாண்புமிகு தலைவரையும் கௌரவ சுகாதார அமைச்சரையும் கேட்டுக்கொள்ளும் அதேநேரம், முல்லைத்தீவு மாவட்டத்தில் சீரிய சேவையைத் தொடர்ந்தும் ஆற்றிவருகின்ற மருத்துவ அதிகாரிகள் மற்றும் ஊழியர் அணியின் சேவையையும் இந்த அவையில் நன்றிப்பெருக்கோடு மனங்கொள்கின்றேன்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஒரு குடும்பத்தின் வறுமையை ஓரிரு பரிமாணங்களில் அளவிடுவதற்கு மேலாக, கல்வி, சுகாதாரம், பொருளாதார மட்டம், சொத்து, வீடமைப்பு நிர்மாணம் மற்றும் குடும்ப மக்கள் தொகையென ஆறு பரிமாணங்களில் 22 சுட்டிகள் ஊடாக வறுமையின் பல் பரிமாணங்கள் ஆய்வுக்குட்படுத்தப்பட்டு, வறியவர்கள் ஆறுதல் நலன்புரி நன்மைகளுக்காகத் தெரிவு செய்யப்படுகின்றனர். முல்லைத்தீவு மாவட்டத்தில் பதிவுகளின் அடிப்படையில், முதலாவது கட்டத்தில் மேற்படி ஆறுதல் நலன்புரி நன்மை கொடுப்பனவுத் திட்டத்தில் 14,842 குடும்பங்களும் இரண்டாவது கட்டத்தில் 2,942 குடும்பங்களும் என மொத்தமாக 17,784 குடும்பங்கள் உள்ளீர்க்கப்பட்டுள்ளன. விண்ணப்பித்தோரில் முதல் கட்டத்தில் 52.64% குடும்பங்களும் இரண்டாம் கட்டத்தில் 55.86% குடும்பங்களும் மேற்படி கொடுப்பனவுத் திட்டத்தில் உள்ளீர்க்கப்பட்டுள்ளன.

இதற்கு முன்னர் காணப்பட்ட 'சமுர்த்தி' - தமிழில் 'செழிப்பு' என்று சொல்வார்கள் - கொடுப்பனவு முறைமையை விடவும் மேம்பட்ட வகையில், பல்பரிமான வறுமைச் சுட்டிகளின் பயன்பாட்டோடு கொண்டுவரப்பட்ட இம்முறைமையிலும் பொருத்தமற்றவர்கள் உள்ளீர்க்கப்பட்டமை, உள்ளீர்க்கப்பட வேண்டியோர் விலக்கப்பட்டமை என இருவகை முறைப்பாடுகளும் ஏற்றுக்கொள்ளக்கூடிய அளவில் புறத்தே உள்ளன.

ஆறுதல் நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டத்தின் தொடர்ச்சியில் பின்வரும் காரணிகளில் இவ்வரசு கூடுதல் கவனத்தை எடுக்குமாறு கேட்டுக் கொள்கின்றேன். முதலாவது, எண்ணீடுகளை வினைத்திறனாக மேற்கொள்ளல். இரண்டாவது, தொடர்ச்சியான கண்காணிப்பும் மதிப்பீடும். மூன்றாவது, சமர்ப்பிக்கப்படும் ஆட்சேபனைகளுக்கு காலதாமதமின்றிய மறுமொழிகள் வழங்கல். நான்காவது, 6 துறைகளின் 22 சுட்டிகள் எனும் அளவிடல் முறையை மேலும் மேம்படுத்தல். இவற்றுக்கு மேலாக, தீவளாவிய

கணிப்புகளுக்கு அப்பால், வடக்கு, கிழக்குப் பகுதியில், குறிப்பாக வன்னியில் வறுமை தொடர்ச்சியாகத் தக்கவைக்கப்படுவதை இந்தச் சபையில் அரசின் கவனத்துக்குக் கொண்டுவருகின்றேன். மேற்படி கொடுப்பனவுத் திட்டமானது, 5-16 வயதுக்குட்பட்ட இடைவிலகிய மாணவர்களையும் க.பொ.த. (சா/த) பெறுபேறுக்கு கீழான சித்திநிலையையும் கல்வித்துறை சார்பான வறுமையின் சுட்டியாக அடையாளப்படுத்துகின்றது.

போருக்குப் பின்னர் 23 பாடசாலைகள் வவுனியா வடக்கு கல்வி வலயத்தில் மூடப்பட்டுள்ளன. மேற்படி வலயத்தில் 4 பாடசாலைகளில் 50 சதவீதமான ஆசிரியர் பற்றாக் குறையுள்ளது. கடந்த இரண்டு ஆண்டுகளில் 45க்கும் அதிகமான ஆசிரியர்கள் வேலையை வறிதாக்கிச் சென்றுள்ளனர். இத்தகைய சூழமைவு மாணவர் இடைவிலகலையும் மாணவர்களின் கல்வி அடைவில் வீழ்ச்சியையும் தூண்டாதா? இத்தகைய சூழமைவு மாணவர்களையும் சமூகத்தையும் வறுமைக்குள் தள்ளாதா? வாழ்வாதார நிலங்கள், வாழுகின்ற வீடு, காணி இல்லாதிருப்பது வறுமையின் அடையாளம். நெற்செய்கை நிலம், மேட்டுநிலம், வாழுகின்ற வீடு மற்றும் காணி இல்லாதிருப்பதை வறுமையின் சுட்டியாக ஆறுதல் நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டம் அடையாளப்படுத்து கின்றது.

இராணுவத்தினரின் கையகப்படுத்தலில், வனவளத் திணைக்களம், தொல்பொருளியல் திணைக்களம் என்பவற்றின் கையகப்படுத்தலில், தமது சொந்த நிலங்களை, விளைநிலங்களை, மேட்டு நிலங்களை, குடியிருப்பை, தோட்டங்களைப் பறிகொடுத்து மாற்றுக் காணிகளில் தற்காலிகமாகக் காத்திருக்கும் இந்த மக்களை இந்தச் சுட்டிகள் வறுமைப்பட்டவர்களாக அடையாளப்படுத்துகின்றதா? அல்லது வறுமையற்றவர்களாக அடையாளப்படுத்துகின்றதா? சொந்த நிலங்களுக்காகக் காத்திருக்கும் முலைத்தீவின் கேப்பாப்பிலவு மக்கள், மன்னாரின் முள்ளிக்குளம் மக்கள் குறித்த சுட்டிகளின் அடிப்படையில் வறியவர்களாக? வறுமைப்படாதவர்களா? இந்திய இழுவைப் படகுகளாலும் ஈழத்துக்குள்ளான சட்டவிரோத தொழில் முறைகளாலும், நிரப்பிய எரிபொருளின் செலவை ஈடுசெய்யும் அளவுக்குக்கூட மீன்பிடிக்காமல் கரை திரும்பும் மீனவர்கள் இந்தச் சுட்டிகளின்படி வறியவர்களா? வறுமைப்படாதவர்களா? இறுதிப் போரில் உங்களிடம் நம்பி ஒப்படைத்து, வலிந்து காணாமல் ஆக்கப்பட்டுள்ளவர்களது உறவுகளுக்கு, அரசியல் கைதிகளாக இன்றுவரை தடுத்து வைக்கப்பட்டுள்ள எங்கள் உறவுகளின் குடும்ப வறுமைக்கு உங்களின் ஆறுதல் - அஸ்வெசும நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டத்தின் ஆறுதல் - போதாது.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஒருபுறம் எங்களுக்கு வறுமையைத் தக்கவைக்கும் அதே அரசுதான் மறுபுறம் எங்களுக்கு 'ஆறுதல்' என்ற பெயரில் ஒரு நலன்புரித் திட்டத்தைத் தருகிறது. நாங்கள் உழைப்பாளிகள்! உண்ண உணவுக்கு மாற்றாக உணவைப் பயிரிட்ட எங்களுடைய நிலங்களைத் தாருங்கள்! எங்கள் குடியிருப்புக் காணிகளைத் தாருங்கள்! காடுபற்றிப் போயுள்ள எங்கள் விளை நிலங்களைத் தாருங்கள்! தோட்டங்களைத் தாருங்கள்! தரையிலும் கடலிலும் எங்களைத் தொழில்புரிய வகை செய்யுங்கள்! காணாமல் ஆக்கப்பட்ட, சிறையில் வாடும் எங்கள் உறவுகளை விடுவித்து, அவர்கள் குடும்பங்களை ஆற்றுப்படுத்துங்கள்! அதுவே உண்மையான ஆறுதல் நலன்புரித் திட்டம்!

அடுத்து, யானை - மனித மோதலைக் கட்டுப்படுத்தல் பற்றி குறிப்பிட வேண்டும். எங்கள் வாழ்வுக்கும் வளமான வாழ்வாதாரத்துக்கும் போருக்குப் பின்னரான காலத்தில் நிலவும் புதிய அச்சுறுத்தலாகவே காட்டு யானை - மனித மோதலை வன்னி நிலம் காண்கிறது. தொடர்ச்சியாக ஒப்பரிய மனித உயிர்கள் யானை மோதலில் இறப்பது ஆழ்ந்த வேதனைக்குரியது. 17.01.2026 சனிக்கிழமை அன்று அதிகாலை முல்லைத்தீவின் துணுக்காய் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட தேறாங்கண்டல் பகுதியில் வயற்காவலில் இருந்த பொன்முடி சுஜிந்தன் என்னும் 19 வயதுடைய இளைஞன் காட்டு யானை தாக்கி உயிரிழந்துள்ளார். காட்டு யானை தாக்கி உயிரிழந்த இளைஞன் சுஜிந்தன், யானை - மனித மோதலில் உயிரிழந்த மற்றொரு நபர். 2020-2024 வரையான காலப்பகுதியில் காட்டு யானை மோதலில் 739 பேர் உயிரிழந்துள்ளனர். முல்லைத்தீவு மாவட்டத்தில் 2020-2024 வரையான காலப்பகுதியில் நால்வரும், வவுனியா மாவட்டத்தில் 2022-2024 வரையான காலப்பகுதியில் பன்னிருவரும் காட்டு யானை தாக்கி உயிரிழந்ததாக மருத்துவ அறிக்கைகள் சுட்டிக்காட்டுகின்றன.

2009ஆம் ஆண்டுக்கு முன்னர் வன்னியில் விடுதலைப் புலிகள் இருந்தபோது, வன்னிக் காட்டிலும் நாட்டிலும் இவ்வாறான காட்டு யானைகள், குரங்குகள் உள்ளிட்ட வனசீவராசிகளின் அட்டூழியங்கள் இருக்கவில்லை. குறிப்பாக, சுற்றாடல் அமைச்சின்கீழ் காணப்படுகின்ற வனசீவராசிகள் திணைக்களம், வனவளத் திணைக்களம் என்பன மக்களின் காணிகளை ஆக்கிரமிக்கும் செயற்பாடுகளில் மும்முரமாக ஈடுபட்டு வருகின்றன. இருப்பினும், காணி அபகரிப்பில் காட்டுகின்ற அதே அக்கறையை வனசீவராசிகள் திணைக்களம் காட்டு யானை - மனித மேதலைக் கட்டுப்படுத்தும் விடயத்தில் காட்டுவதில்லை. அதிகரித்துள்ள யானை - மனித மோதல்களைக் கட்டுப்படுத்த சுற்றாடல் அமைச்சு வனசீவராசிகள் திணைக்களத்தினூடாக விரைந்து நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமென நான் இந்த உயரிய சபையில் கோருகின்றேன். கௌரவ சுற்றாடல் அமைச்சர் அவர்கள் முல்லைத்தீவு, மன்னார், வவுனியா மாவட்டங்களுக்கு வருகை தந்து, துறைசார்ந்தவர்களுடனும் பாதிக்கப்பட்டுள்ள மக்களுடனும் மக்கள் பிரதிநிதிகளான எம்மோடும் கலந்துரையாடல்களை மேற்கொண்டு, யானை - மனித மோதலைக் கட்டுப்படுத்த விரைந்து நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, முக்கியமானதொரு விடயமான நெல் சந்தைப்படுத்தல் சபை ஊடாக விவசாயிகளிடம் நெற்கொள்வனவை மேற்கொள்ளல் பற்றி கூற விரும்புகின்றேன். முல்லைத்தீவு, வவுனியா, மன்னார் உள்ளிட்ட வன்னிப் பிராந்தியம் உட்பட வடக்கு, கிழக்கில் 2025/2026ஆம் ஆண்டுக்குரிய பெரும்போக நெற்செய்கையின் அறுவடை தொடங்கியுள்ளது. இந்த நிலையில், அரசால் உரிய காலத்தில் நெல்லுக்கான நிர்ணய விலை அறிவிக்கப்பட்டுள்ளது. இதற்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இதேபோல், உரிய காலத்தில் நெல் சந்தைப்படுத்தல் சபையினூடாக விவசாயிகளிடமிருந்து நெல்லைக் கொள்வனவு செய்வதற்கான ஏற்பாடுகளையும் மேற்கொள்ள வேண்டும். நெல் கொள்வனவில் தாமதம் ஏற்பட்டால், விவசாயிகள் தனியார் நெல் கொள்வனவாளர்களிடமும் இடைத்தரகர்களிடமும் நெல்லைக் குறைந்த விலைக்கு வழங்கி நட்டமடையும் நிலை ஏற்படும். வன்னி உட்பட வடக்கு, கிழக்கிலுள்ள விவசாயிகள் இம்முறை வெள்ள அனர்த்தத்தாலும் மிக மோசமாகப் பாதிக்கப்பட்ட நிலையில் காணப்படுகின்றனர். எனவே,

[ගරු තුරෛරාසා රවිකරන් මහතා]

விவசாயிகளிடமிருந்து நெல் கொள்வனவை உரிய காலத்தில் நெல் சந்தைப்படுத்தல் சபையினூடாக விரைந்து முன்னெடுக்குமாறு இவ்வுயரிய சபையைக் கோருகின்றேன்.

அடுத்து, கடல் சம்பந்தப்பட்ட ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். தற்பொழுது, இச்சபையில் கௌரவ கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் அமைச்சர் அவர்கள் இல்லை. என்றாலும், அவர் நிச்சயமாக இந்த விடயத்தைக் கவனத்தில் எடுப்பாரென நினைக்கின்றேன். சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகள் எமது கடற்பரப்பு முழுவதும் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. வடக்கு, கிழக்கு எங்கும் இந்த நடவடிக்கைகள் மிக மோசமான முறையில் நடைபெற்றுக்கொண்டு இருக்கின்றது. சுருக்குவலை, வெளிச்சம் பாய்ச்சி மீன்பிடித்தல், dynamite பயன்படுத்தி மீன்பிடித்தல் போன்ற நடவடிக்கைகள் மிக மோசமான முறையில் நடைபெறுகின்றது என்பதை நாங்கள் தொடர்ச்சியாகச் சொல்லி வருகின்றோம். இந்த விடயத்தில் கரிசனை செலுத்தி, சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகளைக் கட்டுப்படுத்த வேண்டும், அவற்றைத் தடுத்து நிறுத்த வேண்டுமென்ற நோக்கத்தோடு கௌரவ அமைச்சர் அவர்களும் கௌரவ பிரதி அமைச்சர் அவர்களும் செயற்பட்டுக்கொண்டு இருப்பதை நான் அறிவேன். ஆழ்கடலில் சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகளில் ஈடுபடும் எவராக இருந்தாலும், அவர்களை நிச்சயமாகத் தடுத்து நிறுத்த வேண்டும். கடந்த கால அரசுகள் சில சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகளுக்கு குறிப்பாக, கரைவலை சார்ந்த நடவடிக்கைகளுக்கு அனுமதி கொடுத்தது தவறென நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அவ்வாறான சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகளுக்கு அனுமதி கொடுத்ததால்தான் இன்று மக்கள் அவதிப்படும் நிலைக்கு உள்ளாகி இருக்கிறார்கள்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු තුරෛරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Madam, please give me one more minute.

இவ்வாறான சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகளுக்கு குறிப்பாக கரைவலை தொழிலுக்கு ஊக்கம் கொடுத்த அரசுகளுக்கும் அதன் அமைச்சர்களுக்கும் அதனோடு சேர்ந்த உத்தியோகத்தர்களுக்கும் எதிராக நடவடிக்கை எடுக்க வேண்டுமென நான் இந்த அரசாங்கத்தைக் கேட்டுக்கொள்கின்றேன். தற்போது இந்த அரசாங்கம் சட்டவிரோத கடற்றொழில் நடவடிக்கைகளைக் கட்டுப்படுத்தும் செயற்பாடுகளில் ஈடுபட்டு வருகின்றது. அதற்காக எனது நன்றியைத் தெரிவித்து விடை பெறுகின்றேன். வணக்கம்!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් බියන්විල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.31]

**ගරු සුනිල් බියන්විල මහතා**
(மாண்புமிகு சுனில் பியன்வில)
(The Hon. Sunil Biyanwila)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද අපි සාකච්ඡා කරන්නේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය සංශෝධනය කිරීම සම්බන්ධයෙන්. අපට මෙහෙම සාකච්ඡාවක් පාර්ලිමේන්තුවට ගෙනෙන්න වුණේ ඇයි? අපි කවුරුත් දන්නවා, පසුගිය අවුරුදු 76ක් තිස්සේ මේ රට පාලනය කරපු පාලකයින් විසින් අපේ රටට අත්පත් කර දුන් තත්ත්වය. විශේෂයෙන් ගත්තොත්, එක් අවස්ථාවක කාබනික පොහොර ගෙනැල්ලා දීලා අපේ රටේ ගොවීන් අසරණභාවයට පත් කළා. ඊට පසු ආර්ථික අර්බුදයක් ආවා. ඒ ආර්ථික අර්බුදය ඇතුළේ කර්මාන්ත කඩාගෙන වැටුණා. සුළු පරිමාණ, කුඩා පරිමාණ කර්මාන්ත සියල්ල කඩාගෙන වැටුණා. ඒවා කඩාගෙන වැටුණාට පසු මොකද වෙන්නේ? ඒක අපේ රටේ අධ්‍යාපනයට බලපානවා; සෞඛ්‍යයට බලපානවා. මේ අර්බුදය ඇතුළේ අපට අර මුලින් ඉතාම පොඩි ප්‍රමාණයකට ලබා දුන් සුබසාධන ආධාර දෙගුණ තෙගුණ කරන්න වුණා. ඒක අපේ රටට ඔරොත්තු දෙන්නේ නැහැ. ඒ ඇයි? පසුගිය කාලයේ රට පාලනය කරපු පාලකයෝ විසින් අපේ රටේ ආර්ථිකය නඟාසිටුවීම සඳහා ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. ඒගොල්ලන්ගේ ආර්ථික ප්‍රතිපත්ති අපේ රටට ගැළපෙන ඒවාත් නොවෙයි. ඒ නිසා අපට සිදු වුණා, නැවත නැවතත් සංශෝධනය කරමින් සුබසාධන සේවා නඩත්තු කරමින් ඉස්සරහට යන්න. මේක රටට බරක්. හැබැයි ඒ තත්ත්වය ඇතුළේ අපි කල්පනා කළා, අපේ ආණ්ඩුව ආවාට පස්සේ අපි මේ මොහොතට අදාළව කළ යුත්තේ කුමක්ද කියලා.

අපි දන්නවා, රටේ සමස්ත ජනතාවම මේ අර්බුදයට මුහුණ දී තිබෙන බව. රාජ්‍ය සේවකයින් ගත්තත්, අප කාටත් අපට වුවමනා පරිදි ජීවිතය ගත කරන්න බැහැ. අපේ ජීවිතවල බොහෝ දේවල් අත් හරින්න සිද්ධ වුණා. දරුවන්ගේ අධ්‍යාපනය අපට පාලනය කරන්න සිද්ධ වුණා. ඒ වාගේම තමයි, අපට හරියට කෑම වේලක් ගන්න නැහැ. අපට සතුටු වෙන්න, විනෝද වෙන්න අවස්ථාවක් නැහැ. අපේ සමස්ත ජනතාවම ඒ සියලු දේවල් අත් හැරියා. හැබැයි, අඩුම ආදායම් ලබන, තුන්වේල කාලා ඉන්නවත් බැරි ජනතාව ගැන අපට හිතන්න වුණා. ඒ නිසා අපි කල්පනා කළා, ඒ ජනතාවට සුබසාධනය අතිශය වැදගත් කියලා. එහෙම හිතලා, අපි බොහෝ දේවල් අත් හැර දමා, අඩුවෙලා තිබෙන සෞඛ්‍ය, අධ්‍යාපන පහසුකම් තවත් ටිකක් අඩු කරලා හරි කමක් නැහැ, මේ ජනතාව ජීවත් කරවන්න ඕනෑය කියන අදහසින් වැඩිහිටි දීමනාව වැඩි කළා, අස්වැසුම දීමනාව වැඩි කළා, එහි කාලය දීර්ඝ කළා. සමහර දේවල් අත් හැර දමා අපට ඇයි එහෙම කරන්න වුණේ? ඒ මිනිස්සුන්ට අපි ජීවිතයක් දෙන්න ඕනෑ. ඒ නිසා අපි කල්පනා කරනවා, මේ රටේ ජනතාවට මීට වඩා හොඳ ජීවිතයක් ගත කරන්න පුළුවන් කාලයක් නිර්මාණය කරන්න ඕනෑය කියලා. ඒකට අපි සූදානම්. මේ අස්වැසුම ප්‍රතිලාභය ලබා දෙන ගමන් රටේ ආර්ථිකය හදන්න, නිෂ්පාදන ආර්ථිකයක් හදන්න අපි වැඩකටයුතු කරමින් ඉන්නවා.

අපි එහෙම කටයුතු කරගෙන යන වෙලාවේ පසුගිය කාලයේ නොසිතූ විධියට අපේ රටට ආපදාවක් ඇති වුණා. ඒ ආපදාව තුළත් අපේ රටේ ආර්ථිකයට, අපේ රටේ ජනතාවට බලපාන කාරණා ගණනාවකට මුහුණ දෙන්න සිදු වුණා. ඊට පසු අපි මොකක්ද කළේ? දෙසැම්බර් මාසයේ 31වැනි දාට අවසන් වෙන්න තිබුණු අස්වැසුම දීමනාව ලබා දෙන කාලය තවත් දීර්ඝ කළා. අපට එය දීර්ඝ කරන්නට වුණා, රටේ පැවති තත්ත්වය අනුව. නමුත්, මේක දිගටම පවත්වාගෙන යන්න අපේ කල්පනාවක් නැහැ. අපේ රටේ අනවශ්‍ය වියදම් අපි දැන් විශාල වශයෙන් අඩු කර තිබෙනවා.

පසුගිය කාලයේ අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, අර 500කට එහා ගිය පිරිසකගේ විශ්‍රාම වැටුප - pension එක - නැති කිරීමට අදාළ පනත් කෙටුම්පත. එහෙම කරන්නේ, අන්න අර ජනතාවට ජීවිතයක් දෙන්නයි. දිගටම සුබසාධන කටයුතුවලින්ම ජනතාව නඩත්තු කරන්න අපට බැහැ. අපි ජනතාවට මීට වඩා හොඳ ජීවිතයක් ලබා දෙන්න ඕනෑ. ඒ නිසා අපි කල්පනා කරනවා, කෘෂිකර්මය, සංචාරක ව්‍යාපාරය වැනි ක්ෂේත්‍ර දියුණු කර අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කර ජනතාව දරිද්‍රතාවෙන් මුදාගන්න. මෙහිදී අපට ලොකු අභියෝගයක් තිබෙනවා. හැබැයි, අපි කණ්ඩායමක් හැටියට ඒ අභියෝගය භාරගෙන තිබෙනවා. පසුගිය කාලයේ ආපදාව ඇති වුණු වෙලාවේත් අපි ඒක ආදර්ශයෙන් පෙන්නුවා. අපි කැප කිරීම් කළා. අපේ රටේ මුදල් ඉතිරි කළා. අපි එහෙම කළේ ඇයි? මේ රටේ ජනතාවට හොඳ ජීවිතයක් ලබා දෙන්න, මේ ජීවිතය හැම දාම මේ ජනතාවට උරුම නොකර ඉන්න. අපට වුණු දේ ඊළඟ පරම්පරාවට නොවෙන්න ඕනෑ කරන ආර්ථිකයක් හදන්න අපි කල්පනා කරමින් ඉන්නවා. ඒ නිසා දැන් අපි මොකද කරන්නේ? දේශපාලන අධිකාරිය හැටියට අපි බොහෝ දේවල් අත් හරිමින් ඉන්නවා, කැප කරමින් ඉන්නවා.

පසුගිය කාලයේ අපි රාජ්‍ය සේවකයින්ටත් ආරාධනා කළා, අපිත් එක්ක එකතු වෙලා වැඩ කරන්න කියලා. අපේ රට ඉල්ලන්නේ වැඩි වැඩියෙන් කැප කිරීම් කරන, සැලසුම් සහිතව වැඩ කරන රාජ්‍ය නිලධාරින්. ඒ රාජ්‍ය නිලධාරිනුත් පසුගිය කාලයේ ආපදා තත්ත්වය හමුවේ රටට ආදර්ශයක් ලබා දුන්නා, අපේ රට වෙනුවෙන් සහ දුක් විඳින මිනිසුන් වෙනුවෙන් වැඩ කරන්න ඔවුන් සූදානම්, ඒ දුක් විඳින මිනිසුන්ට ජීවිතයක් දෙන්න වැඩියෙන් වැඩ කරන්න කියලා. ඔවුන් තුළින් ඒක අපි පසුගිය කාලයේ දැක්කා. ඒ අවස්ථාවේ සමහර අය රාජකාරි වෙලාවටත් එහා ගිය කාලයක් වැඩ කළා, අතිකාල ගත්තේ නැහැ. ඒ වාගේම ඔවුන් තම වැටුපෙනුත් කොටසක් පරිත්‍යාග කළා. ඒ, ඇයි? ඔවුන් පවතින තත්ත්වය අවබෝධ කරගෙන රට වෙනුවෙන් ඉටු කරන්න තිබෙන වගකීම ඉෂ්ට කළ නිසා. අන්න දේශපාලන අධිකාරියත් රට වෙනුවෙන් වගකීම් ඉෂ්ට කරමින් ඉන්නවා; කැප කිරීම් කරනවා; බොහෝ දේවල් අත්හරිමින් ඉන්නවා; ආදර්ශ ලබා දෙනවා. ඒ වාගේම තමයි රාජ්‍ය නිලධාරින් තමන්ට පැවරුණු වගකීමට එහා ගිය දෙයක් කරමින් ඉන්නවා. ඒ, ඇයි? රට වෙනුවෙන් තම යුතුකම ඉටු කරන්න. රටේ ජනතාව ඉල්ලන්නේ එහෙම රාජ්‍ය සේවකයෝ; එහෙම දේශපාලනඥයෝ. අන්න, රටට ඕනෑ කරන දේශපාලනඥයෝ, රටට ඕනෑ කරන රාජ්‍ය නිලධාරින් නිර්මාණය වෙමින් තිබෙනවා. එහෙම කරන්න පුළුවන් වුණේ කොහොමද?

අපි මේ ආණ්ඩුව භාර ගන්න පෙර රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා. ඒ තමයි, අපි බලයට එන්නේ මේ රටේ තිබෙන තත්ත්වය වෙනස් කරලා, මේ රට දියුණු රටක් බවට පත් කරලා, ඒ දියුණු රට ඇතුළේ ඉන්න මිනිසුන් තමන්ට ඕනෑ ඒවා භුක්ති විඳිමින් සතුටින් ඉන්න මිනිසුන් බවට පත් කරනවා කියලා. අන්න ඒ අරමුණ ඉෂ්ට කරන්න අපි රටට සහ ලෝකයට වැඩ තුළින් ආදර්ශයක් පෙන්වූවා. අපේ භාවිතාව සහ ආදර්ශ ඇතුළේ රාජ්‍ය නිලධාරින් ඇතුළු රටේ සමස්ත ජනතාවම තමන්ටම වෙනස් වෙන්න බල කළා. ඒ නිසා අපට පුළුවන්කම ලැබුණා, අපේ රටේ ආර්ථිකය යම් ප්‍රමාණයකට ඉහළ දමන්න. ඒකේ ප්‍රතිඵලයක් හැටියට තමයි අපට ආපදාව පැවති වෙලාවේදී ජනතාව වෙනුවෙන් විශාල ලෙස සුබසාධන කටයුතු කරන්න පුළුවන් වුණේ. අපි ආපදාවට පත් ඒ ජනතාවට පළමුවෙන්ම ගෙවල් සුද්ද කර ගන්න රුපියල් 25,000ක් ලබා දුන්නා. බඩු ගන්න රුපියල් 50,000ක් දුන්නා. ඉතුරු ටික කරන්නත් දැන් අපි එකතු වෙලා නීතිමය කටයුතු යොදමින් ඉන්නවා. අපිට එහෙම කටයුතු කරන්න පුළුවන් වෙලා තිබෙන්නේම රාජ්‍ය නිලධාරින් වාගේම අපේ රටේ දේශපාලන අධිකාරිය ඇතුළු සියලුදෙනා එකතු වෙලා කළ කැප කිරීම් නිසායි.

පසුගිය කාලයේ ජනතාවගේ සුබසාධන කටයුතු වෙනුවෙන් කටයුතු කළා වාගේම විශේෂයෙන් අස්වැසුම හිමි පවුල්වල සිටින පාසල් දරුවන් වෙනුවෙන් රුපියල් 6,000ක දීමනාවක් ලබා දෙන්නත් අපට පුළුවන් වුණා. නමුත්, ඒක ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අපි කල්පනා කරනවා, අපේ ආර්ථිකය දියුණු වෙන්න, දියුණු වෙන්න ඒ සුබසාධන කටයුතු තවත් වැඩි කරන්න ඕනෑය කියලා. ඒ වාගේම අපි වකුගඩු රෝගීන්ට ලබා දෙන දීමනාව වැඩි කළා. ඒ දීමනාව ලබා දෙන ප්‍රමාණයත් අපි වැඩි කරනවා, මේ සංශෝධනවලින්. ඒ වාගේම අපි වැඩිහිටියන්ට ලබා දෙන දීමනාවත් වැඩි කරනවා. ඒ දීමනා අපි වැඩි කරන්නේ ඇයි? මිනිසුන් තුළ අපි බලාපොරොත්තුවක් ඇති කරනවා, මේ රටේ සතුටින් ජීවත් වෙන්න පුළුවන් පරිසරයක් ඔවුන් වෙනුවෙන් අප හදනවාය කියලා. ඒක තමයි මිනිස්සු අපෙන් බලාපොරොත්තු වුණේ. අපි එහෙම කටයුතු කරගෙන යනකොට විපක්ෂය මොකද කරන්නේ? ඒකට විපක්ෂයේ අය කකුලෙන් අදිනවා. පසුගිය කාලයේ අපි වතු කම්කරුවන්ගේ වැටුප රුපියල් 200කින් වැඩි කරනකොට විපක්ෂයේ අය ඒකට විරුද්ධ වුණු ආකාරය ඔබතුමන්ලා දැක්කා. ඔබතුමන්ලා කල්පනා කරලා බලන්න, ඒක පපුවේ තෙතමනයක් තිබෙන අයට කරන්න පුළුවන් වැඩක්ද කියන එක. පොඩි වැටුපක් ලැබෙන, තුන් වේල කන්න බැරි මිනිස්සුන්ට රුපියල් 200කින් වැටුප වැඩි කරනකොට ඒකට විරුද්ධ වෙන්න පුළුවන් වුණු විපක්ෂයක් තමයි අපේ රටේ ඉන්නේ. මොකද, ඉතිහාසය පුරාවටම ඒ අය ජනතාව ගැන හිතපු අය නොවෙයි. ඒ අය හිතුවේ ඒගොල්ලන් ගැන, ඒගොල්ලන්ගේ පවුල් ගැන, ඒගොල්ලන්ගේ හිතවතුන් ගැන, ඒගොල්ලන් වටේට ඉන්න චෞර වළල්ල ගැන. ඒ හින්දා ඒගොල්ලන්ට ජනතාව ගැන දැනෙන්නේ නැහැ. ඒගොල්ලන්ට ජනතාව ගැන දැනෙන්නේ නැති හින්දා තමයි අපි ගන්නා තීන්දු තීරණවලට ඒගොල්ලන් හැම වෙලාවකදීම විරුද්ධ වෙන්නේ. ඒ අය කොහොම විරුද්ධ වුණත් අපට මන්ත්‍රීවරු 159ක් සහිත පාර්ලිමේන්තුවක් තිබෙනවා. ඒ හින්දා ඒගොල්ලන්ට බැහැ, ජනතාව වෙනුවෙන් අපි ගන්නා ක්‍රියාමාර්ග නතර කරන්න.

මේ සුබසාධන කටයුතු හැම දාම කරන්න අපට බලාපොරොත්තුවක් නැහැ. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, රටේ ආර්ථිකය දියුණු කරන්න. එලෙස දියුණු වන ආර්ථිකයට මේ රටේ ජනතාව සම්බන්ධ කරන්න අපි දැනටමත් වැඩ කටයුතු හදමින් ඉන්නවා. ඒ අනුව, බොහෝ පළාත්වල, දුෂ්කර පළාත්වල අපි කර්මාන්ත හදනවා. අපි අලුතෙන්ම කුරුඳු සංවර්ධන දෙපාර්තමේන්තුවක් හැදුවා. ඒ දෙපාර්තමේන්තුව දැන් වැඩ පටන් ගෙන තිබෙනවා. අපි සංචාරක ව්‍යාපාරය දියුණු කරනවා. කෘෂිකර්මය ශක්තිමත් කරනවා. ඒවායේ ප්‍රතිඵල අපි මේ වනවිට ලබමින් ඉන්නවා. අපි කල්පනා කරනවා, අස්වැසුම වෙනුවට තමන්ගේ ස්වෝත්සාහයෙන් ජීවත් වන ජනතාවක් හදලා, ඒ ජනතාවගෙන් මේ රට ශක්තිමත් කරලා, සෞඛ්‍ය පහසුකම්, අධ්‍යාපන පහසුකම් වැඩි කරලා, සියලු දේ තුළ සතුටින් ජීවත් වන මිනිස්සු ඉන්න රටක් හදන්න. ඒ කටයුතු සඳහා සම්බන්ධ වෙන්න කියලා අපි විපක්ෂය ඇතුළු ඔබ සියලුදෙනාට ආරාධනා කරනවා. ඔබ සියලුදෙනාට ජය වේවා!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

මට විනාඩි 11ක් තිබුණා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

විනාඩි 10ක් වශයෙන් තමයි කථික ලැයිස්තුවේ සඳහන් වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා. 1.41]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ මේ පාර්ලිමේන්තුවට මේ රටේ ජීවත් වන දුගී දුප්පත් ජනතාව වෙනුවෙන් ලබා දෙන අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය අනුමත කිරීම සඳහා ඉදිරිපත් කර තිබෙනවා. අස්වැසුම ගැන කථා කරන මේ වෙලාවේදී අපේ රටේ ඉතිහාසය ගැන අපි බලමු. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ හාල්පොත තිබුණු බව අපි දන්නවා; හාල් සලාකයක් දුන්නා. ඊට පස්සේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ ධාන්‍ය වර්ග 8ක්; ඇට අට දුන්නා. ඒ වාගේම ජනසවිය තිබුණා. 1994දී සමෘද්ධි ප්‍රතිලාභය ලබා දුන්නා. ඒ විධියට නැති බැරි මිනිස්සු වෙනුවෙන් වාගේම එදා වේල සොයා ගන්න බැරි මිනිස්සු වෙනුවෙන් හැම රජයක්ම තමන්ට පුළුවන් ආකාරයෙන් පොළොවේ පය ගහලා තමන්ගේ යුතුකම සහ වගකීම ඉටු කළා. ඒක අඩු-වැඩි වෙන්න පුළුවන්. හැබැයි, හරියාකාරව ඒ කාරණය තේරුම් අරගෙන ඒ කටයුත්ත ඉටු කළා.

මේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභය ලැබිය යුතු මිනිසුන්ට ලබා දෙන්නත්, ඒ ප්‍රතිලාභය වැඩි කරන්න යනවා නම් ඒ සඳහාත් අද දවසේ අපේ සහයෝගය අපි වර්තමාන ආණ්ඩුවට ලබා දෙනවා. හැබැයි, අපි මේ ආණ්ඩුවට පැහැදිලි කරලා දෙන්න ඕනෑ කාරණයක් තිබෙනවා. අද උදේ ඉඳන් අස්වැසුම ගැන ආණ්ඩු පක්ෂයෙන් කථා කළ කථික මන්ත්‍රීවරුන්ගේ සහ ඇමතිවරුන්ගේ කථා මම අහගෙන හිටියා. එතුමන්ලා කථා කරන විධියට මට හිතුණේ මේ ආණ්ඩුවේ අවුරුදු පහ ඉවර වනකොට ලංකාවේ කවුරුවත් අස්වැසුම ප්‍රතිලාභය ඉල්ලන්නේත් නැහැ, දුප්පත් මිනිස්සුත් නැති වෙනවාය කියන එකයි. ඒකට මොකක්ද හේතුව? දුප්පත් මිනිස්සු නැති වන විධියට තමයි දැන් මේ වැඩසටහන් ගෙන යන්නේ. දැන් මේ ගෙන යන වැඩ පිළිවෙළ ගැනත් කිව්වා, මෙන්න අපි කරන වැඩ පිළිවෙළ කියලා. එතකොට මිනිස්සු ඇවිල්ලා කියයි, එහෙම කරනවා නම් ඒක ලොකු දෙයක් කියලා. ඒක පොළොවේ පය ගහලා කරන්න පුළුවන් නම් ඇත්තටම බොහොම හොඳ වැඩක්. අස්වැසුම නැති කරන්න පුළුවන් නම් හොඳයි. ඒ කියන්නේ, එතකොට රටේ දුප්පත් මිනිස්සු නැහැ, රටේ ඉන්නේ ඔක්කොම ඇති-හැකි මිනිස්සු විතරයි. ඒක නේ මේ කරන්න උත්සාහ කරන්නේ. පුළුවන් නම් ඒක කරන්න. මේක අභියෝගයක්. ඒක කළොත් තමුන්නාන්සේලාට ඊළඟ අවුරුදු පහත් බලයේ ඉන්න මිනිස්සු අවස්ථාව ලබා දෙයි. හැබැයි, දැන් මිනිස්සු කියන්නේ මොකක්ද? රටේ ජනතාවගෙන් සියයට 80කට දැන් අස්වැසුම දෙන්න ඕනෑ. මොකද, ඒ තරම් මිනිස්සුන්ට ජීවත් වෙන්න අමාරුයි. "දිට්වා" සුළි කුණාටුව ඇවිල්ලා ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපාර කඩාගෙන වැටිලා, බදුවලට අහු වෙලා, ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වෙලා. මේ ප්‍රශ්න නිසා ජනතාව අසරණ වෙලා ඉන්නවා. ඒ නිසා අපි පැහැදිලිව ආණ්ඩුවට මේ කාරණය කියනවා. මේ ආණ්ඩුව බලයට පත් වෙලා දැන් අවුරුද්දයි මාස හතරක් වෙනවා. දැන් ජීවන වියදම දෙස බලන්න. අස්වැසුම ප්‍රතිලාභය ලබන මිනිස්සුන්ට නේ ඒක දැනෙන්නේ. දැන් හාල් කිලෝවක මිල කීයද? මාළු ග්‍රෑම් 500ක් ගන්න ගියාම කීයක් වැය වෙනවාද? එළවලු ටිකක් ගන්න ගියාම කීයක් වැය වෙනවාද? මේ අභියෝගය මිනිස්සුන්ට තිබෙනවා. ජීවන වියදම අහස උසට ගිහිල්ලා තිබෙනවා.

ඊළඟට, දරුවන්ගේ අධ්‍යාපනයට අවශ්‍ය පොත් ටික, බෙහෙත් ටික ගන්න ගියාම කීයක් වැය වෙනවාද? ඒ නිසා අපි යෝජනා කරනවා, තමුන්නාන්සේලා බලයට පත් වෙන්න ඉස්සෙල්ලා දීපු පොරොන්දු ටික ක්‍රියාත්මක කරන්න කියලා. ඒවා තමුන්නාන්සේලා දීපු පොරොන්දු නේ. මේ රටේ මිනිස්සු ඉල්ලන්න ඉස්සෙල්ලා තමුන්නාන්සේලා බලාපොරොත්තු ටිකක් දුන්නා. අන්න, ඒ බලාපොරොත්තු ටික ඉටු කරන්න. අස්වැසුම ලබා දෙනවා වාගේම ඒ පොරොන්දු ටිකත් ඉටු කරන්න. ඔබතුමන්ලා කිව්ව විධියට තෙල් මිල අඩු කරන්න; ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා ඇතුළු ඔබතුමන්ලා කිව්ව විධියට රුපියල් 165කින් තෙල් ලීටරයක මිල අඩු කරලා දෙන්න. එතකොට ජනතාවට සහනයක් ලැබෙනවා.

ඊළඟට, බඩු මිල අඩු කරන්න. බඩු මිල අඩු කළාම ජනතාවට සහනයක් ලැබෙනවා. එදා වේල කන්න අවශ්‍ය කරන භාණ්ඩවල මිල අඩු කරන්න. එතකොට ජනතාවට සහනයක් ලැබෙනවා. ඒක නේ කිව්වේ, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා. පොහොසත් රටේ ලස්සනට ජීවත් වෙන්න මෙන්න මේ ටික කරන්නකෝ. විදුලි බිල අඩු කරන්න. තමුන්නාන්සේලා පොරොන්දු වුණා නේ, විදුලි බිල අඩු කරනවා කියලා. තුනෙන් එකකින් විදුලි බිල අඩු කරනවාය කිව්වා. දැන් ඒක අඩු කරන්න. විදුලි බිලත් අඩු කළාම අස්වැසුම ලබා දෙන මිනිස්සුන්ටත්, අස්වැසුම නොලැබෙන මිනිස්සුන්ටත් ජීවත් වෙන්න පුළුවන් වාතාවරණයක් හැදෙනවා. මොකද, හැමෝටම අස්වැසුම ලැබෙන්නේ නැහැ නේ. ඔබතුමන්ලා ඒ කටයුත්ත කරන්න. මම මේ කියන්නේ, පොරොන්දු වුණු ඒවා ඉටු කරන්න කියලායි. දැන් තමුන්නාන්සේලා කියන්න පුළුවන්, මේවා කරන්න මුදල් නැහැ කියලා. නමුත්, එහෙම මුදල් නැහැ කියන්න බැහැ නේ.

අද උදේ මම මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන ඇමතිතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා, මේ රටට වාහන ආනයනය කිරීමෙන් ලැබුණු බදු මුදල කොපමණද කියලා. ඒ ප්‍රශ්නයට නියෝජ්‍ය ඇමතිතුමා දුන්නු උත්තරය තමයි, "වාහන ආනයනය කිරීමෙන් අපි බලාපොරොත්තු වුණේ රුපියල් බිලියන 441යි. අපට රුපියල් බිලියන 904ක් ලැබිලා තිබෙනවා" කියන එක. ඉතින්, රුපියල් බිලියන 904ක් ලැබිලා තිබෙනවා නම්, මම කලින් කිව්ව විධියට විදුලි බිල අඩු කරන එක ඇතුළු වැඩ ටික කරන්න දැන් පුළුවන් නේ. මිනිස්සුන්ට ආදරෙයි නම් මිනිස්සුන්ට පොරොන්දු වුණු දේවල් ටික කරන්න. ඒ ටික කළොත් අපිට මෙහෙම කියන්න පුළුවන්. තමුන්නාන්සේලා අවුරුදු ගණනාවක් කිව්වා, "අපි දුප්පතුන් නැති කරනවා" කියලා. ඒක කරන්න පුළුවන්. හැබැයි, ඒක කරන්න ඇලඩීන්ගේ පුදුම පහන ගේන්න වෙයිද දන්නේ නැහැ. මේක ලෙහෙසි වැඩක් නොවෙයි. මොකද, අපි ඒ සම්බන්ධයෙන් අත්දැකීම් තිබෙන අය. අපි ආණ්ඩුවේත් හිටියා, විපක්ෂයේත් හිටියා. අපි දැක්කා නේ, ඔය එළියේ ඉඳලා කියන තරම් සුන්දර නැහැ, ඇතුළට ඇවිල්ලා කරන්න පටන් ගත්තාට පස්සේ කියන එක. එළියේ ඉන්නකොට කියන්න පුළුවන්, "අපි අලි දෙන්නම්. කොටි දෙන්නම්. ඉර-හඳ ගෙනැත් දෙන්නම්" කියලා. ඒක මෙතැනට ඇවිල්ලා වාඩි වෙලා බලන්න එපා යැ. මෙතැන වාඩි වුණාම නේ තේරෙන්නේ, දෙවි හාමුදුරුවනේ, මේක කරන්න අමාරුද, බැරිද කියන එක. අන්න ඒ ටික කරන්න කියලා මම බොහොම පැහැදිලිව ඉල්ලනවා.

ඒ වාගේම මේ රටේ යම් කෙනෙක් මුදල් නාස්ති කරනවා නම්, ඒවා මේ රටේ මුදල් නම්, ජනතාවගේ මුදල් නම්, ඒකට විරුද්ධව තමුන්නාන්සේලා ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මුදල් සම්බන්ධයෙන් ගත්තාම, මේ වෙනකොට මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ?

මධ්‍යම අධිවේගී මාර්ගය හදන චීන සමාගම කියනවා, ඒ අධිවේගී මාර්ගය හදන්න ප්‍රමාද වීම නිසා රුපියල් මිලියන 980ක් වන්දි ගෙවන්න කියලා; මධ්‍යම අධිවේගී මාර්ගය හදන චීන සමාගම කියනවා, රුපියල් මිලියන 980ක් වහාම වන්දි ගෙවන්න කියලා. රුපියල් මිලියන 980ක් කියන්නේ සෙල්ලම් ගණනක්ද?

අද අපි අස්වැසුම ගැන කථා කරන්නේ. රුපියල් මිලියන 980ක් කියන්නේ, මේ රටේ අහිංසක මිනිස්සුන්ට, වකුගඩු රෝගියෙකුට, ආබාධිත පුද්ගලයෙකුට, නැති බැරි පවුලකට පරිප්පු ටිකක්, හාල් ටිකක් අරගෙන බත් වේලක් කන්න තිබෙන සල්ලි නේ. ඒක ගෙවන්න වෙන්නේ මේ රටේ මිනිස්සුන්ගේ බදු මුදල්වලින් නේ. ඒකට වග කියන්න ඕනෑ කවුද? එදා ගිහිල්ලා ගහ බදා ගත්තේ කවුද? ඒ පඬු කරද ගහ බදා ගත්තේ දේවානි නෝනා. දේවානි නෝනා ගහ බදාගෙන හිටියා, සාරියත් ගහ වටේ ඔතාගෙන හිටියා. ඒක මාධ්‍යයෙනුත් මරුවට පෙන්නුවා. ඒ නෝනා ගහ බදාගෙන නේ. අන්තිමට මධ්‍යම අධිවේගී මාර්ගය හදන එක නැවතුණා. මධ්‍යම අධිවේගී මාර්ගය හදන එක නැවතුණාම, අත්පුඩි ගැහුවා, ජොලි දැම්මා. විපක්ෂයේ හිටපු අය කිව්වා, "Right! නියමයි වැඩේ" කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අවසානයේ මොකක්ද වුණේ? එහෙම නම් දැන් දේවානි නෝනාගෙන් අය කර ගන්න. කවුරු වුණත් කමක් නැහැ නේ. වැරදි නම් වැරැදියි කියන තීන්දුව ගන්න. දේවානි නෝනාගෙන් අය කර ගන්න.

තමුන්නාන්සේලා දන්නවා, "අස්වැසුම" ලබන මිනිස්සු "දිට්වා" සුළි කුණාටුවට හසුවෙලා මේ වෙලාවේ අනාථ වෙලා ඉන්න බව. තමුන්නාන්සේලා කිව්වා නේ, මට ඉස්සෙල්ලා කථා කරපු මන්ත්‍රීතුමාත් කිව්වා, ඒ අනාථ වෙලා ඉන්න මිනිසුන් වෙනුවෙන් රාජ්‍ය සේවකයිනුත් තමන්ගේ වගකීම ඉටු කළා කියලා. මෙන්න වගකීම ඉටු කරන විධිය. "ලක්ෂ පහේ වන්දි ගෙවීමෙන් ග්‍රාම නිලධාරීන් ඉවත් වෙති" කියලා ප්‍රවෘත්තියක් පළ වෙලා තිබෙනවා. රාජ්‍ය සේවකයින් කැමැති නැහැ, අමාරුවේ වැටෙන්න. ග්‍රාම නිලධාරීන් ලක්ෂ පහේ වන්දිය ගෙවන එකෙන් ඉවත් වෙනවා. "මීට සුළඟේ ගියත්, බිත්තියක් ඉරි තැළුවත් ගෙවන්න කියනවා. විගණනයේදී උත්තර දෙන්න වෙන්නේ අපිට" කියලා ග්‍රාම නිලධාරි මහත්වරු කියනවා. විගණනයේදී උත්තර දෙන්න වෙන්නේ ග්‍රාම නිලධාරි මහත්වරුන්ට. ඒ නිසා ඒ අය කියනවා, "අපි මේකෙන් ඉවත් වෙනවා" කියලා. ඒ අය ඉවත් වෙන්නේ ඇයි? ජනාධිපති සමාව දීලා සිරකරුවන් නිදහස් කරන එකේ වගකීම තිබෙන්නේ ජනාධිපතිතුමා ඇතුළු ඒ කාර්ය මණ්ඩලයට. හැබැයි, අන්තිමට හිරේ ගියේ බන්ධනාගාර කොමසාරිස්. මිනිස්සු හයයි, නිලධාරීන් හයයි. ඉස්සර වාගේ කවුරුවත් ලෙහෙසියෙන් වැඩ කරන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ නිලධාරිනුත් දැන් ඉස්සර වාගේ නොවෙයි, අපිට ජේනවා නේ. නිලධාරීන් හය කරලා වැඩ කර ගන්න බැහැ. මේ සුළි කුණාටුවට හසු වුණු මිනිස්සුන්ට වන්දි දෙනකොට ඒ නිලධාරීන් හයයි. අන්තිමට ඒක සහතික කරපු ග්‍රාම නිලධාරි හිරේ ගියාම, අමාරුවේ වැටෙන්නේ ඔහුගේ නෝනයි, දරුවෝ ටිකයි. ඒ කාරණය තමයි, අපි බොහොම පැහැදිලිව කියන්නේ.

අද මේ "අස්වැසුම" ලබන පවුල් මොනවාද කරන්නේ? ගමේ තිබෙන පුංචි පුංචි රස්සාවල් කරන්නේ. කුලී වැඩක් කරලා ඒ අය ජීවත් වෙන්නේ. අපේ රට වටේම තිබෙන්නේ මුහුද. විශේෂයෙන් ධීවර කර්මාන්තය පැත්තෙන් ගත්තොත්, අපේ හිටපු ගරු ඇමතිතුමාට අපි කිව්වා මේ මාදැල් කර්මාන්තය-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

මාදැල් කර්මාන්තයෙන් තමයි, මේ රටේ ධීවර ජනතාව ජීවත් වෙන්නේ. මාළු ටිකක් කන්නේ, ගෙදර බත් ටිකක් උයා ගන්න හවසට කීයක් හරි සොයා ගන්නේ මේකෙන්. දැන්, මේ මාදැල් කර්මාන්තය නවත්වන්න හදනවා. එතකොට මාදැල් හිමිකරුවෝ මොකද කළේ? ඒ අය අධිකරණයට ගියා. ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardhana)
මේ කාරණාවත් කියලා අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා ඔවුන් මොකක්ද කිව්වේ? "කරුණාකරලා, අපේ රස්සාව කර ගන්න දෙන්න" කියලායි ඔවුන් ඉල්ලුවේ. මහින්ද මහත්මයාගේ ආණ්ඩුව කාලයේදී ඒවාට ශක්තිය දුන්නා. ඒ නිසා "අස්වැසුම" දෙන එක වාගේම අනෙක් පැත්තෙන් මිනිස්සුන්ගේ රස්සාවලට, බඩට ගහන්න එපා. මිනිස්සුන්ව ආරක්ෂා කරන්න. තමුන්නාන්සේලා "අස්වැසුම" දෙන එක හරියාකාරව කරනවා නම්, අපේ සහයෝගය ලබා දෙන බව මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මුනීර් මුලාෆර් නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.51]

**ගරු මුනීර් මුලාෆර් මහතා (ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு முனீர் முலாபர் - சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Muneer Mulaffer - Deputy Minister of Religious and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම විපක්ෂයෙන් ඉල්ලීමක් කරනවා, හැමදාමත් රට නොමඟ යැවූ විධියටම මධ්‍යම අධිවේගී මාර්ගය හැදීම නතරවීමේ කාරණය දේවානි කියන නිලධාරිනිය මත පටවලා, තමන්ගේ නොහැකියාව වසා ගන්න එපා කියලා. ඒ කොන්ත්‍රාත්කරුවන්ට මුදල් දී ගන්න බැරි තරම් තත්ත්වයකට මේ රට පත් කළා කියන කාරණාව සාමාන්‍යයෙන් අපේ රටේ හැම කෙනාම දන්නා කාරණාවක්. තමන්ගේ ඒ බංකොලොත්භාවය, තමන්ගේ නොහැකියාව, හැමවිටම නිලධාරීන් මත පටවලා, ඒ හරහා දේශපාලනය කිරීමට සූදානම් වීම ඇත්තටම ඉතාම ශෝචනීයයි.

[ගරු මුනීර් මුළාෆර් මහතා]

අපි සාමාන්‍යයෙන් දන්නවා, ලෝකයේ හැම රටකම, හැම රජයක්ම උත්සාහ දරන්නේ දුප්පත්කම තුරන් කරන්න බව. හැබැයි, අපේ රටේ අතීතයේ ආණ්ඩුකරණය තුළ දුප්පත්කම තමන්ගේ දේශපාලන මෙවලමක් බවට පත් කරගෙන, ඒ දුප්පත්කම ඔස්සේ තමන්ගේ දේශපාලන අනාගතය ගොඩනහා ගෙන, ඒ දුප්පත්කම පවත්වා ගැනීම හරහාම තමන්ට බලයට පැමිණීමටත්, බලයේ රැඳී සිටීමටත්, නැවත නැවත ඒ ජනතාවම පාවිච්චි කරන, ඉතා මජර සංස්කෘතියක් අපේ රට තුළ තිබුණු බව අපි දන්නවා.

හැබැයි, හෘදය සාක්ෂියක් තිබෙන, මේ මොහොතේ මේ රටේ තත්ත්වය පිළිබඳ අවබෝධයක් තිබෙන සියලුදෙනාම පැහැදිලිව දන්නවා, වර්තමාන රජය කටයුතු කරන ආකාරය. මේ රජය නියෝජනය කරන, මේ රජයට සහයෝගය දක්වන සියලුදෙනාටම තිබෙන බලාපොරොත්තුව තමයි, මේ රටින් දුප්පත්කම තුරන් කිරීම. මේ ආණ්ඩුව දුප්පත්කම තුරන් කිරීම සඳහා වැඩ පිළිවෙළ සකසන, ඒ සඳහා වැඩ කරන ආණ්ඩුවක් බව අද ජනතාව හොඳින්ම දන්නවා. විශේෂයෙන් මේ රටේ ජනතාවගේ තත්ත්වය; දිළිඳු, අන්ත දිළිඳු ජනතාව පිළිබඳව අවබෝධ කරගෙන "අස්වැසුම" වැඩසටහන ඉතා සාර්ථකව අපට කරගෙන යාමට පුළුවන් වෙලා තිබෙනවා.

මෙතැනදී මතු වුණු ප්‍රධාන කාරණාව මේකයි. මේ රටේ සමහර මිනිස්සු කියනවා ලු, අද රටේ දුප්පත්කම තුරන් කිරීම කෙසේ වෙතත්, රටේ ජනතාවගෙන් සියයට 80ක් "අස්වැසුම" ලබන තත්ත්වයට පත් වෙලාය කියලා. මම කියන්න කැමැතියි, ඒ චෝදනාව නඟන අය කණ්ණාඩිය ඉස්සරහට ගොස්, මේ රටේ සියයට 80ක් ජනතාව දුප්පත්කමට, බංකොලොත්භාවයට, දිළිඳු තත්ත්වයට පත්වන තැනට මේ රට පත් කළේ කවුද කියන එක ගැන තමන්ගෙන්ම ප්‍රශ්න කර ගත්තා නම් වඩා වටිනවා කියලා. මේ රටේ ජනතාව දන්නවා, පසුගිය කාලයේ ආණ්ඩුකරණය තුළ රටේ ජනතාවට අත් වුණු ඉරණම. තමන්ගේ එදිනෙදා කටයුතු පවා කර ගන්න බැරි තත්ත්වයක් තිබුණා. අතේ මුදල් තිබුණත් සමහර විට තමන්ගේ වුවමනා, අවශ්‍යතා ඉටු කර ගන්න බැරි රටක් බවට අපේ රට පත් කරපු අය තමයි වර්තමාන රජයේ මේ "අස්වැසුම" වැඩ පිළිවෙළ පිළිබඳව, මේ කාරණා පිළිබඳව කථා කරන්නේ.

ඊළඟට, "දිට්වා" සුළි කුණාටු තත්ත්වය පිළිබඳව සාකච්ඡා කරනකොට අපේ කනට ඇසෙන බොහෝ කාරණා තිබෙනවා. මීට පෙරත් විවිධ කාල වකවානු තුළ, විවිධ ආණ්ඩු කාල තුළ මේ රටේ ආපදා තත්ත්වයන් ඇති වුණා. හැබැයි මේ රටේ ජනතාව දන්නවා, ඒ ආපදා තත්ත්වයට පත් වුණු අය වෙනුවෙන් ක්ෂණිකව ක්‍රියාත්මක වෙන්න. මම මේ අවස්ථාවේදී ගෞරවයෙන් මතක් කරනවා, අපේ රටේ සියලු පුරවැසියන්. ආපදා තත්ත්වය තුළ සියලුදෙනාම ජාති, කුල, ආගම් භේදයකින් තොරව, සියලු භේද පසෙකලා මේ රට යළි ගොඩ නඟන්න විශාල ශක්තියක් වෙලා තිබෙනවා. ඔවුන් පමණක් නොවෙයි, මේ රටින් පිට ජීවත් වන අපේ සහෝදර ජනතාව, විදේශ රටවල්, සංවිධාන - සියලු දෙනා - මේ රට නැවත ගොඩ නැඟීමට අවශ්‍ය ශක්තිය තමන්ට පුළුවන් ක්ෂේත්‍ර තුළ ලබා දෙන්න ඉදිරිපත් වුණා. එවැනි තත්ත්වයක් තුළ රජයක් ලෙස ඒ වගකීම පැහැර නොහැර ආපදා තත්ත්වයට පත් වුණු අය වෙනුවෙන් ඉතා ශක්තිමත්ව ඉදිරිපත් වෙලා ක්ෂණිකව ඔවුන්ට ලබා දිය හැකි සහන ලබා දීමට වර්තමාන රජය විසින් කටයුතු කළා කියන කාරණාව මම විශේෂයෙන් මතක් කරන්න කැමැතියි.

ඒ වාගේම බඩු මිල අඩු කිරීම් පිළිබඳව, තෙල් මිල, විදුලි බිල පිළිබඳවත් මේ සභාව තුළ කථාබහ කළා. වර්තමාන ජනාධිපතිතුමා, අපේ ආණ්ඩුව නිතරම කියන කාරණාව තමයි, රජයක් ලෙස, ආණ්ඩුවක් ලෙස අපට ජනතාවට යම් සහනයක් ලබා දෙන්න ඉඩකඩ ලැබෙන හැම අවස්ථාවකම අනිවාර්යයෙන්ම ජනතාවට ඒ සහන අපි ලබා දෙනවා කියන එක. ජනතා මුදල් කොල්ලකාපු, ඒවා වැරැදි විදියට පාවිච්චි කරපු, තමන්ට බලයක් ලැබුණාම ඒ බලයෙන් තමන්ට සුරපුරයක් හදාගෙන ඉතා සුඛෝපභෝගී ජීවිත ගොඩ නඟා ගත්තු අය, තමන්ගේ දේශපාලනය තුළින් පොහොසත් වුණු අය අද රටේ ජනතාවගේ දුප්පත්කම ගැන, දිළිඳුකම ගැන, අසරණකම පිළිබඳව කථා කිරීම මහා විහිළුවක්. ජනතාවගේ බදු මුදල් වගකීමෙන් පාවිච්චි කළ යුතුයි කියන කාරණය ගැන අවධානය යොමු කරමින් වර්තමාන ආණ්ඩුව හැම විටම කටයුතු කර තිබෙනවා. මේ රටේ ආදරණීය ජනතාව එය දන්නවා. එම නිසා මේ රටේ නිලධාරින් කිසිවෙකු බිය විය යුතු නැහැ. නිවැරදි දේ කරන්න, හරි දේ කරන්න අද අපේ රටේ කිසිම නිලධාරියෙකු බිය විය යුතු නැහැ. මොකද, රජය ඒ සඳහා අවශ්‍ය ඉඩ කඩ, පහසුකම් හැම දෙයක්ම ලබා දෙමින් තිබෙනවා. ඒ නිසා මේ ආපදා තත්ත්වයට පත් වෙච්ච අයගේ තත්ත්වය සැලකිල්ලට අරගෙන අස්වැසුමේ සමහර කරුණු කාරණාත් එකතු කරගෙන කටයුතු කරන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම දිළිඳුකම හෙවත් දුප්පත්කමත් අධ්‍යාපනයත් අතර ලොකු සම්බන්ධයක් තිබෙනවා. ලෝකයේ දියුණු රටවලට යනකොට අපට දකින්න ලැබෙනවා, ඒ වාගේම විදේශගත වෙලා ජීවත් වෙනකොට අපට තේරෙනවා, අපට හැඟෙනවා, ඒ රටවල දරුවන්ට ලැබෙන අධ්‍යාපනය සහ අපේ රටේ දරුවන්ට ලැබෙන අධ්‍යාපනය අතර විශාල පරතරයක් තිබෙන බව. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එපා කියලා පාරට බැහැලා ඉන්න දේශපාලන පොසිලයෝ ටිකක් ඉන්නවා. අතීතයේත් - පසුගිය අවුරුදු කිහිපයකට කලින් - මේ රටේ ජාතිවාදය වපුරලා, ජනතාව අවුස්සලා, වැරැදි මත සමාජගත කරපු සමහර මහාචාර්යවරු, පැලෝපීය නාළය පිළිබඳව කථා කරපු අය අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව විපක්ෂය ගොඩ නඟා තිබෙන උද්ඝෝෂණවල ප්‍රධාන නළුවන් බවට පත් වෙලා ඉන්නවා අපි දැක්කා. මට හරි පුදුමයි! මම ප්‍රශ්න කරන්න කැමැතියි, අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය ගැන තීරණය කරන්නේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරන්නේ පැලෝපීය නාළය පිළිබඳ කථා කරපු ඒ මහාචාර්යවරුද කියලා. ඒ අයට මම කියනවා, රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරන්න කලින් කළ යුතු දෙයක් ගැන. අපේ රටේ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ගර්භාෂ යුද්ධයක් පිළිබඳව කථා කරනවා අපි දැක්කා. මාධ්‍ය ඉදිරියට ඇවිල්ලා ගර්භාෂ යුද්ධය ගැන කථා කරලා ඊළඟ වතාවේ මාධ්‍ය ඉදිරියට ගියාම කියනවා, තමන් එහෙම කිව්වේ නැහැ කියලා. විටින් විට තීරණ වෙනස් කරන, ප්‍රතිපත්තියක් නැති ඒ වාගේ පොසිල පිරිස්වලට මම කියනවා, රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කරන්න කලින් ඔයගොල්ලන්ගේ මනස පුනරුත්ථාපනය කරගෙන එන්න; ඔබ පුනරුත්ථාපනය වෙන්න; පුළුල් මනසකින් යුතුව රටේ දරුවන් ගැන හිතන්න පුළුවන්, ජාතිවාදය වපුරන්නේ නැති, ආගම්වාදය වපුරන්නේ නැති, සැමට ආදරය කරන්න පුළුවන්, සැම සංස්කෘතියකටම ගෞරව කරන්න පුළුවන් මට්ටමට පත් වෙන්න කියලා. එහෙම නැතුව අසාධාරණ ලෙස, දේශපාලනය වෙනුවෙන් එකිනෙකා ඉලක්ක කරලා චරිත ඝාතනය කරන, හැම විටම ඒ තත්ත්වය තුළ ඉන්න ඒ මිනිස්සු මේ රටේ ආදරණීය දරුවන්ගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කිරීම, ඒවා නැවැත්වීමට උත්සාහ දැරීම අපට අලුත් දෙයක් නොවෙයි. මේ රටේ යහපත වෙනුවෙන්, යහපත් දිශානතිය වෙනුවෙන් හොඳ දෙයක් ගොඩ නඟන විට, හොඳ දේවල් ඇති වන විට ඒවාට බාධා එල්ල කරපු අය තමයි අද මේ පැනගෙන එන්නේ.

අපි දන්නවා, දිළිඳුකම සහ අධ්‍යාපනය අතර ලොකු සම්බන්ධයක් තිබෙන බව. දිළිඳුකම තුරන් කරන්න නම් ආර්ථික

වශයෙන් රට ගොඩ නැඟෙන්න ඕනෑ වාගේම දරුවන්ගේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළත් වෙනස්කම් ඇති වෙන්න ඕනෑ. අපට දැනෙනවා අපේ දරුවන් තුළ යම් කම්පනයක් ඇති බව. ඒ කම්පනය වෙනස් කරන්න නම් අනිවාර්යයෙන්ම අපි නිවැරැදි විධියට කටයුතු කළ යුතුයි. ඒ නිසා මේ "අස්වැසුම" හරහා අපේ රටේ ආදරණීය ජනතාවට ශක්තිමත් ජීවිතයක් ගොඩ නැඟීමේ වැඩ පිළිවෙළ අපි අනිවාර්යයෙන්ම හදනවා කියන කාරණාව ප්‍රකාශ කරමින් මම නතර වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**

(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)

(The Hon. Deputy Chairperson of Committees)

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය (කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය)**

(மாண்புமிகு (திருமதி) சரோஜா சாவித்திரி போல்ராஜ் - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)

(The Hon. (Mrs.) Saroja Savithri Paulraj - Minister of Women and Child Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. SANJEEWA RANASINGHA took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

මීළඟට, ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අනුර කරුණාතිලක ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.02]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**

(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)

(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප මේ කථා කරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ වන කාරණය ගත්තොත්, විශේෂයෙන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දරිද්‍රතා රේඛාව පදනම් කරගත්තු දුප්පතුන් හඳුනා ගැනීමේ ක්‍රියාවලිය තුළින් හඳුනා ගැනීමට ලැබුණු අවදානමට ලක් වූ කාණ්ඩය සඳහා වන ප්‍රතිලාභ ගෙවීම 2025 දෙසැම්බර් 31වන දින වන කොට අවසන් වීමට නියමිතව තිබුණත් එම කාල සීමාව 2026 ජූනි මාසය දක්වා දීර්ඝ කර තිබෙනවා.

අපට මතකයි, ජාතික ජන බලවේගය බලයට පත් වනකොට මේ කණ්ඩායමේ ප්‍රතිලාභ ලැබීම 2024 දෙසැම්බර් 31වන දා වනකොට අවසන් වීමට නියමිතව තිබුණු බව. අපි මුලින් එය 2025 මැද භාගය දක්වා දීර්ඝ කළා. ඊට පස්සේ මාර්තු මාසයේදී එය 2025 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කළා. දැන් ආයෙත් 2026 වසරේ ජූනි මාසය දක්වා එය දීර්ඝ කරන්න කටයුතු කර තිබෙනවා. දැන්, අපේ ආණ්ඩුව ඇවිල්ලා, ඒ අයගේ ප්‍රතිලාභ ලැබීම වසරකින් දීර්ඝ කරලා තිබෙනවා. ඒ වාගේම මේ තීරණයත් එක්ක, මේ යෝජනාවලියත් එක්ක දුප්පත් කාණ්ඩයේ පවුල් සඳහා වන රුපියල් 10,000 දීමනාව 2027 ජූනි මාසය දක්වාත්, අන්ත දිළිඳු කණ්ඩායම සඳහා වන රුපියල් 17,500 දීමනාව 2027 ජූනි මාසය දක්වාත් දීර්ඝ වෙනවා.

අපි දන්නවා, සාමාන්‍යයෙන් මේ ප්‍රතිලාභ ලැබෙන්නේ ප්‍රධාන නිර්ණායක කිහිපයක් මත බව. ඒවා තමයි අධ්‍යාපනය, සෞඛ්‍ය තත්ත්වය, ආර්ථික මට්ටම, වත්කම්, නිවාස තත්ත්වය, පවුලේ ජන විකාශය ආදිය. මේ වාගේ කාරණා පදනම් කරගෙන තමයි අස්වැසුම ප්‍රතිලාභින් කවුද, එම ප්‍රතිලාභ ලබන ජනතාව කවුද, ඒ පවුල් ඒකක මොනවාද කියන එක තීරණය වන්නේ. එක පැත්තකින් ජාතික ජන බලවේගය හැටියට අප උත්සාහ කරන්නේ, මහ ජනතාව ආර්ථික පැත්තෙන් සවිබලගැන්වීම කරන අතරේ, ආර්ථික පීඩනය, ආර්ථික විෂමතාව එක්ක පීඩාවට ලක් වන කණ්ඩායම් හඳුනාගෙන, ඒ කණ්ඩායම්වල අයට ඉලක්ක සහගතව සහන ලබා දීමයි. ඒ ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් හැටියට තමයි අස්වැසුම ප්‍රතිලාභ ලබා දීම අප මෙසේ තවදුරටත් දීර්ඝ කරන්නේ. අපි දන්නවා, අස්වැසුම ප්‍රතිලාභ ගෙවීම දීර්ඝ කිරීමත් එක්ක පවුල් 1,920,000කට ප්‍රතිලාභ සැලසෙන බව. ඒ වාගේම, වැඩිහිටි ආධාර ලබන, වකුගඩු රෝගී තත්ත්වය හේතුවෙන් ආධාර ලබන සහ ආබාධ සහිත තැනැත්තන්ගේ දීමනා ලබා දීම දීර්ඝ කිරීමත් සමඟ තවත් 1,270,000ක ප්‍රමාණයකට මෙහි සහන සැලසෙනවා. හැබැයි අපි දන්නවා, සහන කියන ඒවා දීර්ඝ කාලයක් තිස්සේ පවත්වාගෙන යන්න බැහැ කියන එක. අනිවාර්යයෙන් ඔවුන් ආර්ථික පැත්තෙන්, සමාජීය වශයෙන් සවිබලගැන්වීමකට ලක් කරන්නම ඕනෑ. ඒ සඳහා අපි මේ අවුරුද්දේ විශේෂයෙන් ප්‍රජා ශක්ති වැඩසටහන ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේම අනෙකුත් අමාත්‍යාංශ යටතේත් විවිධ ක්‍රියාකාරකම් හරහා මේ දිළිඳු ජනතාව -ආර්ථිකයේ කිසියම් විධියක විතැන්වීමකට ලක් වෙච්ච ජනතාව- සවිබල ගැන්වීම සඳහා විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවා.

ඒ වාගේම මේ කාරණයේදී අපට පෙනෙන දෙයක් තමයි, දිළිඳුකම හෙවත් දුප්පත්කම, බහුමාන දරිද්‍රතාව සොයන කොට අධ්‍යාපනය කියන එක අනිවාර්යයෙන්ම සැලකිල්ලට ගන්න ඕනෑ කාරණයක් බව. මොකද, ඒකෙන් පෙන්නුම් කරනවා මිනිසුන් පුරවැසියන් හැටියට සවිබලගන්වන්න අධ්‍යාපනය කොයි තරම් දුරට වැදගත් සාධකයක්ද කියලා. අන්න ඒ නිසා තමයි මෑත කාලයේ සමාජයයේ සාකච්ඡාවට බඳුන් වෙච්ච අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනස පිළිබඳ සාකච්ඡාව සමාජය තුළ ඇති කර තිබෙන්නේ. අපි 2012 වාගේ කාලයේ ඉඳලා, ඒ වාගේම 2018 ජාතික ජන බලවේගය හැටියටත් මේ පවතින අධ්‍යාපන ක්‍රමයේ පරිවර්තනීය වෙනසක් අවශ්‍යයි කියන සමාජ කතිකාව ඔස්සේ ඇවිල්ලා, 2024 බලයට පත් වුණාට පසුව ඒ වනකොටත් යම් යම් සාකච්ඡාවලට බඳුන් වෙලා තිබිච්ච කරුණුත්, ඒ වාගේම ජාතික ජන බලවේගය හැටියට අප ඉදිරිපත් කරපු කරුණුත් එකතු කරලා, ඒ අන්තර්ගතය තුළ තමයි මේ අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනස පිළිබඳ යෝජනාවලිය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම කරුණක් පිළිබඳ සාධනීය සාකච්ඡාවක් ඇති වීම, එක පැත්තකින් ඒ ක්‍රියාවලියේ ගුණාත්මකභාවයට හොඳ දායකත්වයක් දක්වනවා. ඒ වාගේම ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන අපේ වාගේ රටක ඒ වාගේ දියුණු සාධනීය සාකච්ඡාවක් ඇති වීම ඉතා වැදගත්. නමුත්, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් සමාජයේ විවිධ කොටස්

[ගරු අනුර කරුණාතිලක මහතා ]

අතර මේ මොහොතේ ඇති වෙලා තිබෙන සාකච්ඡාව ඒ වාගේ සාධනීය, ගුණාත්මක සාකච්ඡාවකට දායක වන බවක් පෙනෙන්නේ නැහැ. එක පැත්තකින්, සමහර අය ඒ යෝජනාවලිය තුළ තිබෙන ඒ පරිවර්තනීය වැඩ පිළිවෙළ තුළ තිබෙන අන්තර්ගතය, අරමුණ පිළිබඳ නිසි අවබෝධයක් නැතිව එහෙන් මෙහෙන් ඇහිඳගත් කරුණු කිහිපයක් මුල් කරගෙන ඒ පිළිබඳ විවේචනයක යෙදෙනවා. ඒ වාගේම තවත් සමහර කොටසක් තුන්වන පාර්ශ්වයක් කියපු දේවල් -තමන් හදාරන්නේ නැතිව, තමන් විමර්ශනාත්මකව හොයලා බලන්නේ නැතිව- අරගෙන ඉදිරිපත් කරලා මේ පිළිබඳ විවේචනය කරන්න උත්සාහ කරනවා. අපි දැක්කා, පාර්ලිමේන්තුවේදීත් අපේ විපක්ෂ නායකතුමා ධර්ම චක්‍රය සම්බන්ධ කරුණු තුන්වන පාර්ශ්වයකින් ඇහිඳගෙන ඇවිල්ලා තමන්ගේ වාගේ ඉදිරිපත් කරන්න ගිහිල්ලා, ගමේ භාෂාවෙන් කියනවා නම් ඇන ගත්ත විධිය. ඒ වාගේම තවත් සමහර පිරිසක් මේ ක්‍රියාවලියට ක්‍රියාශීලී දායකත්වයක් දෙන්න අවස්ථාවක් නැති නිසා සමහර කොටස් විවේචනය කරනවා. ඒ අතරේ මේ පිළිබඳව විමර්ශනාත්මකව කල්පනා කර බලලා සාධනීය විවේචන ඉදිරිපත් කරන කණ්ඩායම් ද නැතුවා නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර අය ලොකු සද්දයක් දමාගෙන, මහ ඝෝෂාවක් දමාගෙන පටන් ගත්ත ක්‍රියාකාරකම් අද පුංචි පුංචි සිද්ධි බවට පරිවර්තනය වෙලා තිබෙනවා. විශේෂයෙන් අපි දැක්කා, "අගමැතිනිය ඉල්ලා අස් වෙන්න ඕනෑ, ඉල්ලා අස් වෙන්නේ නැතිනම් මම නැඟිටින්නේ නැහැ" කියලා මද්දුම බණ්ඩාරලා වෙන්න ගියත්, අඩුම ගාණේ පැය 24ක් වාඩි වෙලා ඉන්න බැරුව අකුළාගෙන ගිය සමහර කණ්ඩායම්. කණ්ඩායම් කිව්වාට එතැන 10ක්, 15ක් හිටියා. ඒ වාගේම, සමහර අය අගමැතිනිය ඉල්ලා අස් වෙන්නේ නැත්නම්, අපි විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා එතුමිය පලවා හරිනවා කියලා මහ ඝෝෂාවක් කළා. ඝෝෂාවක් කළා විතරක් නොවෙයි, ඒ වාගේ සිංහනාදයක් කරලා ඒකට අත්සන් කරන ඡායාරූප මාධ්‍යයට මුදා හැරියා. ඒ වාගේම තවත් කණ්ඩායම් වට කරගෙන ඒ ගැන බැරෑරුම් සාකච්ඡා කරනවා කියලා පෙන්වන්න ඒ ඡායාරූපත් සමාජයට මුදා හැරියා. හැබැයි, අද වනකොට මොකද වෙලා තිබෙන්නේ? අද ඒ බැරෑරුම් සාකච්ඡාවලට වෙච්ච දෙයක් නැහැ. ඒ වාගේම ඒ ඝෝෂාව පුංචි කෙඳිරියක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. කථාවක් තිබෙනවා සමහර වෙලාවට මිනිස්සු ගිලින්නත් බැරි, වමාරන්නත් බැරි තත්ත්වයට පත් වෙනවා කියලා. අවාසනාවන්ත විධියට මේ විශ්වාස භංග යෝජනාව පිළිබඳ කාරණයේදී අපේ රටේ විපක්ෂය පත් වෙලා ඉන්නේත් ඒ වාගේ ගිලින්නත් බැරි, වමරාන්නත් බැරි තත්ත්වයකට. විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලාත් බැහැ, නොගෙනැල්ලාත් බැහැ. ඒ නිසා "අද නොවෙයි, හෙට." විශ්වාස භංග යෝජනාව ගෙනෙනවාද නැද්ද කියලා ඇහුවාම, "අද නොවෙයි, හෙට."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන කොට ආණ්ඩුව තමයි ඒ සම්බන්ධයෙන් වැඩියෙන්ම අපහසුතාවට පත් වෙන්නේ. මොකද, ආණ්ඩුවට සම්බන්ධ කාරණයකට විශ්වාස භංග යෝජනාව ගෙනෙන නිසා. නමුත්, මේ විශ්වාස භංග යෝජනාවත් එක්ක විපක්ෂය කෙසෙල් ගහට කොටපු කොට්ටෝරුවා ගානට වැටිලා තිබෙන්නේ. එතැනින් ඉස්සරහට යන්න බැහැ. ඒ නිසා අපි කැමැතියි, මේ කාරණය විපක්ෂයට කියන්න. අපි කැමැතියි, සාධනීය සාකච්ඡාවට. අපි කැමැතියි සාධනීය විවේචනයට. සාමාන්‍යයෙන් අගමැතිතුමියට ගෙනෙන විශ්වාස භංග යෝජනාවක් කියන්නේ සරල එකක් නොවෙයි. ඒක එක පැත්තකින් අගමැතිතුමියගේ තනතුරට අභියෝගයක් වනවා වාගේම, සමස්ත කැබිනට් මණ්ඩලයට කරන අභියෝගයක්; සමස්ත ආණ්ඩුවේ පැවැත්මට කරන අභියෝගයක්. ඒ නිසා අපි කැමැතියි ඒ අභියෝගයට මුහුණ දෙන්න. ආණ්ඩුව හැටියට අපි විපක්ෂයට කියන්නේ ඒ අභියෝගය භාර ගන්න ආණ්ඩුව සූදානම් කියන එකයි. අද නොවෙයි, හෙට කිය කියා ඉන්න එපා. කල් නොයවා මේ සතියේම දවස් දෙකක -22 සහ 23වැනි දාට- විවාදයකට අපි සූදානම්. ඔබතුමන්ලා ඉල්ලීමක් කරනවා නම්, අපේ මන්ත්‍රීවරියන් කිසි කෙනෙක් ඒකට සම්බන්ධ කර ගන්නේ නැතිව ඉන්නම්. මොකද, අපි දැක්කා මතුගමදී කාන්තා සහෝදර සහෝදරියන්ට භය වෙලා තමයි උද්ඝෝෂණ හකුළා ගත්තේ කියලා. එතැනින් පස්සේ උද්ඝෝෂණත් නැහැ, මොකුත් නැහැ. දැන් තිබෙන්නේ මාධ්‍ය සාකච්ඡා විතරයි. මම මෙහෙම කියනවා. ඔබතුමන්ලා මේ විවාදය ගෙනෙනවා නම්, මේ අධ්‍යාපනයේ පරිවර්තනීය ක්‍රියාවලිය තුළ තිබෙන බොරුව හෙළි කරන්න. එතකොට ඒ සම්බන්ධයෙන් තිබෙන දුර්මත පරාජය කරන්න අපට අවස්ථාව ලැබෙනවා. ඒ නිසා දැන් ඔබතුමන්ලාට විකල්ප දෙකක් තිබෙනවා. එකක්, විශ්වාසභංග යෝජනාව භාර දෙන්න. ඒ අභියෝගය ආණ්ඩුවෙන් භාර ගෙන අපි විශ්වාස භංග යෝජනාව ගැන මේ ගරු සභාවේ සාකච්ඡා කරමු; විවාදයට කරමු. එහෙම නැත්නම් වැරදීමක් වුණා කියලා හැම වෙලාවේම කියනවා වාගේ මේ වෙලාවේත් අපිට වැරදුණා කියන එක පිළිගන්න. එතකොට මහජනතාව අවසාන වශයෙන් ඔබතුමන්ලාට සමාව දේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කලිනුත් ප්‍රකාශ කළා වාගේ අස්වැසුම වාගේ ප්‍රතිලාභ, සහන දීර්ඝ කාලයක් තිස්සේ පවත්වා ගෙන යෑම නොවෙයි වග කිවයුතු රජයක් හැටියට කරන්න ඕනෑ. නමුත්, අවාසනාවකට පසුගිය දශක කිහිපයක් තිස්සේ විවිධ වැඩසටහන් හරහා මේ සමාජය සවිබලගන්වන දුප්පතුන්ගේ ජීවිතය නඟා සිටුවන්න විවිධ වැඩසටහන් ක්‍රියාත්මක වුණත්, ඒ වැඩසටහන් තුළ තිබුණු අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපි රටක් හැටියට අසමත් වුණා. ඒ නිසා තමයි අද දවසේ මේ සාකච්ඡා කරන පනත තුළින් ඒ ප්‍රතිලාභ දීර්ඝ කරන්න සිද්ධ වෙලා තිබෙනවා. අද දවසේ අපි මේ අහිංසක මිනිස්සුන්ගේ ප්‍රතිලාභ වැඩි කරමු. හැබැයි, හෙට දවසේ මේ මිනිස්සු තවදුරටත් ආධාර ලබන, ප්‍රතිලාභ ලබන ජනතාවක් බවට පත් නොකර, ඔවුන් ඇත්තටම සවිබලගැන් වූ කණ්ඩායමක් බවට පරිවර්තනය කරන්න අපි සියලුදෙනාම එකතු වෙලා වැඩ කරමු කියලා ඉල්ලමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)

(The Hon. Presiding Member)

ගරු විපක්ෂ නායකතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.16]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**

(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)

(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ගැන සාකච්ඡා වෙන මේ අවස්ථාවේ මම ගරු ඇමතිතුමාට කියන්න කැමතියි අස්වැසුම කියන්නේ සැබැවින්ම දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක් නොවෙයි කියන එක. එය එසේ වන්නට නම් අංග සම්පූර්ණව නිෂ්පාදනය, ආයෝජනය, පරිභෝජනය, ඉතිරි කිරීම සහ අපනයනය මත කේන්ද්‍රගත වූ ඒකාබද්ධ වැඩසටහනක් වෙන්න ඕනෑ. ඒ නිසා සැබැවින්ම දුප්පත්කම තුරන් කිරීමේ වැඩසටහනක් හැටියට මෙන්න මේ අංශ ගණනාව ඒකාබද්ධ වුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ ඉල්ලීම කරන අතරතුර විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රය පිළිබඳව ඔබතුමාත්, තවත් බොහෝ දෙනෙක් ඉදිරිපත් කළ අදහස් පිළිබඳව අපේ පැත්තෙනුත් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න අපිත් කැමතියි. අපි ඇත්තටම කිව්වාද 1 ශ්‍රේණිය, 6 ශ්‍රේණිය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්න එපා කියලා? අපි එහෙම කිව්වාද? මම අහන්න කැමතියි. අපි ඒවා ක්‍රියාත්මක කරන්න එපා කිව්වේ නැහැ. ඔබතුමන්ලාම පටන් ගත්තා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ. ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ආරම්භ කරලා, ඉංග්‍රීසි භාෂා මොඩියුලයේ ඔබතුමන්ලා ඇතුළත් කර තිබුණා දරුවන්ට ඉගෙන ගන්න අසභ්‍ය වෙබ් අඩවියක තොරතුරු. ඒක කළේත් විපක්ෂයද? ඒක විපක්ෂය ද කළේ? ඒක ඔබතුමන්ලා කළේ. ඔබතුමන්ලාගේ නිලධාරින් කළේ. මේක තමයි ඇත්ත කථාව. ඊට පස්සේ,-

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ඔබතුමන්ලා,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් අහගන්න, ඇමතිතුමා. කලබල කරන්නේ නැතිව අහගන්න.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අහගන්න, අහගන්න. අපිත් අහගෙන හිටියා. මහත්තයෙක් වාගේ හැසිරෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම විශේෂයෙන්ම මේ අවස්ථාවේ මේ කාරණය කියන්න කැමැතියි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 1 ශ්‍රේණියට, 6 ශ්‍රේණියට ගෙන එනකොට අපි කිසිසේත් විරුද්ධ වුණේ නැහැ. 6 ශ්‍රේණිය මොඩියුලයට අසභ්‍ය වෙබ් අඩවියකුත් ඇතුළත් කරගත් හේතුව නිසාම ගරු ජනාධිපතිතුමා ඉතාම පැහැදිලිව සඳහන් කරනවා, මේක තාවකාලිකව කල් දානවා ලු, වසරකින්. අපි නොවෙයි කල් දැම්මේ. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා. මේ බලන්න එතුමා කියනවා, "මොඩියුල සකස් කිරීමේදී පවතින ගැටලු, ගුරු පුහුණු කිරීමේ ප්‍රමාදය, තාක්ෂණික ගැටලු මඟ හරවා ගනිමින් 6 ශ්‍රේණියේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ආරම්භ කිරීම 2027 දී සිදු කිරීමට අපේක්ෂා කරනවා" කියලා. මේක ජනාධිපතිතුමන්ම දාපු post එකක්. ඉතින්, අපිද මේ 6 ශ්‍රේණියේ ප්‍රතිසංස්කරණ කල් දැම්මේ? අපිද, ජනාධිපතිතුමාද? අපි කල් දමන්න කියලා කිව්වේ නැහැ. අපි කිව්වේ, මේ වැඩසටහන නිවැරැදි ආකාරයට ක්‍රියාත්මක කරන්න කියලා. ගරු අනුර කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමාට වුවමනාවක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ, අසභ්‍ය වෙබ් අඩවිය ඇතුළත් වුණු විෂය නිර්දේශය අපේ දූදරුවන්ට ලබා දෙන්නට. ඔබතුමා ඒකට රුචිකත්වයක් දක්වනවාද කියලා අපි දන්නේ නැහැ. ඒක ඔබතුමාගේ පෞද්ගලික අභිමතය වෙන්න පුළුවන්. නමුත් ඒක රටේ රාජ්‍ය ප්‍රතිපත්තිය වෙන්න බැහැ නේ. ඒක ජනාධිපතිතුමා අනුගමනය කරන ප්‍රතිපත්තියක් නොවෙයි කියන එක එතුමාගේ ප්‍රකාශයෙන්ම පැහැදිලි වෙනවා නේ. විශේෂයෙන්ම මේ වෙබ් අඩවිය ඇතුළත් වීමත් සමඟ සමාජයේ බරපතළ විරෝධයක් ඇති වුණු බව මම පැහැදිලිව කියන්න කැමැතියි.

ඒ විතරක් නොවෙයි. ඔබතුමාට මම මේ කාරණයත් කියන්න කැමැතියි. මේ අසභ්‍යකරණයට ලක් වුණු විෂය නිර්දේශය මුද්‍රණය කර බෙදා හැරියා. මහා විශාල මුදල් කන්දරාවක් වැය කරලා ඒ පෙළපොත් බෙදා හැරලා, විෂය නිර්දේශ බෙදා හැරලා, තමන්ම වරද කරලා එය විපක්ෂය පිට පටවන්නට එනවා. මොකක්ද මේ විහිළුව? ගරු ඇමතිතුමනි, ඔබතුමා උගත් පුද්ගලයෙක්. ඔබතුමා දන්නවා නේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විශ්වාස භංග යෝජනාව ගෙන එන වැඩ පිළිවෙළ, ක්‍රමවේදය ගැන ඔබතුමා දන්නවා නේ. ඒක ආණ්ඩුවේ අභිමතය පරිදි දින වෙන් කරන දෙයක් නොවෙයි නේ. අධ්‍යාපන අමාත්‍යවරිය රටේ නැති වෙලාවේ එතුමියටත් උත්තර දෙන්න බැරි විදියට විශ්වාස භංගයක් කඩිමුඩියේ ගෙන එන එක ගැන ඔබතුමන්ලාට ආසාවක්, බලාපොරොත්තුවක් තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. ඒ සඳහා ඔබතුමන්ලා කටයුතු කරනවාද කියන එක තමයි මේකෙන් ඉස්මතු වෙන්නේ. එතුමිය ඉන්නේ ඩාවෝස්වල. එතුමියට අසාධාරණයක් කරන්න එපා. *[බාධා කිරීම්]* එතුමිය මේ රටට එන්නේ සිකුරාදා. ඔබතුමන්ලාට ඕනෑ *[බාධා කිරීම්]* නැහැ, නැහැ. නලින්ද ජයතිස්ස මැතිතුමා කිව්වා, මේ බ්‍රහස්පතින්දා සහ සිකුරාදා විශ්වාස භංග යෝජනාව ගනිමු කියලා. ඒක එතුමා කිව්වේ. *[බාධා කිරීම්]* භාරදෙන එක නොවෙයි, විවාදය. *[බාධා කිරීම්]*

වැරදියට වචන පාවිච්චි කරන්න එපා. අධ්‍යාපන ඇමතිතුමිය ඩාවෝස්වල ඉන්න වෙලාවේ නලින්ද ජයතිස්ස මැතිතුමා තමයි කිව්වේ, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා විවාදය තියමු කියලා. මේක ඔබතුමන්ලා එතුමියට විරුද්ධව කරන කුමන්ත්‍රණයක්ද දන්නේ නැහැ. අපි බැරි වෙලාවත් එතුමියට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙනාවොත් ඔබතුමන්ලාගේ මේ කථාව තුළ එතුමියට උත්තර දෙන්න බැරි වෙනවා. ඒක නිසා *[බාධා කිරීම්]* තමුන්නාන්සේලා සතියේ දින හත දන්නේ නැති පුද්ගලයෝ. නලින්ද ජයතිස්ස ඇමතිතුමා කිව්වේ, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා කියලා.

මම මේ අවස්ථාවේ ඔබතුමන්ලාට කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ඔබතුමන්ලා කරන්න යන්නේ දරුවන් ලවා, දෙමව්පියන් ලවා රූපවාහිනී යන්ත්‍ර මිලට අරගෙන, smart boards මිලට අරගෙන. එහෙම නැහැයි කියලා කියනවා ද? අද රාජකීය විද්‍යාලයේ - Royal College එකේ - දෙමව්පියන්ට කියනවා, සල්ලි එකතු කරලා TV sets, smart boards ගන්න කියලා. ඒක නැහැයි කියලා කියනවා ද?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අහගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම මම තව සාක්ෂි දෙන්නම්. කොලොන්න මැතිවරණ කොට්ඨාසයේ පාසල් දෙකක දෙමව්පියන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබෙන ලිපි දෙකක් මම **සභාගත*** කරනවා. එක ලිපියක් ඉදිරිපත් කර තිබෙන්නේ කොලොන්න ආසනයේ කෝන්කටුව වීරබා ආදර්ශ විද්‍යාලයේ දරුවන්ගේ දෙමව්පියන් විසින්.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම තව කාලය ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අනෙක් ලිපිය ඉදිරිපත් කර තිබෙන්නේ කොලොන්න ආසනයේ පනාමුර, ශ්‍රී ඛේමානන්ද ප්‍රාථමික විද්‍යාලයේ දරුවන්ගේ දෙමව්පියන් විසින්. එම පාසල් දෙකේ දෙමව්පියන් ඉදිරිපත් කරපු ලිපි දෙක තමයි මම සභාගත කළේ. ඒ දෙමව්පියන්ට කියනවා, දරුවන් වෙනුවෙන් පාසලේ පන්ති කාමරයට TV ගන්න, smart boards ගන්න කියලා. එතකොට ජනාධිපතිතුමා වෘත්තීය සමිති හමුවෙච්ච වෙලාවේ කියනවා, "ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය smart පුවරු, රූපවාහිනී සහ පරිගණක වැනි යටිතල පහසුකම් දෙමව්පියන්ගේ මුදලින් නොව, රජයේ මුල්‍ය ප්‍රතිපාදන මත ලබා දීමට කටයුතු කරනවා" කියලා. ජනාධිපතිතුමා එහෙම කියනකොට මේ පාසල් පද්ධතියෙන් ඉල්ලීම් කරනවා, "අනේ, අපිට මේවා කරගන්න බැහැ, දරුවන්ගේ දෙමව්පියන්ට මිලමුදල් නැහැ, අපට සල්ලි එකතු කරලා මේවා ගන්න කියනවා" කියලා.

එම නිසා මම පැහැදිලිවම ඔබතුමාට මෙන්න මේ කාරණයත් කියන්න කැමැතියි. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව නොවෙයි ගැටලුව තිබෙන්නේ. ඔබතුමන්ලාට ඉස්සෙල්ලා තමයි අපි කිව්වේ ප්‍රතිසංස්කරණ කරන්න කියලා. Smart boards දෙනකොට හිනා වුණේ ඔබතුමන්ලා නේ. ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනය කරන්න කිව්වාම හිනා වුණේ ඔබතුමන්ලා නේ. ජපන් භාෂාව, හින්දි භාෂාව, චීන භාෂාව, STEAM - Science, Technology, Engineering, Arts and Mathematics - අධ්‍යාපනය ප්‍රවර්ධනය කරනකොට හිනා වුණේ ඔබතුමන්ලා නේ. ඔබතුමන්ලාට ඒවා අමතක ද? ඒවා අමතක ද? පැහැදිලිවම තමන්ගේ වැරදි වහගන්න, අග්‍රාමාත්‍යතුමිය අධ්‍යාපන ඇමතිතුමිය හැටියට කටයුතු කරන කොට එතුමියගේ අකාර්යක්ෂමතාව වහගන්න දැන් ඔබතුමන්ලා සූදානම් කරලා ලොකුවට උද්ඝෝෂණ නිර්මාණය කරනවා, "අනේ, ප්‍රතිසංස්කරණ ලබා දෙන්න" කියලා.

ප්‍රතිසංස්කරණ නැවැත්තුවේ තමුන්නාන්සේලා. ඒක නැවැත්තුවේ ප්‍රතිසංස්කරණ තුළ අසභ්‍යකරණය තිබුණු නිසා. එම නිසා කරුණාකරලා මේ social media, troll farms වාගේ විවිධ කණ්ඩායම්වලට සාත්තු සප්පායම් දීලා මේ බොරුව සමාජගත කරන්න එපා. ඔබතුමන්ලා දැන් "ගොබෙල්ස්ලා" වෙලා. හිට්ලර්ගේ ගොබෙල්ස් න්‍යාය තමයි ක්‍රියාත්මක කරන්නේ. බොරුව සමාජගත කරන්න යන්නේ. මම මේ අවස්ථාවේදී පැහැදිලිවම කියනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඔබටත් ප්‍රථමයෙන් මේ රටට යෝජනා කළේ අපි කියලා. ඒ නවීකරණය, නූතනවාදය යෝජනා කළේ අපි. එයට විරුද්ධ වුණේ ඔබ. හැබැයි, ඔබතුමන්ලා නිර්මාණය කළේ අමුතුම මාදිලියේ අධ්‍යාපනයක්. සියලු දෙනාගේම දැනගැනීම සඳහා මේ English මොඩියුලය, ඔබතුමන්ලා අසභ්‍යකරණයට ලක් කරපු මොඩියුලය මා **සභාගත*** කරනවා. අපි ප්‍රතිසංස්කරණවලට පක්ෂයි; අසභ්‍යකරණයට විරුද්ධයි. ස්තුතියි.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විපක්ෂ නායකතුමාට ස්තුතියි.

මීළඟට, ගරු අම්බිකා සාමිවෙල් මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 9ක කාලයක් තිබෙනවා. *[බාධා කිරීම්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අපි කථා කළේ විශ්වාස භංගය ගැන. එතුමා කථා කළේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන. *[බාධා කිරීම්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභාව නිශ්ශබ්ද වන්න. *[බාධා කිරීම්]*

[பி.ப. 2.27]

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! 2002ஆம் ஆண்டின் *[இடையீடு]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමිය කථා කරන්න, මේක ඔබතුමියගේ වේලාව.

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**
(மாண்புமிகு (செல்வி) அம்பிகா சாமிவேல்)
(The Hon. (Ms.) Ambika Samivel)
இன்றைய தினம் நடைபெறுகின்ற நலன்புரி அனுகூலங்கள் சட்டத்தின்கீழ் அஸ்வெசும நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டம் தொடர்பான விவாதத்தில் இரு விடயங்கள் பேசப்படுகின்றன.

முன்னைய அரசாங்கத்தால் கொண்டுவரப்பட்ட அஸ்வெசும நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டத்தில் திருத்தங்களை மேற்கொண்டு அதனை எமது அரசாங்கம் நடைமுறைப்படுத்தி வருகின்றது. எங்களுடைய அரசாங்கம் ஆட்சிக்கு வருவதற்கு முன்னர், அஸ்வெசும நலன்புரித் திட்டத்தின் கீழான கொடுப்பனவானது கிடைக்கப்பெற வேண்டிய நபர்களுக்குக் கிடைக்காமலும், கிடைக்கக் கூடாதவர்களுக்குக் கிடைப்பதுமாக இருந்தது. இவ்வாறு முரண்பாடுகளைக் கொண்டதும் குளறுபடிகளைக் கொண்டதுமான ஒரு திட்டமாகவே இத்திட்டம் இருந்தது. எங்களுடைய அரசாங்கம் ஆட்சிக்கு வந்ததன் பின்னர், இதற்கென ஒரு குழுவை நியமித்து, அதன்மூலம் குறைபாடுகளைச் சரிசெய்து, தகுதியானவர்களுக்குக் குறித்த கொடுப்பனவைக் கொடுப்பதற்குரிய வேலைகள் படிப்படியாக நடைபெற்று வருகின்றன. ஏனெனில், இந்தக் கொடுப்பனவானது எத்தனையோ வறிய, ஏழை மக்களுக்குக் கிடைக்காமல் இருந்தது. விசேடமாக, மலையகப் பகுதியில் கட்டாயம் கிடைக்க வேண்டியவர்களுக்கு இந்த 'அஸ்வெசும' கொடுப்பனவு கிடைக்காமல் இருந்தது. 'அஸ்வெசும' நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டமானது, வறியவர்களைக்

கொண்டுநடாத்துவதற்கான திட்டமல்ல. மாறாக, அவர்களை வறுமையிலிருந்து வெளியே கொண்டுவந்து, வளப்படுத்துவதற் கான ஒரு திட்டமாகும். இதனையே எங்களுடைய அரசாங்கம் செய்வதற்கு எதிர்பார்க்கின்றது. அதனால்தான் இதிலுள்ள குறைபாடுகளைச் சரிசெய்து, கிடைக்கப்பெறவேண்டிய நபர்களுக்கு இக்கொடுப்பனவு கிடைப்பதற்குரிய வேலைத் திட்டங்களைச் செய்துகொண்டு இருக்கின்றோம்.

முதியோர் கொடுப்பனவாக இருக்கட்டும், அங்கவீனர் களுக்கான கொடுப்பனவாக இருக்கட்டும், எல்லாக் கொடுப்பனவுகளும் தற்பொழுது அதிகரிக்கப்பட்டு இருக்கின்றது. விசேடமாக, 7,500 ரூபாயாக இருந்த முதியோர் கொடுப்பனவு 10,000 ரூபாயாக அதிகரிக்கப்பட்டு இருக்கிறது. அதேபோன்று, சிறுநீரக நோயால் பாதிக்கப்பட்டவர்களுக்கான கொடுப்பனவும் அங்கவீனர்களுக்கான கொடுப்பனவும் அதிகரிக்கப்பட்டு இருக்கின்றது. மேலும், அஸ்வெசும நலன்புரித் திட்டத்தினூடாகப் பயன்பெறுகின்ற குறைந்த வருமானம்கொண்ட குடும்பங்களைச் சேர்ந்த பிள்ளைகளுக்கு 6,000 ரூபாய் கொடுப்பனவு வழங்கப்படுகின்றது. இவ்வாறு நாங்கள் குறைந்த வருமானம் பெறுகின்றவர்கள் தொடர்பில் அதிக அக்கறை செலுத்தி, அவர்களை அந்நிலையிலிருந்து மீட்டெடுப்பதற்கான வேலைத்திட்டங்களைச் செய்து வருகின்றோம்.

அஸ்வெசும திட்டத்தில் மாற்றத்தைக் கொண்டு வருவதற்கான காரணம், எங்களுடைய மக்களுடைய வாழ்க்கையில் மாற்றத்தை ஏற்படுத்த வேண்டும் என்பதுதான். எனக்கு முன்னர் பேசிய எதிர்க்கட்சித் தலைவர் அவர்கள் கூறியதுபோல, கல்வியில் மாற்றத்தைக் கொண்டுவர வேண்டும். மிகவும் வறுமைக் கோட்டுக்குக்கீழ் இருக்கின்ற மாணவர்களுக்குக் கல்வியானது சரியான முறையில் கிடைக்காததால், இவ்வாறான பண உதவிகளைச் செய்து அந்த மாணவர்களுடைய கல்வி நிலையை மேம்படுத்துவதற்குரிய வேலைகளை நாம் செய்துகொண்டு இருக்கின்றோம்.

இவை எல்லாவற்றுக்கும் மேலாக, இன்றுவரை நடைமுறையிலுள்ள மனனம் செய்து ஒப்புவிக்கின்ற எமது கல்வித்திட்டம் நிமித்தம்தான், அக்கல்வித் திட்டத்தினூடான பிழையான வழிநடத்தலின் நிமித்தம்தான், இன்றும் நாங்கள் இந்த நிலைமையை அனுபவித்துக்கொண்டு இருக்கின்றோம். எதிர்காலச் சந்ததியினரான எங்களுடைய பிள்ளைகளின் நலன் கருதி, சிறந்ததொரு கல்வித் திட்டத்தைக் கொண்டுவர வேண்டும். அவர்களை எதிர்கால சவால்களுக்கு முகங் கொடுக்கக்கூடியவர்களாக, தொழில்நுட்ப வளர்ச்சியோடு போட்டிபோட்டு முன்னேறக்கூடியவர்களாக உருவாக்க வேண்டுமென்றால், அது எங்களுடைய புதிய கல்விச் சீர்திருத்தத்தின் மூலமே சாத்தியப்படும்.

புதிய கல்விச் சீர்திருத்தத்தில் ஒருசில பிழைகள் இருக்கலாம். அவற்றைச் சுட்டிக்காட்டி, அதன் நிமித்தம் எங்களது பிரதமர் பதவி விலக வேண்டுமெனச் சிலர் சொன்னார்கள். இவை எல்லாவற்றுக்கும் காரணம், புதிய கல்விச் சீர்திருத்தத்தின் மூலம் கிடைக்கின்ற பிரதிபலன் மிகப் பெரியதொரு மாற்றம் என்பதுதான். இவர்களால் செய்ய முடியாததை எங்களுடைய அரசாங்கம் மக்களுக்குச் செய்யும் போது, தங்களுடைய அரசியல் எதிர்காலம் முழுமையாக இல்லாமல் போய்விடும் என்ற பயத்தின் நிமித்தம் கலங்கிப்போய் வதந்திகளைப் பரப்பி, புதிய கல்விச் சீர்திருத்தத்தை நடைமுறைப்படுத்துவதை நிறுத்துவதற்கான வேலைகளைச் செய்துகொண்டு இருக்கிறார்கள்.

புதிய கல்விச் சீர்திருத்தமானது எமது நாட்டிலும் எமது சமூகத்திலும் எமது பிள்ளைகளுடைய வாழ்க்கையிலும் பாரியதொரு முன்னேற்றத்தை ஏற்படுத்தப் போகின்றது. அதேபோல், வறுமைக் கோட்டுக்குக் கீழிருக்கின்ற எங்களுடைய மக்களின் வாழ்வியலும் மாறும். நிவாரணங்களை எதிர்பார்த்துக் காத்திருக்கின்ற சமூகத்தின் நிலையை மாற்று வதற்கான, தங்களுடைய தொழிலையும் வாழ்வாதாரத்தையும் பலப்படுத்திக் கொள்ளக்கூடிய நல்லதொரு சமூகத்தைக் கட்டியெழுப்புவதற்கான அடித்தளத்தைத்தான் நாங்கள் இந்தக் கல்விச் சீர்திருத்தத்தின்மூலம் இடப்போகின்றோம். நிவாரணங்களைப் பெற்றுக்கொண்டு, தொழில் இல்லாமல் வாழ்க்கையோடு போராடிக்கொண்டு இருக்கும் சமூகத்தினர் தங்களுடைய வாழ்க்கையைத் தாங்களே அமைத்துக்கொண்டு சீரான ஒரு சமூகத்தினராக மாறுவதற்கு நாங்கள் இதன்மூலம் அடித்தளம் இட்டிருக்கின்றோம்.

மக்கள் வறுமைக் கோட்டுக்குக்கீழ் இருப்பதையும் கல்வியில் பின்தங்கிய நிலையில் இருப்பதையும் பயன்படுத்தி, தங்களது தேவைகளை நிறைவேற்றிக்கொள்பவர்களே புதிய கல்விச் சீர்திருத்தத்தை எதிர்க்கின்றார்கள்; அதற்குத் தடைக்கல்லாக இருக்கின்றார்கள். பொய்களைக் கூறியும் வாக்குறுதிகளை வழங்கியும் மக்களை ஏமாற்றலாம். புதிய கல்விச் சீர்திருத்தத்தின்மூலம் கல்வி நிலையில் மாற்றம் ஏற்பட்டு, பிள்ளைகள் தெளிவான நிலைக்கு வந்தால், ஏமாற்று அரசியலைச் செய்ய முடியாது என்ற பயத்தில்தான் இவர்கள் இதற்கு எதிராக நிற்கின்றனர். நாங்கள் அஸ்வெசும நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டத்தில் மாத்திரமல்ல, கல்வித் திட்டத்திலும் மாற்றத்தை ஏற்படுத்தி இருக்கின்றோம்.

இன்று மாற்றுக் கருத்துகளை முன்வைத்துக்கொண்டு இருக்கின்ற எதிர்க்கட்சியினருக்கு ஒரு விடயத்தைக் கூற விரும்புகின்றேன். அதாவது, நாங்கள் எடுத்த எந்த முடிவையும் மாற்றப் போவதில்லை. அவற்றை அப்படியே முன்னெடுத்துச் செல்வோம். தேசிய மக்கள் சக்தி அரசாங்கம் சொன்ன ஒவ்வொரு விடயத்தையும் நிறைவேற்றும் என்பதை நான் மலையக மக்களைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒருத்தியாகச் சொல்கின்றேன். பெருந்தோட்டத் தொழிலாளர் களுக்கு 1,700 ரூபாய் நாட் சம்பளத்தைப் பெற்றுக் கொடுப்போமென நாங்கள் சொன்னோம். அவர்களுக்குக் கொடுத்த வாக்குறுதியின்படி, எந்தவித போராட்டமும் இன்றி அடுத்த மாதம் 10ஆம் திகதியாகும்போது அவர்களுடைய கைகளுக்கு அந்தச் சம்பளம் கிடைக்கப்பெறும். அப்போது அவர்களுக்குத் தெரியவரும் நாங்கள் சொன்னதைச் செய்பவர்கள் என்று.

மலையக மக்கள் உட்பட இலங்கையில் இருக்கின்ற அனைத்து மக்களும் புரிந்துகொள்ள வேண்டிய விடயம்தான் தேசிய மக்கள் சக்தியினராகிய நாங்கள் சொன்ன எல்லா விடயங்களிலும் உண்மைத்துவம் இருகின்றது என்று. கல்விச் சீர்திருத்தத்தின் மூலமாக பிள்ளைகளுடைய வாழ்க்கையிலும் மலையக மக்களுடைய வாழ்க்கையிலும் மாற்றத்தை ஏற்படுத்துவதே எங்களுடைய நோக்கமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දිලිත් ජයවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.37]

**ගරු දිලිත් ජයවීර මහතා**
*(மாண்புமிகு திலித் ஜயவீர)*
(The Hon. Dilith Jayaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් මතුව ඇති කතිකාවත්, ඒ වාගේම අපටම අනන්‍ය සභ්‍යත්වයට එල්ල වී ඇති අභියෝගත් කියන දෙකම එක්ව සාකච්ඡාවට ලක් කළ යුතු යැයි මම විශ්වාස කරනවා. නිදහස් අධ්‍යාපනයෙන් බිහි වුණු පුරවැසියන් හැටියට අපි පළමුව වාගේම නැවත නැවතත් කියන්න ඕනෑ, මේ යුගය විවිධ හේතු නිසා අපේ නිදහස් අධ්‍යාපනය විශාල වශයෙන් අභියෝගයට ලක් වුණු යුගයක් බව. ඉතුරු වෙලා තිබෙන අන්තිම ටිකත් අවසන් වන එක තමයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් සිද්ධ වන්නේ කියන එක මම මතක් කරලා දෙන්න ඕනෑ.

ඒ වාගේම දීර්ඝ කාලයක් තිස්සේ අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය නොවුණු එකත් විශාල ගැටලුවක් බව අපි පිළිගන්න ඕනෑ. මෙය වහා ප්‍රතිසංස්කරණයට ලක් කළ යුතු ක්ෂේත්‍රයක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි අධ්‍යාපනය මෙසේ ප්‍රතිසංස්කරණයට ලක් කරනකොට අපි ඒ ප්‍රතිසංස්කරණ කරන්නේ කුමන අරමුණක් සඳහාද, එයින් බලාපොරොත්තු වන්නේ කුමක් ඉෂ්ට කර ගන්නද කියන එක පැහැදිලි වන්න ඕනෑ. තිබෙන ක්‍රමයටත් වඩා පහත් තත්ත්වයට අධ්‍යාපනය අරගෙන යනවා නම්, දැනටමත් අභියෝගයට ලක් වී තිබෙන නිදහස් අධ්‍යාපනය තවදුරටත් අභියෝගයට ලක් වනවා නම්, ඒක විශාල ප්‍රශ්නයක්. එම නිසා නැවතත් මම පැහැදිලිව කියන්න ඕනෑ, ප්‍රතිසංස්කරණ අවශ්‍යයි, ගෝලීය වෙනස්කම් හා ගැළපෙන ප්‍රතිසංස්කරණ අවශ්‍යයි, දරුවා දියුණු වුණු ලෝකයට ගෙන යන්නට හැකි ප්‍රතිසංස්කරණ අවශ්‍යයි කියලා. හැබැයි, ඒ ප්‍රතිසංස්කරණ කරන්නේ කිනම් කරුණක් අරබයාද, කිනම් පරමාර්ථයක් ඉෂ්ට කර ගැනීම සඳහාද කියන එකත් පැහැදිලි කර ගැනීම අත්‍යවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පාර්ලිමේන්තුවේදී තුන් වතාවක් කිව්වා, නියමු වැඩසටහනක් ඔස්සේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යන්න කියලා. අපි එපා කිව්වේ නැහැ, ඕනෑම පර්යේෂණයක් කරන්න. හැබැයි, නියමු වැඩසටහනක් යටතේ. මෙතුමන්ලාවත් දන්නේ නැහැ, මේ ප්‍රතිසංස්කරණ යෝජනාවලිය ආවේ කොහෙන්ද කියලා. කොහෙන් මතු වුණු එකක්ද කියලා දන්නේත් නැහැ. එහෙන් මෙහෙන් කෑලි අල්ලාගෙන තමයි දැන් මේ කථා කරන්නේ. මේ ඉන්නේ ගමෙන් ආපු අපේ මිත්‍රයෝ. බටහිරින් ගෙනැල්ලා එහෙමපිටින්ම ඔබපු මොඩියුල ක්‍රමයක් මේක. ඇත්තවශයෙන්ම මොඩියුල ක්‍රමය අද ලෝකය පිළිගන්නා අධ්‍යාපන ක්‍රමයක්. එය අවශ්‍යයි. හැබැයි මොඩියුල කියන්නේ, ඒ ක්‍රමවේදයට කියන නම මිසක්, මේ විනාශයට කියන නම නොවෙයි. මේ ප්‍රතිසංස්කරණවල තිබෙන්නේ විනාශයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඉස්කෝලේ යන කාලයේ පස්රුල් පොත ඔබටත් තිබුණා, මටත් තිබුණා. ඔබ දන්නවාද, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලිය තුළ පස්රුල් පොත නැති කරලා කියලා? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි පස්රුල් පොත නැහැ. ඔබට මතක ඇති, අපි කුඩා කාලයේ ඉස්කෝලේ ගිහිල්ලා මේ පොතේ එකම අකුර සිය වතාවක් ලියනවා. එකම අකුර සිය වතාවක්, ඊටත් වැඩි වතාවක් ලියලා, ලියලා තමයි අපි ලස්සනට අකුරක් ලියන්න ඉගෙන ගත්තේ. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලිය තුළ අච්චු ගහලා පොතක් දීලා තිබෙනවා, ඒ පොතේ අකුරු 5ක්වත් ලියන්න බැහැ. ඒ පොත ගෙදර අරගෙන යන්නත් බැහැ, පස්රුල් පොතත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔන්න ඕකයි මේ තුළින් වෙලා තිබෙන්නේ.

දැන් 6 ශ්‍රේණිය ඉංග්‍රීසි මොඩියුලය අකුළා ගත්ත එක ප්‍රමාණවත් නැහැ. මුළු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනාවලියම නියමු වැඩසටහනකට යටත් කළා නම් රුපියල් බිලියන ගණනක් නාස්ති වෙන්නේ නැහැ. අද වනකොට රුපියල් බිලියන ගණනක් නාස්ති වෙලා තිබෙනවා. ඔවුන් කුඩා දරුවෝ. අද හෝඩියේ පන්තියට ගිය දරුවාටයි මේ පරීක්ෂණය කරන්නේ. මේ පරීක්ෂණය කරන්නේ මී පැටවුන්ටද? මී පැටව් දාලා ද, මේ පරීක්ෂණය කරන්නේ? නැහැ. අපේම දරුවන්ට මේ පරීක්ෂණය කරලා තමයි හොයා ගන්න හදන්නේ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරියනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමා කිව්ව කථාව ඇත්ත. අද හෝඩියේ පන්තියට අවශ්‍යයි, TV එකකුයි, JBL sound system එකකුයි. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය හෝඩිය පන්තියට උගන්වන ගුරුවරුන්ගේ අතට තවමත් ලැබිලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, දැන් දරුවන්ට උගන්වන්න පටන් ගන්නවා. නමුත්, ඒ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය ගුරුවරුන්ගේ අතේ නැහැ. PDF එකක් තිබෙන්නේ. ඒක phone එකෙන් හොයා ගන්න ඕනෑ. ඒකේ තිබෙනවා, QR කේත 40කට වැඩිය. ඒ, QR කේත 40 මඟින් තමයි ළමයින්ට ඒ ගැන උගන්වන්න ඕනෑ. ඒක ළමයින්ට පෙන්වන්න අවශ්‍ය වන්නේ ස්මාර්ට් දුරකථනයක් පමණක් නොවෙයි; TV එකටත් දාලා, sounds දාලා ළමයින්ට ඒක පෙන්වන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ආදරයෙන් කථා කරන අපේ නිදහස් අධ්‍යාපනයට මේ වින කරන්නේ කවුද? මෙතරම් බහුතරයක් සමාජ මට්ටමින් මේ ස්තරය නියෝජනය කරමින් මේ පාර්ලිමේන්තුවට කවදාවත් ආපු නැති පරිසරයක් තුළ තමයි මේ දේ ඔබගේ අතින්ම කරවා ගන්නේ. ඔබගේ අතින්ම එය කරවා ගන්නවා. අපේ ගෙල අපේ අතින්ම මිරිකා ගන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි මේ වෙලා තිබෙන්නේ. මේක බොහොම කනගාටුදායක තත්ත්වයක්.

ඒ වාගේම ලංකාවේ මෑත ඉතිහාසයේ ඉතාම දුෂ්කර තත්ත්වයන් තුළ පවා පාසල් දරුවන් හැමෝටම නිල ඇඳුම් ලැබුණා. නමුත්, අද වනකොට කුඩා දරුවන්ට නිල ඇඳුම් ලැබිලාත් නැහැ කියන කාරණයත් මම මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම මම මේ කාරණයත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද අපේ සම්බුද්ධ ශාසනය හා රාජ්‍යය ඉතාම දැඩි අභියෝගයකට ලක් වෙලා තිබෙනවා. විශේෂයෙන් ජනාධිපතිවරයා යාපනයේදී කරන ලද ඉතාම අසංවේදී ප්‍රකාශය නිසා අද මුළුමහත් ශ්‍රී ලාංකික ජන සමාජයම ජාති, ආගම් භේදයෙන් කැලඹිලා තිබෙනවා. ඒක ජාතිවාදී ප්‍රකාශයක්. එතුමාට වැරදීමක් වුණා නම් එතුමා ඒක ඉල්ලා අස් කර ගන්නට ඕනෑ කියායි මම කියන්නේ. එතුමා මතක තියා ගන්නට ඕනෑ, ශ්‍රී ලංකාව කියන්නේ සම්පූර්ණයෙන්ම සම්බුද්ධ ශාසනය හා බැඳුණු රාජ්‍යයක් බව. අද වනකොට බලංගොඩ කස්සප හාමුදුරුවෝ හිර ගෙදර. ඒක නඩු කටයුත්තක් කියන්නට පුළුවන්. නමුත්, ඒක පිටුපස තිබෙන දේශපාලනික කාරණය අපට අමතක කරන්නට බැහැ. අද සංඝයා වහන්සේට නිගරු කරන පක්ෂවලින්, අරමුදල්වලින් සල්ලි දීලා කරන සමාජ මාධ්‍ය භාවිතය අපට අමතක කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මතක් කර දෙන්නට ඕනෑ, මේ රාජ්‍යය පිහිටා තිබෙන්නේම සම්බුද්ධ ශාසනයත් රැකගෙන, සම්‍යක් දෘෂ්ටික දෙවි දේවතාවුන් එක්ව ඇති වන ඒ ත්‍රිකෝණය තුළ බව. අපි සියලු දෙනාම එක්ව කටයුතු කළ යුත්තේ අපේ අන්‍ය ආගමිකයින් සහ අන්‍ය ජාතිකයිනුත් සුරැකෙන ලෙසත්, කිසිම ජාතිවාදයක් ප්‍රවර්ධනය නොවන ලෙසත් සභ්‍යත්වය රැක ගැනීම පිණිස මිස එය අභියෝගයට ලක් කරන්න නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව තත්පරයක් දෙන්න.

මේ කරුණ සඳහන්ව ඇති, ආචාර්ය වන්න ජයසුමනයන් විසින් රචිත "රාජ්‍යය කුමකට ද?" කියන කෙටි ග්‍රන්ථය කියවන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. මෙහි පිටු කිහිපයයි තිබෙන්නේ. මේ පොත කියවන්නට කියලා මම මේ පාර්ලිමේන්තුවේ සියලුම මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා. ආචාර්ය වන්න ජයසුමනයන් විසින් රචිත "රාජ්‍යය කුමකට ද?" කියන කෙටි ග්‍රන්ථය මේ අවස්ථාවේදී **සභාගත*** කරමින්, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.46]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු අමාත්‍යතුමා උදේ කථා කරමින් සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමයේ කාර්යභාරය මොකක්ද කියලා බොහොම පැහැදිලිව කරුණු ඉදිරිපත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවමත් අපේ රටේ දරිද්‍රතාවෙන් මිරිකෙන ජනතාවක් ඉන්නවාය කියන එක අපි පිළිගන්න ඕනෑ. සමාජ සවිබලගැන්වීම කියන එක තිබුණේ අද ඊයේ සිට නොවෙයි. මේ රට පාලනය කළ හැම ආණ්ඩුවක් යටතේම සමාජ සවිබලගැන්වීම තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හැබැයි, සිදු වුණේ නැත්තේත් එච්චරයි; සමාජ සවිබලගැන්වීම සිදු වුණේ නැහැ. පාලකයෝ සවිබලගැන්වුණා. නමුත්, ජනතාව සවිබලගැන්වුණේ නැහැ. ඒ නිසා තමයි අපිට තවමත් මේ අස්වැසුම ප්‍රතිලාභ ක්‍රමය වැනි ක්‍රියාදාමයන් ඉස්සරහට පවත්වාගෙන යන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම කිව්වොත් ලක්ෂ 20ක වාගේ ප්‍රමාණයක් තවමත් මේ ප්‍රතිලාභ, මේ සහන මත ජීවත් වෙනවා. මේකේ තේරුම තමයි, ඒ කොටස ඇත්තටම ජීවිතය විඳින්නේ නැහැ කියන එක, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒගොල්ලන් ජීවිතය විඳවනවා. ඒ විඳවන ජීවිත, වින්දනය ලබන ජීවිත බවට පත් කර ගැනීමේ කාර්යභාරය අපේ ආණ්ඩුවට පැවරිලා තිබෙනවා. ඒක හොඳින් තේරුම් අරගෙන තමයි අපි රටක් හැටියට කටයුතු කරන්නේ. අධ්‍යාපනය වෙන්න පුළුවන්, සෞඛ්‍ය වෙන්න පුළුවන්, සමාජ සවිබලගැන්වීම වෙන්න පුළුවන්; මේ හැම දෙයක්ම නිර්මාණය වෙන්නේ ඒකට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඇත්තටම අධ්‍යාපනයත් මේකට සම්බන්ධ වෙලා තිබෙන්නේ. මේ තත්ත්වයට පත් වෙන්න ඇත්තටම අධ්‍යාපනය බලපානවා.

බොහෝ මිනිස්සු කියනවා, අපේ රටේ සාක්ෂරතාව ඉහළයි කියලා. නමුත්, අපේ රටේ සාක්ෂරතාව ඉහළ මට්ටමක තිබුණාට දියුණුවෙන් බොහොම අඩුයි. දියුණුවෙන් පහළ තැනකයි අපේ රට තිබෙන්නේ. ඒක එහෙම වෙන්නේ ඇයි? මෙන්න මෙතැනදී තමයි අපි ඇත්ත තත්ත්වය තේරුම් ගන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි දන්නවා, මේ සමාජයේ පිරිහුණු ජීවිත තිබෙනවා කියලා. දරිද්‍රතාව, නූගත්කම වැනි තත්ත්වයන් මත්ද්‍රව්‍ය එක්කත් ගැට ගැහිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දරිද්‍රතාව, නූගත්කම එක්ක එකට ගැට ගැහුණු, මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු වැඩිහිටියන් මේ සමාජය තුළ ඉන්නවා. ඒ වැඩිහිටියන් ගත කරන ජීවිතය ඛේදවාචකයක්. සමහර වැඩිහිටියන්ට සිද්ධ වෙලා තිබෙනවා, ළමයින්ගෙන් ගුටි කන්න. එහෙම තත්ත්වයක් සමාජයේ දක්නට තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම අපි ඒ ගැන සොයා බැලුවොත්, එහෙම නොවෙයි කියලා අපි හිතන කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන සමහර ගෙවල්වල පවා මේ ඛේදවාචකය දක්නට තිබෙනවා. ඒක දරිද්‍රතාවත් එක්ක එකට ගැට ගැහිලා තිබෙන්නේ. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වුවමනා වෙලා තිබෙන්නේත් ඒ නිසායි.

මට ඉස්සෙල්ලා කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, පස්රුල් පොත ගැන. ඔව්, පස්රුල් පොතක් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පස්රුල් පොත තිබුණේ මොකටද?

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ඇත්තටම මොකටද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
මොකක්ද ඒකෙන් කළේ?

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
මොකක්ද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒ ගැන කිව්වේ නැති නිසා තමයි මම මේ කියන්න හදන්නේ. පස්රුල් පොත මොකටද තිබුණේ? අපි ඉගෙන ගත්ත කාලයේ පන්තිවල සිටි සමහර ළමයි ඉහළට ආවත්, අකුරු ලියන්න බැරි ළමයිනුත් ඒ අතරේ හිටියා. ඒක ඇත්ත. සමහර වෙලාවට ඒ ළමයි ලිවිය යුතු ප්‍රමාණයෙන් අකුරු ලිව්වේ නැහැ. උදාහරණයක් හැටියට ගත්තොත්, සිංහල අක්ෂර මාලාවේ තිබෙන "අ" යන්න, "උ" යන්න සහ "ල" යන්න ලොකුවට ලියන්න ඕනෑ. එහෙම නොකරන ළමයින්ට තමයි ගුරුවරයා කියන්නේ "පුතේ, පස්රුල් පොතක් අරගෙන එන්න" කියලා. හැමෝටම එහෙම කරන්න කියලා කිව්වේ නැහැ. ඊට පස්සේ ගුරුවරයා පස්රුල් පොත ගෙන්වාගෙන ඒ ළමයාට කියලා "අ" යන්න ලියවනවා; එතකොට ඒ ළමයා "අ" යන්න ලියන්න ඕනෑ ප්‍රමාණයට ලියනවා. "උ" යන්න ලියවනවා; ඒ ළමයා "උ" යන්න ලියන්න ඕනෑ ප්‍රමාණයට ලියනවා. "ල" යන්න ලියවනවා; ඒ ළමයා "ල" යන්න ලියන්න ඕනෑ ප්‍රමාණයට ලියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පස්රුල් පොත විතරක් නොවෙයි, අපිට ගල් ලෑල්ලකුත් තිබුණා. අපි ගල් ලෑල්ලේ ලිව්වා කියලා දැන් ඉන්න පරම්පරාවේත් අධ්‍යාපනයට ගල් ලෑල්ල ඇතුළත් කරන්න ඕනෑද? දැන් මේ කියන තර්කයට අනුව අපි ගල් ලෑල්ලේ ලියපු නිසා මේ අධ්‍යාපනය ඇතුළේ කොහේ හරි ගල්

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා]

ලැල්ලක් ගැනත් තිබෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පිළිගත යුතු සත්‍යයක් තිබෙනවා. ඒ, මොකක්ද? අපේ කාලයේ හිටපු පරම්පරාවට වඩා මේ අලුත්, තරුණ පරම්පරාව දියුණුයි. අපිට වඩා අලුත් පරම්පරාව දියුණුයි. අපි ඒක පිළිගන්න ඕනෑ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු මන්ත්‍රීතුමා, පස්රුල් පොත තිබෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
පෙර පරම්පරාවට වඩා පසු පරම්පරාව දියුණුයි. ඒක නිසා- *[බාධා කිරීමක්]* - පස්රුල් පොත නැති වෙලා නැහැ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ඒක තමයි. හැබැයි, අකුරු 5යි ලියන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
පස්රුල් පොත නැති වෙලා නැහැ. පස්රුල් පොත තිබෙනවා.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
අකුරු 5යි ලියන්න පුළුවන්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය ඇතුළේ කොහේවත් පස්රුල් පොත තහනම් කියලා නැහැ. වෙලා තිබෙන්නේ මේකයි. *[බාධා කිරීමක්]* ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියවලාත් නැහැ මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය. ඔබතුමා පිළිගන්නවා නේ, - *[බාධා කිරීමක්]* අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව ඔබතුමන්ලා දන්නේ නැහැ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ගරු මන්ත්‍රීතුමා, මේ අහන්න. අකුරු 5ක් ලිව්වාම ඇතිද?

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
නැහැ. අනෙක් ඒවාත් ලියන්න ඕනෑ. *[බාධා කිරීමක්]* තව ඕනෑ තරම් දේවල් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* අලුතින් ගෙනෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මොනවාද කියලා දන්නේත් නැතුව නිකම් දඟලන දැඟලිල්ලක් තිබෙන්නේ.

**ගරු දිලිත් ජයවීර මහතා**
(மாண்புமிகு திலித் ஜயவீர)
(The Hon. Dilith Jayaweera)
ඔබතුමා දැක්කාද, පොත? ඔබතුමාත් දැකලා නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் நிபுண ஆரச்சி)
(The Hon. Lakshman Nipuna Arachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට ඉස්සෙල්ලාත් කියා තිබෙනවා, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට විරුද්ධව කෑ ගහන අය මේ ලෝකේ දෙයක් දන්නේ නැතුවයි කෑ ගහන්නේ කියලා. අපේ ගම්වල සමහර වෙලාවට රෑට කොහේ හරි ගෙදරක බල්ලෙක් උඩු බුරනවා, හයියෙන්. ඒ බල්ලා උඩු බුරනකොට, වටේ ඉන්නා අනෙක් බල්ලොත් උඩු බුරන්න ගන්නවා. හැබැයි, හේතුවක් දන්නේ නැහැ, බල්ලෝ ටික. එක බල්ලෙක් උඩු බිරුවාම, වටේම ඉන්නා අනෙක් බල්ලොත් උඩු බුරනවා. හැබැයි, කිසිම තේරුමක් නැහැ. උඩු බුරන බල්ලෝ දන්නේත් නැහැ, මොකටද බුරන්නේ කියලා. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව තිබෙන තත්ත්වයත් ඔන්න ඔය වාගේ තමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කවුරු හරි කෙනෙක් උඩු බිරුවාට පසුව අනෙක් අයත් උඩු බුරනවා, මේ ලෝකේ දෙයක් දන්නේ නැතුව. එතුමන්ලාත් ඒක පිළිගන්නවා. අපි මේ පාර්ලිමේන්තුවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව ඕනෑ තරම් සාකච්ඡා කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂ නායකතුමාවත්, විපක්ෂයේ වෙන කිසිම මන්ත්‍රී කෙනෙක්වත් "මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව අපව දැනුවත් කරන්න" කියලා කවදාවත් කිව්වේ නැහැ. *[බාධා කිරීමක්]* කවදාවත් ඒ ගැන කථා කරලා නැහැ. හැබැයි, දැනුවත් වෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* අපි විපක්ෂයේ ඉන්නකොට, අපි තොරතුරු හොයා ගෙන ගියේ. ඒක තමයි විපක්ෂයේ කාර්යභාරය. විශේෂයෙන්ම විපක්ෂ මන්ත්‍රීවරයෙකුගේ කාර්යභාරය තමයි, ආණ්ඩුව මොකක් හරි වැඩ පිළිවෙළක් ගෙනෙනවා නම්, ඒ වැඩ පිළිවෙළ සම්බන්ධව තමන්ට තිබෙන දැනුවත්භාවය මදි නම්, ආණ්ඩුවෙන් ඒ සම්බන්ධව කරන දැනුවත් කිරීම මදි නම්, ඒවා ගැන තමන් හොයාබලා දැනුවත් වීම. ඒකට තමයි විපක්ෂයේ මන්ත්‍රීවරුන් ඉන්නේ. ඒ අය ආණ්ඩු කරන්නේ නැහැ නේ. වෙන කරන දෙයක් ඇත්තේත් නැහැ නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා මොනවාද කරන්නේ? මේ පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලා මොනවාද කරන්නේ? *[බාධා කිරීමක්]* කරන කෙංගෙඩියක් නැහැ නේ, ඔබතුමන්ලා. ඔබතුමන්ලාගේ කාර්යභාරය ඔබතුමන්ලා කරන්නේ නැහැ. ඔබතුමාටත් මෙතැන කථා කරන්න විනාඩි 8ක් විතර හම්බ වෙනවා. ඔබතුමාත් ඇවිල්ලා විනාඩි 15ක් විතර මෙතැන ඉන්නවා. ගෙදර යනවා. එච්චරයි. අඩුම ගණනේ කමිටුවකටවත් එන්නේ නැහැ නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි අපි මුහුණ දෙන ඛේදවාචකය. කාට නැතත් ආණ්ඩු පක්ෂය හැටියට අපට වගකීමක් තිබෙනවා. මේ හැම දෙයක් සම්බන්ධවම ජනතාව වෙනුවෙන් අපට වගවීමක් තිබෙන්න ඕනෑ; වගකීමක් තිබෙන්න ඕනෑ. මම පැහැදිලිව කියනවා, විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙකු ජනතා වගකීම කියන එක දරන්නේ නැති බව. ඒගොල්ලන්ට සමාජ වගකීමක් නැහැ. ඒ නිසා තමයි මෙවැනි ඛේදවාචකයකට මේ පාර්ලිමේන්තුව පත් වෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* ඒ නිසා අපි විශ්වාස කරනවා, ජනතාව සවිබලගැන්වීම, ජනතාව මේ සිටින තත්ත්වයෙන් මුදා ගැනීම ආණ්ඩුවේ කාර්යභාරය බව. විශේෂයෙන්ම "අස්වැසුම" වාගේ සහනාධාර ක්‍රමවේදවලින් ජනතාව මුදා නිෂ්පාදන ආර්ථිකයට දායක කර ගන්නවා කියන්නේ අපේ රට ඉදිරියේදී හොඳ ගමනක් යනවා කියන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.56]

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කය තුළ දේශපාලනය කළ, අප අතරින් වෙන් වුණු ගරු නන්දන ගුණතිලක මැතිතුමා පිළිබඳව මම පළමුව වචන කිහිපයක් කිව යුතුමයි.

ජනතා විමුක්ති පෙරමුණේ ශිෂ්‍ය ක්‍රියාකාරිකයෙක් විධියට කටයුතු කළ එතුමා, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ BSc උපාධියත් කැප කරමින්, අසීරු කාලයක විප්ලවයක් වෙනුවෙන් තමන්ගේ ශිෂ්‍ය ජීවිතය කැප කළා.

1988-1989 අරගළය පරාජයට පත් වුණාට පස්සේ ජනතා විමුක්ති පෙරමුණ නැවත ගොඩනහන්නට නන්දන ගුණතිලක මැතිතුමා කැප වුණා. කිහිපදෙනෙක් විතරයි හිටියේ. විශාල අභියෝගයක් තිබුණා. ඒ අභියෝග මැද්දේ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයක් හැටියට ජනතා විමුක්ති පෙරමුණ නැවත ගොඩනහන්න නන්දන ගුණතිලක මැතිතුමා නායකත්වය දුන්නා; ජනතා විමුක්ති පෙරමුණේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළා. ඉන් පස්සේ එතුමා 1999දී වමේ පොදු අපේක්ෂකයා හැටියට ජනාධිපතිවරණයට ඉදිරිපත් වෙලා ඡන්ද 344,000ක් ලබා ගත්තා. එතුමා ජනාධිපතිවරණයේ තුන්වැනියා. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් තමන්ගේ විප්ලවීය අදහස් පැත්තකින් තියලා, බිඳ වැටුණු පක්ෂයක් ගොඩනගලා, ඉන් පස්සේ එතුමා මතවාදමය වශයෙන් වෙනස් වෙලා, පළමුව තමන්ගේම පක්ෂයේ කොටසක් සමඟ වෙන් වුණා.

එතුමා මට මුණ ගැහෙන්නේ 2014දී, රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් එක්ක, ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් කටයුතු කළ කිහිපදෙනෙක් සමඟ අලුත් දේශපාලන ගමනක්, අලුත් ප්‍රතිපත්තියක්, අලුත් වැඩ පිළිවෙළක් ගැන සාකච්ඡා කරන මොහොතේ. 2015දී එතුමාට පුළුවන්කම ලැබුණා, අපත් සමඟ එකතු වෙලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපතිවරයා බවට පත් කරන සටනට විශාල ශක්තියක් වෙන්න. කළුතර දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, ලංකාව පුරාම එතුමාගේ සහයෝගයත්, එතුමාගේ කණ්ඩායමේ සහයෝගයත් ඒ සඳහා ලැබුණා. එතුමා පසුව එක්සත් ජාතික පක්ෂයෙන් තරග කරලා, දෙවැනි වතාවටත් පානදුර නගර සභාවේ සභාපති ධුරයට පත් වුණා. මම එතුමා එක්ක කිට්ටුවෙන් ඇසුරු කළා ඒ කාලයේ. මට වගකීමෙන් කියන්න පුළුවන්, එතුමා සෘජු, ඒ වාගේම සියයට 100ක් මූල්‍යමය දූෂණවලින් තොර පුද්ගලයෙක් බව. එතුමා දූෂණ කළේත් නැහැ, වෙන අයට දූෂණයේ යෙදෙන්න දුන්නේත් නැහැ. පානදුර නගර සභාවේ සභාපතිවරයා හැටියට එතුමා දෙවරක් පත් වුණා. පානදුරේ ජනතාවටත්, පොදුවේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙනුත් එතුමා කරපු සේවය විශාලයි. නමුත් කනගාටුදායක විධියට, අපි බලාපොරොත්තු නොවූ විධියට එතුමා අප අතරින් වියෝ වුණා. එතුමාගේ අභාවය සම්බන්ධයෙන් මම මේ මොහොතේ සමඟි ජන බලවේගය වෙනුවෙනුත්, සමඟි ජන බලවේගයේ කළුතර දිස්ත්‍රික්කයේ නායකයා හැටියට පෞද්ගලිකවත් ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

එතුමා මා වෙනුවෙනුත් කැප වෙලා මගේ දේශපාලන ජීවිතයේදී මටත් සහාය ලබා දීපු කෙනෙක්. ඒ කෘතඥතාව මම එතුමා කෙරෙහි පළ කරන්න අවශ්‍යයි. හොඳම මිනිස්සුත් තමන්ගේ කර්මය අනුව නියමිත වෙලාවට මෙලොවින් සමු ගත යුතු වෙනවා. නන්දන ගුණතිලක මැතිතුමා විප්ලවීය දේශපාලනයෙන් පටන් අරගෙන, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් කැප වෙලා, අභියෝගාත්මක දේශපාලනයක් කරලා, ආදර්ශවත්, දූෂණයෙන් තොර ජීවිතයක් ගත කරලා, එතුමා විශ්වාස කරන ප්‍රතිපත්තිය දරමින්ම අප අතරින් වෙන් වුණා. මම එතුමාට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ සභාවේදී බොහොම ගැඹුරට සාකච්ඡා වුණා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ ප්‍රශ්නය. සමඟි ජන බලවේගය වශයෙන් අපත් මේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු විය යුතු බව පිළිගන්නවා. ඒ පිළිබඳ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් වුණු පළමු දිනයේදීම අපි ප්‍රසිද්ධියේ ඒ පිළිබඳව ප්‍රකාශ කරලා, අපේ සහයෝගය පළ කළා. ඒ වාගේම ඒ පිළිබඳව හදිසියේ විවාදයක් මේ පාර්ලිමේන්තුවේ පැවැත්වුණු අවස්ථාවේදී අපි ඉල්ලා සිටියා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල දිග පළල -විස්තර-සහිත ධවල පත්‍රිකාවක් - White Paper එකක් - ඉදිරිපත් කරන්න කියලා. ඒ වෙලාවේ, ධවල පත්‍රිකාවක් කියන්නේ මොකක්ද කියන එක ගැන කිසිම හැඟීමක් නැති සභානායකවරයා ගරු විපක්ෂ නායකතුමාව විවේචනය කළා; විහිළුවට ගත්තා. අදටත් එතුමා ධවල පත්‍රිකාවක් පිළිබඳ කාරණය අවබෝධ කරගෙන නැහැයි කියලා ඊයේ රාත්‍රියේදී රූපවාහිනී නාළිකාවක පැවැති විවාදයකදී අපට පෙනී ගියා. ඒ කියන්නේ ධවල පත්‍රිකාවක වැදගත්කම, ඒ සමස්ත තොරතුරු සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කිරීම පිළිබඳව අදත් විශ්වාසයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල තිබෙන අඩුපාඩු හදාගෙන අපි ඉදිරියට යා යුතුයි. මේ කරන්නේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නිසි ලෙස සලකා බැලීමෙන් තොරව, සමස්ත ප්‍රතිසංස්කරණ ගැන නොසොයා හුදු විෂය මාලා ප්‍රතිසංස්කරණයක් පමණයි. මොකද, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කිව්වාම ආයතනික ප්‍රතිසංස්කරණ වෙන්න ඕනෑ; ඇගයීමේ ප්‍රතිසංස්කරණ කෙරෙන්න ඕනෑ; ගුරු පුහුණුව ප්‍රතිසංස්කරණය වෙන්න ඕනෑ; ඒ වාගේම විෂය මාලාව ප්‍රතිසංස්කරණය වෙන්න ඕනෑ.

නමුත්, අද මේ සිදු කරන්න උත්සාහ කරන්නේ, 1 සහ 6 ශ්‍රේණිවල විෂය මාලා ප්‍රතිසංස්කරණය පමණයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් 1 ශ්‍රේණියේ ප්‍රතිසංස්කරණ ඉදිරියට යනවා වුණත් 6 ශ්‍රේණියේ එක නතර කරනවා කියන එක ගැන ආණ්ඩුව පැත්තෙන් ලොකු විවේචනයක් තිබෙන්නේ, හරියට විපක්ෂය ඒක කළා වාගෙයි. කල් තියා මේ විස්තර දෙන්න, ධවල පත්‍රිකාව ඉදිරිපත් කරන්න, මෙය පුළුල් සංවාදයකට භාජන කරන්න කිව්වාම ඒ කරුණු සභාව ගෙන PowerPoint presentation එකක් විතරක් කරලා, "මේක තමයි ප්‍රතිසංස්කරණ" කියලා විහිළු කරලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අද මේ තත්ත්වයට පත් කිරීම ගැන රජය වග කිව යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇයි එය කල් ගියේ? ජනවාරි මාසයේ 13වන දා අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා 6වන ශ්‍රේණියේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නතර කරමින් ප්‍රකාශයක් නිකුත් කළා. එතුමා කිව්වේ මොකක්ද? මොඩියුල සකස් කිරීමේ ප්‍රමාදය, ගුරුවරුන් පුහුණු කිරීමේ ගැටලු සහ තාක්ෂණික ගැටලු කියන කාරණා තුන මුල් කරගෙන තමයි 6 ශ්‍රේණියේ ප්‍රතිසංස්කරණය වූ විෂය මාලාව උගන්වන්නේ නැතුව තව අවුරුද්දකින් පස්සට දමන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොඩියුල සකස් කිරීමේ දෝෂයට වග කියන්න ඕනෑ විපක්ෂයද? ගුරුවරුන් පුහුණු කිරීමේ ප්‍රමාදයට වග කියන්න ඕනෑ විපක්ෂයද? පාසල්වලට අවශ්‍ය කරන තාක්ෂණික උපාංග නිසි ලෙස, නියම වෙලාවට, ප්‍රමාණාත්මකව සපයා ගැනීමට නොහැකි වීම ගැන වග කියන්න ඕනෑ විපක්ෂයද? ඒවාට වග කියන්න ඕනෑ ආණ්ඩුව. ඒවාට වග කියන්න ඕනෑ අධ්‍යාපන ඇමතිතුමිය. ඒවාට වග

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

කියන්න ඕනෑ විධායකයේ ප්‍රධානියා වන ජනාධිපති. අවසානයේ ගරු ජනාධිපතිතුමා හැමෝටම එන්න කියලා, ඒක නතර කළා. ඒක නතර කළ යුතුව තිබුණාද, තව මාස කිහිපයකට කල් දමලා ඒක කරන්න තිබුණාද කියන ඒ උපාය මාර්ගය ආණ්ඩුවේ තේරීමක්. 6වන ශ්‍රේණියේ සිසුන්ට මෙම අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල වාසිය ලැබීම වසරකින් කල් යන්නේ විපක්ෂය නිසා නොවෙයි, මොඩියුල සකස් කිරීමේ ප්‍රමාදය, ගුරු පුහුණුව නිසි ලෙස ලබා දීමට නොහැකි වීම හා තාක්ෂණික ගැටලු කියන කාරණා තුන මත අනුර කුමාර දිසානායක මැතිතුමා ගත්තු තීරණය නිසායි.

දැන් උද්ඝෝෂණ සිදු කරනවා. ඔවුන් කවුද කියලා බැලුවාම, ඒ සමහර අය ජනතා විමුක්ති පෙරමුණේ හිතවාදින් බව අපට පෙනෙනවා. සිදු වන්නට ගිය ඒ වෙනස නොවීම ගැන අපටත් අවංකව කනගාටුවක් තිබෙනවා. මොකද, සමහර ළමයින්ට ඒ පෙළ පොත් ලැබිලා. ගොඩක් ළමයි බලාපොරොත්තු වුණා, දෙමව්පියන් බලාපොරොත්තු වුණා එම වෙනස ජනවාරි මාසයේම වෙයි කියලා. ඒ වෙනස කළ යුතු බව දැන දැන, ඒ වෙනස ඇහැට පෙනි පෙනී එය අන්තිම මොහොතේ අවුරුද්දකින් කල් දමපු නිසා දරුවන්ට හා දෙමව්පියන්ට අවංකව කනගාටුවක් තිබෙනවා. අපටත් ඒ ගැන කනගාටුව තිබෙනවා. දැන් ඒ ප්‍රමාදය පිළිබඳව වග කියන්න ඕනෑ කවුද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඇයි පොල් ගැහුවේ?

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
පොල් ගහපු නිසාද නතර කළේ? මන්ත්‍රීතුමා, පොල් ගහපු නිසාද නතර කළේ? මොන ලජ්ජා නැති ආණ්ඩුවක්ද මේක? අනුර කුමාර දිසානායක පොල් ගහනවාට භයද? *[බාධා කිරීම්]* එහෙම නම්, පොල් ගහනවාට භය වෙලා තමයි, මේ වටිනා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ නතර කළේ. අඩුපාඩු හදාගෙන යන්නේ නැතුව ඒක නතර කළේ පොල් ගහනවාට භයේද? *[බාධා කිරීම්]* බොහොම හොඳයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතකොට ගුරු පුහුණුව දෙන්න බැරි වුණේ, ගුරු පුහුණුව කර ගන්න බැරි වුණේ, පොල් ගහපු නිසාද? තාක්ෂණික ආම්පන්න නිසි වෙලාවට දෙන්න බැරි වුණේ, පොල් ගහපු නිසාද? මොනවාද මන්ත්‍රීතුමා ඔය කථා? වෙලාවට වැඩ කර ගන්න බැරි වීම ගැන, වෙලාවට syllabuses හදා ගන්න බැරි වීම ගැන, වෙලාවට පොත් ටික අච්චු ගහ ගන්න බැරි වීම ගැන ලජ්ජා වෙන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසන්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මේ කාරණයත් කියලා කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මාස 3ටයි පොත් ටික අච්චු ගහලා තිබෙන්නේ. ඊළඟ මාස 9ට අවශ්‍ය පොත් ටික අච්චු ගහලා නැහැ. මාස 3ටයි විෂය මාලා ප්‍රතිසංස්කරණය කරලා තිබෙන්නේ. *[බාධා කිරීම්]* පළමු මාස 3ටවත් තාක්ෂණික උපාංග නැහැ. එම නිසා කරුණාකර වගකීම භාර ගන්න. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා ඒක නතර කළේ ඔයගොල්ලන්ගේ ආණ්ඩුවේ අඩුපාඩු නිසා මිස අපේ විරෝධතා නිසා නොවෙයි. එම නිසා කරුණාකර වරද පිළිගන්න; වරද හදා ගන්න. එය ඉක්මනින් නිවැරදි කරලා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉතාම ඉක්මනින් මේ රටේ ක්‍රියාත්මක කරන්න. ඒක තමයි අපේ වගකීම. ඒක තමයි අපේ යුතුකම. ඒක තමයි ආණ්ඩුවේ වගකීම.

ස්තූතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කේ. ඉලංකුමාරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.05]

**ගරු කේ. ඉලංකුමාරන් මහතා**
(மாண்புமிகு கே. இளங்குமரன்)
(The Hon. K. Ilankumaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நலன்புரி அனுகூலங்கள் சட்டத்தின்கீழ், அஸ்வெசும நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டம் பற்றிய இன்றைய விவாதத்தில் பேசுவதில் நான் பெரு மகிழ்ச்சியடைகின்றேன். 2002ஆம் ஆண்டின் 24ஆம் இலக்க நலன்புரி அனுகூலங்கள் சட்டத்தின்கீழ், சமூகப் பாதுகாப்பு வலுவூட்டல் ஊடாக இந்தத் திட்டம் அறிமுகப்படுத்தப்பட்டிருந்தாலும், 2023ஆம் ஆண்டு யூலை மாதம் 1ஆம் திகதி நடைமுறைப்படுத்தப்பட்ட அஸ்வெசும திட்டமானது, எமது அரசாங்கம் பதவியேற்றதோடு இடைநிறுத்தப்படும் காலம் நெருக்கிய போதும், இந்த நாட்டின் பொருளாதார நிலைமைகளைக் கருத்திற்கொண்டு, இதனை எமது அரசாங்கமானது திரும்பவும் 2025ஆம் ஆண்டு மார்ச் மாதம் வரை அதன் காலத்தை நீடித்தது. அதேநேரம், அஸ்வெசும பெறுகின்ற அங்கத்தவர்களின் எண்ணிக்கையையும் அதிகரித்தது. இந்த நாட்டின் பொருளாதார நிலைமைகளுக்கு ஏற்ற வகையில் அஸ்வெசும பெறுகின்ற ஏழைக் குடும்பங்களின் 960,000 பேருக்கு 10,000 ரூபாய் கொடுப்பனவை நாங்கள் வழங்குகின்றோம். அதேநேரம், எமது அரசாங்கம் 480,000 வரையான மிகவும் வறிய குடும்பங்களுக்கு அந்தக் கொடுப்பனவுத் தொகையை அதிகரித்து 17,500 ரூபாயை வழங்குகின்றது என்பதையும் இந்த இடத்தில் கூறிக்கொள்கின்றேன். அதைவிட, வறுமைக்கோட்டுக்குக் கீழிருக்கும் அல்லது நலிவுற்றிருக்கும் குடும்பங்களுக்கு நாங்கள் 5,000 ரூபாய் கொடுப்பனவை வழங்குகின்றோம்.

எமது நாட்டில் இருந்து வறுமையை முற்றுமுழுதாக ஒழிக்க வேண்டும் என்பது இந்த அரசாங்கத்தின் இலக்காகும். அதனால்தான் நாங்கள் இந்தக் கொடுப்பனவுகளை வழங்குகின்றோம். இந்த நாடு பொருளாதார வங்குரோத்து

நிலையில் இருந்தும்கூட, மக்களை வறுமை நிலையில் இருந்து மீட்டெடுப்பதற்காக இந்தக் கொடுப்பனவுகளை நாங்கள் கொடுக்கின்றோம். அந்த வகையில், எமது அரசாங்கம் உண்மையாகவே வறுமை நிலையில் உள்ளவர்களுக்கும் அங்கவீனமுற்றவர்களுக்கும் சிறுநீரக நோயால் பாதிக்கப்பட்டவர்களுக்கும் முதியவர்களுக்கும் இந்தக் கொடுப்பனவை வழங்குகின்றது. அங்கவீனமுற்றவர்களுக்கும் சிறுநீரக நோயாளர்களுக்கும் உதவித் தொகையாக 10,000 ரூபாயையும், முதியோர் உதவித் தொகையாக 5,000 ரூபாயையும் அஸ்வெசும கொடுப்பனவினூடாக நாங்கள் வழங்கி வருகின்றோம். எமது அரசாங்கத்தைப் பொறுத்த வரைக்கும், இந்த நாட்டிலிருந்து முற்றுமுழுதாக வறுமையை ஒழிப்பதற்காக முயற்சி செய்துகொண்டிருக்கின்றது.

இன்று நாடு படிப்படியாக எல்லாத் துறைகளிலும் முன்னேற்றமடைந்துகொண்டு வருகின்றது. எம்மை விமர்சிக்க வேண்டுமென்பதற்காக, எதிர்க்கட்சியில் இருப்பவர்கள் எம்மைப் பற்றிய விமர்சனங்களை மக்கள் மத்தியில் கொண்டு செல்கின்றார்கள். அவர்களுக்கு விமர்சிப்பதற்கு ஏதும் இல்லை. ஏதாவது ஒரு சிறிய விஷயத்தைப் பெரிதுபடுத்தி அதனை விமர்சிப்பதனூடாகத் தாங்கள் ஏதோ சாதித்ததுபோல் நினைக்கின்றார்கள். எம்மைப் பொறுத்தவரைக்கும், விமர்சனங்களுக்கு எந்த வகையிலும் நாம் அஞ்சப்போவது இல்லை! ஏனென்றால், எமது அரசாங்கத்தில் மக்களது பொருளாதாரம் படிப்படியாக உயர்ந்து வருகின்றது என்பதை அவர்கள் நன்றாக உணர்ந்திருக்கிறார்கள்.

அபிவிருத்தியுடன் கூடிய தனிநபர் வாழ்க்கையை முன்னேற்றுவதற்காக எமது அரசாங்கம் பயணத்தை மேற்கொள்கின்றது. கொடுப்பனவு பெறுபவர்களில் பாதிப்புக்குள்ளாகக்கூடிய நிலையில் இருப்பவர்களின் அஸ்வெசும பெறுகின்ற காலத்தை 2026ஆம் ஆண்டு யூன் மாதம் வரை நாங்கள் நீடித்திருக்கின்றோம். அதேநேரம், ஏழை மற்றும் வறுமை நிலையில் இருப்பவர்களுக்கு இந்தக் கொடுப்பனவுகளை 2027ஆம் ஆண்டிலும் வழங்க இருக்கின்றோம். தம் கையால் குத்துக்கரணம் அடிக்க வேண்டும், தாங்கள் உழைத்து முன்னேற வேண்டும் என்ற எண்ணம் இந்த நாட்டிலுள்ள எல்லோரிடத்திலும் இருக்கின்றது. 76 ஆண்டுகளாக மாறி மாறி ஆட்சிக்கு வந்த கடந்த அரசாங்கங்களால் அதற்கான கட்டமைப்புகள் உருவாக்கப்படவில்லை. இப்போது படிப்படியாக எமது அரசாங்கம் அதற்கான நடவடிக்கைகளை மேற்கொண்டு வருவதால், தனிநபர் வாழ்க்கையில் முன்னேற்றம் ஏற்பட்டு இந்த அஸ்வெசும கொடுப்பனவில் இருந்துகூட மக்கள் தாங்களாகவே விடுபட நினைப்பார்கள். ஏனென்றால், எல்லோருக்கும் இவ்வாறு கொடுப்பனவுகளைப் பெறுவதைவிட தாங்கள் உழைத்துச் சாப்பிட வேண்டும் என்ற எண்ணக்கரு இருக்கிறது. அந்த வகையில், பொருளாதாரம் முன்னேறும் மட்டும் இவ்வாறான கொடுப்பனவுகளை வழங்குகின்றோம்.

அஸ்வெசும திட்டத்தினூடாக யாழ். மாவட்டத்தில் 14,189 மாணவர்களுக்கு 6,000 ரூபாய் கொடுத்திருக்கிறோம். ஏன், அந்த மாணவர்களுக்கு 6,000 ரூபாய் கொடுத்திருக்கின்றோம் என்றால், பெற்றோரின் சுமைகளைக் குறைக்க வேண்டும் என்பதற்காக. பெற்றோரின் சுமை குறையும்போது, பாடசாலை மாணவர்கள் இலகுவாகக் கல்வி கற்பார்கள். அதன்மூலம் எதிர்கால சந்ததியினருக்கு சிறந்த முறையில் தங்களது பொருளாதாரத்தை மேம்படுத்திக் கொள்ளக்கூடியதாக இருக்கும். அதைவிட, வறுமைக்கோட்டுக்குக் கீழிருக்கின்ற பாடசாலைப் பிள்ளைகளுக்கு சாப்பாத்து வாங்குவதற்காக 3,000 ரூபாய் பெறுமதியான கூப்பனைக் கொடுக்கின்றோம். இந்த நாட்டில் வறுமையை உருவாக்கியவர்கள்தான் எதிர்க்கட்சியில் இருப்பவர்கள். இந்த நாடு செழிப்பான நாடாக இருந்தது. ஒரு காலத்தில் இலங்கையைப் பார்த்து சிங்கப்பூர் வளர்ந்தது. ஆனால், இன்று நாங்கள் பின்தள்ளப்பட்டு இருக்கிறோம். இந்த நாட்டை வங்குரோத்தடையச் செய்தவர்கள் எதிர்க்கட்சியில் இருப்பவர்கள். இந்த நாட்டை வங்குரோத்தடையச் செய்தவர்கள் யார் என உச்ச நீதிமன்றமே வெளிப்படுத்தி இருக்கின்றது. இந்த ஆண்டு அரச துறைகள் அனைத்தும் இலாபத்தை நோக்கி முன்னோக்கி நகர்ந்திருக்கின்றது. எமது நாட்டை எப்படி வளமான நாடாக உருவாக்கலாம் என்பது எமக்குத் தெரியும்.

இலங்கை மலை வளம், கடல் வளம் என அனைத்து வளங்களும் நிறைந்த நாடாகும். அதற்கான பயணத்தைத்தான் தேசிய மக்கள் சக்தி இன்று மேற்கொண்டு இருக்கின்றது. நாங்கள் ஒன்றைக் கூறுகின்றோம். எங்களுடைய செயற்பாடுகளால் ஒரு நாளிலே இந்த நாடு முன்னேறி விடும் என்று ஒருசிலர் நினைக்கின்றார்கள். நாங்கள் பயணத்தை மேற்கொள்ளும்போது மக்களுக்குப் படிப்படியாக நம்பிக்கை வருகின்றது. அந்த நம்பிக்கையின் பலத்தினூடாக மக்கள் அரசாங்கத்தின்பால் அணி திரள்வது தவிர்க்க முடியாததாகும். தங்களது தனிப்பட்ட வாழ்க்கையில் முன்னேற்றத்தைக் கொண்டுவர வேண்டும் என்பதற்காகத்தான் அனைத்து மக்களும் எங்களுக்கு வாக்களித்தார்கள். வீதிகள் அமைக்கப்படத்தான் வேண்டும்! தொழிற்சாலைகள் உருவாகத்தான் வேண்டும்! ஆனால், முன்னைய காலங்களில் பக்கச்சார்பான அபிவிருத்திகள்தான் நடந்தன. அந்த ஆட்சியாளர்கள் வட மாகாணத்தைப் புறக்கணித்திருந்தார்கள். அங்கே சிறந்த தொழிற்சாலைகளை அமைக்கவில்லை; அங்கு வேலைவாய்ப்புகள் உருவாக்கப்படவில்லை. அங்கு பெரும்பாலானவர்கள் கூலித் தொழிலாளிகளாகவும் முறைசார்ந்த, முறைசாரா தொழில்களிலும் ஈடுபட்டு வருகிறார்கள். பரந்தன் இரசாயனத் தொழிற்சாலையை மீள ஆரம்பிப்பதற்காக 21ஆம் திகதியான நாளைய தினம் அடிக்கல் நாட்ட இருக்கின்றோம். அந்த வகையில், எமது அரசாங்கம் வட மாகாணம் தொடர்பில் அதிக கரிசனை கொண்டிருக்கின்றது.

மாண்புமிகு ஜனாதிபதி அவர்கள் வட மாகாணத்துக்குச் சென்றபோது, அங்குள்ள நிலைமையை உணர்ந்துகொண்டார். மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் பலர் கூறியிருக்கிறார்கள், அங்கே தொழிற்சாலைகளை உருவாக்க வேண்டும் என்று. முன்னைய அரசாங்கம் வட மாகாணத்தை ஒரு வகையான கண்ணோட்டத்தில்தான் பார்த்தது. ஆனால், தற்போதைய அரசாங்கம் எல்லா மக்களையும் ஒரே கண்ணோட்டத்திலே பார்க்கின்றது. அதனால்தான் மாண்புமிகு ஜனாதிபதி அவர்களுக்கு வட மாகாணத்தில் அதிகளவான ஆதரவு கிடைத்திருந்தது. இன்று மக்கள் உண்மையை உணர்ந்திருக்கிறார்கள். ஜனாதிபதி அவர்களை மக்கள்தான் பாதுகாக்கிறார்கள். இலங்கை என்பது தமிழ், சிங்களம், முஸ்லிம் என அனைவருக்குமான நாடு என்பதை அனைத்து மக்களும் உணர்ந்திருக்கின்றார்கள். எமது நாடு படிப்படியாக முன்னேறி சிறந்த நிலைக்கு வந்துகொண்டிருக்கின்றது.

வட மாகாணம் யுத்தத்தால் பாதிக்கப்பட்ட மாகாணமாகும். முன்னைய அரசாங்கங்கள் அந்த மாகாணத்தைக் கண்டு கொள்ளவில்லை. ஆனால், எமது அரசாங்கம் வட மாகாணத்துக்குக் கூடுதலான நிதியை ஒதுக்கி, அதிகளவான தொழிற்சாலைகளை உருவாக்கி, அந்தப் பகுதி மக்களையும்

[ගරු කේ. ඉලංකුමාරන් මහතා]

ஏனைய பிரதேச மக்களைப்போல் கண்காணித்து, பொருளாதார அபிவிருத்தியை மேற்கொள்கிறது. தொழிற்சாலைகள் உருவாகும்போது, அங்கே வறுமை குறையும். அதனால் எதிர்காலத்தில் அரசாங்கத்துக்கு சுமை குறையும். யாரிடமும் கையேந்த அவர்கள் விரும்பவில்லை. எங்களது பயணத்தை ஏழை மக்களிலிருந்து ஆரம்பிக்கிறோம். ஏழைகளைச் செல்வந்தர்களாக மாற்றுவதே எமது அரசாங்கத்தின் பொறுப்பாகும். அந்த வகையில், இப்போது உங்களால் உருவாக்கப்பட்ட வறிய மக்களுக்காக நாங்கள் அஸ்வெசும நலன்புரிக் கொடுப்பனவை நீடித்திருக்கிறோம். அதற்கான காலத்தையும் நீடித்திருக்கின்றோம். எதிர்வரும் காலத்தில் எமது பிரதேசத்திலிருந்து வறுமை நீங்குமெனக் கூறி விடை பெறுகிறேன். நன்றி. வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු එම්.ඒ.එම්. තාහීර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Co-operative Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සංජීව රණසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන් ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SANJEEWA RANASINGHA left the Chair, and THE HON. IMRAN MAHAROOF took the Chair.*

[பி.ப. 3.14]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இடம்பெறும் நலன்புரி அனுகூலங்கள் சட்டத்தின்கீழான அஸ்வெசும நலன்புரி நன்மைகள் கொடுப்பனவுத் திட்டம் தொடர்பான விவாதத்திலே சில விடயங்களை முன்வைக்கலாமென நினைக்கின்றேன். இது புதிதாகக் கொண்டுவரப்பட்ட ஒரு விடயமல்ல. ஒவ்வொரு காலப்பகுதியிலும் ஆட்சிக்கு வருகின்ற அரசாங்கங்கள் மக்களைத் தம்வசம் ஈர்ப்பதற்காக ஒரு கொடுப்பனவை வழங்கிவிட்டு, அடுத்து வரும் தேர்தலில் தங்களது பெயரை - நாமத்தை - பதித்துக்கொள்கின்ற ஒரு விடயமாகவே நாங்கள் இதைப் பார்க்கின்றோம். அந்த அடிப்படையில், கடந்த காலத்தில் பொருளாதாரம் இறுக்கமாக இருந்த ஒரு சூழலிலே இந்த அஸ்வெசும நலன்புரித் திட்டம் அமுல்படுத்தப்பட்டது.

பயனாளிகள் 22 தரவுகளின் அடிப்படையில் கணினி முறையில் இதில் உள்ளீர்ப்புச் செய்யப்பட்டுள்ளதை நாங்கள் பார்த்தோம். அந்தப் பிரதேசத்தில் இருக்கின்ற பிரதேச செயலாளர், அபிவிருத்தி உத்தியோகத்தர், கிராம உத்தியோகத்தர்கள் அல்லது சமுர்த்தி உத்தியோகத்தர்கள் மூலமாக அவர்கள் தெரிவு செய்யப்படவில்லை. அதற்கான ஒரு திட்ட வரைவின் மூலமே உள்வாங்கப்பட்டார்கள். கட்டாயமாக உள்வாங்கப்பட வேண்டிய நிலையில் இருக்கக்கூடியவர்களில் 35 சதவீதமானவர்கள் இன்று இந்தத் திட்டத்தில் உள்வாங்கப்படாமல் இருக்கின்றார்கள். புதிதாக ஆட்சிக்கு வந்த இந்த அரசாங்கமும் அந்த நடைமுறைகளில் மாற்றங்களைச் செய்வோம் என்று கூறியபோதிலும், அப்படியாக உள்வாங்கப்படவேண்டிய யாருமே உள்வாங்கப்படாத ஒரு சூழ்நிலையே காணப்படுகின்றது.

தற்போது நாட்டில் பொருட்களின் விலை அதிகரிப்பு மாத்திரமல்லாமல், மின்சாரக் கட்டணம், நீர்க் கட்டணம் மற்றும் ஏனைய அத்தியாவசியமான உணவுப் பொருட்களின் விலையும் அதிகரித்துக் காணப்படுகின்றன. இந்நிலையில், வறுமைக்கோட்டின் கீழ் வாழ்கின்ற மக்களின் வாழ்க்கைத் தரத்தை உயர்த்த வேண்டுமாக இருந்தால், இவற்றைக் குறைக்க வேண்டும். இன்று 500 கிராம் மீனையோ, இறைச்சியையோ வாங்குவதாக இருந்தால் 1,500 ரூபாய் தேவைப்படுகின்றது. நீங்கள் கொடுக்கின்ற 5,000 ரூபாய், 7,500 ரூபாய் அல்லது 15,000 ரூபாயில் ஐந்து அல்லது ஆறு உறுப்பினர்களைக் கொண்ட ஒரு குடும்பம் எவ்வாறு உண்ண முடியும்? அவர்களது வாழ்க்கைச் செலவை எவ்வாறு கொண்டுசெல்ல முடியும்? என்பதை இந்த அரசாங்கம் கவனத்தில் கொள்ளாமல், "பழைய குருடி கதவைத் திறடி" என்று எமது முன்னோர்கள் சொல்வதைப் போன்று, முன்னைய ஆட்சியாளர்களைப் பின்பற்றியே நீங்களும் உங்களுடைய செயற்பாடுகளை முன்னெடுக்கின்றீர்கள் என்பது மிகவும் வருத்தத்துக்குரிய விடயமாக இருக்கின்றது. நாங்கள் எதிர்பார்ப்பது, அத்தியாவசியப் பொருட்களின் விலைகளைக் குறைக்க வேண்டும் என்பதைத்தான். மின்சாரம், நீர், எரிபொருள் கட்டணங்களைக் குறைக்கும்போது மக்கள் ஓரளவேனும் இதிலிருந்து மீட்சி பெற முடியும்.

சாதாரண மக்கள் தனி நபர்களிடம் அல்லது வங்கிகளில் தங்களது சொத்துக்களை அடகு வைத்து எட்டு இலட்சம் - பத்து இலட்சம் ரூபாயைப் பெற்று கடனாளியாக வெளிநாடுகளுக்குச் செல்லும்போது, அந்தக் குடும்பத்தைச் சேர்ந்தவர்களுக்கு அஸ்வெசும நலன்புரித் திட்டத்தினூடான கொடுப்பனவு உட்பட எந்தவொரு கொடுப்பனவும் கிடைக்காத நிலையில் அரசாங்கமானது அவர்களிடமிருந்து கட்டணங்களைப் பிடுங்கி எடுக்கின்றது. இவ்வாறு குடும்ப வறுமை காரணமாக, முதியோர்களின் வைத்தியச் செலவுக்காக, பிள்ளைகளுடைய கல்விச் செலவுக்காக தன்னுடைய வாழ்க்கையை இழந்து, வெளிநாடுகளில் கஷ்டப்பட்டுத் தொழில் செய்கின்ற நபர்களுக்கும் நன்மையில்லை, அவர்களின் குடும்பத்துக்கும் எதுவுமில்லை என்ற அளவிலே இந்த வறுமை ஒழிப்புத் திட்டம்

இருக்கின்றது. இதற்கான மாற்றுத் திட்டத்தைக் கொண்டுவாருங்கள்! இந்த நாட்டில் எத்தனையோ வளங்கள் இருக்கின்றன. அதனூடாகத் தொழில்வாய்ப்புகளைக் கொடுங்கள்! அதற்கான திட்டங்களை முன்னெடுங்கள்! காலாகாலமாகச் செய்கை பண்ணப்பட்டு வந்த நிலங்கள் ஒவ்வோர் அரசினது வேலைத்திட்டத்தின் கீழும் பறிமுதல் செய்யப்பட்டு இருக்கின்றன. அதுவும் இனரீதியாக மேற்கொள்ளப்பட்டு இருக்கின்றன. குறிப்பாக, வட, கிழக்கில் இருக்கின்ற முஸ்லிம், தமிழ் மக்களுடைய காணிகள் பறிமுதல் செய்யப்பட்டு இருக்கின்றன. அவற்றை அவர்களுக்கு மீளவும் செய்கை பண்ணுவதற்கு வழங்குமாறு இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக் கொள்கின்றேன்.

இந்தத் திட்டத்தில் விவசாயிகள், மீனவர்கள் போன்றவர்களும் புறக்கணிக்கப்பட்டு இருக்கிறார்கள். அவர்கள் ஏதோவோர் அடிப்படையில் வள்ளம் ஒன்றை, three-wheeler ஒன்றை, motorcycle ஒன்றை வைத்திருந்தால்கூட, இந்தத் திட்டத்தினூடான கொடுப்பனவு கிடைப்பதில்லை. அதேபோல், நகரப் புறங்களில் காணிகளுடைய விலை கூடுதலாக இருப்பதால், இரண்டு மாடி வீடுகளைக் கட்டுவதற்காக concrete slabs போடப்பட்ட வீடுகளில் இருப்பவர்களுக்கும் அஸ்வெசும திட்டத்தினூடான கொடுப்பனவு கிடைப்பதில்லை. எனவே, இவ்வாறானவர் களையும் இந்தத் திட்டத்துக்குள் உள்வாங்கி, கொடுப்பனவு களை வழங்குமாறு கேட்டுக் கொள்கின்றேன்.

நீங்கள் வழங்குகின்ற இந்தக் கொடுப்பனவை நாங்கள் வேறுவிதமாகவும் சிந்திக்க முடிகின்றது. அதாவது, நீங்கள் இந்தக் கொடுப்பனவை நிதியாக வழங்கும்போது, அதனை அந்த மக்கள் வெவ்வேறு தேவைகளுக்காகச் செலவு செய்கின்றார்கள். அதனை அவர்கள் ஆடம்பரச் செலவுக்காக அல்லது வேறு தேவைகளுக்காகப் பயன்படுத்துகிறார்கள் என்றே நாங்கள் நினைக்கின்றோம். ஏனெனில், நாங்கள் எங்களுடைய பிரதேசங்களுக்குச் செல்லும்போது, நீர்க் கட்டணம் கட்டவில்லை, மின் கட்டணம் கட்டவில்லை, பாடசாலைக்குச் செல்கின்ற பிள்ளைகளுக்கான செலவுகளைச் செய்ய முடியவில்லை, மருத்துவச் செலவை மேற்கொள்ள முடியவில்லை என்று கூறி, நிதி உதவி செய்யுமாறு எங்களை நாடி வருகின்றவர்கள் இவ்வாறான திட்டத்துக்குள் உள்வாங்கப்பட்டு இருப்பதை நாங்கள் பார்க்கின்றோம்.

நீங்கள் வழங்குகின்ற நிதி எங்கே செல்கின்றதென நாங்கள் யோசிக்கின்றோம். இன்று நீங்கள் சப்பாத்து வாங்குவதற்காக வழங்குகின்ற 3,000 ரூபாய் voucherஐக் கொடுத்து, வேறு பொருட்களை வாங்குகின்றார்கள். இதனால் அந்தப் பிள்ளைகள் வெறுங்கால்களோடு, வேறு பாதணிகளோடு பாடசாலைக்குச் செல்கின்ற காட்சிகளை நாங்கள் பார்க்கின்றோம். ஏன் இந்த நிதியை நேரடியாக வழங்காமல், முன்னர் வழங்கியது போன்று கூட்டுறவு நிலையங்களூடாகப் பொருட்களாக வழங்க முடியாதென நாங்கள் கேட்கின்றோம். கடந்த கால அரசாங்கங்களில் இச்செயற்பாட்டில் ஊழல் நிறைந்து காணப்பட்டதாக நீங்கள் கூறுகின்றீர்கள். நிச்சயமாக நாங்கள் அதை ஏற்றுக் கொள்கின்றோம். இந்த அரசாங்கத்தில் இருப்பவர்கள் சுத்தமானவர்கள், கையில் அழுக்குப் படாதவர்கள், மிகத் திறமையானவர்கள் என்று நீங்கள் கூறுகின்றீர்கள். அப்படியென்றால், ஏன் உங்களுடைய ஆட்களை வைத்து இந்தத் திட்டத்தைச் செய்ய முடியாதென நாங்கள் இந்தச் சந்தர்ப்பத்தில் கேட்கின்றோம்.

இந்த நாட்டில் இலவசக் கல்வியும் இலவச மருத்துவ சேவையும் வழங்கப்படுகின்றது. எனினும், இந்த இரண்டு விடயங்களும் இன்று பேசுபொருளாக மாறியிருக்கின்றன. கிழக்கு மாகாணத்தில் மருத்துவச் சேவையானது இரண்டு - மூன்று நாட்களாக ஸ்தம்பிதம் அடைந்திருக்கின்றது. ஒரு வைத்தியருக்கு எதிராக ஏனைய வைத்தியர்கள் சேர்ந்து செய்த முறைப்பாட்டை இந்த அரசாங்கம் கவனத்திற் கொள்ளவில்லை, அதற்குரிய தீர்வை வழங்கவில்லை என்பது அந்த வைத்தியர்களுடைய கவலை! இலவச வைத்திய சேவையைப் பெறுகின்ற மக்கள் இன்று தனியார் வைத்தியசாலைகளுக்குச் சென்று, பணத்தைச் செலவழித்து சிகிச்சை பெறவேண்டிய துர்ப்பாக்கிய நிலைமைக்கு உள்ளாகி இருக்கிறார்கள். குறிப்பாக, சிறுநீரக நோய் மற்றும் ஏனைய நோய்களால் பாதிக்கப்பட்டவர்கள் அரச வைத்தியசாலையில் சிகிச்சை பெறமுடியாமல் உள்ளது. இந்த நோயாளிகள் தனியார் வைத்தியசாலைகளில் சிகிச்சை பெறுவதாக இருந்தால், பாரியதொகை நிதி தேவைப்படுகின்றது. எனவே, இந்த ஏழை, எளிய மக்களுடைய பிரச்சினைகளைத் தீருங்கள்!

அடுத்து, கல்வித் திட்டத்தில் மாற்றங்களைக் கொண்டுவர வேண்டிய கட்டாயத் தேவை இருக்கின்றது. அதற்கு நாங்கள் முழு ஆதரவு தருகின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கான நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள்!

நிச்சயமாக கல்வித் திட்டத்தில் மாற்றத்தைக் கொண்டுவர வேண்டிய தேவையிருக்கின்றது என்பதை இந்த நாடு முழுமையாக ஏற்றுக்கொள்கின்றது. எனினும், நீங்கள் அதில் சில சில்லறை விளையாட்டுக்களை உட்புகுத்தி இருக்கிறீர்கள். அதனை எல்லா மதங்களும் வெறுக்கின்றன. எல்லா மக்களும் வெறுகின்ற ஒரு விளையாட்டை அதில் உட்புகுத்திவிட்டு, அது பற்றி தங்களுக்குத் தெரியாது என்று கூறுவதை முழுப் பூசணிக்காயை சோற்றில் மறைப்பது போன்றதொரு விடயமாகவே நாங்கள் பார்க்கின்றோம். அதேபோன்று, 323 containersக்கும் என்ன நடந்தது என்பது தெரியாது என்று நீங்கள் கூறுகின்றீர்கள். அதைவிட பராதூரமான ஒரு விடயத்தை - sex தொடர்பான விடயத்தை - புதிய கல்வித் திட்டத்தில் உட்புகுத்திவிட்டு, அதற்கு என்ன நடக்கின்றது என்று பார்ப்பதற்காகத்தானா நீங்கள் அப்படிச் செய்கின்றீர்கள்? என்று மக்கள் கேள்வி கேட்கின்றார்கள். இதனைவிடுத்து, நீங்கள் கல்விச் சீர்திருத்தத்தை இந்த வருடத்திலிருந்து முன்னெடுப்பதற்கான நடவடிக்கைகளை மேற்கொள்ளுமாறு கேட்டு, எனக்கு வாய்ப்பளித்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වසන්ත සමරසිංහ ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 14ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.23]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපි සාකච්ඡා කරන්නේ 2002 අංක 24 දරන සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ වන අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය අනුමත කිරීමයි. මේකෙන් අපි සිද්ධ කරන්නේ පසුගිය දෙසැම්බර් මාසයේ ප්‍රතිලාභ අහිමි වෙන්න තිබුණු ලක්ෂ 5කට ආසන්න ප්‍රතිලාභීන්ට ලබා දෙන ප්‍රතිලාභය තවත් මාස 6ක් දක්වා දීර්ඝ කරලා ලබා දෙන කටයුත්තයි. ඒ ප්‍රතිලාභ ලබා දීම සම්බන්ධයෙන් විවිධ අදහස් සහ යෝජනා ආවා. ඒ ප්‍රතිලාභවල ඉතිහාසය විශාලයි. හැබැයි අද මාතෘකාව බවට පත් වෙලා තිබෙන්නේ; වැඩිපුර කථා කරලා තිබෙන්නේ ප්‍රතිලාභ ගැන කථා නොවෙයි. ප්‍රතිලාභ ගැන කථාව වෙනුවට දැන් අලුත් කථාවක් හදන්නයි යන්නේ.

ජනතාවට ඒ ප්‍රතිලාභ වැඩි කරලා ලබා දීම විතරක් නොවෙයි. රජය මේ අවුරුද්දේ තවත් විශාල ව්‍යාපෘති ගණනාවක් හරහා ඒ ප්‍රතිලාභ ලැබෙන ජනතාවටම තවදුරටත් විශාල ප්‍රතිලාභ ප්‍රමාණයක් ලබා දෙන්න කටයුතු කරමින් සිටිනවා. විශේෂයෙන් දිස්ත්‍රික්ක 25ටම නිවාස 16,000ක් ආධාර හැටියට ලබා දෙන්න අපි මේ අවුරුද්දේ කටයුතු කරනවා. නිවාස 16,000ක් ලබා දීම සඳහා වුණු ආධාර වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒකත් එක්ක ඔක්කෝම ගත්තාම මේ අවුරුද්දේ නිවාස 50,000ක් හදන්න විවිධ අමාත්‍යාංශවලින් වැඩ කරනවා. මේ සහන ලබන ජනතාවට නිවසක් නැත්නම්, ඒ අන්ත දුගී ජනතාවට තමන්ටම නිවස ලබා ගන්න පුළුවන්. විශේෂයෙන් ඒ ආධාර වැඩ පිළිවෙළ යටතේ එක ග්‍රාම නිලධාරි වසමකට අඩුම ගණනේ එක නිවසක් දෙනවා. කොළඹ සහ තදාසන්න ප්‍රදේශවල ඒවා යන්නේ තට්ටු නිවාස ක්‍රමයට. එහෙම ආධාර වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් තිබෙනවා.

අපි මේ සංශෝධනය හරහා සිද්ධ කරන්න හදන ක්‍රියාවලිය මේ සභාවේ හැමෝම දන්නවා. මොකද මේක ලැබිය යුතු ජනතාවක් තවම අපේ රටේ ඉන්නවා. අපි ආපු ගමන් මඟ තුළ ඒ අයගේ ආර්ථිකය ශක්තිමත් කරන්න, ඒ අයගේ ජීවිත මෙතැනින් එහාට ගෙන යන්න දැවැන්ත වැඩ පිළිවෙළක් රටට ඕනෑ. ඒ සඳහා තමයි අපි "ප්‍රජා ශක්ති" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නේ. ඒ වැඩ පිළිවෙළ හරහා ගමේ සංවර්ධන කටයුතුවලට හැමකෙනාම දායක කර ගනිමින්, ඉලක්ක සහගත සංවර්ධනයකට මේ රට ගෙන යන්න තමයි අපි කටයුතු කරන්නේ.

මීට කලින් කථා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ කටයුතු කරගෙන යද්දී බඩු මිල අඩු කරන්න ඕනෑය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම බඩු මිල ගැන කියන්න ඕනෑ. පසුගිය අවුරුද්ද තුළ -2024 දෙසැම්බර් මාසයේ ඉඳලා 2025 දෙසැම්බර් මාසය වෙනකම්- අපි මේ රටේ භාණ්ඩ මිල පාලනය සඳහා ගත්ත ක්‍රියාමාර්ග සහ ඒ වෙනුවෙන් කළ රජයේ මැදිහත්වීම ඇතුළේ භාණ්ඩ වර්ග ගණනාවක මිල පහළට ගෙනැල්ලා තිබෙනවා. ඒක ජනතාවට ලැබෙනවා. උදාහරණ ලෙස ගත්තොත්, සුදු ලූනු රුපියල් 660ට තිබුණේ, දැන් රුපියල් 450යි, සියයට 32කින් මිල අඩු වෙලා. සෝයා මීට් තිබුණේ රුපියල් 550ට, දැන් රුපියල් 350යි. ඒවාත් සියයට 36කින් අඩු වෙලා තිබෙනවා. හාල්මැස්සෝ තිබුණේ රුපියල් 960ට, දැන් රුපියල් 830යි. රුපියල් 130කින්, එනම් සියයට 13කින් මිල අඩු වෙලා. රතු සීනි - brown sugar - තිබුණේ රුපියල් 360ට, දැන් රුපියල් 245යි. රුපියල් 95කින් අඩු වෙලා. රතු ලූනු තිබුණේ 460ට. දැන් රුපියල් 300ත්, 360ත් අතර මිලක තිබෙනවා. ඒ කියන්නේ සියයට 18-20 අතර ප්‍රමාණයකින් රතු ලූනු මිල අඩු වෙලා. අල, imported අල සහ ලංකා අල තිබෙනවා. Imported අල රුපියල් 290ට තිබුණේ, දැන් රුපියල් 200 දක්වා මිල අඩු වෙලා තිබෙනවා. අද දවසේ තවත් අඩුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දෙසැම්බර් මාසයේ රුපියල් 220යි, ඊයේ රුපියල් 160යි. ඒ වාගේම ලොකු ලූනු ගිය දෙසැම්බර්වල තිබුණේ රුපියල් 275ට. මේ දෙසැම්බර්වල ලොකු ලූනු මිල රුපියල් 200ටත් අඩු වුණා, ඊයේ වෙනකොට රුපියල් 160යි. මේ ගණන් දිහා බැලුවාම පෙනෙනවා, අප භාණ්ඩ මිල විශාල ලෙස අඩු කර තිබෙන බව. අනික් එක, කිරි පිටි. අපි ඊයේ පෙරේදා කිරි පිටි කිලෝග්‍රෑම් එකක මිල රුපියල් 125කින් අඩු කළා. අප්‍රේල් මාසයේ තවත් මිල අඩු කරනවා, ගරු තාහිර් මන්ත්‍රීතුමනි. අපි පාන් පිටි මිලත් අඩු කෙරුවා. ඒ අනුව, රටේ ජනතාව පාවිච්චි කරන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගණනාවක මිල අපි අඩු කර තිබෙනවා. අපේ රටේ සුදු සහ රතු නාඩුත්, සුදු කැකුළු සහ රතු කැකුළුත් පරිභෝජනය සියයට 85ක් පමණ වනවා. සහල් මිල ගත්තොත්, මුළු අවුරුද්දේම නාඩු සහල් මිල රුපියල් 230ට අඩුවෙන් අපි තබාගත්තා, කැකුළු සහල් මිල රුපියල් 220ට අඩුවෙන් අපි තබාගත්තා. මේ වනකොට අපි සතොස හරහා රුපියල් 220ට නාඩු සහල් විකුණනවා, රුපියල් 210ට අඩුවෙන් කැකුළු සහල් විකුණනවා. අපි රාජ්‍ය යන්ත්‍රණය පාවිච්චි කර භාණ්ඩ මිල අඩු කරන්න විශාල කටයුතු ප්‍රමාණයක් කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා තමයි මම එය ගරු තාහිර් මන්ත්‍රීතුමාගේ අවධානයට යොමු කළේ. රජය මැදිහත් වෙමින් එක් පැත්තකින් භාණ්ඩ මිල අඩු කරන්න වැඩ කරන ගමන්, අනෙක් පැත්තෙන් සහනාධාර ව්‍යාපෘති ද ක්‍රියාත්මක කරනවා. ඒ වාගේම නිවාස ව්‍යාපෘති ඇතුළු තවත් ව්‍යාපෘති ගණනාවක් සඳහා සහන ලබා දෙමින් ජනතාවට අවශ්‍ය පහසුකම් ද රජය විසින් සපයනවා. ඒ පහසුකම් සපයන ගමන් තමයි අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව සිදු කරන්නේ.

දැන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා වන සාකච්ඡා කෙරෙමින් පවතිනවා. ගරු තාහිර් මන්ත්‍රීතුමාත් කිව්වා, මේ ප්‍රතිසංස්කරණ ගෙනෙන්න, හැබැයි අසභ්‍ය දේවල් දමන්න එපා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තේරෙන්නේ නැහැ, මෙච්චර කියලාත් විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් තවත් බොරු කියන්නේ ඇයි කියලා. විපක්ෂයේ මන්ත්‍රීවරුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට කැමැතියි කියලා කියන ගමන් විශ්වාස භංගයත් අත්සන් කරනවා. ඉතින් අපට අහන්න තිබෙන්නේ, මේ විශ්වාස භංගය අත්සන් කළේ මොකටද කියලායි. ළඟ තබාගෙන ඉන්නද? මොකද, විපක්ෂයේ සමහර කණ්ඩායම් මෙය අත්සන් කළේ නැහැ ලු, මේක කථා කරලා අත්සන් කරනවා ලු. ඔබතුමන්ලා අත්සන් කරයිද දන්නේ නැහැ. මොකද, මේ වන විට ඔබතුමන්ලා මේක අත්සන් කරලා නැහැ නේද? ඒ නිසා මේ විශ්වාස භංගය බොරුවක්.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
අත්සන් කළා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ඔබතුමා අත්සන් කරන්න ඇති. මොකද, ඔබතුමා කෝකත් අත්සන් කරනවා නේ. ඔබතුමාට ඒවා අදාළ නැහැ, අත්සන් කරන්න පැන දුන්නා නම් අත්සන් කළා. අපට ඒ ගැන කනගාටුවක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වුවමනායි කියලා මේ අය නිතර නිතර ඔප්පු කළා. දැන් ටිකකට කලින් දිලිත් ජයවීර මන්ත්‍රීතුමාට අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා පැහැදිලි කරලා කිව්වා, අකුරු ලියන එක පිළිබඳව. රූල් පහේ පොතක් එතුමාට ආපහු දෙන්න වෙනවා. මොකද, එතුමා පස්රූල් පොතේ ලියලා නැද්ද කොහෙද? නැත්නම්, පස්රූල් පොතේ විතරයි එතුමා ලියලා තිබෙන්නේ. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. අපේ අධ්‍යාපනය දැන් යන්න හදන්නේ කොහේටද?

අපේ රට සාක්ෂරතාවෙන් ඉහළ රටක්. හැබැයි, අපේ දරුවෝ විශාල පිරිසක් උසස් පෙළ විභාගයෙන් පසු ගෙදර ඉන්නවා. ඔවුන්ට රස්සාවක් කරගන්න අවශ්‍ය වෘත්තීය දැනුම, තාක්ෂණික දැනුම, නව ලෝකය එක්ක යන දැනුම ලබා දෙන්නේ නැහැ. ප්‍රායෝගික අධ්‍යාපනයෙන් අපේ දරුවෝ මගහරවා තිබෙන්නේ. දැවැන්ත විෂය කන්දකින් දරුවාගේ ඔළුව පුරවලා තිබෙන්නේ. දෙමව්පියන්ට වැඩ වැඩි කරලා තිබෙන්නේ. ඒ නිසා තමයි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව තිබෙන්නේ. ඉතින්, මේ සාකච්ඡාව එනකොට අපි ඉතාම පැහැදිලිව කිව්වා, කුලුනු 5ක් උඩයි මේක ගොඩනැඟෙන්නේ කියලා. ඒ කුලුනු පහෙන් පළමුවැනි එක, විෂයමාලා සංශෝධනය. දෙවැන්න, යටිතල පහසුකම් සංවර්ධනය. තුන්වැනි එක, මානව සම්පත් සංවර්ධනය. හතරවැනි එක, මේ සිදු කරන ක්‍රියාවලිය පසුවිපරම සහ විමර්ශනය කිරීම. පස්වැන්න, මහජනතාව දැනුවත් කිරීම. මේ කටයුත්ත කරන්න යද්දි අඩුම තරමින් විපක්ෂයට තිබුණා, මෙවැනි සබුද්ධික සංවාදයකට මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අරගෙන එන්න. නමුත්, ඔවුන් මොකක්ද ගෙනාවේ? විපක්ෂ නායකතුමා, බුද්ධ ධර්මය පොතේ තිබෙන ධර්ම චක්‍රයත් බොරුවක්ය කියන්න ගත්තා. ධර්ම චක්‍රයත් වැරදියටයි දාලා තිබෙන්නේ කිව්වා. මෙතැනට වැටෙන්න ඕනෑ නැහැ, විපක්ෂය. මේ රටේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව පුළුල්, ඒ වාගේම සබුද්ධික සාකච්ඡාවක් බවට පත් කරන්න අවශ්‍ය නම් විපක්ෂයට ඊට එකතු වෙන්න තිබුණා; මෙහි අඩුව මොකක්ද, වැරැද්ද මොකක්ද කියලා පෙන්වා දෙන්න තිබුණා. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අදාළ වන්නේ දරුවන්ට. ආයෙත් ඔයගොල්ලන් කාටවත් ඉස්කෝලේ යන්න ලැබෙන්නේ නැහැ නේ. හිතන්න තිබුණා, අඩුම ගණනේ අනාගත පරම්පරාව වෙනුවෙන් ගොඩනැඟෙන ප්‍රතිසංස්කරණවල තිබෙන අඩුපාඩු හදලා ඒක ඉස්සරහට අරගෙන යන්න ඕනෑය කියලා. හැබැයි, දැන් අපට පෙනෙන්නේ මොකක්ද? මේ අයගේ අධ්‍යාපනයත් ආපහු 6 වසරෙන් නොවෙයි, 1 වසරේ සිටම පටන්ගන්න වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි සංවාදයක් තමයි මේ අය ඇති කළේ.

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව ඇතුළේ තිබුණේ නැහැ, ආගම පිළිබඳ සංවාදයක්. අධ්‍යාපනය අසභ්‍යකරණයට ලක් කළා කියලා නාමකරණය කරන්න හැදුවා. මොකක්ද? ධර්ම චක්‍රයේ ගරාදි ප්‍රමාණයේ ප්‍රශ්නය තමයි එතුමාට තිබුණේ. මේ ධර්ම චක්‍රය අපේ රටේ නායක හාමුදුරුවෝ පිළිගත් එකක්. මේක අපි පාවිච්චි කරන ලකුණ. මේක අපේ බෞද්ධ සංස්කෘතිය ඇතුළේ තිබෙන ලකුණක්. ඒ නිසා අද අපි හැමෝටම අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සාකච්ඡාව කරන්න වෙලා තිබෙන්නේ, එක් පැත්තකින් මෙහි අඩුපාඩුවක් සිද්ධ වෙලා තිබුණු නිසායි. අපි ඒක පිළිගන්නවා. ඒ අඩුපාඩුව සිද්ධ කළේ ඇත්තටම විපක්ෂයේ මෙවැනි දේශපාලන කුමන්ත්‍රණයක් වෙනුවෙන්ද කියන එක දැන් අපි සොයමින් ඉන්නේ. මොකද, විපක්ෂය එකවරම මේ දේ මතු කරපු එකත් එක්ක ප්‍රශ්නයක් ඇති වනවා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කඩාකප්පල් කිරීමේ තුච්ඡ වුවමනාවක් තිබුණාද කියලා.

ඒ වුවමනාව වෙනුවෙන්ද මේ කුමන්ත්‍රණය සිද්ධ වුණේ කියන කාරණයත් අපට සොයන්න තිබෙනවා. මොකද, ඒක නිකම්ම නිකම් එකක් නොවෙයි. 6 ශ්‍රේණියේ English Module එක ඇතුළේ පැනේ මිතුරන් සොයා ගන්නා නූතන ක්‍රමය, එහෙම නැත්නම් වර්තමාන ක්‍රමය හරහා යනකොට පාවිච්චි කරන website එකක් පිළිබඳව සඳහන් වන පේළියක එක වචනයක් තමයි, මේකට අදාළ ප්‍රශ්නය මතු කරන්න හේතු වුණේ. ඒකෙන් තමයි විපක්ෂ නායකතුමා කිව්වේ, "අම්මෝ! අධ්‍යාපනය අසභ්‍යකරණයට ලක් කරලා" කියලා. ඒක තමයි කියන්න හැදුවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරු කිව්වා, පාට දැක්කාම සමරිසි කොඩියේ පාට පෙනෙනවා කියලා. ඒ කියන්නේ, ඒගොල්ලන්ට පාට පෙනෙන්නත් බැහැ. ප්‍රාථමික අධ්‍යාපනය දෙන දරුවන්ට, එහෙම නැත්නම් preschool එකේ දරුවන්ට ඉස්සෙල්ලාම හඳුනාගන්න දෙන්නේ පාට සහ ලකුණු. ලෝකය ලස්සන වෙන්නේ ඒවාත් එක්ක. හැබැයි, මේගොල්ලන් පාටත් එක්ක තරහකින් මේ සමාජය වර්ණ අන්ධභාවයට පත් කරන්න හැදුවා. ඒ ඇයි? මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අඩුපාඩුවක් නැති වුණාම, පොත්වල පාටත් මේගොල්ලන්ට අඩුපාඩුවක් වුණා. ඒ අඩුපාඩු අස්සේ ඒවා ඔක්කෝම එකතු කරගෙන ගිහිල්ලා හදිසියේම විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ ඉඳගෙන විශ්වාස භංගයක් අත්සන් කරනවා. අපි බලාගෙන හිටියා, ඒ විශ්වාස භංගය අරගෙන එයි කියලා. කෝ, විශ්වාස භංගය? දැන් විපක්ෂයට විශ්වාස භංගයක් ගේන්නයි වෙලා තිබෙන්නේ. ඒ තරමට ඒක බංකොලොත් වෙලා තිබෙන්නේ. අඩුම ගණනේ තමන් ඉන්න ස්ථාවරය හරි නම්, අත්සන් කරපු විශ්වාස භංගය ඉදිරිපත් කරන්න ඕනෑ. මහක් යනකොට තේරුණා, මේ විශ්වාස භංගය අත්සන් කළාට වැඩක් නැහැ, තමන් එක්ක ඉන්න තමන්ගේ විපක්ෂයේ කණ්ඩායමවත් මේකට එකතු වෙන්නේ නැහැ කියලා. අඩුම ගණනේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධව ඉදිරිපත් වෙලා තිබෙන මේ යෝජනාව, මේ modules පිළිබඳ ඉදිරිපත් වෙලා තිබෙන යෝජනාව, ඒකේ ඇතුළේ තිබෙන අඩුපාඩු පිළිබඳව විපක්ෂය ඇතුළේ සාකච්ඡාවක් පටන්ගන්න තිබුණා; ඔවුන්ට එහෙම සාකච්ඡාවකට එන්න තිබුණා. එහෙම ආවේත් නැහැ. අපි විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයට කියනවා, කොන්දක් තිබෙනවා නම් අගමැතිතුමියට එරෙහි විශ්වාස භංගය අරගෙන එන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැළැක්වීම වෙනුවෙන් විපක්ෂය නින්දිත උත්සාහයක් ගත්තා. ඒ උත්සාහයේ ප්‍රතිඵලයක් විධියට කුමන්ත්‍රණකාරී ක්‍රියාවලියක් සිද්ධ වුණාද කියලා බලන්න, 6 ශ්‍රේණියේ මොඩියුලය ඇතුළට මේ වචනය ඇතුළත් කිරීම සම්බන්ධව පරීක්ෂණයක් දැනුත් සිද්ධ වෙමින් තිබෙනවා. අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙනාවේ, තවත් පසුපසට ඇදෙමින් තිබුණු සමාජයක් පිම් ගණනාවකින් ඉදිරියට ගෙන යන්නයි; ඒ ප්‍රතිසංස්කරණ තුළින් අපේ උත්සාහය තිබුණේ එතැනට යන්නයි. හැබැයි, ඒ වෙනුවට අද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හකුළාගන්න කියලා බල කරනවා. ඒ නිසා අපි කියන්න ඕනෑ, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කිසිසේත්ම අපි හකුළාගන්නේ නැහැ කියලා. හෙට - 21වැනි දා - පාසල් පටන් ගන්නවා. 1 ශ්‍රේණියේ දරුවන්ගෙන් අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පටන් ගන්නවා විතරක් නොවෙයි, සියලු අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රමානුකූලව ඉදිරියේදී ක්‍රියාත්මක කරනවා කියන කාරණයත් කියන්න ඕනෑ. අඩුපාඩුවක් තිබුණා, ඒ අඩුපාඩුව හදාගෙන, ජනතාවත් දැනුවත් කරගෙන, විපක්ෂය උත්සාහ කරපු ඒ කුමන්ත්‍රණය පරාජය කරලා, එක දරුවෙකුවත් අධ්‍යාපනයෙන් හලන්නේ නැතුව, 6 ශ්‍රේණියේ සියලු දරුවන්ට ලබා දිය යුතු දැනුම ලබා දෙමින්, මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙනයන්න අවශ්‍ය තීරණය තමයි අපි ගත්තේ.

[ගරු වසන්ත සමරසිංහ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කාරණයක් මම කියන්න ඕනෑ. මේ ලබා දෙන සහනාධාර පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළා. සමහර සහනාධාර පාවිච්චියට ගන්නා එක සම්බන්ධයෙනුත් සඳහන් කළා. ඔව්, සමහර තැන්වල එහෙම ප්‍රශ්න තිබෙන්න පුළුවන්. ගෙදරක මහත්තයාගේ account එකට සල්ලි ගියොත්, නෝනා බඩු මල්ල අරගන්න යන්න කලින් බාර් එකටත් ඒ සල්ලි යනවා කියලා අපට විවේචන ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම දරුවන්ට සපත්තු දෙක ගන්න දීපු සල්ලි පාවිච්චි නොකර ඉන්න බැහැ, දරුවන්ට සපත්තු දෙක අරගෙන දෙන්න ඕනෑ. රජය මේ මුදල් වෙන් කළේ, දරුවන්ට පෙළ පොත් වාගේම සපත්තු දෙක, බෑග් එක අරගෙන දෙන්න. ඒ වාගේම ගෙදරට සහනාධාර ලබා දෙන්නේ ජීවත් වෙන්න අපහසුතාවක් තිබෙන මිනිස්සු වෙනුවෙන්. ඒ ජීවත් වෙන්න අපහසුතාවක් තිබෙන මිනිස්සු වෙනුවෙන් ලබා දෙන සහන අපතේ යනවා නම්, එහෙම නැත්නම් අවභාවිත වෙනවා නම් අපි ඒ ගැන සොයා බලන්න ඕනෑ. ගරු තාහිර් මන්ත්‍රීතුමනි, ඔබතුමා තවත් වැදගත් කාරණයක් මතු කළා. අපිත් ඒ පිළිබඳව විවිධ තැන්වලදී කථා කරනවා. යම් විධියකින් එහෙම අවභාවිතාවක් වෙනවා නම්, ඒක නිශ්චිතවම අදාළ කාර්යය සඳහා යෙදවීමට තවදුරටත් අවශ්‍ය තීන්දු තීරණ ගන්න ආණ්ඩුවක් හැටියට අපි කටයුතු කරනවාය කියන කාරණයත් මම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන කථා කළා වාගේම ගරු ජනාධිපතිතුමා උතුරට ගිහිල්ලා කරපු ප්‍රකාශයක් ගැනත් කථා කළා. මේ හැමෝටම කථා කරන්න දෙයක් නැති වුණාම, උතුරේ එක්කෙනා එකක් කියනවා, දකුණේ එක්කෙනා තව එකක් කියනවා. දෙදෙනාම අනුරාධපුරයට වාගේ ආවා නම්, හමු වෙනවා, එතකොට ප්‍රශ්නය ඉවර වෙනවා. ගරු ජනාධිපතිතුමා ඉතා පැහැදිලිව කිව්වා, ආගම් තිබෙන්නේ මිනිස්සු අතර වෛරය පතුරුවන්න නොවෙයි, ආගම් තිබෙන්නේ සංහිඳියාව හදන්න කියලා. මිනිස්සු මෙල්ල කරන්නේ ආගම්වලින්. ඒ නිසා බුදුන් වහන්සේගේ දේශනා තුළවත් නැති දේවල් තමයි, දැන් මේගොල්ලන් දේශනා කරන්න හදන්නේ. ඒකයි මේ ප්‍රශ්නය. ජනාධිපතිතුමා ඉතාම පැහැදිලිව කිව්වා, අපට තිබෙන දැවැන්ත සංස්කෘතික උරුමයන්, ඒ වාගේම අපට තිබෙන බුදුන් වහන්සේගේ ජීවමාන සලකුණු වන ශ්‍රී මහා බෝධිය ඇතුළු අටමස්ථානය පහු කරලා සිල් ගන්න උතුරට යනවා කිව්වාම ඒක පිටුපස යම් හේතුවක් තිබෙනවා කියලා. උතුරේ ජනතාවත් එක්ක විවිධ ප්‍රශ්න හදන්න ආගම පාවිච්චි කරනවා කියන එකයි එතුමා කිව්වේ. හැබැයි, එතුමා ඒ කියපු දේ වෙනුවට දැන් මේ අය කියනවා, වැරදි ප්‍රකාශයක් කළා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු ඇමතිතුමනි.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතුමා කිසිදු ආගම් විරෝධී ප්‍රකාශයක් කළේ නැහැ. ආගම් පාවිච්චි කරලා ජාතිවාදය අවුස්සන මිනිස්සුන්ට එතුමා කිව්වා, ඒක කරන්න එපා කියලා. ආගමට මුවාවෙලා ජාතිවාදය අවුස්සන්න එපා; චීවරයත්, සිල් රෙද්දත් දෙකම ආගමත් එක්ක තබාගන්න; හැබැයි, ඒක පාවිච්චි කරලා ජාතිවාදය අවුස්සන්න එපා කියලායි ජනාධිපතිතුමා කිව්වේ. ඒ ගැන පරීක්ෂණ කරන්න CID එකටත් යනවාලු. පව්! ආගම දහම අනුව ජීවත් වුණා නම් අඩුම තරමින් ඒ කියපු කාරණයවත් තේරෙනවා නේ. මේ සභාව ඇතුළේ අපි අද ඉදිරිපත් කරන මේ සංශෝධනයත්, ඒ වාගේම අධ්‍යාපන ප්‍රතිසංස්කරණත්, මේ සමාජය ඉදිරියට ගෙනයන්න රටක් හැටියට අපි ගන්නා ක්‍රියාමාර්ග "Rebuilding Sri Lanka" වැඩ පිළිවෙළ ඇතුළේ ඉස්සරහට ගෙනයන්න කටයුතු කරද්දි, මේ රටේ සහන අවශ්‍ය ජනතාවට තවදුරටත් සහන සහ පහසුකම් ලබා දෙන්නත් අපි ආණ්ඩුවක් ලෙස කටයුතු කරනවා කියන කාරණයත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்ததாக, கௌரவ எம்.எஸ். உதுமாலெப்பை அவர்கள். உங்களுக்கு 3 நிமிடங்கள் உள்ளது.

[பி.ப. 3.38]

**ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நமது நாட்டில் வறுமைக்கோட்டின் கீழ் வாழும் முப்பத்தேழு இலட்சம் ஏழை மக்களுக்காகச் செயற்படுத்தப்பட்டு வரும் 'அஸ்வெசும' திட்டம் மக்களுக்கு நல்ல பயன்களைப் பெற்றுக்கொடுத்திருக்கின்றது. இதுவரை எமது நாட்டை ஆட்சி செய்த ஒவ்வோர் அரசாங்கமும் வறுமைக்கோட்டுக்குக் கீழ் வாழும் மக்களின் வாழ்வாதாரத்தை உயர்த்துவதற்காகப் பல திட்டங்களைக் கொண்டுவந்திருக்கின்றது; அந்தத் திட்டங்கள் வெற்றியளித்தும் இருக்கின்றன. கடந்த அரசாங்கங்கள் அவ்வாறான திட்டங்களை மாவட்டச் செயலாளர்கள், பிரதேச செயலாளர்கள், கிராம உத்தியோகத்தர் ஊடாகத்தான் அமுல்படுத்தியிருந்தன. ஆனால், துரதிருஷ்டவசமாக கடந்த வருடம் 'அஸ்வெசும' நலன்புரித் திட்டத்துக்குப் பயனாளிகளைத் தெரிவுசெய்வதற்கு, ஒரு வீட்டின் தகவல்களைப் பெறுவதற்காக 300 ரூபாய் வீதம் கொடுப்பனவு வழங்கப்பட்டு, திடீரென இளைஞர் குழுவொன்று நியமிக்கப்பட்டது. இதனால் ஏழைகள் பலர் இந்தத் திட்டத்திலே உள்வாங்கப்படாது, பணக்காரர்கள், வசதி படைத்தவர்கள் உள்வாங்கப்பட்டதனால், அம்பாறை மாவட்டம் உட்பட முழுக் கிழக்கு மாகாண ஏழைகளும் பாரியளவில் பாதிக்கப்பட்டிருக்கிறார்கள். இந்தத் திட்டத்தை மாற்றியமைத்து, ஒரு நியாயமான தீர்வைக் காண்பதற்காக மாவட்டச் செயலாளரையும் பிரதேச செயலாளரையும் உள்ளடக்கிய ஒரு குழுவை நியமித்து, இதிலே பாதிக்கப்பட்ட ஏழைகளுக்கு உதவி செய்யுங்கள் என்ற கருத்தை பாராளுமன்றத்தில் நடைபெற்ற அமைச்சுசார் ஆலோசனைக் கூட்டங்களிலும் பல தடவை நாங்கள் முன்வைத்திருக் கின்றோம்.

1986ஆம் ஆண்டிலிருந்து நான் ஒரு கிராமோதய சபைத் தலைவராக இருந்திருக்கிறேன். ஒரு கிராமோதய சபையை அமைப்பதென்றால், கிராம மட்டத்திலே இருக்கின்ற பள்ளிவாசல்கள், கோயில்கள், பன்சல தலைவர்கள், முக்கிய அரசியல் கட்சித் தலைவர்கள், மக்கள் பிரதிநிதிகள் என அனைவரையும் இணைத்து ஐக்கியத்தை உருவாக்கும் வகையில் அந்தச் சபை அமைக்கப்பட வேண்டும். ஆனால், தற்போதிருக்கின்ற 'பிரஜா சக்தி' என்ற இயக்கம் தனியொரு

கட்சிக்கானதாக உருவெடுத்திருப்பதனால் கிராம மட்டத்திலே பாரிய சீர்குலைவு ஏற்பட்டு வருகின்றது என்பதை நான் உங்களுக்குச் சொல்லவேண்டும். கிராம மட்டத்திலே மக்களால் தெரிவு செய்யப்பட்ட பிரதேச சபை உறுப்பினர்கள் இருக்கிறார்கள்; பாராளுமன்ற உறுப்பினர் இருப்பார். அவர்களில் எவருமே அந்த 'பிரஜா சக்தி' குழுவில் அங்கத்தவராக இல்லை. அதற்கான தெரிவுகள்கூட பகிரங்கப்படுத்தப்படாமல் இரகசியமாக விண்ணப்பப் படிவங்கள் கொடுக்கப்பட்டு ஒரு தனிக் கட்சிக்குரிய செயற்பாடாகத்தான் நடைபெறுகின்றது. ஆளும் கட்சியினர் செய்யும் நல்ல பணிகளுக்கு நாங்கள் - எதிர்க்கட்சியினர் - உதவி செய்திருக்கின்றோம். ஆனால், இதனை ஜனநாயகத்தை மீறுகின்ற ஒரு செயலாகவே நாங்கள் பார்க்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நேற்றைய தினம் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சின் நலன்புரி நன்மைகள் சபையால் அனைத்து மாவட்டச் செயலாளர்கள், அனைத்துப் பிரதேச செயலாளர்கள், மேலதிக நலன்திட்ட உதவி ஆணையாளர்கள், பிரதி நலன்திட்ட உதவிகள் ஆணையாளர்களுக்காக அவசரமாக ஒரு சுற்றுநிருபம் அனுப்பப்பட்டிருக்கின்றது. அதன் பிரதியை நான் இந்தப் பாராளுமன்றத்தில் ***சமர்ப்பிக்கின்றேன்.**

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு வழங்கப்பட்ட நேரம் முடிவடைந்துவிட்டது.

**ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා**
(மாண்புமிகு எம்.எஸ். உதுமாலெப்பை)
(The Hon. M.S. Uthumalebbe)
எனக்கு இன்னும் ஒரு நிமிடம் தாருங்கள், இதனைச் சுருக்கமாகக் கூறி முடிக்கிறேன்.

'அஸ்வெசும' திட்டத்தின் முதல் கட்டம் 2025 நவம்பர் 10ஆம் திகதி தொடங்கியது. அதில் பதிவுசெய்யப்பட்ட பயனாளிகள் மற்றும் பயனாளிகள் அல்லாதவர்களின் தகவல்களைப் பரிசீலிக்க நியமித்திருக்கின்ற குழுக்களில் 'பிரஜா சக்தி' குழுவின் தலைவரையும் செயலாளரையும் பார்வையாளர்களாக நியமிக்கவிருப்பதாக இந்தச் சுற்றுநிருபத்தின்படி அறிவிக்கப்பட்டுள்ளது. அப்படியானால் ஏனைய கட்சிகளுடைய பிரதிநிதிகளையும் நியமிக்க வேண்டும். அம்பாறை மாவட்டத்திலே பயனாளிகளைத் தெரிவுசெய்வதிலே கட்சி பேதம் காண்பிக்கப்படுகின்றது. ஆகவே, எல்லாக் கட்சிகளினதும் தலைவர், செயலாளர்களை அதில் இணைக்க வேண்டும் அல்லது கட்சி சார்பற்ற, அரசியலில் ஈடுபடாதவர்களை உள்ளடக்கி, சுதந்திரமாகப் பயனாளிகளைத் தெரிவுசெய்யக்கூடிய ஓர் அமைப்பை நீங்கள் ஏற்படுத்த வேண்டுமென்று கூறி, விடை பெறுகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி, கௌரவ உறுப்பினர் அவர்களே! அடுத்ததாக கௌரவ உறுப்பினர் இராமநாதன் அர்ச்சுனா அவர்கள். உங்களுக்கு 8 நிமிடம் இருக்கின்றது.

[பி.ப. 3.43]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே!

இன்றைய தினம் என்னுடைய உரையை ஆரம்பிப்பதற்கு முன்னர் ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். இந்தப் பாராளுமன்றத்திற்கு உறுப்பினராக ஒரு நபரைத் தெரிவு செய்வதற்கான அடிப்படைக் கல்வித் தகுதியாக ஆண்டு 3, ஆண்டு 4, ஆண்டு 5 என்று ஏதாவதொன்றைக் கொண்டுவர வேண்டும். ஏனென்றால், மனிதனுடைய அடிப்படைத் தேவைகள் உணவு, உடை, உறையுள் என்பது ஆண்டு 1இல் படிக்கும் பிள்ளைக்கே தெரியும். ஆனால், செம்மறியொன்று ஜனாதிபதியவர்கள் இருந்த மேடையில் நின்று சொல்கிறது, "உணவு, உறையுள், வீடு" என்று. வெட்கம்! இந்தச் செம்மறி மாதிரியான பாராளுமன்ற உறுப்பினர்களை யாழ்ப்பாணத்தில் வைத்திருக்கின்ற NPP கட்சிக்கு நான் சொல்ல விரும்புவது, தயவுசெய்து ஆண்டு 2, ஆண்டு 3 படித்த மாணவர்களையாவது உங்களுடைய கட்சியில் சேர்த்துக் கொள்ளுங்கள்! ஏனென்றால், மனிதனின் அடிப்படைத் தேவைகளாக உணவு, உடை, உறையுள் என்பதைக்கூட சொல்லத் தெரியாத NPP உறுப்பினர்களை வைத்துக்கொண்டு வடக்கு மாகாணத்தில் அண்மையில் ஜனாதிபதி வந்து புக்கை சாப்பிட்டுவிட்டுப் போயிருக்கிறார்.

இந்தப் புக்கை தொடர்பாகச் சில விடயங்களை நான் சொல்ல வேண்டும். யாழ்ப்பாணத்திலே புக்கை என்பது முக்கியமான ஓர் உணவு. ஜனாதிபதி அவர்கள் யாழ்ப்பாணத்திற்கு வந்து புக்கை கொடுத்துவிட்டுப் போயிருக்கிறார். நாங்கள் ஜனாதிபதியிடம் புக்கை கேட்கவில்லை. நாங்கள் கேட்பது, வலி. வடக்கில் இருக்கின்ற காணிகளை விடுவியுங்கள்! வலி. வடக்கில் இருக்கின்ற மக்களுடைய வாழ்வாதாரத்தைப் பாருங்கள்! இந்திய மீனவர்கள் அள்ளிக்கொண்டு போகின்ற, சுரண்டுகின்ற வளங்களை Navy மூலமாக நிற்பாட்டுங்கள்! இடம்பெயர்ந்த மக்களது வீடுகளைக் கட்டிக்கொடுங்கள்! குறிப்பாக, இன்று வரைக்கும் தன்னுடைய தந்தையான ஆனந்தசுதாகரனை எதிர்பார்த்துக் காத்திருக்கின்ற 12 வயதுக் குழந்தையினுடைய ஆசையை நிறைவேற்றுங்கள்! இவ்வாறான சின்னச் சின்ன விடயங்களைத்தான் கேட்டுக் கொண்டிருக்கின்றோம். ஆனால், சிலர் ஜனாதிபதிக்கு புக்கை சமைத்துக் கொடுத்துக் கொண்டு இருக்கிறார்கள். வெட்கம்!

சம்பந்தப்பட்ட செம்மறிக்குக் கிளிநொச்சி நீதிமன்றத்திலே அன்று வழக்கொன்று இருந்தது. நான் ஒரு வழக்குத் தவணைக்குச் சமுகமளிக்கவில்லையென்றால் நான் இன்று உள்ளே! சாதாரணமாக ஒருவர் நீதிமன்றத்துக்குச் சமுகமளிக்கவில்லையென்றால், ஒன்றில் அவர் வைத்தியசாலையில் admit பண்ணப்பட்டிருக்க வேண்டும் அல்லது தகுந்த ஒரு காரணம் இருக்க வேண்டும். ஆனால், இந்த உணவு, உடை, உறையுள் சொல்லத் தெரியாத செம்மறி அன்றைக்கு கிளிநொச்சி நீதிமன்றத்துக்குப் போகவில்லை. ஆகவே, நீதிபதிகளிடம் மன்னிப்புக் கேட்டு நான் இந்த விடயத்தைச் சொல்லுகின்றேன். என்னவென்றால், அரசாங்கமோ, எதிர்க்கட்சியோ, பணக்காரனோ, பிச்சைக்காரனோ, யாராக இருந்தாலும் நியாயம் என்பது சமமாக இருக்க வேண்டும். ஆனால், இந்த உணவு, உடை, உறையுள் சொல்லத் தெரியாத நபர் அன்று

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා]

நீதிமன்றத்தைக்கூட அவமதித்திருக்கின்றார். நீதிமன்றத்தை அவமதிப்பதை எப்போதுமே ஏற்றுக் கொள்ளாதவன் நான். இந்த நாட்டிலே எவருக்கும் ஒரு நியாயம் கிடைக்க வேண்டுமாகவிருந்தால் அது நீதிமன்றத்தால் மட்டுத்தான் வழங்கப்பட முடியும். எந்தவொரு நீதிபதிக்கும் நாங்கள் கொடுக்கின்ற மரியாதை, இந்த நாட்டிலே இருக்கின்ற எங்களுடைய கடைசி உரிமைக்குரிய மரியாதை! ஆனால், சம்பந்தப்பட்ட செம்மறி அன்று ஒரு விதானையாருக்கு அடித்தது. நான் ஒரு விதானையாருக்கு அடித்திருந்தால் என்ன நடந்திருக்கும் என்று யோசித்துப் பாருங்கள், கௌரவ சபாநாயகர் அவர்களே! என்னுடைய கால், கைகளை எல்லாம் பிடுங்கியிருப்பார்கள். ஆனால், சம்பந்தப்பட்ட செம்மறி விதானையாருக்கு அடித்துவிட்டு பாராளுமன்றத்தில் சுற்றித்திரிகிறது. இவரை arrest பண்ணுவதற்கு பொலிசார் 7 மாத அவகாசம் கேட்கிறார்கள். ஆனால், நான் bathroom இல் இருக்கும்போது தேடிவந்து என்னை arrest பண்ணினார்கள். இதுதான் இவர்களுடைய அரசாங்கம் - வெட்கம்!

அடுத்து, கிழக்கு மாகாணத்திலே உள்ள அக்கரைப்பற்று வைத்தியசாலை தொடர்பாக ஒரு விடயத்தைக் குறிப்பிட விரும்புகின்றேன். அங்கு மிகப் பெரிய துரோகமொன்றைச் செய்திருக்கிறார்கள். சாவகச்சேரி ஆதார வைத்தியசாலை யிலிருந்த நான் இப்போது பாராளுமன்றத்தில் இருக்கின்றேன். என்ன காரணத்துக்காக? Secretary-General அவர்களே, நீங்கள் கஷ்டப்பட வேண்டாம். ‘புக்கை’ என்பது தமிழிலே உணவுக்குப் பொருத்தம். ஆகவே, நீங்கள் அது குறித்துப் பயப்பட வேண்டாம்! 'புக்கை' என்பது உங்களுடைய மொழியில் வேறு அர்த்தம்! என்னுடைய மொழியில் 'புக்கை' என்பது ஒரு வகை உணவு!

சரி, நான் பிரச்சினைக்கு வருகின்றேன். கிழக்கு மாகாணத்திலே அக்கரைப்பற்று ஆதார வைத்தியசாலையிலே இன்றைக்கும் வைத்தியர்கள் பணிப் பகிஷ்கரிப்பில் ஈடுபட்டு வருகின்றார்கள், ஒரேயொரு MS timeக்கு வர வேண்டும், timeக்குப் போக வேண்டும் என்பதை உறுதி செய்ய அவருடைய fingerprintஐ எடுக்கவேண்டும் என்பதற்காக. கிழக்கு மாகாணத்திலே முஸ்லிம் மக்கள் செறிந்து வாழுகின்ற அந்த இடத்தில் உள்ள வைத்தியசாலையில் இன்றைக்கு இரண்டாவது நாளாக அநியாயமாகப் பிரச்சினை நடந்து கொண்டிருக்கின்றது. இரண்டாவது நாளாகத் திருகோணமலை வைத்தியசாலை உட்பட கிழக்கு மாகாணத்தில் எல்லா வைத்தியசாலைகளின் செயற்பாடுகளும் முடங்கிப்போய் இருக்கின்றது. இதனால் ஏழை மக்கள் பாதிக்கப்படுகின்றனர்; அது தொடர்பாக உங்களுடைய கவனத்துக்குக் கொண்டு வருகின்றேன்.

அதைவிட முக்கியமான விடயம் என்னவென்றால், வடக்கு மாகாணத்தில் யாழ்ப்பாணம் போதனா வைத்தியசாலையில் இருக்கின்ற ஒரு மாபெரும் ஊழல்வாதி வைத்தியர் தங்கமுத்து சத்தியமூர்த்தி தொடர்பான விடயங்கள் பலவற்றை நான் வெளிப்படுத்தியிருக்கின்றேன். ஒரு கிழமைக்கு முன்னர் அதே வைத்தியசாலையில் 34 வருடங்கள் வேலை செய்த ஒரு நபர், தலையிலே தேங்காய் விழுந்து அன்று மாலை 4.30இற்கு அனுமதிக்கப்பட்ட நிலையில், இரவு 9.00 மணி வரைக்கும் CT scan எடுக்கப்படவில்லை. வைத்தியர் தங்கமுத்து சத்தியமூர்த்தி நாளைக்குப் பாராளுமன்றத்தின் Sectoral Oversight Committeeக்கு வரவிருக்கிறார்; நான் நாளைக்கு அங்கு இந்த விடயம் தொடர்பில் கதைக்கின்றேன். வடக்கு மாகாணத்தினுடைய யாழ். போதனா வைத்தியசாலையில் தலையில் தேங்காய் விழுந்து சிகிச்சைக்குச் சென்றவருக்கு சுமார் 5 மணித்தியாலங்கள் CT scan எடுக்கவில்லை. யாழ். போதனா வைத்தியசாலையில் இருக்கின்ற CT scanners இரண்டும் வேலை செய்யவில்லை. Northern hospital என்று சொல்லப்படுகின்ற வைத்தியர் அஜந்தாவினுடைய தனியார் வைத்தியசாலைக்கு நோயாளிகள் அனுப்பப்பட்டு CT scan எடுக்கப்படுகின்றது. இன்றைக்கு சுகாதார அமைச்சரிடம் இது பற்றி கேட்டபோது, தனக்கு அந்த விடயம் தெரியாது என்று சொல்கின்றார். அதை நினைக்கும்போது எனக்குச் சரியான கவலையாக இருக்கிறது. சில விடயங்களை நான் உங்களுக்குச் சிங்களத்திலும் சொல்ல ஆசைப்படுகின்றேன்.

අපේ ජනාධිපතිතුමා ආවා, Jaffnaවලට. මම සිංහලෙන් කථා කරන්නේ. "පෝය" කියන්නේ සිංහල වචනයක්. ඒ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියලා තමයි දෙමළ වචනය තිබෙන්නේ. ඒවාට වෙන වචනයක් නැහැ. කිරි බත් කියන්නේ වෙන දෙයක්. මම දැක්කා, අපේ ජනාධිපතිතුමා දවස් දෙකකට කලින් Jaffnaවලට එනවා. අපේ මිනිස්සුන්ට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඊට පස්සේ අපේ මිනිස්සුත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අපේ ජනාධිපතිතුමා උතුරට ආවාම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එක නොවෙයි අපේ උතුරේ ජනතාව බලාපොරොත්තු වෙලා හිටියේ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

කියන කෑම හදලා දෙන්න අපි ජනාධිපතිතුමාට බලාපොරොත්තු වෙලා හිටියේ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

බත් හරි නැත්නම් කිරි බත් හරි, ඒ බත් එක හදන එක කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, උතුරේ ගොඩක් දේවල් විසඳන්න තිබෙනවා.

අපේ Palaly area එකේ තිබෙන අපේ land එක release කරයි කියලා අපි බලාපොරොත්තු වුණා. උතුරේ ඉන්න ජනතාව

මෙතුමාට ඡන්දය දුන්නේ එතුමාව විශ්වාස කරලා. මෙතුමා දෙමළ ප්‍රභාකරන් විධියට ඉන්නවා කියලා විශ්වාස කර කර තමයි අපි මෙතුමාට ඡන්දය දුන්නේ. මෙතුමා ඇවිල්ලා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

එක නොවෙයි උතුරේ අපි බලාපොරොත්තු වෙන්නේ. උතුරට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ඇවිල්ලා එතැන ජාතිවාදය අවුස්සන එකට අපි කැමති නැහැ. දැන් ඇවිල්ලා ජනාධිපතිතුමා කථාවක් කියනවා. වසන්ත සමරසිංහ මහත්මයා මෙතැනට ඇවිල්ලා කථා කරලා ගියා.

මම මේක අනිවාර්යයෙන් කියන්න කැමැතියි. උතුරට ජනාධිපතිතුමා ඇවිල්ලා කියනවා, අනුරාධපුර බෝධි තිබෙනකොට අනුරාධපුරය පහු කරලා උතුරට සිංහල ජනතාව එනවා කියන්නේ ජාතිවාදය අවුස්සන්න කියලා. එතකොට උතුරේ අපට සිංහල ජනතාව මුණගස්වන්න කැමති නැද්ද? සිංහල ජනතාව බලන්න අපි කැමති නැද්ද? අපි කැමතියි. අපි දකුණේ ඉන්න සිංහල ජනතාවට හැමදාම කියන්නේ, උතුරට ඇවිල්ලා අපි ඉන්න විධිය, අපේ ජනතාව ඉන්න විධිය වාගේම අප කොච්චර අමාරුවෙන් ජීවත් වෙනවාද කියලා බලන්න කියායි.

හැබැයි, ජනාධිපතිතුමා කියනවා, දකුණේ ඉන්න මිනිස්සු උතුරට එන්නේ ජාතිවාදය අවුස්සන්න කියලා. දැන් මම උතුරේ ඉන්නවා. මට දකුණේ තිබෙන කෝවිලකට යන්න බැරිද? දකුණේ හොඳ කෝවිලක් තිබෙන නිසා මට ඒකට යන්න බැරිද? දකුණේ තිබෙනවා, කෝනේෂ්වරන්. උතුරේ නල්ලූර් තිබෙන නිසා මට ඒකට යන්න බැරිද? එතකොට, මම විශ්වාස කරනවා, මේගොල්ලන් තමයි ජාතිවාදය අවුස්සන්නේ කියලා. එකක් මතක තබා ගන්න. මම මහින්ද රාජපක්ෂලාට විරුද්ධයි. මහින්ද රාජපක්ෂ අපේ මිනිස්සුන්ව මැරුවා කියලා මම අදත් පිළිගන්නවා. හැබැයි, දැන් ඔයගොල්ලන්ට ජම්පර් එකක් දමලා උතුරට යන්න පුළුවන් නම් ඒකට එකම හේතුව, - මහින්ද රාජපක්ෂ ඔයගොල්ලන්ගේ දෙයියෝ. මගේ දෙයියෝ වෙන්න බැහැ, කවදාවත්. හැබැයි, ඔයගොල්ලන්ගේ දෙයියෝ. හැබැයි, එතුමා අපිත් එක්ක -අපි වෛරයෙන් කියන්නේ නැහැ, අපි කැමැත්තෙන් කියන්නේ- රණ්ඩු වෙලා, අපේ නායකයාව නැති කරලා එතුමා ජයග්‍රහණය කළාට මේ රටේ ඉන්න ජනතාව එතුමාව එළියට දැම්මා. දැන් බලන්නකෝ, ආගමත් නැහැ. රුපියල් 5,000ක් දෙන්න කියනවා, ගිහිල්ලා A/L ළමයින්ට බුදියා ගන්න කියලා. ආපහු තව ආප්ප කථාවක් පටන් ගත්තා. ඒ ආප්ප ලියුමක් ගෙනැල්ලා දැම්මේ, මම. LGBTQ කියන කථාව මේ පාර්ලිමේන්තුවට ගෙනැත් දැම්මේ, මම. හැබැයි, grade six ළමයින්ට ඒක උගන්වනවා කියන්නේ කොච්චර,- දැනට ඒ මොඩියුලය අයින් කර ගත්තේ නැත්නම් සම්පූර්ණයෙන්ම අයින් කර ගත්තේ නැත්නම්, තව අවුරුද්දක් දැම්මොත් ඒක කවදාවත් වෙනස් වෙන්නේ නැහැ. ළමයි buddy.net එක හොයලා ඉවරයි, ඒ වාගේ ගොඩක් දේවල් හොයලා ඉවරයි.

මේගොල්ලන්ට INGO එකෙන් හරි, NGO එකෙන් හරි සල්ලි එනවා නම්, අපි දන්නේ නැහැ, ඒ සල්ලි කොහොමද එන්නේ කියලා. පැලවත්තට එනවාද, නැත්නම් ටිල්වින් සිල්වාට එනවාද කියලා අපි දන්නේ නැහැ. හැබැයි අපි විශ්වාස කරනවා, මේ රටේ සංස්කෘතියක් තිබෙනවා කියලා. මේ රටේ සිංහල ජනතාව සියයට 80ක්, 85ක් ඉන්න නිසා මේ රට, සිංහල, බෞද්ධ රටක් කියලා ඔයගොල්ලෝ කිව්වාට අපට කිසි ප්‍රශ්නයක් නැහැ. අපිත් කැමැතියි, මේ රට ඇතුළේ ශ්‍රී ලාංකිකයෝ විධියට ජීවත් වෙන්න. මේගොල්ලෝ - NPP - බලයට ඇවිල්ලා දැන් අවුරුද්දක් වෙලා තිබෙනවා. හැබැයි, එක දේශපාලන ප්‍රශ්නයක්වත් කථා කරලා ඉවර කර ගත්තාද? දෙමළ මිනිස්සු, සිංහල මිනිස්සු අතර තිබෙන ප්‍රශ්න එකක්වත් ඉවර කර ගත්තාද? දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව කටයුතු කළාද? කිසි දෙයක් කරලා නැහැ. කිසි දෙයකට උත්තර නැහැ. හැබැයි, උතුරට ඇවිල්ලා අපට

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

අවුරුදු 40ක්. ජනාධිපතිතුමා නොවෙයි කවුරු ඇවිල්ලා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

දුන්නත් අපට ඒක ඕනෑ නැහැ. අපට ඕනෑ, මේ රටේ සමානව ජීවත් වෙන්න, සිංහල ජනතාවත් එක්ක ජීවත් වෙන්න. අපට ලස්සන රටක් හදන්න ඕනෑ. මමත් පිළිගන්නවා, මේගොල්ලෝ කවදාවත් වෙනස් වෙන්නේ නැහැ කියලා. තව අවුරුදු 5ක්, අවුරුදු 10ක් මේ පාර්ලිමේන්තුව ඇතුළේ ජීවත් වෙන්නේ කොහොමද කියලා තමයි මේගොල්ලෝ බලන්නේ. මම එකක් කියන්නම්. ඔයගොල්ලන්ට තව අවුරුදු 4ක් තිබෙනවා. ඒ අවුරුදු 4 ඇතුළේ ඔයගොල්ලෝ යම්කිසි ප්‍රමාණයකට වැඩ කළේ නැත්නම් ඊළඟ පාර එනකොට ඔයගොල්ලන්ව අපට පාරෙදි දකින්න වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ආර්.එම්. ජයවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.52]

**ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය දීර්ඝ කිරීම, සංශෝධනය කිරීම සඳහා අද දවසේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. විශේෂයෙන් අපි දන්නවා, වසර ගණනාවක් තිස්සේ මේ විධියට විවිධ වර්ගයේ ප්‍රතිලාභ ලබමින් ජීවත් වන ජනතාවක් මේ රට තුළ ඉන්න බව. අපි දැක්කා, එක මොහොතකදී හාල් සේරු දෙක දෙනවා කියනවා, හාල් සේරුව දෙන්නම් කියනවා. ඒ ආකාරයට විවිධ අවස්ථාවලදී විවිධ නම්වලින් විශාල වශයෙන් දේවල් දෙන බවට පොරොන්දු වෙලා ආණ්ඩු හදලා ඒ ආණ්ඩු යටතේ ඒ ප්‍රතිලාභ ලබපු ජනතාවක් ඉන්නේ.

අපි දන්නවා, මේ "අස්වැසුම" කියන වැඩසටහන ඇවිල්ලා තිබෙන්නේ කොයි වාගේ වෙලාවකද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 - 2022 කාල සීමාව තුළ ආරම්භ වුණු, මේ

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

රටේ ආර්ථිකය කඩා වැටීම හරහා ඇති වුණු තත්ත්වයට උත්තරයක් විධියට ලෝක බැංකුව ඇතුළු කණ්ඩායම යෝජනා කරපු අදහසක් විධියට තමයි මේ "අස්වැසුම" කියන යෝජනාව එන්නේ. එතකොට මේ ප්‍රතිලාභ ලබන්න හිමිකාරිත්වය තිබෙන අය ලංකාව තුළ විටක ඉතා සුළු පිරිසක් ඉඳලා, දැන් වනකොට ජනතාවගෙන් තුනෙන් එකකට වැඩි පිරිසක් මේ "අස්වැසුම" ප්‍රතිලාභ ලබන්න සුදුසුයි කියන මට්ටමට සාකච්ඡාවක් ඇති වෙලා තිබෙනවා. අස්වැසුම ලබන්න ඕනෑ කියලා අයදුම් පත්‍ර ඉදිරිපත් කරන ප්‍රමාණය ලක්ෂ 37ක් දක්වා වැඩි වනකොට අපි කල්පනා කරනවා, පවුල් ලක්ෂ 57ක්, 60ක් ඉන්නකොට පවුල් ලක්ෂ 37ක් අයදුම් පත්‍ර ඉදිරිපත් කරන්නේ කොහොමද කියලා.

විපක්ෂයෙන් බොහෝ අය මේ කාරණය ගැන කථා කළා. මම දැක්කා, උදැසන රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීවරයා කියනවා, "මේ ආණ්ඩුව පිහිටුවලා අවුරුද්දයි මාස හතරක් ගත වෙලා තිබෙනවා. දැන් මාර ප්‍රශ්නය වෙලා තිබෙන්නේ, මේ ප්‍රශ්නවලට උත්තර දීලා නැහැ, විසඳුම් දීලා නැහැ" කියලා. එතුමා මේ සභාවේ හිටියා නම් මට එතුමාගෙන් මේ කාරණය අහන්න තිබුණා. එතුමා අවුරුදු 25ක් තිස්සේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඇමතිවරයෙක් හැටියටත් හිටපු කෙනෙක් එතුමා, මන්ත්‍රීවරයෙක් හැටියට දැන් හිටියාට. ආණ්ඩුවක් ඇතුළෙත් අවුරුදු විසි ගාණක් ඉඳලා අපෙන් අහනවා, අවුරුද්දයි, මාස හතරකින් "කෝ, මේ ප්‍රශ්න ටික විසඳලා නැහැ නේ" කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර්ලිමේන්තුව ඇතුළේ කොයි තරම් වාද විවාද කරන්න ඇතිද මේ දුප්පත්කම නැති කරන්න? හැබැයි දුප්පත්කම ඇතිවීම සඳහා බලපාන කාරණා පිළිබඳව ගත්තොත්, එකක් තමයි අධ්‍යාපනය නොලැබීමේ දුර්වලකම. ග්‍රාමීය මට්ටමේ දුප්පත්කම වැඩි වෙන්න ප්‍රධාන හේතුව තමයි අධ්‍යාපනය නැතිකම.

අපි දන්නවා, මේ "අස්වැසුම" යෝජනා ක්‍රමය ඇවිල්ලා, ක්‍රියාවට නැඟිලා 2026 වසරෙන් අවසන් වෙන්නයි නියමිතව තිබෙන්නේ කියලා. මේ යෝජනාව ඉදිරිපත් කරනකොටම 2026 වසරෙන් අවසන් වෙනවා කියලා කලින් දැනුවත් කර තිබුණා. මේකෙදි දුප්පත් මිනිස්සුන්ට ප්‍රතිලාභය ලබා දීම සඳහා කාණ්ඩ 4කට බෙදුවා. එක කාණ්ඩයක් තමයි, කෙටි කලක් තුළින් ආර්ථික හැකියාවක් ඇති මට්ටමට ගොඩ නඟන්න පුළුවන් අය. එහි ලක්ෂ 4ක විතර ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට මාසයකට රුපියල් 2,500 ගණනේ මාස 6කට දෙන්න යෝජනා කරනවා. ඊළඟ කාණ්ඩයේ ලක්ෂ 4ක විතර ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට මාසයකට රුපියල් 5,000 ගණනේ දෙන්න යෝජනා කරනවා. ඊළඟ යෝජනාව එනවා, තවත් ලක්ෂ 8කට. ඒ අය වෙනම කාණ්ඩයකට ඇතුළත් වෙනවා. ඒ වාගේම තවත් යෝජනාවක් එනවා. ඒ පිරිසත් එක්ක සමස්තය ලක්ෂ 20කට තමයි මේ යෝජනාව ආවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ 20කට ආපු මේ යෝජනාව ඇතුළේ කාණ්ඩ 4කට බෙදලා ඒ කාණ්ඩ 4ට මාස 6, අවුරුද්ද, අවුරුදු දෙක වශයෙන් වෙන් කරලා සමස්ත ක්‍රියාවලිය අවුරුදු 4කින් නිමා වෙන්න තමයි හදලා තිබුණේ. හැබැයි, වත්මන් ආණ්ඩුව හැටියට අපි කල්පනා කළේ මොකක්ද? අවුරුදු එකින් එක "අස්වැසුම" ලබලා, ශක්තිමත් ආර්ථිකයකට පරිවර්තනය වෙලා, ආර්ථිකය සමතුලිත තත්ත්වයට පත් වෙනවා එහෙම නැත්නම් ඔවුන්ගේ ජීවන තත්ත්වය හොඳ තත්ත්වයකට පත් වෙනවා කියලා හිතලා හදපු මේ "අස්වැසුම" වැඩ පිළිවෙළ තුළ කාගේවත් ජීවන තත්ත්වය හොඳ මට්ටමකට පත් වෙලා තිබෙනවා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කිසි කෙනෙකුගේ ජීවන මට්ටම හොඳ තත්ත්වයට පත් වෙලා නැහැ. එහෙමනම් අපට සිද්ධ වෙනවා, මේ වැඩ පිළිවෙළ තවදුරටත් පවත්වා ගෙන යන්න. පවත්වා ගෙන යන්න වෙන්නේ, "අස්වැසුම" ප්‍රතිලාභ ලබන ප්‍රමාණය, ප්‍රතිලාභ ලබන්න ඉල්ලුම් කරන ප්‍රමාණය අනුව. අයදුම්පත්‍ර ලක්ෂ 37ක් එනකොට අපට දැනෙනවා, මේ කටයුත්ත තවදුරටත් පවත්වා ගෙන යන්න ඕනෑ කියලා. හැබැයි ප්‍රශ්නයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ තමයි, මේ තෝරා ගැනීමේ ක්‍රියාවලිය. මේ තෝරා ගැනීමේ ක්‍රියාවලියට අනුගත කර තිබෙන නිර්ණායක ටික බැලුවොත්, ඒ නිර්ණායකවලට අනුව සල්ලි තිබෙන කෙනා මේකට ඇතුළත් වෙන්නත්, සල්ලි නැති කෙනා පිටතට යන්නත් පුළුවන්.

ඒ නිර්ණායකවල අහලා තිබෙනවා, ඔබට සින්නක්කර ඉඩමක ඔප්පුවක් තිබේද කියලා. සමහර අය කොච්චර දුප්පත් වුණත් ඔවුන්ගේ පොඩි ඉඩමට ඔප්පුවක් තිබෙනවා. ඒ වාගේම අහනවා, ඔබට ස්ථිර වහලක් සහිත ගෙයක් තිබෙනවාද කියලා. කොච්චර දුප්පත් වුණත් සමහර අයට ස්ථිර වහලක් සහිත ගෙයක් තිබෙනවා. මේකේ එවැනි ප්‍රශ්නවලට උත්තර දුන්නාම ලකුණු නැතිවෙනවා; ලකුණු කැපෙනවා. ඒ වාගේම ඒකේ අනෙක් පැත්තත් තිබෙනවා. ඒ තමයි, සල්ලිත් තිබෙනවා, දේපළත් තිබෙනවා, සියල්ල තිබෙනවා, හැබැයි ජීවත් වෙන්නේ තාත්තාගේ ඉඩමේ. එතකොට තමන්ගේ නමින් ඔප්පුවක් නැහැ. ඔහුට ලකුණු හම්බ වෙනවා. පාසල් යන වයසේ දරුවන් ඉන්නවාද කියලා අහනවා. දරුවන් එක්කෙනෙක්, දෙන්නෙක්, තුන්දෙනෙක් ඉන්නවා නම් ලකුණු ගොඩක් හම්බ වෙනවා. දරුවන් නැති වයසක අම්මලා, තාත්තලා තනියෙන් ජීවත් වුණාට, ආර්ථිකය ශක්තිමත් නැතිව ජීවත් වුණාට දරුවන් නොමැති වීම නිසා මේකෙදි ගැටලුවක් තිබෙනවා. ඔවුන්ට ලකුණු හම්බ වෙන්නේ නැහැ. ඒ නිසා මේ තෝරා ගැනීමේ නිර්ණායක මත පදනම් වෙලා ප්‍රතිලාභ ලබා දීමේදී ගැටලුවක් තිබෙනවා. එය දැවැන්ත ගැටලුවක්. ඒ සම්බන්ධයෙන් සමාජය තුළ දැවැන්ත විවේචනයක් තිබෙනවා. ඒ තමයි, තිබෙන මිනිස්සුන්ට දීලා, නැති මිනිස්සුන්ට දීලා නැහැ කියන එක. ඒ නිසා අපි විශ්වාස කරනවා මෙය සංශෝධනය විය යුතුයි කියලා. ඒ නිසා අපි මෙන්න මේ දීර්ඝ කිරීම -මාස 6කට මේ ගෙවීම් වැඩි කිරීම- කරනවා. තිබිච්ච ගෙවීම් සියල්ල අපි වැඩි කළා. වැඩි කරලා තමයි අපි කාලයත් දීර්ඝ කළේ. ආණ්ඩුවක් හැටියට අපි සැලකිය යුතු මැදිහත් වීමක් මේ ජනතාව වෙනුවෙන් කර තිබෙනවා. ඒ වාගේම මේ දීර්ඝ කිරීම හරහා මේ කටයුත්ත පිළිබඳව නිශ්චිත සමාලෝචනයක් කරලා ඒ තුළින් විධිමත්ව, සහන ලැබිය යුතු සුදුසුම අයට සහන ලබා දීම වෙනුවෙන් මැදිහත් වීමක් කරන්න, කමිටු පත් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ අවුරුද්දේ මැද භාගය වෙනකොට ඒකට අදාළ කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

අපි දැක්කා, අද දවස තුළ විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් වෙච්ච විවිධ ප්‍රශ්න, ගැටලු ගැන. ආපදාවලට ලක් වෙච්ච අය ගැන, ආපදාව ගැන හෙට දවසේ සම්පූර්ණයෙන්ම අපට කථා කරන්න පුළුවන් වෙයි. ඒ අය කියන මේ දැවැන්ත ආර්ථික පීඩාව ඇතුළේ බඩු මිල ගැනත් කථා කළා. අපේ වසන්ත සමරසිංහ ඇමතිතුමා බඩු මිල ගැන පැහැදිලි කළා. බඩු මිල වැඩියි, බඩු මිල අඩු කරන්න කියලා ගොඩක් අය කිව්වා උදෙත් මට ඇහුණා. ඒ අයගෙන් මට මේ කාරණය අහන්න ඕනෑ. පසුගිය අවුරුදු කිහිපය තුළ බඩු මිල වැඩි වීමේ වේගය අනුව උද්ධමනය සියයට අසූ ගණන්, අනූ ගණන් දක්වා ගිහිල්ලා තිබුණා. හැබැයි, ඒ උද්ධමනය පසුගිය අවුරුද්ද ඇතුළත මාස 10කට වැඩි කාලයක් සෘණ අගයක පවත්වාගෙන ගියා.

උද්ධමනය සෘණ අගයක් වුණාම බඩු මිල වැඩි වෙන්නේ නැහැ; බඩු මිල අඩු වෙනවා. අපේ රටේත් බඩු මිල අඩු වීමේ වේගය වැඩි වෙලා තිබුණා. භාණ්ඩ මිල වේගයෙන් පහළට යාමත්,

ඒ හේතුවෙන් උද්ධමනය සෘණ අගයක් දක්වා ගමන් කරන්නත් පටන් ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. උද්ධමනය ඉහළ යනවා වෙනුවට මාස 10ක් තිස්සේ උද්ධමනය පහළට ගිහින් තිබුණා. ඒ නිසා උද්ධමනය පාලනය කර ගැනීම වෙනුවෙන් ආණ්ඩුව ක්‍රියාමාර්ගයක් ගත්තා.

යම් රටක් සංවර්ධනය කරා ගමන් කරවනවා නම් ඒ රටේ බඩු මිල වේගයෙන් අඩු වෙලා යෑම හරහා නිෂ්පාදනය කඩා වැටිලා, ආර්ථිකය අර්බුදයකට ගිහිල්ලා, ඒ රට ආර්ථික වශයෙන් අර්බුදයට වැටීම වැළැක්වීම වෙනුවෙන් උද්ධමනය ධන අගයක තියාගෙන යන්න ඕනෑ කියා අපි විශ්වාස කරනවා. දැන් සියයට 4කට අඩු උද්ධමන වේගයක් සහිතව ආර්ථිකය ක්‍රමානුකූලව වර්ධනය වෙමින් තිබෙනවා. ආර්ථිකයේ අත්පත් කර ගත් වර්ධන වේගය සියයට 5 සීමාව ඉක්මවා ගිහින් තිබෙනවා, 2025 වර්ෂයේදී. ඒ නිසා විපක්ෂයේ ආර්ථික ඔස්තාර්ලා, විද්‍යාඥයන් වාගේ කට්ටිය අපට කරුණු ඉදිරිපත් කරන කොට හිතෙනවා, 'මෙතුමන්ලා ඉදිරිපත් කරන කරුණු කිසි ලෙසකින්වත් වැඩක් නැහැ' කියලා. අවුරුදු 76ක් තිස්සේ මාරුවෙන් මාරුවට රට පාලනය කරපු ඒ කට්ටිය තමන්ගේ ඒ දැනුම, හැකියාව පාවිච්චි කරලා රට ආර්ථික වශයෙන් කළමනාකරණය කරලා තිබුණා නම්, මේ වනකොට රටේ ජනතාවට මේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න වෙන්නේ නැති වෙයි කියලා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සහන; අස්වැසුම ප්‍රතිලාභ, ආබාධ සහිත තැනැත්තන්ට ලබා දෙන දීමනා, වකුගඩු ආධාර, වැඩිහිටි දීමනා ආදි සියල්ලෙහි ගණනත් වැඩි කරලා ඒවා මේ තත්ත්වයෙන් පවත්වාගෙන තවත් මාස 6ක් ඉස්සරහට ගිහින් ජන ජීවිතය හොඳ තැනකට ගේන්න අපි නිශ්චිත වශයෙන්ම මැදිහත් වෙනවා කියා ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුගත් වසන්ත ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු (මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා (විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) கிரிஷாந்த அபேசேன - விஞ்ஞான மற்றும் தொழில்நுட்ப அமைச்சர்)
(The Hon. (Prof.) Chrishantha Abeysena - Minister of Science and Technology)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු සුජීව දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සුජීව දිසානායක මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. IMRAN MAHAROOF left the Chair, and THE HON. SUJEEWA DISSANAYAKE took the Chair.*

[අ.භා. 4.04]

**ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு சுகத் வசந்த த சில்வா)
(The Hon. Sugath Wasantha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ සාකච්ඡාවක් මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සිද්ධ වන අවස්ථාවක මේ කථාව කරන්න ලැබීම ගැන මම අවංකවම සතුටු වෙනවා. ජාතික ජන බලවේගය රජය විධියට අපි බලාපොරොත්තු වෙනවා, අපි අපේක්ෂා කරනවා, සුබසාධනවාදී වැඩ පිළිවෙළ හරහා ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නංවන්න. අන්න ඒ සඳහා අප ගන්නා වැයමක ප්‍රතිඵලයක් තමයි "අස්වැසුම" ඔස්සේ අද මේ කෙරෙන සංශෝධනයත් එක්ක පෙනෙන්නේ.

"අස්වැසුම" කිව්වාම, සිංහල භාෂාවෙන් කියැවෙන්නේ සහනය, සැනසිල්ල වාගේ අදහසක්. මම දැක්කා, මීට ඉහත කථා කරපු මන්ත්‍රීවරයා "ගහ දන්නා අපට කොළ කඩා පෑමක්" සිද්ධ කළා; දෙමළ වචනයක් සිංහල ඌරුවට නගමින් ඉතාම කැත, නිර්ලජ්ජී වාග් ව්‍යවහාරයක් ප්‍රදර්ශනය කළා. තමන් කියපු ඒ වචනයේ අර්ථයවත්, ඒ වචනයෙන් ගම්‍ය වන ස්වරූපයෙන් පෙනෙන දේවත් නොවෙයි ඇත්තෙන්ම ඔහු ඉස්මතු කරන්න හැදුවේ. අපි සිංහල භාෂාව පරිහරණය කරන මිනිස්සු. අපි දන්නවා, වචනයක වාග් අර්ථය, කෝෂාර්ථය සහ ධ්වනිතාර්ථය. අපි ඒ කාරණා නොදන්නවා නොවෙයි. හැබැයි, අපි වර්ගවාදය, ආගම්වාදය, ජාතිවාදය ප්‍රතික්ෂේප කරන පක්ෂයක් විධියට, දේශපාලන ව්‍යාපාරයක් විධියට ඉතාම අවධාරණයෙන් කියන්න ඕනෑ, ජාතිවාදය, වර්ගවාදය, ආගම්වාදය මත ජීවත් වෙන්න දේශපාලන ගමනක් යන්න උත්සාහ කරන ඔබ අවලංගු වෙලා හමාර බව. පසුගිය මැතිවරණ දෙකේදීම උතුරේදීත්, දකුණේදීත් ඉතාම පැහැදිලිව ප්‍රකාශ කළේ මොකක්ද? ශ්‍රී ලාංකීය ජාතිය තවදුරටත් ආගම්වාදී විධියට, ජාතිවාදී විධියට, වර්ගවාදී විධියට දේශපාලන තීන්දු තීරණ ගන්නේ නැහැ කියන එකයි පෙන්නුම් කළේ. බතට මොන වචනය කිව්වත්, පරිස්සම් වෙන්න ඕනෑ කාරණය තමයි අපි ඇත්තෙන්ම බත්ද කන්නේ, පුණ්ණක්කුද කන්නේ, පිදුරුද කන්නේ කියන එක. ගරු අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා කියපු දේ වර්ගවාදී ස්වරූපයකින් ඉස්මතු කරමින් රටේ භේද ඇති කරන්න ජාතිවාදී, වර්ගවාදී විෂබීජ පතුරවන්න, ඒ තුළ දේශපාලනික වාසි ලබා ගන්න දරන උත්සාහයක් තමයි ඒ කථාවලින් පෙනෙන්නේ. ඔවුන් තවමත් වර්ගවාදී, ජාතිවාදී මඩ ගොහොරුවේම බීජ බවට පත් වෙලා ඒ තුළම විනාශ වීමේ මුව අභියස ඉන්න බව දේශපාලනික විඥානය විසින් හඳුනා නොගැනීම ගැන අතිශයින් කනගාටු වෙනවා; අතිශයින් කනගාටු වෙනවා! මට ලැබී තිබෙන මිනිත්තු කිහිපයෙන් ඒ ගැන කථා කරන්න කාලය වෙන් කරන්න සිද්ධ වීම ගැන කනගාටුයි. තවදුරටත් මම විශ්වාස කරන දේ තමයි, ශ්‍රී ලාංකික ප්‍රජාව තුළ ජාතිවාදී වර්ගවාදයට ඉඩක් නැහැ කියන එක.

ඒ වාගේම කලින් කථා කරපු කතික මන්ත්‍රීවරුන් කියපු දේවල් කිහිපයක් ගැනත් කියන්න ඕනෑ. එදා ඇට අටක් අපට දෙනවා කියලා අපෙන් ඡන්ද ගත්තා; පාන් ගෙඩිය රුපියල් 3.50ට දෙනවා කියලා ඡන්ද ගත්තා. තවත් වතාවක "ජනසවිය" කියලා ව්‍යාපෘතියක් ගෙන එමින්, "සමෘද්ධිය" කියලා ව්‍යාපෘතියක් ගෙන එමින් දුප්පත්කම ඡන්ද විධියට මංකොල්ල කාපු දේශපාලන ව්‍යාපාර තිබුණා. ජාතික ජන බලවේගය විධියට අපි කිසිසේත් දුප්පත්කම මංකොල්ල කන සුබසාධනවාදී, දීමනාවාදී දේශපාලනයක් ගෙන ගියේ නැහැ. හැබැයි අපි දන්නවා, නිර්ධන පාන්තික ජනතාවගේ හද ගැස්ම, ඔවුන්ගේ බඩේ වේදනාව. ඔවුන් ජීවත් කරවීමේ අභිලාෂය අප තුළ තිබෙන නිසා තමයි, "අස්වැසුම" ප්‍රතිලාභ ලබා දීම තවත් හය මාසයකින් දීර්ඝ කරමින් ඔවුන්ගේ ප්‍රතිලාභ ඉහළ නංවන වැඩ පිළිවෙළක් ගෙන එන්නේ. අනෙක් පැත්තෙන්, මේ හරහා ආබාධ සහිත ප්‍රජාවට, වකුගඩු දීමනාව ලැබෙන ප්‍රජාවට සහ නොයෙකුත් ආධාර අනුබල ලැබිය යුතු, දීමනා ලැබිය යුතු කණ්ඩායම්වලට නිර්ලෝභීව සමාජ සුබසාධනවාදී දීමනා ලබා දීමට කිසිසේත් අප රජය පැකිළෙන්නේ

[ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා]

නැහැ කියන එක සනාථ වන අවස්ථාවක්, මේක. පසුගිය අය වැය ලේඛනය තුළ අපි තවත් කණ්ඩායමක් හඳුනා ගනිමින් තැලසීමියා රෝගීන්ට ලබා දුන් රුපියල් 3,000 දීමනාව රුපියල් 10,000 දක්වා වැඩි කර තිබෙනවා. මොකද, අපි දන්නවා ඒ කණ්ඩායම්වලට තමන්ගේ ජීවන පැවැත්ම තහවුරු කර ගනිමින්, පවත්වාගෙන යමින් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා විශාල වැය බරක්, විශාල ප්‍රවාහන වියදමක් දරන්න සිදු වෙනවා කියලා. ඒ කණ්ඩායම්වලට අවශ්‍ය දීමනා අවශ්‍ය මොහොතේදී නොලැබී තවත් අවුරුදු ගණනාවකින් ලැබීම වැඩක් නැති බව රජය පිළිගන්නා නිසා තමයි සැම අය වැය ලේඛනයක් පාසාම දිය යුත්තන්ට ලබා දිය යුතු දීමනා අප ලබා දෙන්නේ. එහෙම නොවුණොත් අපට සිද්ධ වෙන්නේ ඔවුන්ගේ ජීවන තත්ත්වය, ඒ දුක නොබැලූ කණ්ඩායමක් විධියට සමාජගත වෙන්නයි. අපි ඒ සඳහා කිසිසේත් සූදානම් නැහැ.

අනෙක් පැත්තෙන්, ආබාධ සහිත ප්‍රජාවගේ පාර්ශ්වයෙන් ගත්තාම අපි සියලු දීමනා ඉහළ නංවා තිබෙනවා. දීමනා ලැබෙන පිරිස ද -ප්‍රජා කණ්ඩායම ද- පළල් කර තිබෙනවා. ඒ ඇයි? අපි විශ්වාස කරනවා, ඔවුන්ගේ ජීවන තත්ත්වය ඒ ආකාරයෙන් පවත්වගෙන යාමට අනිවාර්යයෙන්ම මේ දීමනා ක්‍රමය තිබිය යුතුයි කියලා. හැබැයි, මේ දීමනාව යැපුම් මානසිකත්වයක් කරා ගෙන යා යුතු නැහැ කියන එක අපි පිළිගන්නවා. ඔවුන්ගේ ජීවන තත්ත්වය ඒ ආකාරයෙන් පවත්වාගෙන යමින් බලගැන්වුණු සමාජ කණ්ඩායමක් විධියට මේ ආන්තික කණ්ඩායම් අනිවාර්යයෙන් සමාජය ඉදිරියට ආ යුතුයි, ස්වශක්තිය මත පදනම් වෙමින්, ස්වශක්තිය මත තමන්ගේ ජීවන තත්ත්වය තහවුරු කර ගත යුතුයි.

තවත් වැදගත් දෙයක් තිබෙනවා. ජාතික ජන බලවේගය රජය විධියට මේ දීමනා ලබා දීමේ ස්වභාවයට නව චින්තාවක් ගෙනැල්ලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමා "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ කඩා වැටුණු ජන ජීවිත, කඩා වැටුණු ආර්ථිකය ගොඩ නැඟීම සඳහා දීමනා පැකේජයක් ඉදිරිපත් කළා. සමහර ගෙවල්වල වටිනාකමට වඩා වැඩි ආධාරයක් ලබා දීමට ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව සූදානම් වනවා. ඒ ගැන ප්‍රශ්න කරද්දී එතුමා කිව්වේ මොකක්ද? "ඔව්, ඒ ගෙයි වටිනාකම එච්චර නොවෙන්න පුළුවන්. හැබැයි, අපි ගෙයක් දෙන්නේ ඒ ජීවන තත්ත්වය ඒ ආකාරයෙන් පවත්වාගෙන යාමට නොවෙයි" කියලායි. ඊට වඩා දියුණු, ඊට වඩා උසස් ජීවිතයක් ගත කරන්න සුදුසු ගෙයක් දෙන්න තමයි අපි ඒ වැඩි කරපු දීමනාව දෙන්නේ. පැල්පතක් කැඩුණා නම් අපි ඒ පැල්පතේ වටිනාකම ගෙවලා වැඩක් තිබෙනවාද? නැහැ. අපි බලාපොරොත්තු වෙන්නේ පැල්පතක් කැඩුණා නම් ඊට වඩා හොඳ ගෙයක් ලබා දෙන්නයි. ඒ හරහා සෞඛ්‍යවත්, පොහොසත් ජීවිතයක්, සතුටු ජීවිතයක් විපතට පත් ප්‍රජාවට ලබා දෙන්නයි. විපක්ෂයේ කණ්ඩායම් පුදුම වෙනවා. විපක්ෂයේ කණ්ඩායම් ගණන් හදලා කියනවා, "කොහොමද රුපියල් 25,000 ගණනේ, රුපියල් 50,000 ගණනේ, ලක්ෂ දෙක ගණනේ, ලක්ෂ පහ ගණනේ දෙන්නේ, එච්චර පොහොසත් ද අපි, ආර්ථිකය කඩා වැටෙයි" කියලා. නැහැ. අපි බලාපොරොත්තු වෙන්නේ ඒ කඩා වැටුණු මිනිස්සුන්ගේ ජීවිතවලට නැවත පණ දෙන්න, නැවත හුස්ම දෙන්න. හිටියාට වැඩිය උසස් ජීවන තත්ත්වයක් ඔවුන්ට උරුම කර දෙන්නයි. ඒක වැරදිදිද කියලායි මම අහන්නේ. ඒක වැරදිදිද? ඒක නොවෙයිද, රජයකින් බලාපොරොත්තු වෙන දේ? ජනයා රංජනය කරනවා කියන්නේ ඒකට නොවෙයිද? එහෙම රංජනය කිරීමට සූදානම් වෙන, ඒ සඳහා පියවර ගන්න සූදානම් වෙන ජනාධිපතිවරයා, අවලාදයකට ලක් කරන, අවමානයට ලක් කරන තුම්මුල්ලේ පද්මෙලාට කියන්න ඕනෑ, තුම්මුල්ලේ විමලෙලාට කියන්න ඕනෑ පරාජය වෙච්ච, කුජීත වෙච්ච අයට සත්‍යාග්‍රහණය කර ගන්න බැහැ කියලා. නැවතත් දේශපාලනය ගැන නව දැක්මකින්, නව අවබෝධයකින් කටයුතු කරන්න. නැත්නම් සත්‍යාග්‍රහයට වෙච්ච දේ තමයි හැම දාම ඔබට සිද්ධ වෙන්නේ කියන එක මම කියන්න කැමතියි.

අස්වැසුම හරහා මේ ප්‍රතිලාභ ලැබෙන සියලු කණ්ඩායම්වලට, මේ දීමනා ලැබෙන සියලු කණ්ඩායම්වලට අපි ඉතා ඕනෑකමින් අභියාචනාත්මකව ඉල්ලා සිටිනවා ඔබගේ ජීවන පැවැත්ම තහවුරු කර ගන්න කියලා. ඒ වාගේම බල ගැන්වුණු සමාජ කණ්ඩායමක් විධියට සංවර්ධනයට දායක වෙන්න කියලා ආරාධනා කරමින් මට කථා කරන්න ලබා දුන් අවස්ථාවට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.13]

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මට කලින් කථා කරපු මන්ත්‍රීතුමා කිව්වා, "දූප්පත්කම මංකොල්ලකන දේශපාලනය මිනිස්සු අත හැරියා" කියලා. ඒක ඇත්ත කථාවක්. මේක ඇට වර්ග 8ක් දෙනවා නම් ඡන්දය දෙනවා කියපු මිනිස්සු ඉන්න රටක්, පාන් ගෙඩිය රුපියල් තුනයි පනහට දෙනවා කියද්දි ඡන්දය දීපු මිනිස්සු ඉන්න රටක්, ආහාරපාන වාගේ දේවල්වලට, එහෙමත් නැත්නම් දූප්පත්කම අළෙවි කරලා ඡන්දය ගන්න බැහැයි කියන තැනට ආවා කියන එක තමයි 70 අවුරුදු සාපය නැමැති බොරුවට තිබෙන හොඳම උදාහරණය, ගරු මන්ත්‍රීතුමා. ඒ කියන්නේ මිනිස්සු ඉදිරියට ගිහිල්ලා තිබෙනවා. අතීතයේ කැම වේලකට ගන්න පුළුවන් ඡන්දය අද ප්‍රතිපත්තිවලට ගන්න පුළුවන්කම ලැබුණා කියන්නේම, ඔබ නිරන්තරයෙන් කියන රට විනාශ වුණා ය කියන කථාව එතැනින්ම ඉවර වෙනවා කියන එකයි. ඇත්ත, අතීතයේ එහෙම වුණා තමයි. අද මිනිස්සු ප්‍රතිපත්ති දිහා බලලා තමයි ඔබට ඡන්දය දුන්නේ කියලාත් ඔබතුමන්ලා කියනවා. ඔව්, ඒක තමයි දියුණුව කියන්නේ. එතැනින්ම තමයි අපේ කථාව ආරම්භ කරන්න තිබෙන්නේ. රටක් දියුණුවීමේ දී සමස්ත ජනතාව එකවර ජයග්‍රාහී තැනකට ගෙනියන්න බැහැ, දියුණුවකට ගෙනියන්න බැහැ. ඒ නිසා අඩු ආදායම්ලාභීන් සුබසාධනය කිරීම කිසිසේත්ම රටක නරක ප්‍රතිපත්තියක් නොවෙයි. නමුත්, රටකට තිබෙන ප්‍රධාන ප්‍රශ්නයක් තමයි අඩු ආදායම්ලාභීන් සුබසාධනය කරන්නේ කෙසේද කියන ප්‍රශ්නය. කවුද, ඒ සඳහා දායක වෙන්නේ කියන එක තමයි මේ ආණ්ඩුවලට මුහුණ පාන්නට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. මෙන්න මේ දායක කර ගන්නා කණ්ඩායම ප්‍රමාණවත් නැත්නම් ආණ්ඩු කරන්නේ, බාහිරින් ණය පහසුකම් ලබා ගනිමින් මේ සුබසාධන කටයුතුවලට අවධානය යොමු කරන එක. ණය පහසුකම් යටතේ සුබසාධනය කිරීමේ අවසන් ප්‍රතිඵලය, බේදවාචකයකින් කෙළවර වෙනවා. අපි එවැනි බේදවාචකයකට ගිය රටක්. ඒකත් අමතක නොකළ යුතු දෙයක්.

ඒ විතරක් නොවෙයි. රජය ණය වෙන එක වරදක් නොවෙයි කියලා ජනාධිපතිවරයා ජනාධිපතිවරයණයට කලින් කිව්වා. ඉඳලා හිටලා හෝ ඇත්ත කියනකොට ඒකත් හොඳ අදහසක්. ඒකත් ඇත්ත කථාවක්. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඒ ලබා ගන්නා ණය මුදල් අපි යම් තැනක ආයෝජනය කළොත්, ඒ ආයෝජනය මඟින් ලැබෙන ප්‍රතිලාභ හරහා බදු මුදල් මඟින් හෝ එහෙමත් නැත්නම් වෙනත් ක්‍රම මඟින් අර ලබා ගත්ත ණය හා පොලිය ආවරණය කරන්න බැරි නම්, ඒ ලබා ගත්ත ණය ආයොජනයක් ලෙස භාවිත කළාට ඒක නැවත රටට ණයක් බවට පත් වෙනවා. සුබසාධනය නරක දෙයක් නොවෙයි. හම්බ කරලා වියදම් කරන ක්‍රමයක සුබසාධනයට යන්න පුළුවන් නම්, රටක් ලෙස දියුණුව කරා යන මාවත විවර කර ගන්න අපට පුළුවන්. යම් හෙයකින්

එහෙම කරන්න බැරි වුණාම මොකද වෙන්නේ? සමාජ සුබසාධනය සඳහා තවත් කණ්ඩායමක බදු මුදල් භාවිත කරන්න පටන් ගන්නවා. ඒ කාගේද? ඉහළ ආදායම් ලබන මිනිස්සුන්ගේ බදු මුදල්. ආදායම් බදු ලෙස එකතු කර ගන්න මේ මුදල් ප්‍රමාණය රජයට ගත්තාම ඇතිවන ප්‍රශ්නයක් තමයි, ඒ බදු මුදල් ගෙවන අයට ප්‍රාග්ධන මුදල් අහිමි වෙන එක. තව ව්‍යාපාර පටන් ගන්න, වෙනත් ආයෝජනවලට තිබෙන අවස්ථාව ඒ අයටයි අහිමි වෙන්නේ. සමාජ සුබසාධනය හොඳයි. සමාජ සුබසාධනය ජනප්‍රියයි. හැම වෙලාවකම යමක් ලැබෙනකොට මිනිස්සු ඒකට කැමැතියි. හැබැයි, ඒ අතරතුර ජනප්‍රිය නැති එක තමයි, බදු. අනිවාර්යයෙන්ම බදු මුදල් ඉහළ නැංවීම නොකර අපට බැරි වෙලා තිබෙනවා, ජනතාවට සහන ලබා දෙන්න. එහෙම නම් මෙන්න මේ තත්ත්වය බැලන්ස් කර ගන්නේ කොහොමද කියන එක තමයි අපේ ප්‍රශ්නය බවට පත් වෙන්නේ. එක පැත්තකින් බදු ඉහළ නංවනවා. අනෙක් පැත්තෙන්, අතීතයේ ඉඳලා ණය ලබා ගන්නවා, ඒවාට පොලිය ගෙවනවා. පොලිය ගෙවා ගන්න බැරිව තව ණය ගන්නවා. බදු මුදල් ලබා ගැනීම හරහා බදු ගෙවන්නන්ගේ ප්‍රාග්ධනය අහිමි වෙනවා. අරගන්න ඒ සියලු ණය මුදල් ටිකයි, බදු මුදල් ටිකයි අවසානයේදී ඵලදායී වැඩවලට යොදා ගැනීමට නොහැකිවීමේ චක්‍රයකට අහුවෙලා දිගින් දිගට, දිගින් දිගට දියුණුවීමේ මාවතක යනවා වෙනුවට අපි එකතැන කැරකෙන්න පටන් අරගෙන තිබෙනවා.

සමාජ සුබසාධනය ලෝකයේ කිසිම රටක් එපා කියන්නේ නැහැ. ධනවාදී ආර්ථිකයක් විශ්වාස කරන ඇමෙරිකාව පවා සුබසාධනය සඳහා අවධානය යොමු කරලා තිබෙනවා. සමාජ ආරක්ෂණය සඳහා ඒ රටවල අවධානය යොමු කර තිබෙනවා. එහෙම නම් දැන් අපි කොහොමද මේ ප්‍රශ්න ටික ලිහා ගන්නේ? ඒක තමයි අපි සාකච්ඡාවට ගත යුතු දේ. ඇයි අපි රටක් විධියට රක්ෂණ ක්‍රමයක් ගැන අවධානය යොමු නොකරන්නේ? ලංකාවේ සමස්ත ජනතාවම රක්ෂණය කරන තැනට අපට යන්න පුළුවන්. ආණ්ඩුවට අපි යෝජනා කරනවා, එවැනි රක්ෂණ ක්‍රමයක් ගැන අවධානය යොමු කරන්න කියලා. විශේෂයෙන්ම 2016 කාලසීමාවේ රවී කරුණානායක මැතිතුමා ඇමතිවරයා වශයෙන් හිටපු කාලයේ ස්වාභාවික ආපදාවලට අදාළ රක්ෂණ ක්‍රමයක් ගෙනැල්ලා තිබෙනවා. ඒක යම් අවස්ථාවක නිලධාරින්ගේ ගැටලුවක් නිසා අසාර්ථක වුණා. නැවත ඒ ගැන අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

ඒ වාගේම තමයි වැඩිහිටි ජනගහනයේ අර්බුදය. වැඩිහිටි ජනගහනය ක්‍රමයෙන් වැඩිවන රටක් තමයි අපේ රට. අවුරුදු 60ට වඩා වැඩි අයට දීමනාවක් දෙන රටක් අපි. මේ වැඩිහිටි දීමනාව දෙන එක හොඳයි. හැබැයි, දිගින් දිගටම මේ විධියටම රාජ්‍ය භාණ්ඩාගාරයෙන් මේ මුදල් අරන් දෙනවා ද, ඒ සඳහා වෙනම අරමුදලක් හෝ රක්ෂණ ක්‍රමයක් ආරම්භ කරනවා ද කියලා අපි කල්පනා කළ යුතුයි. වයස අවුරුදු 30ක පුද්ගලයෙකුට අවුරුදු 60 වෙනකම් මාසයකට රුපියල් 1,000ක් වෙන් කරන්න පුළුවන් නම්, ආණ්ඩුව මැදිහත් වෙලා රක්ෂණ සමාගමක් එක්ක සම්බන්ධ වෙලා ඒ මුදල යොදලා රක්ෂණ ක්‍රමයකට ගියා නම් හොඳ විශ්‍රාම වැටුපක් ඒ අයට ලබා ගන්න පුළුවන්. මෙතැනින් අවුරුදු 30කට පස්සේත් රාජ්‍ය බදු මුදල්වලින් මේ වැඩිහිටි දීමනා ගෙවීම වෙනුවට, තමන්ට තමන් බලා ගන්න පුළුවන් ක්‍රමයක් හදන්න නීති අණපනත් වෙනස් කරන්න ආණ්ඩුවට පුළුවන්. මෙන්න මේ වාගේ අලුත් වැඩ පිළිවෙළවලට අවධානය යොමු නොකර, නත්තල් සීයා වාගේ අච්චරක් දෙනවා, මෙච්චරක් දෙනවා කිව්වාට වැඩක් නැහැ. ඒක මරු කියලා මිනිස්සු සතුටු වෙනවා. හැබැයි, රටක් හැටියට ඉදිරියට යන ගමනේදී අපි ඉදිරියට යනවා වෙනුවට එක තැන කැරකෙමින් ඉන්නේ. ඒ නිසා ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. බහුතර ජනප්‍රියවාදී ආණ්ඩුවක් මේක. ඔබට මේ තීරණ ගන්න පුළුවන්. මේ තීරණ අරගන්න. එහෙම නොගෙන අපට රටක් විධියට ඉදිරියට යන්න ක්‍රමයක් ලැබෙන්නේ නැහැයි කියන එක මතක් කරනවා.

ඊළඟ ප්‍රශ්නය තමයි, රජයකට තිරසර ලෙස අඩු ආදායම්ලාභීන් සුබසාධනය කරන්න පුළුවන් කොහොමද කියන එක. මේ අඩු ආදායම්ලාභීන් හැමදාම අපි මේ විධියටම තියාගන්නවා ද? අඩු ආදායම්ලාභීන් වැඩි ආදායම්ලාභීන්ගේ පැත්තට ගේන්නේ කොහොමද?අනෙක් ප්‍රශ්නය තමයි, මේ අඩු ආදායම්ලාභීන් දිගින් දිගටම මේ සහන ක්‍රමය බලාපොරොත්තු වෙන එක. අපි මොකක්ද මේ සඳහා ගන්නා ක්‍රියාමාර්ගය?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අමිල ප්‍රසාද් මහතා**
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
තව පොඩි වෙලාවකින් මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මම උදාහරණයකට කිව්වොත්, අපේ රටේ අඩු ආදායම්ලාභී පුද්ගලයන් ඉන්නවා. ඊට අමතරව ආබාධිත පුද්ගලයන් ඉන්නවා. මේ අය කොහොමද ජාතික ආර්ථිකයට එකතු කර ගන්නේ? අනාරක්ෂිතව පවතින ඕනෑ තරම් රේල් ගේට්ටු අපේ රටේ තිබෙනවා. අස්වැසුම හෝ වෙනත් සහනාධාරයක් ලබන කෙනෙක් මේ ස්ථානයකට සම්බන්ධ කරලා හෝ ගමේ ඉන්න සංවර්ධන නිලධාරින් එකතු කරගෙන මේ අය ඵලදායී වැඩකට යොදාගෙන හෝ මේ සහනාධාරය වැටුපක් බවට පරිවර්තනය කරගෙන ඒගොල්ලන්ගෙන් රාජ්‍යයට සේවයක් ලබාගෙන මේ සංවර්ධන ක්‍රියාවලියට එකතු කරගන්න බැරි ඇයි? මම නැවත නැවත ඔබතුමන්ලාට කියන්න උත්සාහ කරන්නේ අලුත් ක්‍රම පිළිබඳව හිතන්න කියලායි. ග්‍රාමීය ආර්ථිකය ඇතුළේ තිබෙන විවිධ කර්මාන්ත තිබෙනවා. කම්හල්කරුවන් ඉන්නවා. හැබැයි, මේ අයට ප්‍රමාණවත් ආදායමක් හිමි වෙන්නේ නැහැ. ගොවිතැන් කරන අය ඉන්නවා. ඔවුන්ටත් ප්‍රමාණවත් ආදායමක් හිමි වෙන්නේ නැහැ. ඒ නිසා මේ අයට තාක්ෂණික දැනුම ලබා දීම සඳහා කාර්මික විද්‍යාල හෝ මොකක් හරි ක්‍රමයක් ඇති කරලා මේ අයගේ දැනුම් වපසරිය විශාල කළොත් මම විශ්වාස කරනවා, මේ අය අඩු ආදායම්ලාභීන්ගේ සිට වැඩි ආදායම්ලාභීන් දක්වා ගෙන යන්න පුළුවන් කියලා. ඒ නිසා ආණ්ඩුව මේ වෙලාවේ මේවාට මුදල් වෙන් කරන අතරතුර අඩු ආදායම්ලාභීන්, ඉහළ ආදායම්ලාභීන් බවට පත් කරන්නටත් මේ මුදලින් කොටසක් වෙන් කරනවා නම් හොඳයි කියලා ඉල්ලීමක් කරනවා. හේතුව, මේ විෂම චක්‍රය වෙනස් කර ගත්තේ නැත්නම් අපට යන්න සිද්ධ වෙන්නේ දිගින් දිගටම ඒක අස්සේම තමයි.

අවසාන වශයෙන් මම කියන්නේ මෙච්චරයි. මේ රට මේ ස්ථානයට පැමිණීමේදී විවිධ ගැටලු ඇතුළු අනම් මනම් ප්‍රශ්න තිබුණත්, මේ දක්වා පැමිණි ගමනේ හොඳ දේවලුත් තිබෙනවා. ඒ තමයි මේ සමාජ සුරක්ෂිතභාවය. අඩු ආදායම්ලාභීන් ආරක්ෂා කර ගැනීම සඳහා සෑම ආණ්ඩුවක්ම මැදිහත්වීම හොඳයි. හැබැයි, ඒ ක්‍රමය වෙනස් විය යුතුයි. ඒ සඳහා ආණ්ඩුවක් ලෙස අලුත් ක්‍රමයකට හිතන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ධර්මප්‍රිය විජේසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.20]

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින පැවැත්වෙන්නේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය පිළිබඳ විවාදයයි. මේ විවාදයත් ඉතාම වැදගත් විවාදයක්. මේක, අපේ රටේ පීඩාවට පත් වෙන, එහෙම නැත්නම් දුප්පත්කමට ඇද දමලා තිබෙන ජනතාව බලා ගැනීම සඳහා සකස් කරන ලද ප්‍රතිලාභ වැඩසටහනක්. කාලාන්තරයක් තිස්සේ අපේ රටේ ප්‍රතිලාභ වැඩසටහන් සකස් කරලා තිබුණා. ජනසවිය විධියට, සමෘද්ධිය විධියට, ඊට පස්සේ අස්වැසුම විධියට වැඩසටහන් තිබුණා. ජනසවිය, සමෘද්ධිය දිගටම පවත්වාගෙන යන්න හදපු වැඩසටහනක්. හැබැයි, අස්වැසුම වැඩසටහන කියන්නේ දිගට පවත්වාගෙන යන්න හදපු වැඩසටහනක් නොවෙයි, අවසන් කිරීම ඉලක්ක කරගෙන හදපු වැඩසටහනක්.

අපි බලය ගන්න වෙලාව වෙනකොටත් මේක සකස් කරන ලද වැඩසටහනක්. නමුත් මේ වැඩසටහන පුරා ගැටලු විශාල ප්‍රමාණයක්, විශාල අකටයුතුකම් ප්‍රමාණයක් සිදු වෙලා තිබුණා. නමුත් ඒ වැඩසටහන තුළ පැවති අඩුපාඩු සකස් කිරීම සඳහා වන පියවරක් තියන්න එවකට ආණ්ඩු කටයුතු කරලා තිබුණේ නැහැ. ඒක අදියර කිහිපයකින් අවසන් කර ගන්න, අවසන් වෙන්න හදපු වැඩසටහනක් නිසාම ඒක අවසන් කරන්න, ඒක සකස් කරන්න, ඒක නිවැරැදි කරන්න ඔවුන්ට වුවමනාවක් තිබුණේ නැහැ කියලා අපි හිතනවා. නමුත් අපි බලයට පත් වුණාට පස්සේ ජනතාවගෙන් අපට දිගින් දිගට මැසිවිලි එන්න පටන් ගත්තා, ප්‍රතිලාභ ලැබෙන්න ඕනෑ කොටසක් එළියේ ඉන්නවා, ප්‍රතිලාභ ලැබිය යුතු නැති කොටසක් ප්‍රතිලාභ ලබනවා කියලා. ඒක නිසා මේක නිවැරැදි කරන්න උත්සාහ කරන්න වුවමනා වුණත්, මේක නිවැරැදි කිරීම සඳහා දිගු කාලයක් අවශ්‍ය වන නිසාත් අපි ඒ වැඩසටහන නිවැරැදි කිරීම සඳහා, එහෙම නැත්නම් මේකේ අඩුපාඩු සකස් කිරීම සඳහා පියවර තියන්න ඕනෑ කියන අදහස සහිතව ආවා. නමුත් මේ වැඩසටහන හදලා තිබුණේම වසරක් පාසා සමාලෝචනය කරමින්, නිවැරැදි කරමින් ඉස්සරහට යන්නයි.

2023, 2024 ඇතුළු කිසිදු වසරක මේක සමාලෝචනය කිරීමක් සිදුවී තිබුණේ නැහැ. ඒක නිසා අපි ආණ්ඩුවක් විධියට 2025 වසරේ මේක සමාලෝචනය කරනවා කියන අදහසේ හිටියා. නමුත් "දිට්වා" සුළි කුණාටුවත් එක්ක ඒ වැඩසටහන ඇත්තටම කල් යනවා. ඒක නැවත සකස් කිරීම සඳහා වන කාලය අපට 2026 දක්වා දීර්ඝ කරන්න සිදු වුණා. අද දින -ජනවාරි 20වන දින- ඒ වැඩසටහන -නැවත මේක සකස් කිරීම සඳහා තොරතුරු එකතු කරන වැඩසටහන- ආරම්භ කරන්න, ජනතාව අතරට යන්න තමයි සූදානම් වෙලා තිබුණේ. ඒ අතරේ මේ වැඩසටහන පවත්වාගෙන යද්දී 2025.12.31වැනි දිනය වන විට අපි අවස්ථා දෙකකදී - එක අවස්ථාවක අපි ඒක දීර්ඝ කළා. දෙසැම්බර් 31 අවසන් වෙන්න තිබුණු කොටස නැවත මාස හයකින් දීර්ඝ කිරීම සඳහා වන යෝජනාව තමයි අපි මේ සංශෝධනය ඇතුළේ අරගෙන එන්නේ.

විපක්ෂය මේ සමාජ ප්‍රතිලාභ වැඩසටහන පිළිබඳව කථා කරනවා වෙනුවට විපක්ෂ නායකගේ සිට සියලුදෙනා -එක් කෙනෙක්, දෙන්නෙක් හැර- දිගින් දිගටම කථා කළේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ ඒ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා ඒකට මුවා වෙලා අගමැතිතුමියට මඩ ගහන එක. එහෙම නැත්නම් අගමැතිතුමියට අපවාද කරන එක තමයි විපක්ෂයේ කාර්යභාරය වෙලා තිබුණේ. අද දින විපක්ෂ නායකතුමාගේ සම්පූර්ණ කථාව අස්වැසුම ප්‍රතිලාභ වැඩසටහන පිළිබඳව කිසිදු සඳහනක් නැති කථාවක් බවට පත් වෙලා තිබුණා. ඒක නිසා අපි විපක්ෂ නායකතුමාට මතක් කරන්න කැමැතියි, මේ පාර්ලිමේන්තු සැසිවාරයේදී කැතම වචන හුවමාරුව පටන් ගත්තේ අගමැතිතුමිය ඉලක්ක කරගෙනයි කියලා. නරක විධියට අගමැතිතුමියට අපහාස කරන්න පටන් ගත්තා.

අගමැතිතුමිය මේ රටේ ඉතාම ගුණගරුක, වැදගත් ස්ථානයක හිටපු මහත්මියක්. මේ රට ගොඩනඟන්න, මේ රට අලුත් කරන්න, මේ රට ඉදිරියට රැගෙන යන්න කියන අදහස සහිතව එතුමියගේ පෞද්ගලික සියලු දේවල් කැප කරලා මේ රට වෙනුවෙන් පියවර තැබුවා. එහි ප්‍රතිඵලයක් ලෙස තමයි එතුමිය නව ආණ්ඩුවේ අගමැතිතුමිය බවට පත් වෙන්නේ. ඒ වාගේම එතුමිය අපේ රටේ අධ්‍යාපන ඇමතිතුමිය බවට පත් වෙනවා.
එතැනින් පසුව මේ අධ්‍යාපනය පිළිබඳව අපි දිගින් දිගටම, දිගින් දිගටම කරගෙන එන ලද සොයා බැලීම් සහ අත්හදා බැලීම් එක්කත්, ඒ වාගේම ආණ්ඩුවක් ලෙස අපි ඡන්දයට ඉදිරිපත් වන මොහොතේත් අපේ අදහස වුණේ අපේ අධ්‍යාපනය ප්‍රතිසංකරණයට ලක් කළ යුතුයි කියන එක. හැබැයි, ඊට පස්සේ ආණ්ඩුව පත්වෙලා එම අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට පියවර තබනවාත් සමඟම එහි තිබුණු යම් යම් අඩු පාඩු පදනම් කරගෙන -සමහර ඒවා සැලසුම් සහගතව සිදු කළ අඩු පාඩු- විපක්ෂ නායකතුමා, අගමැතිතුමිය ඉලක්ක කරගෙන කැත ප්‍රහාරයක් එල්ල කරන්න පටන් ගත්තා. එහි කූටප්‍රාප්තිය තමයි, ඔවුන්ගේ දෝෂාභියෝගය කියන මහා සෝෂාව. විපක්ෂය එකතු වෙලා විශ්වාස භංග යෝජනාවක් ගෙනැල්ලා අගමැතිතුමිය ගෙදර යවන්න ඕනෑය කියලා මහා මාධ්‍ය සන්දර්ශනයක් දැම්මා. විපක්ෂයේ මන්ත්‍රීවරු අත්සන් කරලා විශ්වාස භංග යෝජනාවක් භාර දීලා අගමැතිතුමිය ගෙදර යවන්න තමයි ඔවුන්ගේ සූදානම තිබුණේ. අපිත් බලාගෙන සිටියා, විපක්ෂය අද අත්සන් කරයි; තව දවසක අත්සන් කරයි; ඊළඟ දවසේ අත්සන් කරයි කියලා. අපි හිතුවා, ඒක අද භාර දෙයි; හෙට භාර දෙයි; නැත්නම් ඊට පස්සේ හෝ භාර දෙයි කියලා. අපි ඇහුවා, ඔබතුමන්ලා ඒක භාර දෙනවාද කියලා. අපි හිතනවා, විපක්ෂ නායකතුමාට අවම වශයෙන් තමන්ගේ කණ්ඩායමේ අත්සන් ටිකවත් ලබාගන්න බැරි වීම නිසා ඒක භාර දෙන්න බැරි වුණා කියලා. ඇත්තටම දැන් ඔවුන් අපහසුතාවට පත්වෙලා තිබෙනවා, බරපතළ අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. විපක්ෂ නායකතුමා අසමත් පුද්ගලයෙක් බවට පත්වෙලා තිබෙනවා. මේක ඔවුන්ගේ දෙවැනි විශ්වාස භංග යෝජනාව. අපේ නියෝජ්‍ය ආරක්ෂක ඇමතිතුමාට තමයි පළමු විශ්වාස භංග යෝජනාව ගෙනාවේ. අවම වශයෙන් විශ්වාස භංග යෝජනාවක් ගෙනෙන්නේ කොහොමද කියලා ස්ථාවර නියෝග බලන්නේ නැතුව ගෙනාපු නිසා ඒක ඇනගත්තා, ෆේල් වුණා. දෙවැනි විශ්වාස භංග යෝජනාව, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පදනම් කරගෙන අගමැතිතුමියට එරෙහිව ගෙනාවා. ඒ යෝජනාව භාර දෙන්න බැරුව දැන් කෙඳිරි ගාමින් ඉන්නවා; එම නිසා අපි විපක්ෂ නායකතුමාට කියනවා; එතුමාට අභියෝග කරනවා, ඒ වාගේම විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමාට අපි අභියෝග කරනවා, පුළුවන් නම් ඔය විශ්වාස භංගය භාර දෙන්න. ඒ විශ්වාස භංගය එන දවසට ඒක අරමුණු කරගෙන දින දෙකක විවාදයක් කරලා, අධ්‍යාපන ප්‍රතිසංස්කරණය කියලා කියන්නේ මොකක්ද, මේ විපක්ෂය නඟන පුහු සෝෂාව මොකක්ද කියන එක අපි රටට හෙළිදරව් කරන්නම්. අපි නැවත අභියෝග කරනවා, විපක්ෂ නායකතුමාට කොන්දක් තිබෙනවා නම්, ඔබතුමන්ලා අත්සන් කරපු විශ්වාස භංග යෝජනාව ගෙනැල්ලා ගරු කථානායකතුමාට භාර දෙන්න කියලා. එහෙම භාර දුන්නොත් තමයි ඔබතුමන්ලාට කොන්දක් තිබෙනවා කියලා අපි හිතන්නේ.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**
(மாண்புமிகு தர்மப்ரிய விஜேசிங்ஹ)
(The Hon. Darmapriya Wijesinghe)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සුජීව දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சுஜீவ திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (பேராசிரியர்) சேன நாணாயக்கார அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SUJEEWA DISSANAYAKE left the Chair and THE HON. (PROF.) SENA NANAYAKKARA took the Chair.*

[අ.භා. 4.29]

**ගරු නන්දන පත්මකුමාර මහතා**
(மாண்புமிகு நந்தன பத்மகுமார)
(The Hon. Nandana Pathmakumara)
අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීම සඳහා වන යෝජනා ක්‍රමය පිළිබඳව කථා කරන මේ මොහොතේ මටත් කථා කරන්නට පුංචි වේලාවක් හෝ ලැබීම පිළිබඳව මා සන්තෝෂ වෙනවා.

මීට පෙර කථා කරපු විපක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් අතර, අපේ කළුතර දිස්ත්‍රික්කයේ හිටපු ඇමතිවරයකු දුප්පත්කම ගැන කථා කරමින් කිව්වා, අපේ රටේ බඩු මිල අඩු නැහැ ලු. කර්මාන්තශාලා වහලා ලු. බදු ගහනවා ලු. රජයේ සේවකයන්ට සහන නැහැ ලු. මේගොල්ලන්ට කරන්න අමාරුයි ලු. ඔන්න ඔහොම තමයි එතුමාගේ කථාව තුළ එතුමා ප්‍රකාශ කළේ. අපි විශ්වාස කරනවා, අපි ආණ්ඩුව හදලා අවුරුද්දකුත් මාස 4කට ආසන්න කාලයක් තුළ අපේ රටේ බඩු මිල විශාල ප්‍රමාණයකින් අඩු වෙලා තිබෙනවා කියලා. ඒක එතුමා නොදන්නවා වුණාට මේ රටේ ජනතාව දන්නවා. ඒ නිසා ජනතාව සිටින්නේ කොතරම් සතුටින්ද කියලා අපි දන්නවා. ඇත්තටම ජනතාව සතුටින් සිටින නිසා අපේ පැත්තෙන් අපි සතුටින් ඉන්නවා.

ඊළඟට කියනවා, කර්මාන්තශාලා වහලා ලු. එතුමා තමයි එහෙම කියන්නේ. කුඩු කර්මාන්තශාලා; අයිස් මත් ද්‍රව්‍ය කර්මාන්තශාලා නම් වහලා තිබෙනවා. එහෙම නැතුව මේ රටේ සංවර්ධනය වෙනුවෙන් දායක වන කර්මාන්තශාලා, අලුතින් ආරම්භ කළ කර්මාන්තශාලා නම් එකක්වත් වහලා නැහැ. ඇත්තටම ඒවා වැහෙයි කියලා තමයි එතුමන්ලා බලාගෙන ඉන්නේ. එහෙම වෙයි කියලා තමයි එතුමන්ලා සිතමින් ඉන්නේ; සිහින දකිමින් ඉන්නේ. නමුත්, මේ රටේ නව කර්මාන්තශාලා ආරම්භ වෙනවා, බලාගෙන සිටියදී එම කර්මාන්තශාලා දියුණු වෙනවා. එම නිසා රටේ ජනතාව ඉන්නේ සතුටින්. ඒ නිසාම අපිත් සතුටින් ඉන්නවා.

ඊළඟට එතුමා කියනවා, බදු ගහනවා ලු. ඔව්, අපි ආණ්ඩුවක් ලෙස බදු ගන්න ඕනෑ. ඒ වාගේම එතුමන්ලා දන්නවා, බදු නොගෙවපු බොහෝ අයට දැන් බදු ගෙවන්න සිදුවෙලා තිබෙනවා කියලා. මොකද, එතුමන්ලාගේ කාලයේ බොහෝ අය බදු ගෙව්වේ නැහැ. බදු හොරකම් කළා. ඒ වාගේ දේවල්වලට කිසිම ඉඩක් නැහැ, අපේ ආණ්ඩුව තුළ.

ඒ වාගේම රජයේ සේවකයන්ට සහන දුන්නේ නැහැ කියලා කිව්වා. අපේ ආණ්ඩුව තරම් රජයේ සේවකයන්ට සහන දුන් ආණ්ඩුවක් නැති තරම්. අපි පඩි වැඩිවීම් ලබා දුන්නා. ඒ නිසා රජයේ සේවකයන් මොන තරම් තෘප්තිමත්වද ඉන්නේ කියලා අපි දන්නවා. එතුමන්ලා හිතන විධියට අපි මේක කරන්නේ අමාරුවෙන් ලු. ඔව්. ඒගොල්ලන් අවුරුදු ගණනාවක් -අවුරුදු 76ක් - කරපු දේ වෙනස් කරන්න තමයි අපට දැන් සිදුවෙලා තිබෙන්නේ. ඒ නිසා මේක අමාරුයි. අමාරු බොහෝ දේවල් හොඳ දේවල් කියලා අපි දන්නවා. ඒ නිසා අමාරුවෙන් හරි අපි මේක හදන බව මේ මොහොතේ කියන්න ඕනෑ.

අපි දන්නවා, අපේ රටේ දුප්පත්කම වැඩිවීමට බලපෑ ප්‍රධාන හේතු ගණනාවක් තිබුණු බව. දුප්පත්කම අවම කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම අසාර්ථක වීම අපේ රටේ දුප්පත්කමට එක හේතුවක් වුණා. ඒ වාගේම වැඩිහිටි හා ආබාධිත පුද්ගලයින්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් නොලැබීමත් අපේ රටේ දුප්පත්භාවයට යම් හේතුවක් වුණා. ඒ වාගේම නිදහස් අධ්‍යාපනය තුළ සමාන අවස්ථා නොලැබීමත් අපේ රටේ දුප්පත්කමට හේතුවක් වුණා. ඒ වාගේම සෞඛ්‍ය සුබසාධක සේවාවල තිබුණු දුර්වලතා ද අපේ රටේ දුප්පත්කමට හේතුවක් වුණා. ඒ වාගේම නිවාස හා ජීවන ආරක්ෂාව පිළිබඳව රාජ්‍යයේ අසාර්ථකත්වයත් දුප්පත්කමට හේතුවක් වුණා. මෙන්න මේ කියපු දේවල් අපි වෙනස් කරලා තිබෙනවා. ප්‍රධාන වශයෙන් දුප්පත්කම අවම කිරීමට මෙතෙක් පැවති රජයන්වලට වැඩිය විශාල මැදිහත්වීමක් අපි කරමින් ඉන්නවා. අපි දන්නවා, අපේ රටේ ජනසවිය වැඩසටහන තිබුණා, සමෘද්ධිය වැඩසටහන තිබුණා, මේ වනකොට අස්වැසුම වැඩසටහන තිබෙනවා කියා. ඒවායේ තිබුණු අසාර්ථකත්වයන් අපි ඕනෑ තරම් දැක්කා. ගම් මට්ටමින් සහන දෙනකොට දේශපාලන අධිකාරිය මැදිහත් වෙලා ඒවා වෙනස් කරපු විධිය අපි ඕනෑ තරම් අත්දැකලා තිබෙනවා. ඒ වාගේම සහන ලබා දීමට පවුල් තෝරන විට ඔවුන්ගේ හිතවත්කම් මත සිදුකළ තෝරා ගැනීම් අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. ඒ වාගේම වැඩිහිටි දීමනාව විධියට මෙතෙක් ලබා දුන්නේ ඔවුන්ට ජීවත් වන්න තරම් ප්‍රමාණවත් මුදලක් නොවෙයි. රුපියල් 1,000ක්, රුපියල් 2,000ක් වැනි ඉතාම සුළු මුදල් ප්‍රමාණයක් තමයි දුන්නේ. අපි බලයට ඇවිත් තමයි ඒක රුපියල් 5,000ක් කළේ. ඒ විතරක් නොවෙයි. වැඩිහිටියන්ට, ආබාධිත පුද්ගලයින්ට මේ ආණ්ඩුව තරම් -අපේ රජය තරම්- සලකන කිසිම ආණ්ඩුවක් ඉතිහාසයේ තිබිලා නැහැ. අපි ඔවුන්ට සමාජයේ හදන සමාන අවස්ථා ගත්තොත්, මොන තරම් ප්‍රමාණයකින් අපි ඒ සඳහා මැදිහත් වෙනවාද කියලා පෙනෙනවා.

[ගරු නන්දන පත්මකුමාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූප්පත්කමේ ප්‍රධාන ලක්ෂණ කිහිපයක් තිබෙනවා. ඒ අතර තිබෙන ප්‍රධාන කරුණක් තමයි, අධ්‍යාපනය. අධ්‍යාපනය ගත්තොත්, මෙතෙක් පැවති අධ්‍යාපන ක්‍රමයේ තිබුණු දුර්වලතා හඳුනා ගනිමින් අපි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගේන්න හදන වෙලාවේ විපක්ෂය එය නවත්වන්න, එය වළක්වන්න කරපු මැදිහත්වීම අපි දැක්කා. අපි දන්නවා, මේ අධ්‍යාපන ක්‍රමය වෙනස් නොකර අපේ රටට මෙතැනින් ඉදිරියට යන්න බැහැ කියලා. ඒ නිසා අපි විශ්වාස කරනවා, අපේ රට දූප්පත්කමින් ගලවා ගැනීමට තිබෙන ප්‍රධාන සාධකයක් තමයි දූප්පත් පවුල්වල දරුවන්ට නිසි අධ්‍යාපන ක්‍රමයක් ලබා දීම කියලා. ඒ තුළින් ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීම මේ රට වෙනස් වීමේදී ප්‍රධාන වශයෙන් බලපානවා.

ඒ වාගේම පාසල් අධ්‍යාපනයේ තිබෙන අසමානතා වෙනස් කිරීමට අදාළ පියවර අපි අරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබුණු විශේෂ දුර්වලතා. පසුගිය කාලයේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිදු වූ කඩා වැටීම තුළ ජනතාවට විශාල වශයෙන් පෝලිම්වල ඉන්න සිදු වුණා. ප්‍රතිකාර කිරීමට අවශ්‍ය උපකරණ නොමැති වීම නිසා අපහසුතාවට ලක් වුණා. නිසි වැඩ පිළිවෙළක් නැතිකම නිසා තමයි මෙහෙම වුණේ. මේ වසරේ විශාල මුදල් ප්‍රමාණයක්, වැඩිම මුදල් ප්‍රමාණයක් සෞඛ්‍ය අමාත්‍යාංශයට වෙන් කරලා ඒ හරහා රටේ ජනතාවගේ සෞඛ්‍ය වෙනුවෙන් අපි මොන තරම් මැදිහත් වීමක් කරනවාද කියන එක කවුරුත් දන්නවා.

දූප්පත්කම නැති කිරීම පිණිස ග්‍රාමීය මාර්ග පද්ධතිය, ග්‍රාමීය නිවාස, ග්‍රාමීය මට්ටමේ ජනතාවගේ ස්වයං රැකියා, කර්මාන්ත දියුණු කරන්න මොන තරම් මුදල් ප්‍රමාණයක් 2026ට අදාළ අය වැයෙන් වෙන් කළාද කියලා අපි දන්නවා. මේ සියල්ල තුළ අපි මේ රටේ දූප්පත්කම ඉතා ඉක්මනින් නැති කරලා, අපේ රටේ ජනතාව සතුටින් සිටින ජනතාවක් බවට පත් කරනවා කියා ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.36]

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நாடளாவிய ரீதியில் வருமானம் குறைந்த மக்களுக்கு அரசானது பல்வேறு உதவிகளைச் செய்து வருகின்றது. அந்த வகையில், பொத்துவில் பிரதேச செயலாளர் பிரிவில் அஸ்வெசும முதலாம் கட்டத்தில் 10,021 குடும்பங்களும் இரண்டாம் கட்டத்தில் 2,733 குடும்பங்களும் நன்மை பெற்று வருகின்றன. மேலும், சுமார் 5,000 பேரினது விண்ணப்பங் களைப் பரிசீலனை செய்ய வேண்டியுள்ளதுடன், 19 குடும்பங்களது கொடுப்பனவுகள் தொழில்நுட்ப அறிவு இல்லாமை காரணமாக தாமதமாகின்றன. இவற்றை விரைவாகத் தீர்த்து, கொடுப்பனவுகளை வழங்க ஆவன செய்ய வேண்டும்.

புள்ளி வழங்கல் அடிப்படையில் தெரிவுசெய்யப்படும் இந்தப் பயனாளிகள் 20 சுட்டிகள், 6 பரிணாமங்கள் அடிப்படையில் தெரிவு செய்யப்படும் முறைக்குப் பதிலாக, இன்னமும் சுட்டிகள், பரிணாமங்களை அதிகரித்து, தகுதியான குடும்பங்கள் அனைத்துக்கும் இந்த அஸ்வெசும கொடுப்பனவு வழங்கப்படல் வேண்டும். எமது பொத்துவில் பிரதேச செயலாளர் பிரிவிலுள்ள மக்கள் வறுமைக் கோட்டின்கீழ் உள்ளவர்கள் என்பதைத் தெரிவிப்பதுடன், இப்பிரதேச செயலாளர் பிரிவில் அஸ்வெசும கொடுப்பனவு தொடர்பான நடவடிக்கைகளை மேற்கொள்கின்ற உத்தியோகத்தரான அப்துர் ரஹுமான் அவர்களுக்கு எனது நன்றியை இந்தச் சபையில் தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

மேலும், அரச சேவையில் பணியாற்றுகின்ற பட்டதாரிகளில் சுமார் 1,200 பேர் அதற்குச் சமமல்லாத கீழ் பதவிநிலைகளில் அரச அலுவலகங்களில் பணிபுரிவது அவதானிக்கப்பட்டுள்ளது. MN சம்பள அளவுத்திட்டத்தின்கீழ் பணிபுரிந்து சம்பளம் பெறவேண்டிய அவர்கள், PL சம்பள அளவுத்திட்டத்தொகுதியில் பணிபுரிந்து சம்பளம் பெற்று வருகின்றார்கள். அரசாங்கமானது இதனைக் கவனத்தில் எடுத்து, அவர்களுக்கான நியமனத்தின் தன்மையை மாற்றம் செய்து, MN சம்பள அளவுத் திட்டத்தின்கீழ் கடமை புரிந்து, சம்பளம் பெறுவதற்கு ஆவன செய்ய வேண்டுமென நான் இந்தச் சபையில் கேட்டுக் கொள்கின்றேன். பொது நிருவாகத்துக்குப் பொறுப்பான அமைச்சர் அவர்கள் இதனைச் செய்து கொடுப்பதற்கு முயற்சி எடுக்க வேண்டும். அரசாங்கமானது பட்டதாரிகளுக்கான தொழில்வாய்ப்புகளை வழங்கும்போது, அவர்களால் பெறப்பட்ட பட்டத்தைக் கவனத்திற்கொள்ள வேண்டுமெனக் கூறிக்கொள்ள விரும்பு கின்றேன். அவர்களால் பெறப்பட்ட பட்டத்துக்கும் அவர்கள் செய்யும் தொழிலுக்கும் எந்தவிதமான சம்பந்தமும் இல்லாமல் இருப்பதால், பூரணமான சேவையை அவர்களிடமிருந்து பெற முடியாமல் உள்ளது. எனவே, இதனையும் அரசாங்கம் கவனத்திற்கொள்ள வேண்டும்.

கிழக்கு மாகாணத்தில் தொண்டர் ஆசிரியர்களாகக் கடமைபுரிந்து, 19/0314/127/009ஆம் இலக்க, 28.06.2019ஆம் திகதிய அமைச்சரவைத் தீர்மானத்தின் பிரகாரம் SLTS 3-II ஆசிரியர் நியமனம் பெற்ற பலர், 45 வயதைத் தாண்டி யிருப்பதால் ஓய்வூதியம் பெறும்போது அவர்களுடைய சேவைக் காலம் குறைவாக இருக்கும் நிலை ஏற்பட்டுள்ளது. ஆதலால் அவர்கள் தொண்டர் ஆசிரியர்களாகக் கடமைபுரிந்த 2005-2019 காலப்பகுதியையும் சேவைக்காலத்தினுள் சேர்க்க அரசு நடவடிக்கை மேற்கொள்ள வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நாட்டிலுள்ள முஸ்லிம் மாணவர்கள் மார்க்கக் கல்வி கற்கும் இடங்கள் மூன்றாகப் பிரிக்கப்பட்டுள்ளன. Quran Madarasa, Primary Arabic College, Arabic College என்பனவே அவையாகும். இவற்றில் பெரும்பாலானவை 1ஆம், 2ஆம் தரத்திலேயே உள்ளன. இங்கு வழங்கப்படும் சான்றிதழ்களைக் கொண்டு மேலதிக கற்கைகளைத் தொடர முடியாமல் உள்ளது. Arabic College சான்றிதழ்களை மட்டும் கொண்டே மேலதிக கற்கைகளைத் தொடர முடியும். சஹ்ரானுடைய பிரச்சினையின் பின்னரே இந்தப் பதிவுகள் தரம் உயர்த்தப்படாமல் ஆக்கப்பட்டதாக அறிய முடிகின்றது. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களும் கௌரவ பிரதி அமைச்சர் அவர்களும் இது தொடர்பில் நடவடிக்கை எடுத்து, உரிய நிலையங்களுக்கான தகுதியின் பிரகாரம் அவற்றைத் தரம் உயர்த்த ஆவன செய்யுமாறு கேட்டுக் கொள்கின்றேன்.

பொத்துவிலில் இதற்காகக் கஷ்டப்பட்டுக்கொண்டு இருக்கின்ற M.C. Nasurdeen, K. Kaiyoom, Akbar Hassan, I. Irfan, S.M. Sabry, A.L. Irzath, A. Haque, M.N. Mifra, S.M. Mahdhoom, M.L. Nagoorthamby, A. Majeed, Zainulabdeen Moulavi, Lebbeithamby Moulavi, Salahudeen Moulavi, Mohammed Hanifa Hajiyar, Hithayathullah Moulavi, A.L.M. Mouzoom, Nizardeen Moulavi ஆகியோருக்கு நன்றிகளைத் தெரிவித்துக் கொள்ள விரும்புகின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**
(மாண்புமிகு எம்.எஸ். அப்துல் வாசித்)
(The Hon. M.S. Abthul Wazeeth)
මට තව තත්පර 30ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

அதேபோன்று, Pottuvil Grand Jummah Mosqueஐப் பல கோடி ரூபாய் செலவில் அமைக்க உதவிய Marhoom Sathakath Hajiyar இன் மகனான Safras, M.S.M. Nouzer Hajiyar, Subair Hajiyar, M.I. Cader Mohaideen Hajiyar, S.L.M. Niyas, A.M. Rafeek, M.A. Siddeeque, N.P.M. Jabarooth, A.L. Kamardeen, N.M. Ishak, N.P.M. Raheem, S.M.A Azeez ஆகியோருக்கும் நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அக்கரைப்பற்று பொதுச் சந்தையானது அமைக்கப்பட்டும் அதன்மூலம் அங்குள்ள வியாபாரிகள் பூரணமான சேவைகளைப் பெறவில்லை என்பதால், UDAஆனது அதனை நவீன முறையில் வாகனத் தரிப்பிடத்துடனான வியாபாரிகளும் பொதுமக்களும் பயன்படுத்தும் வகையிலான புதியதொரு பொதுச் சந்தையாக மாற்றி வழங்க ஆவன புரிய வேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். அருகம்பே பிரிவில் UDA மூலமாக நவீன ரக Comfort Centre ஒன்றை அமைத்து, பிரதேச சபைக்கு அதிக வருமானத்தை ஈட்டித்தரும் ஓர் இடமாக அதனை வழங்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். மேலும், மருதமுனையில் beachஇல் நிர்மாணிக்கப்பட்டுள்ள Children's Park பூரணப்படுத்தப் படாமல் உள்ளது. அதனை UDA திட்டத்துக்குள் சேர்த்து பூரணப்படுத்தி மக்களினதும் சிறுவர்களினதும் பாவனைக்கு விடவேண்டும். பாண்டிருப்பு நாவலர் சந்தியில் இருந்து மருதமுனை ஊடாக நீலாவணை வரையான வீதி பொலிஸ் நிலையம் வரை புனரமைக்கப்பட வேண்டும். இதனால் சிறந்த போக்குவரத்தை ஏற்படுத்தலாம். அத்துடன், நீலாவணையில் Tsunami Relocate-Islam Nagarஇலுள்ள Cemetery Roadஉம் பூரணப்படுத்தப்பட வேண்டுமெனக் கேட்டு, விடை பெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.40]

**ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා**
(மாண்புமிகு ஆர்.எம். சமந்த ரனசிங்ஹ)
(The Hon. R.M. Samantha Ranasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද දවස පුරාම කථා කළේ සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ අස්වැසුම සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ගැනයි. මේක විශේෂ සාකච්ඡාවක්. නමුත්, මේ සාකච්ඡාව පුරාවටම ඒ ගැන නොවෙයි විපක්ෂය කථා බහ වුණේ. විපක්ෂය ඒකෙන් පැනලා ගියා කියලා තමයි මට නම් හිතෙන්නේ. මොකද, අවුරුදු 76ක් තිස්සේ මේ ධනවාදී ආර්ථිකය බිහි කරපු සංකීර්ණ ගැටලුවලින් එකක් තමයි, අපේ රටේ දිළිඳුභාවය. පසුගිය කාලය ගත්තොත්, අපේ රටේ පවුල් ලක්ෂ 24ක් දිළිඳුභාවයට පත් කරපු මේ ආර්ථික ඔස්තාර්ලා මේක ගැන කථා නොකර හෙමින්ම මඟ හැරලා වෙන වෙන සාකච්ඡාවල හිටියා. ඒගොල්ලන් මේ ගැන කථා කළොත් ඒගොල්ලන්ටම මේක පාරා වළල්ලක් වන නිසා ඒ අය විවිධ තැන්වලින් මඟ හැරලා ගියා.

එක මන්ත්‍රීවරයෙක් කියලා ගියා, ආණ්ඩුවක් ලෙස අලුත් ක්‍රමයකට හිතන්න කියලා. ඒ මන්ත්‍රීතුමා දන්නේ නැතුව ඇති, මේ ආණ්ඩුව දිළිඳුභාවය තුරන් කිරීම වෙනුවෙන් විශාල වැඩ කොටසක් මේ අවුරුද්ද තුළ කරගෙන යන බවත්, 2030 වර්ෂය වෙනකොට ග්‍රාමීය දිළිඳුභාවය තුරන් කිරීම සඳහා දැවැන්ත වැඩ පිළිවෙළක් හදලා තිබෙන බවත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා 2026 වර්ෂයේ අය වැයෙන් රුපියල් බිලියන 240ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, දිළිඳු පවුල් දහනවලක්ෂයක් මේ අවුරුද්ද තුළ අපි රැක බලා ගන්නවා. එමෙන්ම, මේ අවුරුද්ද තුළ ආබාධිත අය, වකුගඩු ආබාධ තිබෙන අය සහ වැඩිහිටියන් ලෙස 1,270,000කට අවශ්‍ය දීමනා ලබා දීලා, ඔවුන් බලා ගන්නා වැඩ පිළිවෙළක් අපි සකස් කරලා තිබෙනවා. අස්වැසුම වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී දරුවන්ට පාසල් ලිපිද්‍රව්‍ය ලබා ගැනීම සඳහා රුපියල් 6,000ක දීමනාවක් ලබා දෙනවා. අස්වැසුම අරමුදලෙන් නොවුණත්, දරුවන් 300ට අඩු පාසල්වල දරුවන්ටත් රුපියල් 6,000ක් ඒ වෙනුවෙන් ලබා දෙනවා. ඒ වාගේම දුප්පත් පවුල්වල දරුවන්ට සපත්තු වවුචරයක් ලබා දෙනවා. එමෙන්ම, අපේ රටේ දරුවන්ගේ පෝෂණය වෙනුවෙන් ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන්ට දිවා ආහාර වේලක් ලබා දීමටත් කටයුතු කරනවා. මේ දීමනා ටික ලබා දීලා විතරක් අපි අවසන් කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දිළිඳු ජනතාව මේ දිළිඳුභාවයෙන් මුදා ගැනීම සඳහා අපේ රටේ දැවැන්තම ව්‍යාපාරයක් ගොඩනඟලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ තුළ අපි සැලසුම් කරලා තිබෙනවා, මේ රට නිෂ්පාදන ආර්ථිකයක් ලෙස ගොඩනඟන්නත්, ඒ සඳහා වැඩ පිළිවෙළක් හදන්නත්. මේ රටේ වැඩ කරන ජනතාව වන අවුරුදු 18ට වැඩි, අවුරුදු 60ට අඩු ශ්‍රම බලකාය නිෂ්පාදන ආර්ථිකය තුළට ගන්න අපි විශාල සැලැස්මක් හදලා තිබෙනවා. නිෂ්පාදන ආර්ථිකයක් හදලා අපේ රටේ ජනතාව ඒකට සම්බන්ධ කරලා, ඔවුන් උපයන ජාතික ධනය ඒ නිෂ්පාදන ආර්ථිකයට සම්බන්ධ වෙච්ච ජනතාවට පෙරළා ලැබෙන ක්‍රමයක් අපි සකස් කරමින් සිටිනවා. ඒ ආර්ථික වැඩ පිළිවෙළ රට පුරා ආසන්නව ග්‍රාම සේවා වසම් 14,000ක දියත් කරමින් යන මොහොතක තමයි 2026 වර්ෂයටත් අපි මේ මුදල වෙන් කළේ.

ඒ විතරක් නොවෙයි, ග්‍රාමීය දිළිඳු ජනතාව වෙනුවෙන් නිවාස වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහාත්, ගමේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා විශාල මුදලක් ලබා දීමටත්, "දිරිය" සුළු කුණාටුවට හසු වුණු කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් නඟාසිටුවීම සඳහා විශාල ලෙස ආධාර, මූල්‍ය පහසුකම් ලබා දීමටත්, විශේෂයෙන්ම වතු කම්කරු ජනතාවගේ වැටුප් වැඩි කිරීමටත්, ග්‍රාමීය ජනතාවගේ ආර්ථිකය සහ ජන ජීවිතය නඟාසිටුවීම සඳහාත් විශාල වැඩ කොටසක් අපි කරගෙන යනවා.

ඒ නිසා විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට යන එන මං නැතුව, වැලේ වැල් නැතුව ඉන්නේ. ඒගොල්ලන් පසුගිය කාලයේ සටන් පාඨයක් ගෙනාවා, විපක්ෂය මර්දනය කරනවා කියලා. අපි ඒ අයට කියනවා, ඔව්, ඔබ දේශපාලනය

[ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා]

කරපු කුඩු ජාවාරම් නැවතෙනවා, ඔබ දේශපාලනය කරපු දූප්පතුන් මේ රටින් නැති වෙනවා, ඒ නිසා විපක්ෂයේ දේශපාලනයත් නුදුරු කාලයේදී නවතිනවා කියන කාරණය. ඒ සඳහා අපි රටක් හැටියට, ආණ්ඩුවක් හැටියට වැඩ කරනවා කියන කාරණයත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු චාමර සම්පත් දසනායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.45]

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට එදා අපට අස්වැසුම සහනාධාර නැතුව යන්න බැහැ කියපු කට්ටියටම තමයි දැන් සහනාධාර දෙන්න වෙලා තිබෙන්නේ. පසුගිය කාලයේ අපි සහනාධාර බෙදනකොට, අපි සමෘද්ධිය බෙදනකොට ඔයගොල්ලන් කිව්වේ, "මේ ආණ්ඩු හැම එකක්ම සහනාධාර බෙද බෙදා ඉන්නවා. වැඩ පිළිවෙළක් නැහැ. රටේ ආර්ථිකය හදන්නේ නැහැ" කියායි. හැබැයි, දැන් ඔයගොල්ලන්ටත් ඒකේම එල්ලිලා යන්න වෙලා. ඔයගොල්ලන් ඒක තේරුම් ගත්ත එක ගැන අපි සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟ කාරණය මේකයි. මේ රටේ ඩොලරයේ වටිනාකම රුපියල් 200ට තිබුණේ. අපේ රටේ තෙල්, ගෑස් නැති වීම වැනි ප්‍රශ්න ඔක්කෝටම හේතුව වුණේ මොකක්ද? හිටපු ඇමෙරිකානු තානාපති ජූලි චන්ග් ගිය එකට මම රතිඤ්ඤා පත්තු කරනවා. ඇය තමයි මෙහේ ඉඳිමින් ඔක්කෝම ගේම් ගැහුවේ. ගෝඨාභයට ගහපු ගේම් එක කමක් නැහැ. රටේ ජනාධිපති එළවන්න ඇය ගේම් එකක් ගහපු එකට කමක් නැහැ. හැබැයි, රටේ ජනාධිපති එළෙව්වා පමණක් නොවෙයි, රටේ ආර්ථිකයත් විනාශ කළා, ඔය ජූලි චන්ග්. රටේ ගෑස්, තෙල් නැතුව මිනිස්සු පාරට බස්සලා අරගළ හැදුවේ, ඔක්කෝම දේවල් කළේ ඔය ගෑනි තමයි කියන එක මම මේ වෙලාවේදී භය නැතුව කියනවා. මොකද, ඔය ගෑනිගේ වැඩ පිළිවෙළ හින්දා තමයි ඒ දේවල් වුණේ. මම නම් ඒ ගැන දන්නවා. ඒ කාලයේ අපි මාදිවෙල හිටියේ. සමහරු රෑට රෑට චීන තානාපති කාර්යාලයට ගියා. සමහරු ඇමෙරිකානු තානාපති කාර්යාලයට ගියා. එහෙම ගිහිල්ලා තමයි මේ රට විනාශයට පත් කළේ. අනුන්ගේ කොන්ත්‍රාත් අරගෙන එන කෙනෙක් තමයි, ඒ ගෑනු කෙනා. අපි ඒවාට කැමැති නැහැ. කොයි ආණ්ඩුවක්වත් වට්ටන්න වෙන රටවල අය ඕනෑ නැහැ. මේ ආණ්ඩුව වට්ටන්නත් වෙන රටවල අය ඕනෑ නැහැ. ආණ්ඩු වට්ටන්න ඕනෑ නම්, මේ රටේ මිනිස්සු ආණ්ඩුව වට්ටයි. අනුන්ගේ පරිප්පු, අනුන්ගේ කොන්ත්‍රාත් ඕනෑ නැහැ, ඒකට. අනුන්ගේ කොන්ත්‍රාත් කරපු ගෑනියෙක් තමයි ඔය ජූලි චන්ග් කියන්නේ. ඒ ගැනත් මම මේ වෙලාවේදී මතක් කරනවා.

ඊළඟ කාරණය මේකයි. ජනාධිපතිතුමා ලස්සනට කොට කලිසමක් ගහලා, කළු පාට ටී-ෂර්ට් එකක් දමාගෙන කාල් ලුවිස්ට වැඩිය වේගයෙන් යාපනයේ ඇවිද්දා. කාල් ලුවිස් එතැන හිටියා නම් ජනාධිපතිතුමාට පරදිනවා. හැබැයි, ජනාධිපතිතුමා එකක් මතක තබා ගන්න ඕනෑ. ඔය විධියට ජනාධිපතිතුමාට යාපනයේ ඇවිදින්න අවස්ථාව ලැබුණේ මේ රටේ සෙබළු, නැත්නම් සොල්දාදුවන්, රණ විරුවන් නිසා. ඒගොල්ලන්ට රණ විරුවන් කියන්න බැහැ කිව්වා නේ. නමුත්, ඒ රණ විරුවන් දිවි පරදුවට තබා කරපු ඒ වික්‍රමය නිසා තමයි, අද ජනාධිපතිතුමාට යාපනය අර්ධද්වීපයේ ඇවිදින්න පුළුවන් වුණේ. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලය තුළ යුද්ධය නිමා කරන්න සොල්දාදුවන් ඒ කරපු කැප කිරීම නිසා තමයි අද වත්මන් ජනාධිපතිතුමාටත් යාපනයේ ඇවිදින්න පුළුවන් වුණේ, කාල් ලුවිස්ටත් වඩා වේගයෙන්.

ඊළඟ කාරණය මේකයි. මේ ආණ්ඩුව බලයට ආවේ තරුණ ඡන්දවලින්. අද තරුණ පිරිස් ඊශ්‍රායලයට යවන මහා ජාවාරමක් කරගෙන යනවා, විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 8,000ක් වෙබ් අඩවියේ ලියාපදිංචි වෙලා ඉන්නවා. ඒ තරුණ ළමයි ඔක්කෝම දැන් මේ ආණ්ඩුවෙන් ඉල්ලීම් කරනවා. මම මේ ආණ්ඩුවට වැඳලා කියනවා, ඒ අයට අසාධාරණයක් කරන්න එපා කියලා. ඔයගොල්ලන් මේ තරුණ ළමයින්ගේ ඡන්ද ගත්තා. දැන් ඒ රැකියා අවස්ථා ඔක්කෝම ටික ඒජන්සිවලට දෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒජන්සියෙන් රුපියල් ලක්ෂ 40ක් ගන්නවා. ඒ නිසා මිනිස්සුන්ට, ළමයින්ට ගෙවල් විකුණන්න වෙනවා, ඒජන්සිවලින් යනවා නම්. ඒජන්සිවලින් යනවා නම් නීතිය නැහැ. අනෙක් පැත්තෙන් යනවා නම් හැම නීතියක්ම තිබෙනවා. දුවන්න ඕනෑ, පනින්න ඕනෑ, ඔක්කෝම කරන්න ඕනෑ. මා ළඟ තිබෙනවා, 775කගේ තොරතුරු. නිෂ්පාදන අංශයේ රැකියා සඳහා යැවීමට ලොතරැයි ඇදලා, ඔක්කෝම කරලා තිබෙනවා. හැබැයි, 13දෙනායි තවම ආණ්ඩුවෙන් යවා තිබෙන්නේ. මේ ආණ්ඩුව බලයට එන්න කලින් කිව්වේ එහෙම නොවෙයි. නමුත්, දැන් ඒජන්සිකාරයින්ට එම රැකියා අවස්ථා දීලා, ඒ අවස්ථා විකුණා ඊශ්‍රායලයට යන්න ඉන්න ළමයින්ගේ අනාගතය නැති කර තිබෙන්නේ. ඒ අයට යන්න අවස්ථාව තිබියදී තමයි එහෙම වෙලා තිබෙන්නේ. අද 8,000ක් බලාගෙන ඉන්නවා, ඊශ්‍රායලයට යන්න. මීට කලින් හිටපු කිසිම විදේශ කටයුතු ඇමති කෙනෙක්වත් කරපු නැති වැඩක් මේ කරන්නේ. හැබැයි, මේ ආණ්ඩුව ඒකට උත්තරයක් දෙන්නේ නැහැ.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ගැනත් මම කියන්න කැමතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඛනිජ තෙල් සංස්ථාවේ බහිරවයෝ කිහිප දෙනෙක් ඉන්නවා. ඛනිජ තෙල් සංස්ථාවේ 18 කියලා තෙල් ටැංකියක් තිබෙනවා. මේ ටැංකියට තෙල් පුරවන ප්‍රමාණයක් තිබෙනවා. ඒ, ගුවන් යානාවලට ගහන තෙල්. ඉංජිනේරුවා එපා කියද්දීත් ඒ ටැංකියට බලෙන් තෙල් පුරවපු නිසා අද වනකොට තෙල් ලීටර් 35,000ක් අපතේ ගිහින් තිබෙනවා. පාඩුව රුපියල් කෝටි 5කට වැඩියි.

ඊළඟ කාරණය මේකයි. ඇමතිතුමා රුපියල් බිලියන 35ක් වෙන් කර තිබෙනවා, ටැංකි අලුත්වැඩියා කරන්නයි, නළ පද්ධතිය අලුත්වැඩියා කරන්නයි. රුපියල් බිලියන 35ක් කියන්නේ පොඩි ගණනක් නොවෙයි. කොන්ත්‍රාත් දීලා, කොමිස් ගහලා, ඒවායෙන් පගාව ගන්න තමයි මේ ඔක්කෝම කරන්නේ.

ඊළඟට මේ ආයතනයේ එක බහිරවයෙක් තමයි සරත් බන්දු. මා ළඟ ලැයිස්තුව තිබුණා. මම හිතන විධියට, මේ බහිරවයෝ ටික ඉන්නකල් බැහැ. පී.ජී. සරත්චන්ද්‍ර, ඩබ්ලිව්.එම්. නෙත්තිකුමාර, රාජකරුණා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, ඉංජිනේරු උපතිස්ස වාගේ කණ්ඩායමක් එකතු වෙලා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සම්පූර්ණයෙන් විනාශ කරනවා. අර තෙල් leak වෙච්ච එකේ පාඩුව බැලුවොත්, රුපියල් කෝටි 5කට වැඩි පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා. විශ්‍රාම ගිහිල්ලා, ආපසු ගෙනැල්ලා තමයි අලුත් සභාපති මේ තියාගෙන ඉන්නේ. මේ රටේ මේ සහනාධාර දෙනවා

වාගේම මේ මුදල් ආරක්ෂා කරන්න ඕනෑ. මේ මුදල් ආරක්ෂා කර ගත්තේ නැත්නම්, මේ වාගේ හොරු තියාගෙන මේ ආණ්ඩුවට වැඩ කරන්න බැහැ. හැබැයි කිව්වේ කොහොමද? පට්ට හොරු ටිකක් ඉන්නවා, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ.

ඊළඟට මම කියන්නේ, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ගැන. වයසක මිනිසුන්ගේ ඡන්දය එපාද, ඔබතුමන්ලාට? ජ්‍යෙෂ්ඨ පුරවැසියන් EPF එක හරි ETF එක හරි විශ්‍රාම වැටුප හරි අරගෙන fixed deposits දැම්මාම කලින් සියයට 15ක පොලියක් දුන්නා. ඒක සියයට 10 වුණා. හැබැයි දැන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සියයට 10ත් නැහැ, මේ අවුරුද්දේ ඉඳලා. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට සියයට 10ක්වත් නොදෙන බව මහ බැංකුව කියලා, දැන් බැංකුවලින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ඒක දෙන්නේ නැහැ. ඒක එකක්.

ඊළඟට මම කියන්න ඕනෑ, පොලීසියේ ස්ථානමාරුවීම් සම්බන්ධ කාරණයක්. දෙහිඅත්තකණ්ඩියේ ඉන්න පොලිස් කාන්තාවක් මාරු කරනවා, අම්පාරේ එහා පැත්තේ කෙළවරට. දුර ප්‍රමාණය කිලෝමීටර 150ක්. එතුමිය ළමයිනුත් අරගෙන යනවා. ස්ථාන මාරු කිරීමේ නිසි වැඩ පිළිවෙළක් නැහැ, පොලීසියේ. දෙහිඅත්තකණ්ඩිය එක පැත්තක. දෙහිඅත්තකණ්ඩියේ ඉඳලා අම්පාරේ එහා පැත්තේ කෙළවරට මාරු කරනවා. මේ වාගේ ප්‍රශ්න ගොඩක් තිබෙනවා.

ඊළඟ කාරණය මේකයි. මූලාසනයේ ඉන්න ඔබතුමා මහාචාර්යවරයෙක් නේ. දැන් "බිග් කුච්චන් 2" ඉන්නවා, මාතර. අවුරුදු 38ක් ඉංග්‍රීසි උගන්වපු ගුරුවරයෙක්, ඊයේ දැක්කාද අර ඉන්දියානු මහ කොමසාරිස් එක්ක කළ ඉංග්‍රීසි කථාව? ඉතින් අපට කොහොමද ඉංග්‍රීසි පුළුවන් වෙන්නේ, ගුරුවරයාට ඉංග්‍රීසි බැරි වුණාම? අවුරුදු 38ක් ගුරු වෘත්තියේ හිටපු ඉංග්‍රීසි ගුරුවරයාට ඉංග්‍රීසි කථා කරන්න බැරි වුණාම අපි වාගේ පොඩි ගම්වලින් ආපු මිනිස්සු කොහොමද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉංග්‍රීසි පුරුදු වෙන්නේ? එයා ඉස්සර වෙලා ඉංග්‍රීසි පුරුදු වෙන්න එපා යැ. එයා ඉංග්‍රීසි වරද්ද වරද්දා කියනවා. මේ රටට ලජ්ජා කරන්න එපා කියන්න, මේ බිග් කුච්චන්ලාට.

ඊළඟට, දැන් මේගොල්ලන් අයින් වෙන්න කියනවා, රිදීගම වැව ආසන්නයෙන්. අවුරුදු 70ක්, 80ක් තිස්සේ ඉන්න උදවිය ඉන්නවා. කොහොමද, ඒ මිනිස්සු අයින් වෙන්නේ? අයින් වෙනවා නම්, වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. වැඩ පිළිවෙළක් නැතුව කොහොමද, මිනිස්සු අයින් කරන්නේ?

ඒ වාගේම තමයි, ලංකා විදුලිබල මණ්ඩලයේ උසස්වීම් දෙන්න විභාගයක් තිබුණා. අවුරුදු 7ක්, දැන් විභාගය තියලා. ඒගොල්ලන් දැන් ඉංජිනේරුවෝ. ප්‍රතිඵල ආවේ 2025දී. 126දෙනෙක් සමත් වෙලා ඉන්නවා. දැන් ඒ 126දෙනාටම දෙන්නේ නැතුව වෙනත් ආයතනවලින් බඳවා ගන්න යනවා.

ඊළඟට මම කියන්න කැමැතියි, රාජ්‍ය බුද්ධි අංශය ගැන. පාස්කු ප්‍රහාරය වෙලාවේ ඔබතුමන්ලා කෑ ගැහුවා, බුද්ධි අංශය ආරක්ෂා කරන්න ඕනෑ, බුද්ධි අංශය හරියට හිටියේ නැහැ කියලා. ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානයෙන් නිකුත් කළ 2025 දෙසැම්බර් මස 18 දිනැති මේ ලිපිය මම **සභාගත*** කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බුද්ධි අංශයේ 40ක් මේ වෙනකොට මාරු කරලා තිබෙනවා. ඒ list එක තිබෙනවා, මා ළඟ. බුද්ධි අංශයේ 40ක් මේ ආණ්ඩුව මාරු කරලා තිබෙනවා. බුද්ධි අංශය මාරු කරලා, මේ රටේ රාජ්‍ය බුද්ධි සේවය නැති කරන්න වැයමක් කරනවාද කියලා මම දන්නේ නැහැ. බුද්ධි අංශයේ 40ක් මේ වෙනකොට මාරු කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, තවත් ගොඩක් දේවල් වෙනවා. ඒවා ඔක්කෝම කියන්න ඕනෑ. ඊළඟ කාරණය, රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපතිට වැඩ බැරි නිසා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයෙක් ඉන්නවා. සභාපති, සිසිර රණතුංග. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, ජේ.එම්. අමාන්. ජේ.එම්. අමාන් තමයි අද පාලනය කරන්නේ. එයා විශ්‍රාම වැටුපක් ගන්නේ නැහැ. රාජ්‍ය වැවිලි සංස්ථාවේ වංචා ටික සම්පූර්ණයෙන් කරන්නේ ජේ.එම්. අමාන්. සභාපතිතුමා උඩ බලාගෙන ඉන්නවා. ඇයි? සභාපතිවරුන්ට වැඩ බැරි නිසා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරු පත් කරගෙන හිටියාම ඒ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්ට ඕනෑ විධියට වැඩේ කරගෙන යනවා. ඒවා ගැන රාජ්‍ය වැවිලි සංස්ථාව භාර ඇමතිතුමා දන්නවාද දන්නෙත් නැහැ. මේවා ගැන අපට තොරතුරු දෙනවා. තොරතුරු ලැබුණාම අපි ඒ තොරතුරු ගෙනැල්ලා ඒවා ගැන පාර්ලිමේන්තුවේදී කථා කරන්න ඕනෑ. නැත්නම් මේවා කවුරු කථා කරන්නද?

එපමණක් නොවෙයි. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ප්‍රශ්න ඇතුළු තව ගොඩක් දේවල් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
තවත් ප්‍රශ්නයක් තිබෙනවා. මේ ප්‍රශ්නය ගැන බලන්නකෝ.

ජනාධිපතිතුමා පොංගල් බත් කන්න ගියා යාපනේ. ජනාධිපතිතුමා හිතාගෙන ඉන්නවාද දන්නේ නැහැ ඒ හිටපු සෙනඟ ජනාධිපතිතුමාගේ රැස්වීමට ආපු සෙනඟ කියලා. නැහැ. පොලිස් දෙපාර්තමේන්තුවෙන් එක ගමකින් 20දෙනා, 20දෙනා එකතු කරලා තමයි ඒ රැස්වීමට සෙනඟ ගෙනාවේ. ජනාධිපතිතුමා කළ කථාව අහන්න ඒ මිනිස්සු හිටියේ නැහැ. පොලීසියෙන් බලෙන් සෙනඟ එකතු කරලා ගෙනැල්ලා තමයි ඒ රැස්වීම තිබ්බේ. ඒ අස්සේ ත්‍රිකුණාමලයේ බුදු පිළිමයේ ප්‍රශ්නයට හාමුදුරුවෝ රිමාන්ඩ් කරලා. මෙහෙම ජාතිවාදී විධියට කටයුතු කරන්න බැහැ. ජනාධිපතිතුමාට උතුරේ ඡන්ද බලාගෙන මෙහෙම කටයුතු කරන්න බැහැ. එතකොට සිංහල බෞද්ධ මිනිසුන්ගේ ඡන්ද? ඒවා ඡන්ද නොවෙයිද? උතුරේ සහ නැඟෙනහිර ජනතාවගේ ඡන්ද විතරද ඡන්ද? නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
මේ රටේ සමස්ත ජනතාව ඡන්ද දීලා තමයි එතුමා ජනාධිපති වෙලා ඉන්නේ. උතුරටත් සලකන්න ඕනෑ, නැඟෙනහිරටත් සලකන්න ඕනෑ. අපි එපා කියන්නේ නැහැ. ඒ වාගේම දකුණටත් සලකන්න ඕනෑ එකම විධියට. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා එකම විධියට සලකන්නේ නැහැ නේ. එතුමා අතැනට ගිහිල්ලා එකක් කියනවා. තව තැනකට ගිහිල්ලා එකක් කියනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු චාමර සම්පත් දසනායක මහතා]

එහෙම කරන්න බැහැ. අපේ හාමුදුරුවරු රිමාන්ඩ් කරවනවා. වෙරළ පොඩ්ඩක් ඇල්ලුවා කියලා මොකක්ද වෙන්නේ? ත්‍රිකුණාමලයේ වෙරළ පොඩ්ඩක් ඇල්ලුවා කියලා මොකක්ද වෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු චාමර සම්පත් දසනායක මහතා**
(மாண்புமிகு சாமர சம்பத் தசநாயக்க)
(The Hon. Chamara Sampath Dasanayake)
ඒක ඇල්ලුවාටද හාමුදුරුවරු හිරේ දමන්නේ? මෙහෙම කරන්න ගියොත් මේ රටේ ජාතිවාදී ප්‍රශ්නය හදන්නේ අපි නොවෙයි, මේ ආණ්ඩුවම තමයි කියන එක මේ වෙලාවේදී මම කියන්න ඕනෑ. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිශාන්ත ජයවීර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.56]

**ගරු නිශාන්ත ජයවීර මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிசாந்த ஜயவீர - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Nishantha Jayaweera - Deputy Minister of Economic Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද දින සාකච්ඡාවට භාජන කරන්නේ සුබසාධක ප්‍රතිලාභ පනත යටතේ ඉදිරිපත් කරන ලද "අස්වැසුම" සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ යෝජනා ක්‍රමය ගැනයි. සුබසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමවේදය ප්‍රධාන වශයෙන් සමාජ කාණ්ඩ දෙකකට බෙදා තිබෙනවා. එහි පළමු සමාජ කාණ්ඩය යටතේ අනුකාණ්ඩ 4ක් තෝර ගන්නවා. ඒ අනුකාණ්ඩ 4 ගත්තාම සංක්‍රාන්තික කොටසක් හඳුනා ගන්නවා. ඒගොල්ලන්ට රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙන්න කටයුතු කරනවා. ඊට අමතරව අවදානම් කියලා කණ්ඩායමක් තෝර ගන්නවා. ඒගොල්ලන්ට රුපියල් 5,000ක දීමනාවක් ලබා දෙනවා. ඒක අප්‍රේල් මාසයෙන් අවසන් වෙන්න නියමිත වෙලා තිබෙනවා. ඊටත් අමතරව දුප්පත් කාණ්ඩය කියලා කණ්ඩායමක් තෝරා ගන්නවා සහ එම දුප්පත් කාණ්ඩයේ පිරිසට ලබා දුන් රුපියල් 8,500ක දීමනාව නව රජය පත් වුණාට පස්සේ රුපියල් 10,000ක් දක්වා වැඩි කරන්න සමත් වෙලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! අද දින විවාදයේ කටයුතු අවසන් වන තෙක් කාලය දීර්ඝ කර ගැනීමට සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථාව කරන්න.

**ගරු නිශාන්ත ජයවීර මහතා**
(மாண்புமிகு நிசாந்த ஜயவீர)
(The Hon. Nishantha Jayaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊටත් අමතරව අන්ත දිළිඳු කියලා හඳුනා ගත්ත සමාජ කාණ්ඩයට එතෙක් ලබා දුන් රුපියල් 15,000ක දීමනාව අපි රුපියල් 17,500ක් දක්වා වැඩි කරලා තිබෙනවා. අද දින විශේෂයෙන්ම සාකච්ඡාවට භාජනය වෙන්නේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන රුපියල් 5,000ක දීමනාවක් දීපු අවදානම් කාණ්ඩයට අයිති පිරිස වෙනුවෙන් ඒ දීමනාව ලබා දෙන එක තවත් මාස හයකින් දීර්ඝ කිරීම සම්බන්ධවයි. "දිට්වා" සුළි කුණාටුවෙන් වූ ආපදාවත් එක්ක ඒ අසරණ වුණු ජනතාව ගැන සලකා බලලා රජය විසින් ගත්ත තීරණය අනුව තමයි මේක ක්‍රියාත්මක වෙන්නේ.

මීට අමතරව දෙවන සමාජ කාණ්ඩය විධියට වැඩිහිටි ජනතාව, ආබාධ සහිත ජනතාව සහ වකුගඩු රෝගී ජනතාවට ඒ දීමනා ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. හැබැයි, රජය විධියට අපේ පැහැදිලි පරමාර්ථය සහනාධාර ලබා දෙන පිරිස දිගින් දිගටම සහනාධාර ලබා දීම තුළින් පවත්වාගෙන යෑම නොවෙයි. මට කලින් විපක්ෂයෙන් කථා කළ මන්ත්‍රීවරු කිව්වා, සහනාධාර වැඩ පිළිවෙළ දිගින් දිගටම පවත්වාගෙන ආවා කියලා. විශාල යෝජනා වගයක් ගෙනාවා. නමුත් එතුමන්ලාගේ කාලයේ එම යෝජනා ක්‍රියාත්මක නොකිරීම තුළ තමයි දිගින් දිගටම සහනාධාර ලබා දීම පවත්වාගෙන යන්න වෙන්නේ. අපි රජයේ වියදම ගත්තාම, රජයේ නිලධාරින්ට වැටුප් සඳහා යන වියදමට වඩා වියදමක් සහනාධාර සහ දීමනා වෙනුවෙන් රජයට දරන්න වනවා. එම පිරිස සවිබලගන්වලා, ආර්ථික ක්‍රියාකාරකම්වලට දායක කරගෙන රජයේ වියදම අවම කර ගැනීම තමයි අපේ රජයේ ප්‍රධානම බලාපොරොත්තුව. අපි අන්න ඒ අරමුණට යන ගමනට ඉතාම විධිමත්, විද්‍යානුකූල වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. අපි ඉතා කෙටි කාලයක් ඇතුළත සහනාධාර ලබන පිරිස සවිබලගැන්වීමටත්, ඒ තුළින් මේ පිරිස අවම කර ගැනීමටත් අවශ්‍ය වැඩ කටයුතු ක්‍රියාත්මක කරනවා.

ඊත් එක්කම, අපි මෙතැනදී තවත් කරුණක් හඳුනාගෙන තිබෙනවා. සමාජයේ මතවාදයක් හැදිලා තිබුණා, මේ ප්‍රතිලාභ ලබා ගන්නා පිරිස අතර සුදුසුකම් නැති අයත් ඉන්නවා කියලා. මේ කියන පනත අනුවත් වසරකට වරක් නැවත ලියාපදිංචියක් කරන්න ඕනෑ. අපි මෙහිදී ඒ නැවත ලියාපදිංචියත් ආරම්භ කරලා, ඒ වැඩ කටයුතුත් නිසි පරිදි ක්‍රියාත්මක කරලා, ඉලෙක්ට්‍රොනික දත්ත පද්ධතියක් නිර්මාණය කරගෙන යනවා, නිවැරදි ක්‍රමවේදයක් අනුව නිවැරදිම පුද්ගලයන් හඳුනාගෙන සහනාධාර ලබා දෙන කාල සීමාව ඇතුළත ඒ පුද්ගලයන්ට සහනාධාර ලබා දීලා, ඒ පිරිස සවිබලගැන්වීමක් සිදු කරලා, ඒ පිරිස සමාජගත කරලා ආර්ථික ක්‍රියාකාරකම්වලට දායක කර ගන්න.

ඊට අමතරව, මෙතැනදී විශේෂයෙන්ම කථා වුණා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන. විපක්ෂයෙන් මතු වෙච්ච තර්ක විතර්ක දෙස බලන කොට පෙනෙනවා, ඒගොල්ලන් හැම තිස්සේම කථා කරන්නේ ගල් ලෑලි යුගයට යන්න බව; රුල් පහේ පොත් යුගයට යන්න බව. ඒ මතු වෙච්ච කාරණා සලකා බලන කොට ඇත්තටම අපට හිතෙනවා මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ එන්න තිබුණේ මීට වඩා කොච්චර කාලයකට කලින්ද කියලා. මොකද, පාර්ලිමේන්තුවේ අපේ ආණ්ඩු පක්ෂයේ සංයුතිය දෙස බලන කොට පෙනෙනවා, ආචාර්යවරුන්, මහාචාර්යවරුන්,

වෛද්‍යවරුන්, විශේෂඥ වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, පරිණත දේශපාලනඥයන්, වෘත්තිකයන්, ව්‍යවසායකයන් ඇතුළු සියලුදෙනාගෙන් සමන්විත අතිවිශිෂ්ට ආණ්ඩු පක්ෂයක් නිර්මාණය වෙලා තිබෙන බව. ඉතින්, මෙහෙම නිර්මාණය වෙච්ච ආණ්ඩු පක්ෂය විසින් ගෙනෙන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන අපට තවදුරටත් තර්ක කරන්න අවශ්‍ය නැහැ. මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගෙන ඒමේ අරමුණ අපේ යල් පැන ගිය අධ්‍යාපන ක්‍රමය නැති කර නවීන තලයට ගැළපෙන, කාලයට ගැළපෙන අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීමයි. ඒ සඳහා අවශ්‍ය යෝජනා පිළිබඳව අධ්‍යාපන විශේෂඥයන් සියලු දෙනා එක්ක කථා කරලා තමයි අප මේ ප්‍රතිසංස්කරණ ගෙන එන්නේ. මේ ගැන කථා කරන්න අපි පැකිළෙන්නේ නැහැ.

අපි ඔබතුමන්ලාට අභියෝග කරනවා, ඔබතුමන්ලා ඔය ගෙනෙන්න යන විශ්වාස භංගය ඉතාම ඉක්මනින් ගෙනෙන්න කියලා. අපි මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගැන දවස් දෙකක් කථා කරන්න කැමැතියි. ඒ ගැන කිසිම ගැටලුවක් නැහැ. අපටත් ඕනෑ මේ පිළිබඳව සාකච්ඡා කරලා, විවාද කරලා මේ ගැන ජනතාවට නිවැරදිව වටහා දීලා, ඉතාම ඉක්මනින් -කඩිනමින්- මේ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන්නයි. අපි ඒකට ලැහැස්තියි.

අපි ඔබතුමන්ලාට අභියෝග කරනවා, අර ඔබතුමන්ලා කියපු විශ්වාස භංගය ඉතාම ඉක්මනින් මේ සභාවට ඉදිරිපත් කරන්න කියලා. විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරු කිව්වා, මේ ආණ්ඩුව මහා ලොකු මුදලක් සොයා ගත්තා, ජනතාවට සහන දෙන්න ඒ මුදල් පාවිච්චි කළේ නැහැ කියලා. එතුමන්ලා පැහැදිලිව අවබෝධ කර ගන්න ඕනෑ, අපේ ආර්ථික දේහයට 2025 අවුරුද්ද අවසානයේ 2026 අවුරුද්ද වෙනුවෙන් රුපියල් බිලියන 562ක් තරම් අතිවිශාල මුදලක් මුදා හරින්න හැකි වුණේ, අපේ රජය එතරම් ශක්තිමත් වුණේ රජය ගෙන ගිය විධිමත් ආර්ථික සහ මූල්‍ය විනය හමුවේ ඉතිරි කර ගත් මුදලින් බව. ඒ මඟින් තමයි රජය විධියට මේ මහා විපතට පත් වෙච්ච ජනතාවට සහන දීලා, ඒ ජනතාව සවිබලගන්වා, ඔවුන්ගේ ගෙවල් දොරවල්, ව්‍යාපාර, කර්මාන්ත නඟා සිටුවන්න අවශ්‍ය මූල්‍යාධාර මේ ආර්ථික දේහයට මුදා හරින්න සමත් වුණේ.

ඊටත් අමතරව, විශේෂයෙන්ම කියන්න තිබෙන්නේ මේකයි. අපේ ගරු ජනාධිපතිතුමා ඇතුළු ජාතික ජන බලවේගය රජය වටා උතුරු නැඟෙනහිර සහ කඳුකරයේ ජනතාව විශාල වශයෙන් ඒක රාශි වෙනවා දකින කොට විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට ඒක දරා ගන්න බැරිව විවිධ අවලාද නඟනවා. නමුත්, මේ රටේ ජනතාව ඒක පැහැදිලිව අවබෝධ කරගෙන තිබෙනවා. කලින් අදහසක් මතු වුණා, එදා ඒ අයගේ නායකයන් මේ රටේ යුද්ධය පරාජය කළ බව. යුද්ධය පරාජය කළාට ඒ නායකයින්ට බැරි වුණා උතුරු නැඟෙනහිර ජනතාව දිනාගන්න. නමුත්, අපේ ගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ ජාතික ජන බලවේගය රජය උතුරු නැඟෙනහිර සහ කඳුකරයේ ජනතාව දිනාගත්තා; පැහැදිලිවම දිනාගත්තා. මැතිවරණ ප්‍රතිඵලවලින් එය පැහැදිලිව පෙනෙනවා. ජනාධිපතිතුමා ඒ ප්‍රදේශවලට යනකොට එම ප්‍රදේශවල ජනතාව විශාල වශයෙන් එතුමා වටා ඒක රාශි වන ආකාරය පෙනෙනවා; ජනතාව ආකර්ෂණය වෙනවා පෙනෙනවා. එතුමන්ලා කිව්වා වාගේ එතුමන්ලා යනකොට තමයි හමුදාවේ විශාල පිරිසක් අරගෙන යන්නේ. ඒ අත්දැකීම ප්‍රකාශයට පත් කළාට ජනතාව මේ ජනාධිපතිතුමා වටා තමයි ඒක රාශි වෙන්නේ. ඒ බවත් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) உபாலி பன்னிலகே - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சர்)
(The Hon. (Dr.) Upali Pannilage - Minister of Rural Development, Social Security and Community Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ ප්‍රශ්න, ගරු ආර්.ජී. විජේරත්න මහතා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

# කල්තැබීමේ ප්‍රශ්න
## ஒத்திவைப்பு வினாக்கள்
## ADJOURNMENT QUESTIONS

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**
(மாண்புமிகு ஆர்.ஜீ. விஜேரத்ன)
(The Hon. R.G. Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්නය මෙයයි.

"දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් පීඩාවට පත් ජනතාවට ලබා දෙන මූලික සහන කටයුතු රජය විසින් සිදු කොට තිබේ. නමුත් එම ව්‍යසනය හේතුවෙන් අවධානය යොමු කළ යුතු මීළඟ පියවර කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත. ඒ අනුව,

01. මෙම ආපදාව හේතුවෙන් අර්ධ සහ පූර්ණ හානි සිදු වූ නිවාසවලට අදාළව වන්දි ගෙවීම පිළිබඳව රජය විසින් ගෙන තිබෙන වැඩ පිළිවෙළ කුමක්ද?

02. ආපදාවට පත් ව්‍යාපාර සඳහා රජය මඟින් ලබා දෙන සහන සහ ඒවා ලබා දීමට බලාපොරොත්තු වන කාල රාමුව කුමක්ද?

03. ආපදා හේතුවෙන් හානියට පත් දේපළ සඳහා රක්ෂණ ප්‍රතිපූර්ණය සහ ණය සහන පිළිබඳව රජය අවධානය යොමු කරන්නේද? යොමු කරන්නේ නම් ඒ කුමන ආකාරයෙන්ද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ ව්‍යසනයක් ඇති වුණු බව අපි කවුරුත් දන්නවා. ඒක ස්වාභාවික ව්‍යසනයක් බවත් අපි දන්නවා. නමුත් එතැනින් පස්සේ විපක්ෂයේ විවිධ පුද්ගලයෝ මේ ආපදාවෙන් විපතට පත් වුණු ජනතාව වෙනුවෙන්

[ගරු ආර්.ජී. විජේරත්න මහතා]

අපේ ආණ්ඩුව සහන සැලසුවේ මොන ආකාරයෙන්ද කියන එක පිළිබඳව වග විභාගයකින් තොරව විවිධ චෝදනා ඉදිරිපත් කරමින්, නොයෙකුත් අව්වාරවත් ප්‍රකාශ නිකුත් කරමින් සිටියා. හැබැයි පසුගිය කාල සීමාවලත් ස්වාභාවික ආපදාවලට අපේ රට ලක් වෙලා තිබුණා. ඒ කාල සීමාවලදී ඔවුන් කටයුතු කළේ මොන ආකාරයෙන්ද කියන එක පිළිබඳව ඉතිහාසය හදාරද්දී අපට හෙළිදරව් වෙනවා.

මා නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයේ කැටයාපතන කන්ද නාය ගියාට පසුව ඒ නාය ගිය පවුල් සිය ගණනක් කඳවුරුවල, එහෙමත් නැත්නම් කුඩාරම් තුළ මාස 14ක කාලයක් හිටියා. ඒ අය නැවත පදිංචි කරවන්න ඉඩමක් දෙන්න බැරි වුණා. ඒ විතරක් නොවෙයි, අපි කවුරුත් දන්නවා රාමසර කන්ද නාය ගියාට පස්සේ අවතැන් වූ ඒ ජනතාව අවුරුද්දකට ආසන්න කාලයක් පිට්ටනියක කුඩාරමකට වෙලා හිටපු බව. අවසානයේ කුඩාරම් කඩා වැටුණා. ඊට පස්සේ තැන් තැන්වල පන්සල්වලට ගිහින් දාලා, ඊටත් පස්සේ තමයි ඔවුන් වෙනුවෙන් සහන කටයුතු ආරම්භ කරන්න පටන් ගත්තේ. මීරියබැද්ද නාය යාම සම්බන්ධවත් මේ විධියටම තමයි කටයුතු කළේ. ඉතිහාසය පුරා සිද්ධ වෙච්ච ඒ ස්වාභාවික ව්‍යසනවලදී කඩිනම් පියවර නොගත් පුද්ගලයෝ අද අපෙන් ප්‍රශ්න කරනවා, මේ ආපදාවෙන් විපතට පත් වුණු අයට සහන සැලසුවේ කොහොමද කියලා. ඒ නිසායි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ.

විශේෂයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව හෙවත් ජාතික විගණන කාර්යාලය ඉදිරිපත් කළ වාර්තා කිහිපයක කරුණු කිහිපයක් මේ සභාවට උපුටා දක්වන්න මම කැමැතියි. මුලින්ම, 2019 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධ විගණන වාර්තාවේ කරුණු කිහිපයක් ඔබ හමුවේ ඉදිරිපත් කරන්නම්. "ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් අමාත්‍යාංශය මඟින් නගර 10ක් සඳහා ආපදා අවදානම් සිතියම් සැකසීම සඳහා ලබා දුන් රුපියල් මිලියන 2ක් හා ලෝක ආහාර වැඩසටහන මඟින් ලබා දුන් රුපියල් මිලියන 2ක මුදල් ප්‍රයෝජනයට නොගෙන ආපසු යවා තිබුණි" කියා එහි සඳහන් වෙනවා.

එහි ඊළඟ කාරණය විධියට සඳහන් කරනවා, "කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රුපියල් මිලියන 1,034.39ක වියදමින් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැඟිල්ල 2010 වර්ෂයේ ඉදි කර තිබූ නමුත්, එම ඉඩම සහ ගොඩනැඟිල්ල මධ්‍යස්ථානය වෙත නීත්‍යනුකූලව පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිම කර නොතිබුණි" කියලා.

2020 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධ වාර්ෂික විගණන වාර්තාවෙන් කියන්නේ මොකක්ද? "විගණනයට ලක් කළ තොරතුරු අනුව ආපදා පූර්ව අනතුරු ඇඟවීමේ කුලුනු 77ක් සඳහා රුපියල් 89,764,707ක් වැය කර තිබුණද, චන්ද්‍රිකා තාක්ෂණය අක්‍රියව පවතින බැවින් එම කාර්යයෙන් බලාපොරොත්තු වූ කුලුනු 77හි ක්‍රියාකාරී තත්ත්වය පවත්වා ගෙන යෑම සාර්ථක වී නොතිබුණි". මේ, 2020 වාර්ෂික විගණන වාර්තාවේ සඳහන් කරුණු.

ඊළඟට ඔවුන් කියනවා, "2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත සංශෝධනය කිරීමට 2008 වර්ෂයේ සිට සිදු කර තිබුණු නමුත් 2020 දෙසැම්බර් 31 දින වන තෙක් අදාළ සංශෝධන පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි."

මෙන්න මේගොල්ලන්ගේ කෙරුවාව පිළිබඳ විගණන වාර්තාව.

ඊළඟට ඔවුන් කියනවා, "ආපදා කළමනාකරණය සඳහා බහුවිධ අවදානම් පැතිකඩ සැකසීම සඳහා 2016 සිට 2019 කාලසීමාව සඳහා භාණ්ඩාගාරයෙන් රුපියල් මිලියන 247ක මුදලක් වෙන් කර දී තිබුණු අතර, එයින් රුපියල් මිලියන 201ක ප්‍රතිපාදන මෙම කාර්යය සඳහා ලැබුණි. එසේ වුවත්, මෙම කාර්ය ඉටු කර නොතිබුණු අතර, ලැබී තිබූ ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 53ක් අදාළ අරමුණින් බැහැරව වැය කර තිබුණි."

මේ විගණන වාර්තා සියල්ලෙන්ම කියාපාන්නේ මොකක්ද? ඔවුන්ගේ අකාර්යක්ෂම බව, එහෙම නැත්නම් නිසි ලෙස මේ සඳහා අවධානය යොමු නොකරපු එක. ඒ තරම් කැක්කුමක් තිබුණු නැති පිරිසක් මේ වෙලාවේ බොරුවට ජනතාව අවුස්සන්න, ජනතාව නොමඟ යවන්න නොයෙකුත් බොරු බෙගල් කියමින්, අවලාද නඟමින් ඉන්නවා. එහෙමත් නැත්නම් ආණ්ඩුව යම් යම් චක්‍රලේඛ පිළිබඳ කරුණු ඉදිරිපත් කළාට පස්සේ, පසුවදාම කඳවුරට ගිහිල්ලා අහනවා, "රුපියල් 25,000 ලැබුණාද?" කියලා. ඒ තරමට බොළඳ කරුණු ඉදිරිපත් කරන තරමටම ඔවුන් අද දුර්වල වෙලා තිබෙනවා. අපි කවුරුත් දන්නවා, චක්‍රලේඛයක් ඉදිරිපත් කළාම ඒ අනුව අදාළ ක්‍රියාමාර්ග ගැනීමට යම් කාලසීමාවක් ගත වෙන බව. ඒක අපි කවුරුත් හොඳාකාරව දන්නවා. එසේ කරුණු දැන සිටියදීත්, ජනතාව නොමඟ යැවීම සඳහා, ජනතාව උසිගැන්වීම සඳහා මෙවැනි බොරු ප්‍රකාශ කරන තරමටම ඔවුන් අද අඥබාලයන් බවට පත් වී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ ප්‍රශ්නයට සාර්ථක පිළිතුරක් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

පිළිතුරු ලබා දීම, ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් ලැබෙනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා විෂය සම්බන්ධ කරුණු ගෙන හැර දැක්වීමත් සමඟම අසන ලද ප්‍රශ්නයට මා පිළිතුරු ලබා දෙනවා.

පසුගිය කාලවකවානුවේ ඇති වුණු "දිට්වා" සුළි කුණාටුවෙන් පස්සේ පීඩාවට පත් ජනතාව වෙනුවෙන් ආපදා කළමනාකරණ පිළිබඳ ජාතික සභාව කිහිප විටක් රැස් වෙලා, ඒ සම්බන්ධව විශේෂ සැලකිල්ලක් යොමු කරලා, අවධානයක් යොමු කරලා කටයුතු කළා.

ඒ වාගේම, ඒ එක් එක් අවස්ථාවලදී අවශ්‍යතාව අනුව බිමේ සිට ජාතික මට්ටම දක්වා ඒ කරුණු කාරණා සැලකිල්ලට ගෙන චක්‍රලේඛ නිකුත් කරමින් මන්ත්‍රීතුමා ගෙන හැර දැක්වූ පරිදි හානියට පත් වූ, පීඩාවට පත් වූ ජනතාවට සහන ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ සඳහා විශේෂ අවධානයක් යොමු කරමින්, අපේ අමාත්‍යාංශය විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රමය අනුව අවශ්‍ය කටයුතු සලස්වා තිබෙනවා.

මෙම ආපදාවෙන් පීඩාවට පත් ජනතාවගේ පූර්ණ හානි සිදු වුණු නිවාස තිබෙනවා, අර්ධ හානි සිදු වුණු නිවාස තිබෙනවා. ඒවාට වන්දි ගෙවීම් සඳහා රජය විසින් කරගෙන යන වැඩ පිළිවෙළ ගැන තමයි ඔබතුමාගේ ප්‍රශ්නය තුළින් විශේෂ අවධානය යොමු කළේ.

අය වැය චක්‍රලේඛ අංක 08/2025 මඟින් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයෙන් 2025 ජනවාරි 6 දින නිකුත් කරන ලද මාර්ගෝපදේශය මඟින් ආපදාව හේතුවෙන් අර්ධ සහ පූර්ණ හානි සිදු වූ නිවාසවලට වන්දි ගෙවීමේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අනුව මේ "දිට්වා" සුළි කුණාටුවෙන් සිදු වූ නාය යෑම් සහ ගංවතුර හේතුවෙන් පදිංචි ස්ථාන, නිවාස අහිමි වූ පවුල් සඳහා යම් යම් ක්‍රම අනුව වන්දි මුදල් ලබා දෙන්න කටයුතු සලස්වා තිබෙන්නේ. ඒ අවශ්‍යතා අනුව පසුගිය දෙසැම්බර් මස සිට වන්දි ලබා දීමට දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන නිදහස් කරලා තිබෙනවා. අපි ඒක හරි පැහැදිලිව දිස්ත්‍රික් ලේකම්වරුන්ට දන්වා තිබෙනවා. එතුමන්ලා සහ ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ග්‍රාම නිලධාරින්ගෙන් ලබා ගන්නා ඒ තොරතුරු අනුව කුලී නිවසක් සොයා ගැනීමෙන් පසු, මාසිකව ගෙවීම් කටයුතු කරන ආකාරයට අපි ඒ කටයුතු සලස්වා තිබෙනවා.

මේ වන විට දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් රජයේ ඉඩම් හඳුනා ගනිමින් පවතිනවා. දැනට හඳුනා ගෙන තිබෙන ඉඩම් පිළිබඳ සාරාංශයක් - විස්තරයක් - අපි හදලා තිබෙනවා. මම ඒක **සභාගත*** කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් ඒ ගැන අවබෝධයක් ලබා ගන්න පුළුවන්. ඒ අනුව ඔබතුමා නියෝජනය කරන ප්‍රදේශයට ගිහිල්ලා ඒ ජනතාව දැනුවත් කරන්න ඔබතුමාට පුළුවන්. මේ සඳහා අදාළ උපදෙස් ඇතුළත් මාර්ගෝපදේශයත් නිකුත් කරලා තිබෙනවා. නිවස හරි, එහෙම නැත්නම් හානියට පත් වෙච්ච ව්‍යාපාර ස්ථානය හරි, ඒ ගොඩනැඟිල්ල හරි ඉදිකර ගන්න අවශ්‍ය ගිවිසුම් පත්‍රයක් සකස් කරලා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කිරීමට කටයුතු කරලා තිබෙනවා. ඒ අනුව තමයි ඒක තහවුරු වෙන්නේ. කෙනෙක් හිටපු ස්ථානයේ, හානිය සිදු වෙච්ච ගොඩනැඟිල්ලේ තක්සේරු වාර්තාව අනුව තමයි ඔවුන්ට ඒ සහන ලැබෙන්නේ.

ආපදා ප්‍රත්‍යස්ථීක ලෙස නිවාස ඉදිකිරීමට ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විශේෂ සැලකිල්ලක් යොමු කරලා තිබෙනවා. එය ඔවුන්ගේ වගකීමක් හැටියට ගෙන ඒ සඳහා සහාය ලබා දීලා තිබෙනවා, ඒවා තක්සේරු කර ගැනීමේ ඉදිරි කටයුතුවලට. නිවාස ඉදිකිරීම ආරම්භ කර තිබෙන දින සිට දින 7ක කාලයක් ලබා දීම එම ගිවිසුම තුළින් සනිටුහන් වෙනවා.

02. ආපදාවට පත් ව්‍යාපාර සඳහා අපේ රජය මඟින් ලබා දෙන සහන සහ ඒවා ලබා දීමට බලාපොරොත්තු වන කාල රාමුවකුත් තිබෙනවා. ඒ අනුව තමයි අපි කටයුතු කරන්නේ.

විශේෂයෙන්ම ආපදාවට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් සඳහා ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීමට වාර්ෂිකව සියයට 3ක පොලී අනුපාතයක් යටතේ ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන රාජ්‍ය බැංකු තුන හරහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රමයක් 2025 දෙසැම්බර් 16 වන දින සිට අපි හඳුන්වා දීලා තිබෙනවා. මේ වසරේ ජනවාරි 1වැනි දා ඉඳලා ක්‍රියාත්මක වෙන ආකාරයට එම ණය යෝජනා ක්‍රමය මඟින් මහා පරිමාණ ව්‍යවසායකයන්ටත් කාරක ප්‍රාග්ධන ණය ලබා ගන්න පුළුවන්. මෙම ණය යෝජනා ක්‍රමය සඳහා වෙන් කර ඇති මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් මිලියන 10,000කි. මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට කැමැත්තක් දක්වන අනෙකුත් බැංකු හා ආයතන හරහා ද ඉදිරියේදී මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව ඔබතුමාට දන්වන්න කැමැතියි. ඒ වාගේම ණය ලබා දීමට අවශ්‍ය මූලික නිර්දේශය, ව්‍යාපාරය පිහිටි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරින් විසින්ද, අවසාන නිර්දේශය අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින්ද ලබා දිය යුතු අතර, එමඟින් ණය ඉල්ලුම් කරනු ලබන ව්‍යවසායන් "දිට්වා" සුළි කුණාටුව පැවැති කාල සීමාවේදී ක්‍රියාත්මක වූ ව්‍යවසායක් බව සහ එයට "දිට්වා" සුළි කුණාටුවෙන් බලපෑම් ඇති වූ බව ද තහවුරු කළ යුතුයි.

ක්ෂුද්‍ර, සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසායකයන් නැවත නඟා සිටුවීම සඳහා වන ණය යෝජනා ක්‍රමය යටතේ අක්‍රිය ණය කාණ්ඩය යටතට බැංකු විසින් වර්ගීකරණය කරන ලද ව්‍යවසායන්ට ණය ලබා දීම සඳහා කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ නිර්දේශ මත මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ක්‍රියාත්මක වූ ණය යෝජනා ක්‍රමය යටතේ 2025 වර්ෂය අවසාන වන විට ණය ලබා දී ඇත.

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ණය ලබා ගැනීමට නොහැකි වූ අයට මේ වසරේ ණය ලබා දීමට අවශ්‍ය කටයුතු තවදුරටත් කරමින් පවතිනවා.

03. ඒ වාගේම බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව ව්‍යසනයෙන් සෘජුවම බලපෑමට ලක්වූ පුද්ගලයින් හා ව්‍යාපාර සඳහා වෙනත් කිසිදු පූර්ව බැඳීම් නොසලකා මාස තුනක් හෝ මාස හයක් සඳහා ණය ආපසු ගෙවීමේ සහන කාලයක් ලබා දෙන අතර වෙක්පත් ප්‍රතිලාභ, ගෙවීම් නැවැත්වීම, ප්‍රමාද ගෙවීම් ගාස්තු, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ/වෙනස් කිරීමේ ගාස්තු සහ දඩ පොලිය සඳහා අය කිරීම් මේ අවුරුද්දේ - 2026 - ජනවාරි 31 දක්වා අත්හිටුවා තිබෙනවා. එමෙන්ම බලපෑමට ලක් වූ පුද්ගලයින් සහ ව්‍යාපාර සඳහා එක් එක් සිද්ධිය අනුව ණය පහසුකම් ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උපදෙස් දී තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)
2025 අංක 04 දරන එම චක්‍රලේඛය මේ අවස්ථාවේ මා **සභාගත*** කරනවා.

ඔබතුමාට ඒ සම්බන්ධවත් අවබෝධයක් ලබා ගන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

---

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**සභාමේසය මත තබන ලද ලේඛනය:*
*சபாபீடத்தில் வைக்கப்பட்ட ஆவணம்:*
*Document tabled:*

ඇමුණුම 01

**ආපදාවට ලක්වූ ඉඩම්වල පදිංචි ජන කොටස් නැවත පදිංචි කරවීම සඳහා සුදුසු ඉඩම් පිළිබඳ සාරාංශ වාර්තාව**

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ප්‍රාදේශීය ලේකම් සතු රජයේ ඉඩම් (අක්කර) | LRC (අක්කර) | රජයේ වෙනත් දෙපාර්තමේන්තු සතු (අක්කර) | රජයේ වතු හා වතු සමාගම සතු (අක්කර) | පුද්ගලික ඉඩම් (අක්කර) | පරිත්‍යාග (අක්කර) | නිවාස සංවර්ධන අධිකාරිය සතු (අක්කර හා කැබලි) | | එකතුව (අක්කර) |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | නාඋල | 18.158 | | | | | | | 92 | 18.158 |
| 2 | අඹුල්ල | 92.625 | | | | | | | | 92.625 |
| 3 | රත්තොට | | | | 120 | 725 | | | | 845 |
| 4 | උකුවෙල | 0.875 | 85.5 | | | | 2 | 1 | 76 | 165.375 |
| 5 | යටවත්ත | | | | | 1.25 | | | | 1.25 |
| 6 | පල්ලේපොල | 0.5732 | | 3 | | | | | | 3.5732 |
| 7 | අඹන්ගඟකෝරලේ | 3.157 | | | 10 | | | | 10 | 13:157 |
| 8 | මාතලේ | 22.3422 | | | | | 2.5 | | | 24.8422 |
| 9 | ගලේවෙල | 4 | 5 | 2 | | | 10 | | | 21 |
| 10 | ලග්ගල | 42.593 | | | | | | | | 42.593 |
| 11 | විල්ගමුව | | | 10 | | | | | | 10 |
| | | 184.3234 | 90.5 | 15 | 130 | 726.25 | 14.5 | 1 | 178 | 1161.573 |

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I rise to point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)
Sir, I have a point of Order to raise.

There is a serious Constitutional issue that has arisen. Under Standing Order No. 22, I think the Secretary-General has to take it up and a Ruling should be given as soon as possible by the Hon. Speaker, maybe tomorrow. Under Standing Order No. 92(2)(a), I would say that Article 41A.(1)(e)(iii) of the Constitution places a Constitutional duty on the Hon. Speaker to nominate, by agreement of the Hon. Prime Minister and the Hon. Leader of the Opposition, three eminent persons from the civil society to the Constitutional Council. The necessity for such nomination has already arisen as the term of the previous civil society members expires today. The announcement should have been made today. Since no announcement has been made, I want an explanation be given. It should be taken up by the Hon. Speaker and a statement should be made tomorrow morning. I know, Sir, that you cannot do it.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Okay, thank you. අපි ඒ කාරණය ගරු කථානායකතුමාගේ අවධානය සඳහා යොමු කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ.භා. 5.22ට, 2026 ජනවාරි 21වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி.ப. 5.22 மணிக்கு பாராளுமன்றம், 2026 சனவரி 21, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 5.22 p.m. until 9.30 a.m. on Wednesday, 21st January, 2026.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.